# විෂය නිර්දේශ

සහ

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## හතරවන ශ්‍රේණිය



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

අනුග්‍රහය
යුනිසෙෆ් ආයතනය

2008

# විෂය නිර්දේශ

සහ

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

මව්බස (සිංහල)
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි
දෙවන ජාතික භාෂාව (දෙමළ)
සිසු තක්සේරු කිරීම

## හතරවන ශ්‍රේණිය

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2008

පළමුවන මුද්‍රණය 2001
දෙවන මුද්‍රණය 2002
පළමුවන සංශෝධිත මුද්‍රණය 2008

හිමිකම් ඇවිරිණි

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ප්‍රාථමික පාසල් අවධිය ළමා සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියකි. අනාගතයේ සාර්ථක පුරවැසියකු වශයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය ශක්තීන් රාශියක් ගොඩ නැගෙන්නේත් හැඩ ගැසෙන්නේත් මේ කාල පරිච්ඡේදය තුළ දී ය. ඒ සඳහා ළමුන්ගේ වර්ධනයට හිතකර එසේ ම ඒවාට අනුබල දෙන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. මෙහි දී ළමුන්ට තමා අවට පරිසරය සමඟ නිරන්තරයෙන් ගැටී අත්දැකීම් ලබා ගැනීමටත් ක්‍රියාකාරී ලෙස පරිසරය සමඟ සම්බන්ධ වීමටත් ප්‍රීතිය හා සතුට අත්විඳීමටත් තමා කරන වැඩ තුළින් සාර්ථකත්වය භුක්ති විඳීමටත් දෙමව්පියන්ගේ හා ගුරුවරුන්ගේ ආදරය හා පිළිගැනීම ලැබීමටත් ඉඩ ප්‍රස්තා සැලසිය යුතු ය. එවැනි අවස්ථා ළමයාගේ සංවර්ධනය උපරිම මට්ටමකින් සිදු කිරීමට අනුබල දෙන්නක් වෙයි.

ප්‍රාථමික ශ්‍රේණි සඳහා විෂයමාලා සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් පිළියෙල කිරීමේ දී ඉහත දක්වන ලද කරුණු දැඩි ලෙස සැලකිල්ලට ගෙන ඇත. එම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ද එම කරුණු ඉස්මතු වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමට ගුරුවරුන් විසින් අවධානය යොමු කළ යුතු ය. එසේ ම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් ගුරු මහත්ම මහත්මීන්ට තම පන්ති කාමරවල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා කරන මග පෙන්වීමක් පමණක් බව ද අවධාරණය කරනු කැමැත්තෙමි. එහි ඇතුළත් කරුණු සැලකිල්ලට ගෙන තමාගේ ප්‍රදේශයට ගැළපෙන ආකාරයට තමාගේ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ගොඩ නගා ගැනීමට ගුරුවරුන් උනන්දු විය යුතු ය. නිර්මාණාත්මක ලෙස පන්ති කාමර කටයුතු ගොඩ නගා ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රයෝජනයට ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින ඉතාමත් විශාල පිරිසකගේ දායකත්වයෙන් සම්පාදනය කරන ලද්දකි. ඔවුන් සියලු ම දෙනාටත් මෙම කාර්යය වෙනුවෙන් මූලිකත්වය ගෙන ක්‍රියා කළ ප්‍රාථමික අධ්‍යාපන ඒකකයේ සියලු ම නිලධාරි මහත්ම මහත්මීටත් මාගේ කෘතඥතාවය හිමි වේ.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මුද්‍රණය කිරීම උදෙසා මූල්‍ය අනුග්‍රහය දැක්වීම වෙනුවෙන් යුනිසෙෆ් ආයතනයට අපගේ විශේෂ ස්තුතිය හිමිවේ.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2007 ජුනි 20 දින දී ය.

# සංඥාපනය

2008 වසරේ දී තුන්වන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 1998 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ තුන්වන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන ලද ගුරු අත්පොතේ නව සංස්කරණයකි. 2000 සිට පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් සැලකිල්ලට ගෙන මෙම සංස්කරණ සිදු කර ඇත. එසේ ම 2003 වර්ෂයේ දී පළ කළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද විෂයමාලා පසුපෙවුම් වැඩ සටහන මඟින් ලබා ගත් තොරතුරු, විවිධ ආයතන මඟින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව පවත්වන ලද පර්යේෂණවලින් ලබා ගත් තොරතුරු සහ ගුරු මහත්ම මහත්මීන් හා ගුරු උපදේශක මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුද මෙම සංස්කරණය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී. විශේෂයෙන් ම ප්‍රධාන අවධීන් සහ ශ්‍රේණිවල විෂයමාලා අතර තිබූ පරතරය නැති කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මඟින් උත්සාහ දරා ඇත.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය යනු ගුරු මහත්ම මහත්මීන් හට තමන්ගේ පන්තිවල ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කර ගැනීමට මග පෙන්වනු ලබන උපදෙස් සංග්‍රහයකි. එම මග පෙන්වීම්වලට අනුව තමන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සකස් කර ගැනීම ගුරු මහත්ම මහත්මීන්ගේ වගකීම වෙයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිටින සිසුන් සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියක පසු වන්නන් ය. සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා සහ පෞරුෂ ලක්ෂණ ගොඩ නැගෙන්නේත්, හැඩ ගැසෙන්නේත් මේ අවධියේ දී ය. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී, මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු මෙන් ම ඉහත සඳහන් කළ ළමා සංවර්ධනය හා සම්බන්ධ කරුණු ද සැලකිල්ලට ගත යුතු ය. මෙම වයස් සීමාවේ පසුවන සිසුන්ගේ ඉගෙනීම සිදු වන්නේ ආසන්න පරිසරයත් සමඟ අන්තර් ක්‍රියා කිරීමෙනි. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී සිසුන්ගේ ආසන්න පරිසරය අර්ථාන්විත ලෙස යොදා ගැනීමට ගුරු මහත්ම මහත්මීන් උත්සාහ කළ යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇති ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී, විනෝදජනක වැඩ සහ ක්‍රියාකාරකම්වලට වැදගත් තැනක් දී තිබේ. සිසුන්ට තම ළමා කාලයේ දී ප්‍රීතිය භුක්ති විඳීමට හා සාර්ථකත්වය අත්දැකීමට අවස්ථාවන් තිබීම ඔවුන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා අතිශයින් වැදගත් වේ. එමෙන් ම ඔවුන්ගේ අනාගත ජීවිතයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීමේ පදනම ද ඇති කළ යුතු ය. පුද්ගලයකුගේ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය ජීවන නිපුණතා රාශියක් විෂයමාලාව තුළ අන්තර්ගත කර ඇත. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි දක්වා ඇති අයුරු ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමෙන් සිසුන්ට එම නිපුණතා අත් කර දීම ගුරුවරුන්ගේ වගවීමක් වේ. ඒ සඳහා පන්ති කාමරය තුළ හැකිතාක් අවස්ථා සම්පාදනය කිරීම වැදගත් ය. තමාගේ පන්තියේ ඉගෙන ගන්නා සිසුන් ඉගෙනුම් ක්‍රියාවලිය සමඟ කොතරම් හොඳින් සම්බන්ධ වන්නේද යන්න පිළිබඳ ව නිරන්තරයෙන් සැලකිලිමත්ව සිට අවශ්‍ය පිළියම් යොදමින් කටයුතු කිරීම ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානයට ලක් විය යුතු තවත් කරුණකි. තක්සේරු කිරීම යනුවෙන් අදහස් කරන මෙම ක්‍රියාවලියෙහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ සෑම සිසුවකුගේ ම ඉගෙනීම වැඩි දියුණු කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා ගුරුවරුන්ගේ ගුරු උපදේශකවරුන්ගේ විදුහල්පතිවරුන්ගේ ගුරුවිද්‍යාල, අධ්‍යාපන විද්‍යා පීඨ, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගෙන් හා අධ්‍යාපන නිලධාරීන් විශාල පිරිසකගේ ද සහාය ලබා ගන්නා ලදී. ඒ සියලු ම දෙනා ම දැක් වූ දායකත්වය වෙනුවෙන් අපගේ කෘතඥතාවය පළ කරමු. එසේ ම ප්‍රාථමික අධ්‍යාපන අංශයේ කටයුතුවලට නිරන්තරයෙන් සහාය දක්වන හිටපු ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වන කමලා පීරිස් මෙනවිය, චිත්‍රාංගනී මල්වැන්න මිය, ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර යන මහත්ම මහත්මීන් ලබා දී ඇති සේවය බෙහෙවින් අගය කරමු. එසේ ම නිරන්තරයෙන් අපට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ජගත් වික්‍රමසිංහ මහතා කෘතඥතා පූර්වක ව සිහිපත් කරමු. මෙම කෘතිය සකස් කිරීම වෙනුවෙන් ඇප කැපවී ක්‍රියා කළ අපගේ අංශයේ සියලු ම නිලධාරී මහත්ම මහත්මීන්ගේ සේවය ඉතා ඉහළින් අගය කරමු.

ආචාර්ය සුරනිමල ලේකම්ගේ
අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපන

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

2007 ජුනි 20 දින දී ය



.

# ජාතික අරමුණු

(i) මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම.

(ii) වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

(iii) මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

(iv) පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

(v) සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

(vi) පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

(vii) ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

(viii) ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම. පැහැදිලි ව කතා කිරීම. තේරුම් ගැනීම සඳහා කියවීම. නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(iii) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජීක, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව.

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

(iv) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(v) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(vi) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(vii) “ඉගෙනීමට ඉගෙනුම” පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පළමුවන මුද්‍රණය - 2001

උපදේශනය :
ආචාර්ය ජී. බී. ගුණවර්ධන
(අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)
ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
(සහකාර අධ්‍යක්ෂ ජනරාල් -ජාතික අධ්‍යාපන ආයතනය)

අධීක්ෂණය :
විමල් සියඹලාගොඩ
(අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපනය)

විෂයමාලා කමිටුව :
ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
විමල් සියඹලාගොඩ
පී. සුබ්‍රමනියම්
ඊ. එල්. සුරනිමල
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර
එම්. එල්. විදානපතිරණ
කේ. එච්. පරණවිතාන
ජේ. එච්. චන්ද්‍රසේන
ටී. කේ. වීරතුංග
අයිරින් ගජනායක
කේ. ඩී. ආර්. දයාවංශ
ඒ. අතුකෝරළ
නන්දා බෙන්තරගේ
එස්. අයි. එම්. එච්. කරීම්
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ
එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න
පී. ජී. ප්‍රේමලතා ජයසිංහ
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
කේ. ආර්. පත්මසිරි
එස්. එම්. ආර්. සුදින්
එම්. එන්. චන්දන ප්‍රනාන්දු
ආර්. එම්. කෝ ද සිල්වා
ටී. මුහුන්දන්
වී. එන්. එස්. උදයචන්ද්‍රන්

පරිගණක වචන යෙදුම :
මොනිකා විජේකෝන්

සංශෝධිත මුද්‍රණය 2007

උපදේශනය :
මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
(අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)
විමල් සියඹලාගොඩ මයා
(සහකාර අධ්‍යක්ෂ ජනරාල් - භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

අධ්‍යක්ෂණය :
ආචාර්ය සුරනිමල ලේකම්ගේ
(ප්‍රාථමික අධ්‍යාපන ඒකකය)

සංස්කරණය හා සම්බන්ධීකරණය :
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය

ලේඛක මණ්ඩලය
අභ්‍යන්තර
ආචාර්ය සුරනිමල ලේකම්ගේ
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා
එම්. පී. එස්. ද සිල්වා මෙනවිය
එස්. එම්. ආර්. සුදින් මයා
එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය
පී. ජී. ප්‍රේමලතා ජයසිංහ මිය
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා
කේ. ආර්. පත්මසිරි මයා
එම්. එන්. චන්දන ප්‍රනාන්දු මයා
ආර්. එම්. කෝ ද සිල්වා මිය
එස්. උදයචන්ද්‍රන් මයා
එච්.ඩබ්.ඩබ්.එම්.සජීවා රුවනි රඹුක්වැල්ල මිය

බාහිර
කේ. ඩී. ආර්. දයාවංශ මයා
සරත් කුමාරසිංහ මයා

සහභාගිත්වය - ඉංග්‍රීසි අධ්‍යාපනය
එච්. ආර්. එස්. කේ. අටුගොඩ මයා
ඊ. වී. ඩී. සී. පී. පෙරේරා මිය


චිත්‍ර
කේ. ඩී. ආර්. දයාවංශ මයා

පිටකවරය
අමරා අමරසිංහ මෙනවිය

පරිගණක වචන යෙදුම :
මොනිකා විජේකෝන් මිය
මුද්‍රණ සහාය
එස්. පී. ඒ. සරත් කුමාර මයා

1 වන රූප සටහන

ප්‍රාථමික විෂයමාලා සැලැස්ම - 2007




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ප්‍රතිව්‍යුහකරණ යටතේ 1999 වර්ෂයේ සිට ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ විශේෂ ලක්ෂණ

* ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති අවුරුදු 5ක කාල සීමාව විෂයමාලා සංවර්ධන හා අනෙකුත් කටයුතුවල පහසුව තකා ප්‍රධාන අවධි තුනකට බෙදීම.
  1 ප්‍රධාන අවධිය : 1 වන සහ 2 වන ශ්‍රේණි
  2 ප්‍රධාන අවධිය : 3 වන සහ 4 වන ශ්‍රේණි
  3 ප්‍රධාන අවධිය : 5 වන ශ්‍රේණිය

* පළමුවන ශ්‍රේණියට ඇතුළු වන දරුවන් ආරම්භයේ දී ම පහසුවෙන් හඳුනා ගැනීමට ගුරුවරයාට භාවිත කළ හැකි සැලසුම්ගත සෙල්ලම් හා ක්‍රියාකාරකම් සමූහයක් හඳුන්වා දීම.

* සාමාන්‍ය අධ්‍යාපන අවධිය අවසානයේ දී සිසුන් විසින් වර්ධනය කර ගත යුතු යැ යි නිර්දේශිත නිපුණතා ප්‍රකාශයට පත් කර ඇත. ඒවා ගොඩනැගීමට සුදුසු පදනමක් සැපයෙන පරිදි සැකසුණු නිපුණතා පාදක විෂයමාලාවක් වීම.

* විෂය ක්ෂේත්‍ර හතරක් යටතේ සංවිධානය කර තිබීම.
  - භාෂාව
  - ආගම
  - ගණිතය
  - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

* දරුවකුගේ පූර්ණ වර්ධනයට භාෂාව හා ගණිත නිපුණතාවලට අමතර ව සෞන්දර්ය, නිර්මාණ, විද්‍යාව, සෞඛ්‍යය හා පෝෂණය වැනි තවත් අංශ කිහිපයකට අයත් නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. මෙම නිපුණතා වෙන් වෙන් ව විෂයයන් වශයෙන් ඉදිරිපත් කිරීමට වඩා සිසුනට ගැළපෙන තේමා තුළින් අවස්ථානුකූල ව මතු කර ඉගෙනීමට සැලැස්වීම වඩා යෝග්‍ය ලෙස පිළිගැනේ. මෙවැනි අංශ මතු කර ගැනීමට සමත් තේමා සමූහයකින් සමන්විත පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි පෙරට වඩා සමෝධානිත ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාෂාව, ගණිතය සහ ආගම යන විෂය ක්ෂේත්‍රවලට සම්බන්ධ නිපුණතා වර්ධනයට ද අවස්ථාවන් සැලසෙන හෙයින් එහි විෂය සම්බන්ධීකරණ ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පළමුවන ශ්‍රේණියේ සිට ම පන්තියේ ගුරුවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි නම් නව අංගයක් හඳුන්වා දීම.

* දෙවන ප්‍රධාන අවධියේ සිට විධිමත් ව ඉංග්‍රීසි විෂය හඳුන්වා දීම.

* පළමුවන ශ්‍රේණියේ සිට දිගට ම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලටත්, පස්වන ශ්‍රේණියේ දී සිසු ලැදියා හා අවශ්‍යතාවලට ගැළපෙන වෛකල්පිත ක්‍රියාකාරකම්වලටත් කාල සටහන තුළින් ඉඩ ප්‍රස්තා සැපයීම.

* ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවෙන් සිසුන් තුළ ජීවන නිපුණතා සංවර්ධනය කිරීමට ඉඩ සලසා තිබීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

* සමස්ත ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාලියේ දී ප්‍රධාන තැනක් හිමි වනුයේ ශිෂ්‍ය කේන්ද්‍රීය දිශාවට නැඹුරු වූ ක්‍රමවේදවලට ය. එම ක්‍රමවේද ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් වේ.

- සැලසුම්ගත සෙල්ලම් හා විනෝදජනක වැඩ
- ක්‍රියාකාරකම්
- අසුන්ගත වැඩ

* පළමුවන ප්‍රධාන අවධියේ දී සැලසුම්ගත සෙල්ලම් සහ ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක් ද අසුන්ගත වැඩවලට අඩු අවධානයක් ද ලැබේ. දෙවන ප්‍රධාන අවධියේ දී මෙම ක්‍රමවේද තුනට ම ආසන්න වශයෙන් සමාන ව අවධානය හිමි වේ. තෙවන ප්‍රධාන අවධියේ දී ක්‍රියාකාරකම් සහ අසුන්ගත වැඩවලට වැඩි අවධානයක් ද සෙල්ලම්වලට අඩු අවධානයක් ද ලැබේ. මේ අන්දමට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද සංකලන ප්‍රධාන අවධි තුන තුළ ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීම.

* සිසු ඉගෙනුම් ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ ව හඳුනා ගැනීම පිණිස නිරීක්ෂණය, වාචික ප්‍රශ්න කිරීම,සිසුන්ට සවන් දීම වැනි අවිධිමත් ක්‍රමවලට ප්‍රමුඛතාවය දෙන අඛණ්ඩ ව කර ගෙන යා යුතු පන්ති කාමර පාදක තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම.

* එක් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් හෝ තවත් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් හෝ සමඟ සසඳා තීරණ ගැනීමේ ක්‍රමයෙන් මිදී නිශ්චිත අරමුණක් හෝ සිසු පූර්ව සාධන මට්ටමක් සමඟ සිසු සාධනය සසඳා තීරණ ගැනීමට සමත් පිළිවෙළින් නිර්ණායක මූලික සහ පූර්ව සාධන මූලික තක්සේරු කිරීමේ ක්‍රම යොදා ගැනීමට අනුබල දීම.

* සැමට අධ්‍යාපනය තහවුරු කර ගැනීම ඉලක්ක කර ගනිමින්, ඒ සඳහා ප්‍රමිතියක් වශයෙන්, එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී සිසුන් විසින් අනිවාර්යයෙන් ම ප්‍රවීණතා මට්ටමට ළඟා විය යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුන්වා දීමට පියවර ගැනීම.

* එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී ළඟා කර ගත යුතු යැ යි අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ව ප්‍රවීණතාවක් ලබා ඇත්දැ යි තක්සේරු කිරීමට පියවර ගැනීම.

* එක් එක් ප්‍රධාන අවධියක් අවසානයේ අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ප්‍රවීණතාවක් සියලු ම සිසුන්ට ලබා දීම ඉලක්ක කර ගෙන එම එක් ප්‍රධාන අවධියක් එකම ගුරුවරයකුගේ යටතට පත් කිරීමට අනුබල දීම.

* පළමුවන ප්‍රධාන අවධියේ සිසුන් පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී සිටින විට ගුරු අධීක්ෂණය යටතේ, සංවිධානාත්මක ව හයවන ශ්‍රේණියේ සිසුන් සමඟ කණ්ඩායම් වැඩවල යෙදීමට ඉඩ ප්‍රස්තා සැපයීම.

* පළමුවන ප්‍රධාන අවධියේ දී පමණක් මව්බස විෂයයට ගණිතය විෂයයට වඩා වැඩිකාලයක් ද, දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී විවේක කාලය සඳහා දිනකට මිනිත්තු 20ක කාලයක් ද වෙන් කිරීම.

* 2007 වර්ෂයේ සිට පළමුවන ප්‍රධාන අවධියට දෙවන ජාතික භාෂාව හඳුන්වා දීම. එය සවන් දීමට හා කථනයට පමණක් සීමා කර තිබුණ ද තුන්වන ශ්‍රේණියේ සිට කියවීම හා ලිවීම ක්ෂේත්‍ර සම්බන්ධ කරමින් විධිමත් ව සිසුන්ට ඉගෙනීමට අවස්ථා සලසා තිබීම.

* 2007 වර්ෂයේ සිට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගණිත විෂයය සඳහා ද භාවිත කිරීම.

* 2007 වර්ෂයේ සිට සිසුන්ගේ කායික හා මානසික සංවර්ධනය සඳහා උපකාරී වන ශරීර සුවතා වැඩසටහන් පළමුවන ප්‍රධාන අවධිය සඳහා ක්‍රියාත්මක කිරීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1.0 | මව්බස (සිංහල) - විෂය නිර්දේශය | 01-03 |
| | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 03 |
| | හැඳින්වීම | 04-08 |
| 1.1 | සවන් දීම | 09-23 |
| 1.2 | කතා කිරීම | 24-31 |
| 1.3 | කියවීම | 32-52 |
| 1.4 | ලිවීම | 53-67 |
| | තක්සේරු පත්‍රිකාව | 68 |
| 2.0 | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - විෂය නිර්දේශය | 69-77 |
| | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 77 |
| | හැඳින්වීම | 77-80 |
| 2.1 | පැළෑටි හා ගස්වැල් | 81-87 |
| 2.2 | අප අවට සිටින සත්තු | 88-92 |
| 2.3 | අප පරිහරණය කරන දේ | 93-96 |
| 2.4 | අපේ ආහාර | 97-102 |
| 2.5 | අපි ලක්වැසියෝ | 103-108 |
| 2.6 | ආරක්ෂාව හා පරිස්සම | 109-112 |
| 2.7 | ජලය | 113-115 |
| 2.8 | ගමනාගමනය | 116-119 |
| 2.9 | ගෙවත්ත | 120-123 |
| 2.10 | වැඩ පහසු කිරීමේ මං | 124-130 |
| 2.11 | මිනිස් හැසිරීම් | 131-135 |
| 2.12 | පොළොව හා අහස | 136-142 |
| 2.13 | අපට කළ හැකි වෙනස්කම් | 143-145 |
| 2.14 | මිනිසා හා තොරතුරු | 146-148 |
| 2.15 | අපේ අතීත විත්ති | 149-152 |
| 2.16 | අපේ යහපැවැත්ම | 153-158 |
| | තක්සේරු පත්‍රිකාව | 159 |
| 3.0 | ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි | 160-180 |
| 4.0 | දෙවන ජාතික භාෂාව - විෂය නිර්දේශය | 181-183 |
| | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 184 |
| | හැඳින්වීම | 184-185 |
| | ආදර්ශ ක්‍රියාකාරකම් සන්තතිය | 186-203 |
| | පොදු තක්සේරු පත්‍රිකාව | 204 |
| 5.0 | සිසු ප්‍රගතිය තක්සේරු කිරීම | 205-208 |
| 6.0 | අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | 209-210 |


ගණිතය විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය,
ආගම් සඳහා විෂය නිර්දේශ හා ගුරු අත්පොත්
වෙන වෙන ම ඉදිරිපත් කර ඇත.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## කාලය බෙදා ගැනීම - දෙවන ප්‍රධාන අවධිය ( තුන්වන හා හතරවන ශ්‍රේණි)

| විෂයය | සතියකට කාලය | |
|---|---|---|
| 1. මව්බස | පැය | 5.00 |
| 2. ගණිතය | පැය | 5.00 |
| 3. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය | 6.00 |
| 4. ඉංග්‍රීසි | පැය | 3.00 |
| 5. දෙවන ජාතික භාෂාව | පැය | 1.00 |
| 6. ආගම | පැය | 2.00 |
| 7. උදය රැස්වීම හා ආගමික වතාවත් | පැය | 1.15 |
| 8. විවේක කාලය | පැය | 1.40 |
| 9. ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය | 2.05 |
| 10. විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු | 30 (සතියේ එක් දිනක) |
| සතියකට මුළු කාලය | පැය | 27.30 |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## දෙවන ප්‍රධාන අවධියට පිවිසෙන සිසුන් හඳුනා ගැනීම

වර්ෂය ආරම්භයේ දී තමන් වෙත පැමිණෙන සිසුන්ගේ හැකියා නොහැකියා රුචි අරුචිකම් හා ලැදියාවන් පිළිබඳ අවබෝධයක් ලබා තිබීම ගුරුවරයාට ඉතා වැදගත් වේ. දෙවන ප්‍රධාන අවධිය පුරාවට වසර දෙකක පමණ කාලයක් ගුරුවරයා හා සිසුන් අතර මනා අන්තර් සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා මෙමගින් පහසු ආරම්භයක් සලසා ගත හැකි ය. එසේ ම ඵලදායී ඉගෙනුම් අවස්ථා සම්පාදනය කිරීම සඳහා ද එය බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.
දෙවන ප්‍රධාන අවධියට පිවිසෙන සිසුන් හඳුනා ගැනීමේ දි සැලකිල්ලට ගත හැකි මූලාශ්‍ර කිහිපයකි.

1. පළමුවන ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සම්බන්ධ වාර්තා
   පළමුවන ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සකස් කිරීමේ දී දෙවන ප්‍රධාන අවධිය තුළ පහසුවෙන් කටයුතු කිරීම සඳහා සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම ප්‍රවීණ කළ යුතු නිපුණතා කෙරෙහි ද අවධානය යොමු කර ඇත. එබැවින් පළමු ප්‍රධාන අවධියෙහි අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා, දෙවන ප්‍රධාන අවධියෙහි පදනම් නිපුණතා ලෙස සැලකීම වටී.
   සිසුන් එක් එක් නිපුණතාවන්හි ප්‍රවීණතාව කරා ගෙන ඒමේ දී පළමු ප්‍රධාන අවධියෙහි ගුරුවරයා විසින් භාවිත කරන ලද අනාවරණ උපකරණ, ඒවා ක්‍රියාවට නංවා ඇති අයුරු, ඒ ඔස්සේ රැස් කර ගෙන ඇති තොරතුරු සැලකිල්ලට ගෙන සිසුන් එක් එක් විෂය ක්ෂේත්‍ර ඔස්සේ අත්කර ගෙන ඇති විෂය සාධනය මෙන් ම ඔවුන් සතු සමාජීය කුසලතා පිළිබඳ ව ද තක්සේරු කළ හැකි ය. ඒ පිළිබඳ ව යළි මුල සිට ම තොරතුරු රැස් කිරීමට කටයුතු කරනවා වෙනුවට පළමු ප්‍රධාන අවධියෙහි වාර්තා ද ප්‍රයෝජනයට ගැනීම මගින් ගුරුවරයාගේ කාර්යයන් වඩා කාර්යක්ෂම කර ගැනීමට හැකි වනු ඇත.

2. පළමුවන ප්‍රධාන අවධියෙහි ගුරුවරයා සමඟ සාකච්ඡා කිරීම.
   වසර දෙකක කාලයක් සිසුන් සමඟ ගත කිරීම තුළින් එක් එක් සිසුවා පිළිබඳ ව අත්කර ගත් අත්දැකීම් සම්භාරයක් පළමුවන ප්‍රධාන අවධියෙහි ගුරුවරයා සතුව තිබේ. එම ගුරුවරයා සමඟ සාකච්ඡා කිරීම මගින් සිසුන් පිළිබඳ ව අදහසක් ඇති කර ගැනීමට උත්සාහ දැරිය හැකි ය. කෙසේ වුව ද සිසුන් පිළිබඳ පූර්ව නිගමනවලට එළඹීමෙන් වැළකී සිටීම අවශ්‍ය ය.

3. දෙමව්පියන්/භාරකරුවන් සමඟ සාකච්ඡා කිරීම.
   සිසුන්ගේ සමාජ ආර්ථික පරිසරය පිළිබඳ ව මෙන් ම ඔවුන් පාසල් යාම කෙරෙහි දක්වන ආකල්ප පිළිබඳ ව ද තොරතුරු දැන ගැනීම ප්‍රයෝජනවත් වේ. මේ සඳහා ඔවුන්ගේ දෙමව්පියන් හෝ වෙනත් භාරකරුවන් හෝ සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා ගත හැකි නම් වඩා ප්‍රයෝජනවත් විය හැකි ය.

4. සිසුන් සමඟ සාකච්ඡා කිරීම.
   දෙවන ප්‍රධාන අවධියෙහි ඉගෙනුම් කටයුතු ආරම්භ කර පළමු සති කිහිපය තුළ දී සිසුන් සමඟ සාකච්ඡා කිරීම සහ ඔවුන් නිරීක්ෂණය කිරීම මගින් ඔබ විසින් රැස් කර ගෙන ඇති තොරතුරු තව දුරටත් තහවුරු කර ගැනීමට හෝ සංශෝධනය කර ගැනීමට පුළුවන.
   මෙහි දී සිසුන්ගේ ආකල්ප හා රුචිකත්ව පිළිබඳ ව තව දුරටත් අවබෝධ කර ගැනීමට ද අවස්ථාව සැලසේ.

සිසුන් හඳුනා ගැනීම සඳහා තවත් බොහෝ ක්‍රමවේද භාවිත කළ හැකි ය. දෙවන ප්‍රධාන අවධිය ආරම්භයේ දී සිසු හැකියා ප්‍රදර්ශනය කිරීම සඳහා පළමු ප්‍රධාන අවධිය භාර ගුරුවරයාගේ ද සහාය ඇති ව වැඩසටහනක් සංවිධානය කර ගැනීම අර්ථවත් අවස්ථාවක් විය හැකි ය. මේ සඳහා විදුහල්පතිවරයාගේ සහාය ලබා ගත හැකි වන අතර දෙමාපිය සහභාගිත්වය ද ලබා ගත හැකි ය.

මෙසේ විවිධ ක්‍රමවේද භාවිත කර සිසුන් පිළිබඳ ව ලබා ගන්නා තොරතුරු භාවිතයට ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 1.0 මව්බස

### 1.1 සවන් දීම

1.1.1 සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.
- ඡේදයකට සවන් දී ස්ථාන, පුද්ගල, සත්ත්ව හා ද්‍රව්‍ය නාම වෙන් කර දක්වයි.
- වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කරයි.
- වචනවල තේරුම අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.
- සිදුවීම් කිහිපයක අනුපිළිවෙළ නිවැරදි ව දක්වයි.

1.1.2 සවන් දී වින්දනය ලබයි.
- කවි/ගීවලට සවන් දෙමින් තාල තබයි.
- කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- ළමා නාට්‍යවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

1.1.3 ඉගෙනීම සඳහා සවන් දෙයි.
- ගුරුවරයාට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- විශේෂ ආරාධිතයන්ට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- විද්‍යුත් මාධ්‍ය අධ්‍යාපනික වැඩ සටහන්වලට සවන් දී කරුණු ඉදිරිපත් කරයි.

1.1.4 සවන් දී චින්තනයට යොමු වෙයි.
- තේරවිලිවලට සවන් දී විසඳයි.
- ගැටලුවලට සවන් දී විසඳයි.
- කතන්දර, සිදුවීම්වලට සවන් දී පෙර කියයි.

### 1.2 කතා කිරීම

1.2.1 කතා කිරීම මගින් සුහදත්වය වර්ධනය කර ගනියි.
- සුහද කතා බහේ යෙදෙයි.
- කතන්දර කියයි.
- තේරවිලි කියයි.
- කවි, ගී ගායනය කරයි.
- අත්දැකීම් පවසයි.

1.2.2 නිසි උච්චාරණය සහිත ව කතා කරයි.
- තාලානුකූල ව කවි, ගී, සින්දු කියයි.
- වාචික අභිනය සහිත ව හඬ නඟා කතා කරයි.
- අවධාරණයෙන් කතා කරයි.

1.2.3 සන්නිවේදන අවශ්‍යතා සඳහා කතා කරයි.
- පණිවිඩ පවසා පිළිතුරු රැගෙන එයි.
- අත්දැකීම් සෙසු අයට පවසයි.
- උගත් අලුත් දැනුම අන්‍යයන් හා බෙදා ගනියි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 1.3 කියවීම

1.3.1 නිවැරදි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි.

- සියලු මහාප්‍රාණ අක්ෂර සහිත ව මිශ්‍ර සිංහල හෝඩියේ අක්ෂර නිසි ලෙස උසුරුවමින් කියවයි.
- වේගය වර්ධනය කර ගනිමින් කියවයි.
- නැවතීම, කොමාව, ප්‍රශ්නාර්ථය, විශ්මයාර්ථය යන විරාම ලක්ෂණවලට අවනත ව කියවයි.
- විවිධ ශෛලීන් අනුව කියවයි.
- ඉස්පිලි, පාපිලි, අල්කිරීම්, ඇලපිලි, ඇදපිලි, රකාරාංශය, යංසය හා ගයනුකිත්ත යෙදුණු වචන නිවැරදි ව උසුරුවමින් කියවයි.

1.3.2 කියවා අවබෝධ කර ගනියි.

- සන්නිවේදන සලකුණු කියවා අවබෝධ කර ගනියි.
- සරල දැන්වීම් කියවා අවබෝධ කර ගනියි.
- ආරාධනා පත් කියවා අවබෝධ කර ගනියි.
- සරල කවි කියවා අවබෝධ කර ගනියි.
- සරල ඡේද කියවා අවබෝධ කර ගනියි.

1.3.3 වාග්මාලාව පෝෂණය සඳහා කියවයි.

- විවිධ වෘත්තීන් හා බැඳුණු වචන කියවයි.
  සමානාර්ථවත් පද කියවයි.
  විරුද්ධාර්ථවත් පද කියවයි.
  මව්බස පෙළ පොතෙහි හමු වන භාෂාමය යෙදුම් කියවයි.

1.3.4 රසාස්වාදය සඳහා කියවයි.

- කාටූන් කියවා රස විඳියි.
- ළමා කතන්දර කියවා රස විඳියි.
- ළමා කවි කියවා රස විඳියි.
- ළමා නාට්‍ය කියවා රස විඳියි.

1.3.5 කියවීමේ පුරුද්ද ඇති කර ගනියි.

- පොත් එකතු කර හුවමාරු කර ගෙන කියවයි.
- ළමයින් සඳහා සැකසූ සරල ගද්‍ය, පද්‍ය නිර්මාණ කියවයි.

## 1.4 ලිවීම

1.4.1 ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.

- සිංහල හෝඩියේ අක්ෂරවල අංග, ප්‍රමාණය, හැඩය අනුව නිවැරදි ව ලියයි.
- අකුරු හා වචන අතර පරතරය ගැන සැලකිලිමත් ව ලියයි.
- නැවතීමේ ලකුණ හා ප්‍රශ්නාර්ථය යොදා ලියයි.
- අර්ථය සඳහා අවශ්‍ය අකුරු හා පිලි යොදා වාක්‍ය ලියයි.
- උපුටා ගෙන නිවැරදි ව ලියයි.
- පවසන දේ අසා නිවැරදි ව ලියයි.

1.4.2 අවශ්‍යතා සඳහා ලියයි.

- පෞද්ගලික ලිපි ලියයි.
- ආකෘති පත්‍රයක් ඇසුරෙන් පෞද්ගලික තොරතුරු සපයයි.
- විදුලි පුවතක් මගින් පණිවිඩයක් යවයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

1.4.3 නිර්මාණාත්මක ව ලියයි.
- දෙබස් නිර්මාණය කර ලියයි.
- රචනා නිර්මාණය කර ලියයි.
- චිත්‍ර හෝ සිදුවීම් හෝ ඇසුරෙන් සරල කතා නිර්මාණය කර ලියයි.
- සරල කවි නිර්මාණය කර ලියයි.

1.4.4 නිවැරදි ලේඛන වහරට යොමු වෙයි.

1.4.4.1 නිවැරදි වාක්‍ය රටා (උක්ත රූපී වාක්‍ය)
- මම යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි.
- අපි යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි.
- ඔහු යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි.
- ඇ යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි.
- ප්‍රාණවාචී ඒක වචන පුරුෂ ලිංග නාම යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි.
- ප්‍රාණවාචී බහු වචන පුරුෂ ලිංග නාම යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි.
- ප්‍රාණවාචී ඒක වචන ස්ත්‍රී ලිංග නාම යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි.
- ප්‍රාණවාචී බහු වචන ස්ත්‍රී ලිංග නාම යෙදෙන වාක්‍ය නිවැරදි ව ලියයි

1.4.4.2 අක්ෂර වින්‍යාසයේ රටා අනුව ලියයි.
- මහාප්‍රාණ අක්ෂර යෙදෙන, භාවිතයේ යොදා ගන්නා වචන නිවැරදි ව ලියයි.
- ණ, ළ යෙදෙන භාවිතයේ යොදා ගන්නා වචන නිවැරදි ව ලියයි.
- ශ, ෂ යෙදෙන භාවිතයේ යොදා ගන්නා වචන නිවැරදි ව ලියයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

හතරවන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සෙල්ලම් හා විනෝදජනක වැඩ අඩු ප්‍රමාණයකින් ද ක්‍රියාකාරකම් හා අසුන් ගත වැඩ සමාන ප්‍රමාණයකින් ද යොදා ගැනීම අපේක්ෂා කෙරේ.

මව්බස විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී පෙළ පොත යොදා ගත යුතු අතර ඒ සඳහා පැහැදිලි උපදෙස් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සපයා ඇත. ඒ අනුව ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගන්න. සිසුන් තුළ නිර්මාණශීලී භාවය වර්ධනය කිරීම සඳහා ඔබගේ නිර්මාණශීලී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය විශාල අනුබලයක් බව සිතන්න.

භාෂා වර්ධන ඉලක්ක කරා යාම සඳහා මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි සඳහන් අතිරේක පොත්, පුවත් පත්, සඟරා, කැසට් පටි සංයුක්ත තැටි ආදිය ඇතුළත් සම්පත් කට්ටලයක් පන්ති කාමර මට්ටමින් සපයා ගෙන ඒවා උචිත පරිදි භාවිත කරන්න.

පන්ති කාමරය තුළ ඇති පන්ති පුස්තකාලය පොත් මල්ල කියවීම් ඒකකය සඳහා සිසුන් යොමු කිරීමට වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කරන්න. (මෙම වැඩසටහන් ස්ථාවර හා නිරන්තර වැඩ ලෙස අඛණ්ඩ ව පවත්වා ගෙන යන්න)

මව්බස විෂයය යටතේ සිසුන්ගේ වාග්මාලාව පෝෂණය කිරීම සඳහා 'පද පොතක් '(නාම පද, ක්‍රියා පද, සමානාර්ථවත් පද, විරුද්ධාර්ථවත් පද, යුගළ පද ආදී භාෂාවේ ඇති විවිධ පද වර්ග රැස් කර ගෙන එක් එක් සිසුවා විසින් පවත්වා ගෙන යන පොතකි.) පවත්වා ගෙන යන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තෝරා ගත් ගුවන් විදුලි හා රූපවාහිනී ළමා අධ්‍යාපනික වැඩසටහන්වලට සවන් දීමට හා නැරඹීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (පන්ති කවවල දී දෙමාපියන් දැනුවත් කරන්න.)

නිර්මාණශීලී හා විශේෂ දක්ෂතා ඇති සිසුන්ට අත දීමේ පියවරක් ලෙස ඔවුන් ගුවන් විදුලි, රූපවාහිනී වැඩසටහන්වලට යොමු කිරීමටත්, පුවත් පත්වල ළමා පිටු සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමටත් යොමු කරන්න.

සෙමින් හා වේගයෙන් ඉගෙන ගන්නා සිසුන් දෙපිරිස ම ඔබට අභියෝගයක් බැවින් ඔවුන් සඳහා උපකාරක හා අභියෝගාත්මක වැඩ සැලසුම් කිරීම ඔබ සතු යුතුකමක් හා වගකීමක් ලෙස සලකන්න.

## හැඳින්වීම

මව්බස විෂය සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම වශයෙන් ක්ෂේත්‍ර හතරක් යටතේ ඉදිරිපත් කර ඇත. ගුරුවරයාට විෂය අන්තර්ගත කරුණු පැහැදිලි කර ගැනීමට පහසු වනු පිණිස එසේ ඉදිරිපත් කර ඇතත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී මෙම ක්ෂේත්‍ර අදාළ පරිදි සමෝධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නිපුණතා පාදක ප්‍රවේශයේ දී, මූලික නිපුණතාවක් ලෙස සාක්ෂරතාව සඳහන් කෙරේ. එහි දී, සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව හා නිරවුල් ව ලිවීම, එලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම යන නිපුණතා කරා සිසුන් ළඟා කරවීම අපේක්ෂිත ය.

මෙම සන්නිවේදන නිපුණතාවලට අමතර ව පරිසරයට අදාළ නිපුණතා, වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා, ආචාර ධර්මවලට හා ආගමට අදාළ නිපුණතා, ක්‍රීඩා හා විවේකය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නිපුණතා, පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා යන අනෙක් නිපුණතා වර්ධනය වන ලෙසින් විෂයයට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

### ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

* එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමේ, කතා කිරීමේ කියවීමේ හා ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
* නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නගා කියවයි.
* ක්‍රමවත් ව පැහැදිලි ව හා නිවැරදි ව ලියයි.
* සවන්දීම, කතා කිරීම, කියවීම හා ලිවීම සම්බන්ධ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
* පොත් පත් කියවා තේරුම් ගනියි. රස විඳියි.
* තම අත්දැකීම් වාර්තා කිරීමට හා අදහස් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහද ව, නිරවුල් ව හා ආචාරශීලී ව ඉදිරිපත් කරයි.

### දෙවන ප්‍රධාන අවධියේ අපේක්ෂිත නිපුණතා

* ආචාරශීලී බව ප්‍රදර්ශනය කරමින් සවන් දෙයි.
* සවන් දුන් දෙයක ප්‍රධාන අදහස වෙනස් නොකර නැවත පවසයි.
* සුහද බව රැක ගනිමින් කතා බහේ යෙදෙයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

* නිසි උච්චාරණය සහිත ව කතා කරයි.
* නිසි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි.
* කියවා අවබෝධ කර ගෙන වැදගත් කරුණු ඉදිරිපත් කරයි.
* සරල වියරණ රීති රැක ගනිමින් වැකි ලියයි.
* සුවිශේෂී යොමු කිරීමකට අනුව නිර්මාණාත්මක ව ලියයි.

හතරවන ශ්‍රේණිය සඳහා අපේක්ෂිත නිපුණතා

* වින්දනාත්මක ව හා අවබෝධයෙන් යුතු ව සවන් දෙයි.
* සුහදත්වය වර්ධනය කර ගනිමින් නිසි උච්චාරණය සහිත ව කතා කරයි.
* නිවැරදි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි.
* කියවා අවබෝධ කර ගනියි.
* රසාස්වාදය සඳහා කියවා වාග්මාලාව පෝෂණය කර ගනියි.
* ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.
* නිවැරදි ලේඛන වහරට අනුව ලියයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පෙළ පොත භාවිතය සඳහා උපදෙස්

1. ඉගැන්වීමේ කාර්යයට පෙර ගුරුවරයා පෙළ පොත හොඳින් අධ්‍යයනය කළ යුතු වේ.

2. පෙළ පොතේ පාඩම් ඉදිරිපත් කිරීමේ දී අපේ රට හා අප සතු සාර්ධර්ම, සත්ත්ව හා ශාක ලෝකය, විද්‍යාත්මක සොයා ගැනීම්, පරිසර සුන්දරත්වය හා සංරක්ෂණය, ආරක්ෂාව හා පරිස්සම, කෘෂි කර්මාන්තය, සාහිත්‍ය හා රස වින්දනය, විශ්ව සාහිත්‍ය යන විවිධ ක්ෂේත්‍ර පදනම් කර ගත් දර්ශනයක් සහිත ව වන බැවින් ඒවා වඩා අර්ථවත් ලෙස ශිෂ්‍යයා සතු කිරීම ඔබට පැවරේ.


3. වසරින් වසර ශිෂ්‍යයා තුළ ක්‍රමික භාෂා නිපුණතාවක් ඇති වන සේ පෙළ පොත සැලසුම් කර ඇති බව සැලකිල්ලට ගන්න.

4. සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම යන භාෂා ක්ෂේත්‍ර හතර ම ශිෂ්‍යයන් විසින් ප්‍රගුණ කළ යුතු බැවින් පෙළ පොත කියවීම් ක්ෂේත්‍රය සඳහා පමණක් භාවිත කිරීම අපේක්ෂා නොකරන අතර එය සෙසු භාෂා ක්ෂේත්‍ර සමඟ ද සමෝධානය කර ගත යුතු වේ.

5. පෙළ පොතේ පාඩම් ඉදිරිපත් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කර ඇති මව්බස 04 ආධාරක හඬ පටය භාවිත කරන්න.

6. හතරවන ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති භාෂා නිපුණතා ඉටු කර ගැනීම සඳහා යෝජනා කර ඇති ඇතැම් ක්‍රියාකාරකම්වලට සමාන ක්‍රියාකාරකම් පෙළ පොතෙන් ද සොයා ගත හැකි ය. එසේ ම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතැම් ක්‍රියාකාරකම් සඳහා පෙළ පොත සහාය කර ගත හැකි ය. එවැනි අවස්ථා මොනවා දැයි පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශ හොඳින් අධ්‍යයනය කර හඳුනා ගන්න.

7.




පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පන්ති කාමරය තුළ සිදු වන ගුරු-සිසු අන්තර්ක්‍රියා සහිත ඉගෙනුම් අවස්ථා පමණක් සිසුන්ගේ භාෂා වර්ධනයට ප්‍රමාණවත් නොවේ. භාෂා වර්ධනය ඉලක්ක කර ගත් වැඩ සටහන් රාශියක් පාසල තුළ ක්‍රියාත්මක විය යුතු ය. එසේ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ. මේවා පාසල් හා පන්ති ප්‍රතිපත්ති වශයෙන් සැලසුම් කර ක්‍රියාවට නැංවීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

* උදෑසන රැස්වීම් හා පන්ති රැස්වීම්
    - කථන ක්‍රියාකාරකම්
    - සවන් දීම සඳහා ක්‍රියාකාරකම්
    - නිවේදන
    - ප්‍රවෘත්ති විකාශනය
    - දවසේ සිතුවිලි
    - නැරඹීම් අවස්ථා (විද්‍යුත් මාධ්‍යය)

* විවිධ ප්‍රසංග
    - සාමූහික හා කේවල ඉදිරිපත් කිරීම්
    - රංගන හා රූපණ
    - විනෝදාත්මක ඉදිරිපත් කිරීම්

* ප්‍රදර්ශන
    - නිර්මාණාත්මක ලේඛන (පොත්, සඟරා, ලිපි)
    - චිත්‍ර, කාටූන්
    - ඉගෙනුම් ආධාරක
    - තැනීම්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

* සිහිති පොළ
    - චරිතාරෝපිත කතා
    - භූමිකා රංගන
    - රංගන හා රූපණ

* ආගමික හා සංස්කෘතික වැඩසටහන්
    - භක්ති ගීත
    - කැරොල් ගීත
    - මව් ගුණ ගී, දේශාභිමානී ගී
    - නාට්‍ය
    - ජන ගී
    - විදි නාට්‍ය
    - අවුරුදු උත්සව

* ළමා සාහිත්‍ය මාසය
    - භාෂා දින සංවිධානය
    - අත් අකුරු තරග
    - කියවීමේ තරග
    - පොත් එළිදැක්වීම (කවි, ගීත, නාට්‍ය)
    - නාට්‍ය තරග
    - ජන ගී, ජන නැටුම්
    - නිවේදක තරග
    - සුබ පැතුම් පත්, ආරාධනා පත්, පෝස්ටර් සැකසීමේ තරග
    - ශ්‍රී ලාංකික සාහිත්‍යකරුවන් පිළිබඳ තොරතුරු රැස් කිරීමේ තරග

* බිත්ති පුවත්පත, නිර්මාණ පැදුර
    - නිර්මාණාත්මක ලේඛන
    - පද්‍ය නිර්මාණ/ගද්‍ය නිර්මාණ
    - චිත්‍ර කාටූන් චිත්‍ර
    - නිසඳැස් සංකල්පනා

* පාඨක සමාජ
    - පන්ති පුස්තකාල භාවිතය
    - පොත්පත්, සඟරා හුවමාරු කිරීම

    ඉහත දැක්වෙන පාසල් වැඩ සටහන්වල දී සිසුන්ගේ භාෂා කුසලතා වර්ධනය සඳහා මෙම ක්‍රියාකාරකම් හා වැඩසටහන් සංවිධානය කරන්න. මෙම වැඩසටහන් වාර්ෂික සැලැස්මට ද ඇතුළු කරන්න.

## සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

මෙම ශ්‍රේණියේ දී මව්බස විෂය තුළ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ සිසුන් සමඟ වැඩ කරමින් හා සිසුන්ගේ වැඩ නිරීක්ෂණය මඟින් සිදු කරන ඇගයීම් විධිවලට ය. සෙල්ලම් හා විනෝදජනක වැඩ ක්‍රියාකාරකම්, පෙළ පොත භාවිතය වැනි අවස්ථාවල දී නිරීක්ෂණ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ක්‍රම මඟින් හතරවන ශ්‍රේණියට අදාළ නිපුණතා වර්ධනය වීම සිදු වන්නේ දැයි නිරතුරු ව තොරතුරු රැස් කරමින් තක්සේරු කළ යුතු ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

* සිසු ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි වාර්තා
    - කණ්ඩායම් වැඩ ප්‍රගති සටහන්
    - කාර්ය සාධන ලිපි ගොනුව
    - බිත්ති පුවත් පතට ඉදිරිපත් කළ ලිපි එකතුව
    - විෂය තක්සේරු පත්‍රිකා
    - අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වාර්තා
    - සිසු කෙටි සටහන් පොත
    - විශේෂ අවශ්‍යතා ඇති (සෙමින්/වේගයෙන් ඉගෙනුම ලබන) සිසුන් සම්බන්ධ වාර්තා
    - කණ්ඩායම් වැඩ/ප්‍රගති සටහන් /ගෙදර වැඩ නිමවුම් එකතුව

ගෙදර වැඩ පැවරීම

✶ පන්ති කාමරය තුළ දී ඉගෙන ගන්නා වූ විෂය කරුණු තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා සිසුවාට දැරිය හැකි ප්‍රමාණයට ගෙදර වැඩ පවරන්න.

✶ ගෙදර වැඩවල දී කළ යුතු දේ හා වැඩ කරන ආකාරය පිළිබඳ ව සිසුන්ට වැටහෙන සේ පැහැදිලි උපදෙස් දෙන්න.

✶ පන්ති ක්‍රියාකාරකම් සඳහා නිවසින් ගෙන ආ යුතු දෑ පිළිබඳ ව කල්වේලා ඇති ව සිසුන් හා දෙමාපියන් දැනුවත් කරන්න.

✶ දෙමාපියන් දැනුවත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරේ අවධානය යොමු කරන්න.
    ✦ පවරන සීමිත ගෙදර වැඩ කොටස් සිසුන් විසින් ම කළ යුතු බව
    ✦ නිවස තුළ භාෂාමය වර්ධනයට තුඩු දෙන පරිසරයක් ගොඩ නැගිය යුතු බව
    ✦ කියවීමට අවශ්‍ය පොත් පුවත් පත් තෝරා ගැනීමට උදවු කළ යුතු බව
    ✦ ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් තෝරා ගැනීමට උදවු කළ යුතු බව

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 1.1 සවන් දීම

## නිපුණතාව

1.1.1 සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

## නිපුණතා මට්ටම

1.1.1.1 ජේදයකට සවන් දී ස්ථාන, පුද්ගල, සත්ත්ව, ද්‍රව්‍ය නාම වෙන් කර දක්වයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

## ක්‍රියාකාරකම

ස්ථාන, පුද්ගල, සත්ත්ව හා ද්‍රව්‍ය නාම සියල්ල ඇතුළත් සරල ජේදයක් තෝරා ගන්න. සිසුන්ට හොඳින් සවන් දීමට හැකි වන සේ එම ජේදය ගුරුවරයා විසින් කීප වරක් කියවන්න.

ජේදයේ අඩංගු නාම පද පහත දැක්වෙන වගු තුළ ලිවීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ :- රෑට උඟරන්, මුවන්, ගෝනුන් ආදීන්ගෙන් හේන රැක ගැනීමට ගමරාල දරන වෙහෙස සුළු පටු නොවේ. ගමරාල පැල තුළ සිට කෑගසයි. එහෙත් ඉන් වැඩක් වූයේ නැත. හේන පාළු වී බඩඉරිඟු, මුං, තල විනාශ විය නොසතුටට පත් ගමහාමිනේ නිතර ඇනුම් පද කීවා ය .

වගුව 01

නාම පද

| ස්ථාන නාම | පුද්ගල නාම | සත්ත්ව නාම | ද්‍රව්‍ය නාම |
|---|---|---|---|
| හේන | ගමරාල<br>ගම හාමිනේ | උඟරන්<br>මුවන්<br>ගොනුන් | බඩඉරිඟු<br>මුං<br>තල<br>කවුපි |

උදාහරණ :- බදුල්ල බලා යන දුම්රියෙන් බැස ගත් කසුන්, නිෂාම්, රාධා සහ ගුරුතුමිය වට පිට බලන්නට වූහ. කඳු අතරින් පටන් ගෙන පුළුන් රොදක් පාවෙන්නා සේ පහළට ගලා බසින දිය ඇල්ල එකවර ම නෙත ගැටිණි. පැළෑටි, පඳුරු ගස් හා ගල් අතරින් ගලා යන ජලය මත පීනා යන ගෙම්බන් කසුන්ට දැක ගත හැකි විය. මෙම චමත්කාර දර්ශනය බලා සිටි කසුන් ‘මෙය නම් හරි ම අලංකාර දසුනක්’යැයි පැවසී ය.

වගුව 02

නාම පද

| ස්ථාන නාම | පුද්ගල නාම | සත්ත්ව නාම | ද්‍රව්‍ය නාම |
|---|---|---|---|
| | | | |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.1.1.2 වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
නිවේදනයකට සවන් දී වැදගත් කරුණු ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
පහත සඳහන් උදාහරණ ලෙස දී ඇති එක් එක් අවස්ථාවට උචිත ශෛලියෙන් යුතු ව පටිගත කර ගන්න.
උදාහරණ 1 :-

| |
|---|
| කරුණාවෙන් සවන් දෙන්න. . . . . .<br>වවුනියාවේ සිට මාතර බලා යන රජරට රැජින දුම්රිය තව ස්වල්ප මොහොතකින් තුන්වෙනි වේදිකාවට පැමිණෙනවා ඇත. එම දුම්රිය නවත්වන්නේ කුරුණෑගල, පොල්ගහවෙල, මීරිගම, ගම්පහ, රාගම, මරදාන හා කොළඹ කොටුව.<br>කොළඹ කොටුවේ සිට මාතර දක්වා ඇති සෑම දුම්රිය ස්ථානයක ම නවත්වනවා ඇත. |

නිවේදනය ඇසුරෙන් පහත සඳහන් වැදගත් කරුණුවලට පිළිතුරු සැපයීමට සලස්වන්න. (වාචික ව සහ ලිඛිත ව)

1. දුම්රිය ආරම්භ කරන ස්ථානය .......
2. දුම්රියේ ගමනාන්තය ......
3. දුම්රිය පැමිණෙන වේදිකාව ......
4. දුම්රියේ නම ......
5. දුම්රිය නවත්වන ස්ථාන දෙකක් ....

මෙවැනි වෙනත් නිවේදන මේ සඳහා යොදා ගන්න.

ක්‍රියාකාරකම 2
ප්‍රවෘත්තියකට සවන් දී වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කිරීම.
පහත සඳහන් ප්‍රවෘත්තියට සවන් දීමට සලස්වන්න. ඒ අසුරෙන් වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කරවන්න. (වාචිකව හෝ ලිඛිතව)

| |
|---|
| ගාල්ල සංඝමිත්තා විදුහලේ 2007 වසරේ හයවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ජයනී සරලා කාරියවසම් සිසුවිය දීපා මෙතා නම් සම්මානනීය ඉන්දියානු චිත්‍රපට අධ්‍යක්ෂවරියගේ වෝටර් චිත්‍රපටයේ චුයියා චරිතයට පණ පොවා ලොව හොඳ ම ළමා නිළිය ලෙස 2007 වසරේ සම්මානය හිමි කර ගෙන ඇත.<br>ඇය මෙම චරිතය සඳහා තෝරා ගැනීමේ මූලික කටයුතු සිදු වූයේ හතරවන ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටිය දී ය. |

සිසුන්ට ගැළපෙන මෙවැනි වෙනත් ප්‍රවෘත්ති තෝරා ඉදිරිපත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## ක්‍රියාකාරකම 3

ගීතයකට සවන් දී වැදගත් කරුණු අවබෝධ කර ගැනීමට සලස්වන්න.

පහත සඳහන් ගීතයට සවන් දී එහි වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. (වාචික ව සහ ලිඛිත ව)

පුතුනේ මේ අහගන්න පුතුනේ
පුතුනේ මේ අහගන්න
මං පොඩි කාලේ හඳමාමා කිවු
කතාව මේ අහගන්න පුතුනේ
පුතුනේ මේ අහගන්න
පුංචි කුඩුවක කැළයේ
සැළලිහිණි ජෝඩුවක් උන්නා
ලස්සන සිංදු කියාලා
පොඩි පුතා නැලෙව්වා දෙන්නා
හිටි හැටියෙ ම දවසක් දා
මොර සූරන වැස්සක් වැස්සා
ඇළ දොළ ගංගා පිරිලා
වැහි වතුර ගල ගලා වැස්සා
මහ සැඩ සුළඟක් හමලා හෝගා
ගස් වැල් ඉදිරී ඇද වැටුණා
පුතුනේ මේ අහගන්න පුතුනේ
පුතුනේ මේ අහගන්න
අම්මයි අප්පයි දෙන්නා
හත් දෙයියනෙ දෙයියනෙ කියලා
පොඩි පුතා බදාගෙන ඉඹලා
මහ හයියෙන් විලාප දුන්නා
කොයි කාගෙත් දුක සැප බලනා
මේ මුළු තුන් ලෝකෙට ලොක්කා
පොඩි පුතා බදා ගෙන හඬනා
ඒ මවගේ දරු දුක දැක්කා
හිත උණුවීලා අනුකම්පාවෙන්
වැහි බිඳු අහසට ඇද ගත්තා
පායා හිරු පෙර වාගේ දිලුණා
වන මල් පිපිලා නැටුවා
ඉන් පසු අම්මයි අප්පයි වුට්ටයි
සතුටින් කල් ගෙව්වාලු සුව සේ
පුතුනේ මේ .....

(පදමාලාව - කරුණාරත්න අබේසේකර)

මෙවැනි වෙනත් ගීතද මේ සඳහා ඉදිරිපත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

### ක්‍රියාකාරකම 4

චරිතාපදාන කතා ඇසුරෙන් වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කිරීමට සලස්වන්න.
පහත සඳහන් චරිතාපදාන කතාවට සවන් දී ඒ ඇසුරින් වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න. (වාචික ව සහ ලිඛිත ව)

ශ්‍රී ලංකා නාමය ලොව පුරා රැව් පිළිරැව් දීමට සමත් වූ බුද්ධිමතුන් අතුරෙන් අග්‍රගණ්‍ය පඬි රුවනක් ලෙසින් මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා හඳුන්වා දිය හැකි ය.

1896 දෙසැම්බර් මස 26 වැනි දින ගාල්ලේ මැටරඹ නම් ග්‍රාමයේ උපන් පරණවිතාන මහතා ළා බාල අවධියේ සිට ම පාලි හා සංස්කෘත භාෂා උගත්තේ ය. ගාල්ලේ බොනවිස්තා විදුහලින් ඉංග්‍රීසි භාෂාව උගත්තේ ය. 1920 දී ඉංග්‍රීසි ගුරුවරයකු ලෙස පත් වූ පරණවිතාන මහතා 1935 දී ශිලා ලේඛන සහකාරවරයකු ලෙසින් සේවයට බැඳුණි. 1956 දී සීගිරිය කැටපත් පවුරට සීමා වී තිබූ කුරුටු ගී 685ක් පමණ වෙන් කොට ගෙන ඒවා පැහැදිලි කරමින් සිංහල ගැමි ලේඛකයාගේ නිර්මාණ ශක්තිය ලෝකයට එක්කර ලීමට සමත් විය.

පුරා වසර 33ක් තිස්සේ අව්වේ වේලෙමින් වැස්සේ තෙමෙමින් සෙල්ලිපි කිය වූ පරණවිතාන පඬිවරයා රජරට ප්‍රදේශය පුරා මිහිදන් ව තිබූ වටිනා වස්තු කැණීම් ආශ්‍රයෙන් මතු කර ගෙන ඒ පිළිබඳ තොරතුරු කියවා ඒවා සාමාන්‍ය ජනතාවට පැහැදිලි කර දීමට වටිනා පොත් පත් ද ලියා පළ කරමින් සිංහල සාහිත්‍යයට ද විශාල සේවයක් කළේ ය.

- සවන් දුන් චරිතාපදාන කතාව තුළින් ඉස්මතු කර ගත හැකි කරුණු මොනවා දැයි විමසන්න. (ලිඛිත ව සහ වාචික ව)
- මෙවැනි වෙනත් චරිතාපදාන කතාවලට සිසුන් යොමු කරවන්න.

### ක්‍රියාකාරකම 5

කවියකට සවන් දී වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
පහත සඳහන් කවියට සවන් දී ඒ ඇසුරෙන් වැදගත් කරුණු තෝරා ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න. (වාචික ව සහ ලිඛිත ව)

උදාහරණ 1 :-

ගොඩ මඩ දෙක ම සරුසාර ය පලබර ය
කටු රොද ගම්මාන තරමක පිටිසර ය
ඒ ගම මැදින් ගලනා ගඟ මනහර ය
කඩ මණ්ඩිය පිහිටියේ ගම කෙළවර ය

(සුදෝ සුදු - කේයස්)

උදාහරණ 2 :-

වහලේ සිදුරු අතරින් වැහි බිඳු බේරේ
ගොම මැටි නො ගෑ බිම පොඩි වළවල් හැරේ
කටු මැටි බිත්තියේ පොළවට බර තීරේ
මැටි ගැලැවිලා දිය කඳ යයි ගෙය පාරේ

(පිටිසර සිරියාව - කේයස්)

සිසුන්ට ගැළපෙන වෙනත් කවි හා පෙළ පොතේ කවි ද මේ සඳහා තෝරා ගන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.1.1.3 වචනවල තේරුම අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1

පුවත්පත්, සඟරා, පොත් පත්, ළමා නාට්‍ය, ගීත, කවි, විකට කතාවල රසවත් කොටස්වලට සවන් දීමට අවස්ථාව සලසා දෙන්න.
මේ සඳහා පහත දැක්වෙන ඡේදය චිත්ත රූප මැවෙන අයුරින් ඉදිරිපත් කරන්න. ඡේදය රස විඳීමෙන් පසු එහි ඇති වචන පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ඒවායේ අර්ථය පැහැදිලි කර දෙන්න.
උදාහරණ :-

මේ අතර කුඹුරු මඩ කිරීම නිසා ඒවායේ සිටින මාළු මත් වී උඩ පාවීමට පටන් ගනිති. කාවයියන්, ලුලන් වැනි ලොකු මාළුන් කුඹුරු මඩවන අය අල්ලා ගනිති. මාළුන් අල්ලා ගැනීමට පියඹා එන ලිහිණි රංචු ඉතා පහතින් හරකුන් උඩින් පියාසර කරන විට හරක් දක්කන්නෝ කෙවිටෙන් උනට පහරක් ගසති.
(කුඩා අපියි, අපේ ගමයි, යූ.පී.ඩී, කාරියවසම්)

උදාහරණ :-

දින ගණනක් එක දිගට ම වැසි ඇදහැලීම නිසා කුඹුරු යාය ජලයෙන් පිරී උතුරා යයි. බොහෝ දිනකට පසු ගෙදර එන සුනිමල්ට පාර දිගට ම හමු වූ අයට තොරතුරු කියමින් ඒමට සිදු වූ නිසා ඔහු ගෙට ගොඩ වූයේ අඳුරු වැටුණු පසුව ය. ගහෙන් වැටුණු පොල් ගෙඩිය අහුලා ගත් අම්මා මිදුලේ වූ පොල් ගොඩ අසලට යනු ඔහු දුටුවේ ය. හදියේ ම තමා අසලට ආ පුතා දුටු අම්මාගේ සිත සතුටින් උතුරා ගියේ ය. ලිප උඩ තැබූ ඇතිලියක යමක් උතුරා බුබුළු දමමින් තිබිණ. අසල වූ බංකුවේ හිඳගත් සුනිමල්ට අම්මා තෙල් හිඳ අවසන් ව ඇති බව පෙණින. අම්මාගේ දුබල මුහුණට හිනාවක් නැගෙනු ඔහු දුටුවේ ය. කුප්පි ලාම්පුවේ වූ දුබල එළියෙන් වුව ද අම්මාගේ දුබල මුහුණ එළිය වැටී ඇති බව සුනිමල් දුටුවේ ය.

උදාහරණ :-

පෙර දිග මුතු ඇටය ලෙස ලොව පසිඳු වුණ
දම් දිවයිනකි මෙය පෙර සිට පැවැත එන
එය රැක ගැනුම වගකීමක් බාර වුණ
යුග යුතුකමට දැන් අත් වැල් බඳිනු මැන
(ශ්‍රී ලංකාවේ ලෝක උරුම - ඩේවිඩ් අතුකෝරළ)

මෙවැනි වෙනත් ගද්‍ය, පද්‍ය කොටස් තෝරා ගෙන වචනවල තේරුම් රස විඳීමට සිසුන් යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.1.1.4 සිදුවීම් කීපයක අනුපිළිවෙළ නිවැරදි ව දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
පහත සඳහන් සිදුවීම්වල අනුපිළිවෙළ හඳුනා ගන්න. දී ඇති එක් එක් වගන්තිය පත්‍රිකාවල වෙන වෙන ම ලියා ගන්න.
ඒවායේ අනුපිළිවෙළ මාරු කරමින් සිසුන්ට සවන් දීමට සලස්වන්න.
නිවැරදි අනුපිළිවෙළට ගළපා ප්‍රකාශ කිරීමට හා ලිවීමට උපදෙස් දෙන්න. (සිද්ධිවල ප්‍රධාන අදහස් අනුපිළිවෙළින් ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් වේ)
උදාහරණ :-
අහස වැහි වලාකුළින් බර විය.
තද සුළඟින් ගස්වැල් ඇඹරෙන්නට විය.
හෝ .. හෝ.. ශබ්දය ඈතින් ඇසුණි.
මිදුල බොර වතුරෙන් පිරී ගියේ ය.

උදාහරණ :-
පහත දැක්වෙනුයේ මුතු කැට ළමා සමාජයේ වර්ෂ අවසාන ත්‍යාග ප්‍රදානෝත්සවයේ න්‍යාය පත්‍රය යි.
* ස්තුති කතාව
* පොල් තෙල් පහන දැල්වීම
* ත්‍යාග ප්‍රදානය කිරීම
* ආරාධිත අමුත්තන් පිළිගැනීම හා කැඳවාගෙන ඒම
* පිළිගැනීමේ කතාව
* ප්‍රධාන ආරාධිතයාගේ කතාව

(නිවැරදි අදහස ඉස්මතු වන සේ අනුපිළිවෙළ වෙනස් නොවන පරිදි වගන්ති වැඩි ගණනකින් ප්‍රකාශ කළ ද නිවැරදි සේ සලකන්න.)

උදාහරණ :-
පහත සඳහන් කවි පෙළ ඇසුරෙන් සිදුවීම් කීපයක් අනුපිළිවෙළට පෙළ ගැස්වීමට සිසුන් යොමු කරන්න.
මෙහෙමයි වී බත් වන්නේ

1. මඩකුඹුරේ සිට එන්නේ
ගෝනි ගොඩක සැඟවෙන්නේ
කලක් ම එහි දුම් බොන්නේ
බිම්තැන්නට බැස ගන්නේ

2. තද අව්වේ සැතපෙන්නේ
මෝල් ගහෙන් බැට කන්නේ
පිට හම ඉන් ගැළවෙන්නේ
වතුරෙගමදි නා ගන්නේ

3. සැළිය ගොඩටයි යන්නේ
ලිග්ගල උඩමයි ඉන්නේ
එතැනදි ගිනි තැප ගන්නේ
කෝපෙන් ඩහදිය ලන්නේ

4. මෙහෙමයි වී බත් වන්නේ
කැකුළු සුවඳ පතුරන්නේ
කල් සලකාලයි කන්නේ
පිළුණු වුණොත් ලෙඩ දෙන්නේ

5. කිරෙන් පිසූ කල කිරිබත්
කහ, කිරි යෙදූ කල කහබත්
දියෙන් තැනූ කල දියබත්
පිළුණු වුණොත් නැත යහපත්
(ආනන්ද රාජකරුණා)

මෙවැනි වෙනත් ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කරවන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.1.2 සවන් දී වින්දනය ලබයි.

නිපුණතා මට්ටම
1.1.2.1 කවි සහ ගීවලට සවන් දෙමින් තාල තබයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

පහත සඳහන් කවි සහ ගී සිසුන්ට සවන් දීමට සලස්වන්න. මේ සඳහා කැසට් පට භාවිත කරන්න. එම කවි සහ ගීවලට සුදුසු තාල තැබීමට සිසුන් යොමු කරවන්න.
කවි සහ ගී තාල තබමින් ගායනා කිරීමට අවස්ථාව සලසා දෙන්න.

උදාහරණ :-

පටුවන් නළලත අඩ සඳ වැන්නේ
දුටුවන්ගේ සිත් සතුට වඩන්නේ
රන්වන් කළ ගෙඩි දෑතට ගන්නේ
නැටුමෙන් කළ ගෙඩි සබ පින වන්නේ
(කළ ගෙඩි නැටුම)

උදාහරණ :-

තත් තත් තනත් තනෙන ... //
තත් තත් තනත් තම් දෙ නා .. නා.. //
තන තනෙන තන තනෙන ...
තතන තම්දෙන තා නෙන ... //
තානත් තනත් තම්දෙ නා නා //

සත් වෙත් මහත් අදර
ලත් යුත් සිදත් කුමරු
ගත් සිත් තොසත් පැවිදි අංගා
අණ කරන ඡන්න යෙන
කන්ථකය අසු ගෙනෙන
ගෙන යෙදුන අසුගෙ පිට නැංගා
(තුරගා වන්නම)

* කවි තෝරා ගැනීමේ දී සතුන්, ගස්වැල්, රථ වාහන, ස්වභාව ධර්මය, ළමා සිතුවිලි, පවුලේ අය, දේශානුරාගය ආදී ළමා ලෝකයට උචිත තේමා යටතේ ලියවුණු කවි තෝරා ගන්න.
* මේ සඳහා සිංහල හතර පෙළ පොතේ එන පද්‍ය පන්ති යොදා ගත හැකි ය.
* මීට අමතර ව එච්. ඩී. ජයතිලක, ආනන්ද රාජකරුණා, චන්ද්‍රරත්න මානවසිංහ, එස්. මහින්ද හිමි, මුනිදාස කුමාරතුංග, ඩබ්ලිව්. ඒ. අබේසිංහ වැනි අය සරල බසින් ළමයින් සඳහා ලියා ඇති කවි ගී තෝරා ගන්න.

\- අපේ පැරැන්නන් වැඩ කරන විට ගැයූ ජන කවි අසා රස විඳීමට අවස්ථාව ලබා දෙන්න.
  මේ සඳහා නෙළුම් කවි, කුරහන් කවි, පැල් කවි, පතල් කවි, කරත්ත කවි, පාරු කවි, ජන ක්‍රීඩා ආදිය යොදා ගත හැකි ය.
  අපේ පැරැන්නන් එදිනෙදා වැඩ කරන විට වෙහෙස නිවා ගැනීමට සතුට ලබා ගැනීමට මෙවැනි ගී ගායනා කළ බව පැහැදිලි කර දෙන්න.
  මේ සඳහා රංගනය සහිත ව ගායනයේ යෙදිය හැකි ජන කවි තෝරා ගෙන රංගනයේ යෙදෙමින් ගායනා කිරීමට හා රස විඳීමට අවස්ථාව සලසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ :-

අම්බිලි මාමේ

අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ
පුළුන් වලා යටින් ඉඳන් එබිල බලන්නේ
වටින් පිටින් ඇදෙන්නේ
මුහුණ ඔබේ සිඹින්නේ
සේද යොදා සැදූ වලා - සළු ද කියන්නේ
පාත බලන්නේ - මුව විහිදන්නේ
රිදී සිනා පපා - මෙලෝ එළිය කරන්නේ

සිසිල් සුළං හමන්නේ
කුමුදු සමන් පිපෙන්නේ
අඳුරු කැලා - දසත බලා පැනල දුවන්නේ
තුරු නැලැවෙන්නේ - සුවඳ හමන්නේ
කුසුම් කැලා - රේණු සලා - බිම සරසන්නේ

සියල් සතුන් නිදන්නේ
සුරන් මෙලෝ වඩින්නේ
ගුවන් කුසේ මැණික් රැසේ - ඔබ සරසන්නේ
සිරස සදන්නේ - රැස් පළඳන්නේ
සුපුන් සඳේ - ඔබ නිබඳේ - ලෝ පුබුදන්නේ

(පද රචනය - ආර්. එන්. එච්. පෙරේරා)

ගී සින්දුවලට සවන් දී රස විඳීමට යොමු කිරීමට සුදුසු ගීත තෝරා ගැනීමේ දී පහත සඳහන් ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වන්න.

- අර්ථය පහසුවෙන් අවබෝධ වන පදමාලාවක් තිබීම.
- විචිත්‍ර සංකල්පනා සරල ලෙස නිර්මාණය කර තිබීම.
- කනට මිහිරි ශබ්දාලංකාර යොදා තිබීම.
- තාල තැබිය හැකි වීම.

උදාහරණ :- ගී

අක්කෙ අක්කෙ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ ...

(පදමාලාව - ආනන්ද සමරකෝන්)

සකිය සගව්වට රෝදය කැරකෙනවා
සසඳ සසඳ අපි මහ පාරේ යනවා

(පදමාලාව - රෝහණ බැද්දගේ)

මේ අවුරුදු කාලේ - සිනහ වෙයන් රාලේ
තෙල් ඉහිරුණු කැවුම් ගෙඩිය වාගේ

(පදමාලාව - ලයනල් රංවල )



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

රෑ තරු බබළනවා - මල් පිපිලා වාගේ
එළියෙන් නැහැවෙනවා - මල් වැහැලා වාගේ
(පද මාලාව - පූජ්‍ය මර්සලීනු ජයකොඩි පියතුමා)

හෙළ ජාතික අභිමානේ - වැඩි විරුවන්සේ පොරණේ
හෙළ මව්බිම සව් සිරියෙන් - සරසව් පිබිදෙව් පිබිදෙව්
(පදමාලාව - කරුණාරත්න අබේසේකර)

මොනවද අම්මේ අකුරු ජාතියක් මල් පෙතිවල කවුදෝ ලියලා
කවුරු ද අම්මේ මේවා ලියන්නේ පාට පාට ඉරි හැඩ ගහලා
(පද මාලාව - ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ)

මුහුදු පතුල යට ඉඳලා - මුතු ඇටයක නිදිකරවා
පෙණ කැටියක පා කරලා - මගෙ දෝතට පුතු ආවා
(පදමාලාව - මහගම සේකර)

මේ සඳහා පහත සඳහන් කැසට් පට යොදා ගන්න.

- මුතු පබළු කැසට් පටය - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
- සූරතල් නංගී කැසට් පටය - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
- අහමු ගයමු රස විඳිමු - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
- ළමා ගී 1 - 2 - ජාතික අධ්‍යාපන ආයතනය
- වින්දන - ජාතික අධ්‍යාපන ආයතනය
- මගෙ පොඩි යාළු කැසට් පෙළ
- සූරිය අරණ කැසට් පටය
- හඬ - ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම

1.1.2.2 කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

- කතාව ඉදිරිපත් කරන විට රසවත් අවස්ථා, සිද්ධි, යෙදුම් ආදිය වඩාත් විස්තරාත්මක ව ඉදිරිපත් කරන්න.
- කතාවේ ඇති සංවාද කොටස් ආකෘතිය සහිත ව සජීවී ස්වරූපයෙන් ඉදිරිපත් කරන්න.
- මේ සඳහා සිනහව, සතුට, කරුණාව, ඉවසීම, නුවණැති බව යන ගුණාංග මතු වන අන්දමේ කතා තෝරා ගන්න.

  උදාහරණ :- සිනහව - අන්දරේගේ කතා
  කරුණාව - බුද්ධදාස රජතුමා නයාට ප්‍රතිකාර කිරීම පිළිබඳ කතා පුවත
  ඉවසීම - ක්ෂාන්තිවාදී ජාතිකය
  නුවණැති බව - මහෞෂධ පඬිතුමාගේ කතා

කතන්දරවල චරිත, සිද්ධි, සිසුන්ට අනුකරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
කතන්දරවලට සවන් දී ඒ පිළිබඳ ප්‍රශ්න කරමින් සාකච්ඡා කිරීමට යොමු කරන්න.
කතන්දරයකට සවන් දී අවබෝධ කර ගත්තා දැයි දැන ගැනීමට සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
සිසු අදහස් ප්‍රකාශ කිරීම සඳහා සරල ප්‍රශ්න කීපයක් අසන්න.

නිපුණතා මට්ටම

1.1.2.3 ළමා නාට්‍යවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

නාට්‍යමය සංවාද කොටස් අසා රස විඳීමට යොමු කරන්න. හතරවන ශ්‍රේණියේ පෙළ පොතේ එන ළමා නාට්‍ය කොටස් ද වින්දනය සඳහා සවන් දීමට යොමු කරන්න. මේ සඳහා අලංකාර යෙදුම් සහිත ශබ්ද රසය ඉස්මතු වන නාට්‍යමය සංවාද කොටස් රස විඳීමට යොමු කරන්න. සවන් දුන් දේ ගැන සාකච්ඡා කරමින් අදහස් දක්වමින් රස විඳීමටත් රඟ දැක්වීමටත් යොමු කරන්න.

උදාහරණ :- අඹ යාළුවෝ, නෙළුම් කුමාරි, කඳා වළලු යන ළමා නාට්‍ය යොදා ගන්න. මීට අමතර ව ශ්‍රී ලංකා ගුවන් විදුලිය, විදුල ළමා ගුවන් විදුලිය, ජාතික හා ස්වාධීන රූපවාහිනී සේවාවන් මගින් විකාශනය කරන උචිත ළමා නාට්‍යවලට සවන් දීමට හා නැරඹීමට සිසුන් යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව

1.1.3 ඉගෙනීම සඳහා සවන් දෙයි.

නිපුණතා මට්ටම

1.1.3.1 ගුරුවරයාට සවන් දී ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

පහත සඳහන් සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික හා අධ්‍යාපනික වශයෙන් වැදගත් දේශීය හා ජාත්‍යන්තර දින හා සති පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. ඔබ ද මේ පිළිබඳ ව තොරතුරු රැස් කර ගෙන අදාළ දිනයේ සිසු මට්ටමට ගැළපෙන සේ කරුණු ඉදිරිපත් කරමින් සිසුන් සමඟ සංවාදයක යෙදෙන්න. මෙය අවස්ථා කීපයක දී ක්‍රියාත්මක කරන්න.

පහත ක්‍රියාකාරකම්වලට අමතර ව වැදගත් යැයි සිතන වෙනත් තේමා සිද්ධි ද මතු කර ගන්න.

| | | | |
|---|---|---|---|
| ✶ ලෝක පරිසර දිනය | - ජූනි 05 | ✶ ලෝක මත්ද්‍රව්‍ය දිනය | - ජූනි 26 |
| ✶ ලෝක ජල දිනය | - මාර්තු 22 | ✶ සාක්ෂරතා දිනය | - සැප්තැම්බර් 08 |
| ✶ සුදු සැරයටි දිනය | - ඔක්තෝබර් 15 | ✶ ජාතික වීර දිනය | - මැයි 22 |
| ✶ ලෝක වැඩිහිටි දිනය | - ඔක්තෝබර් 01 | ✶ ලෝක ළමා දිනය | - ඔක්තෝබර් 01 |

නිපුණතා මට්ටම

1.1.3.2 විශේෂ ආරාධිතයන්ට සවන් දී ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

පාසලට සමීප ප්‍රදේශයේ ජීවත් වන විශේෂ පුද්ගලයන් කීප දෙනකු පන්ති කාමරයට ගෙන්වා ඔවුන්ගේ ජීවන අත්දැකීම් හෝ වෘත්තීය අත්දැකීම්වලට සවන් දීමට හා ඒ සම්බන්ධ ව සංවාදයකට සිසුන් යොමු කරන්න.

ආදර්ශවත් පුද්ගලයන් ගෙන්වා ගැනීම සඳහා විශේෂ අවධානය යොමු කරන්න.

- ග්‍රාමසේවා නිලධාරී
- ගමේ හොඳ ම ගොවි මහතා
- ගමේ ආදර්ශවත් වැඩිහිටියෙක්
- දක්ෂ ක්‍රීඩකයෙක්/ක්‍රීඩිකාවක්
- නීතිගරුක රියැදුරෙක්
- වඩු කාර්මිකයෙක්
- වැඩිහිටි නිවාස පාලකයෙක්
- ළමා නිවාස පාලකයෙක්
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.1.3.3 විද්‍යුත් මාධ්‍ය අධ්‍යාපනික වැඩසටහන්වලට සවන් දී කරුණු ඉදිරිපත් කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
විද්‍යුත් මාධ්‍ය අධ්‍යාපනික වැඩසටහන් හා ප්‍රවෘත්ති කීපයක් පටිගත කර ගන්න.
මෙම වැඩසටහන් සිසුන්ට සවන් දීමට සලස්වන්න.
සවන් දුන් දේ පිළිබඳ සාකච්ඡා කරන්න. සවන් දුන් දේ ඇසුරෙන් සරල ප්‍රශ්න කීපයකට පිළිතුරු වාචික හා ලිඛිත ව ලබා ගන්න.
මෙම වැඩසටහනේ වැදගත්කම සම්බන්ධ ව පන්ති කාමරවල දී දෙමාපියන් දැනුවත් කරන්න. මෙවැනි ක්‍රියාකාරකම් නිරන්තර හා ස්ථාවර වැඩසටහන් ලෙස සැලසුම් කර ගන්න.
උදාහරණ :-

- ✶ පරිසර වැඩසටහන්
- ✶ විද්‍යාත්මක සොයා ගැනීම්
- ✶ කාලීන සිදුවීම්
- ✶ චරිතාපදාන
- ✶ ක්‍රීඩා
- ✶ ජාතික හා ජාත්‍යන්තර දින
- ✶ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
- ✶ ඓතිහාසික සිද්ධි

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.1.4 සවන් දී චින්තනයට යොමු වෙයි.

නිපුණතා මට්ටම
1.1.4.1 තේරවිලිවලට සවන් දී විසඳයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

තේරවිලි සොයා ගෙන පන්තියට පැමිණෙන ලෙස කලින් උපදෙස් දෙන්න.
සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා තේරවිලි වටයක් (තරගයක්) පවත්වන්න.
සොයා ගත් තේරවිලි ඇතුළත් පොත් පිංචක් සකස් කරන ලෙස උපදෙස් දෙන්න.
උදාහරණ :-

✡ මූණේ තිබෙන රට (සිරියාව)
මල්ලේ තිබෙන රට (බුරුමය)

✡ කැවොත් පලතුරක් - කැපුවොත් මරණයක් (බෙලි)

✡ කැලේ රජා කවුද යාළු - (කැලේ රජා සිංහයාලු)
ගොඩේ ගොයා කවුද යාළු - ( ගොඩේ ගොයා තලගොයාලු)

✡ බුදු කියන්නේ මුනිඳුටයි
කුස්සිය නම් පැලකටයි
එක අතකට මුනි පැලයි
අනෙක් අතට ........ (පැණිමුලයි)

තේරවිලි කවිය
අන්න බලාපන් අත්තක ඉඳ ලෝලු
පපුව කඩා අහනක් ඉඳ මඳ කාලු
කකා ගිය ලෙල්ල රසකර උයාලු
අද බැරිනම් හෙට තෝරා එව යාලු
(ගොරකා)

පිළිතුරු කවිය
අතු ඉතිවල ගෙඩි ගණ හැර තියෙනවද
ගෙඩිය වගේ ඇහිලි හුහක් තියෙනවද
මාළු උයන කොට ඒවා දමනවද
මාමේ නුඹ කීවේ ගොරකා නොවෙද

තේරවිලි කවිය
ගසට නමකි ගස මැරුණම වෙන නමකි
ගෙඩියට නමකි ගෙඩියේ සුඹුලට නමකි
මදයට නමකි මද කන කොට වෙන නමකි
මෙතුන් පදේ තෝරාලා එවන් සකි

පිළිතුරු කවිය
ගසට ගොයම් වෙයි මල විට පිදුරු වෙතී
සුඹුලට දහයියා ඇටයට වී කියතී
මදයට හාල් කියමින් එය බතට කතී
මෙතුන් පදේ තේරුම මේ ලෙසට වෙතී

තේරවිලි කවිය
ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
ටං ටං ගාන්නා තෝරා එවාපන්
මග වැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

පිළිතුරු කවිය
ටිං ටිං ගාන්නා ලේනා නොවේදෝ
ටං ටං ගාන්නා ගෝනා නොවේදෝ
මග වැලි පිසින්නා කුකුළා නොවේදෝ
දෙගම්බඩ රජා කිඹුලා නොවේදෝ

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තේරවිලි කවිය

ළපටි කාලෙ එක නමකි
පැසුණු විටදි තව නමකි
ඉදුණු විටදි වෙන නමකි
තෝරාලා බලන් සකි

පිළිතුරු කවිය

ළපටි කාලෙ පොළොස් කියයි
පැසුණු විටදි කොස් නම වෙයි
ඉදුණු විටදි වරකා වෙයි
යාළුවේ තේරුවේ මමයි

නිපුණතා මට්ටම
1.1.4.2 ගැටලුවලට සවන් දී විසඳයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
විසඳීමට හැකි ගැටලුවක් සිසුන්ට සවන් දීමට සලස්වන්න. සිසුන් සමඟ සාකච්ඡා කරන්න. වාචික හා ලිඛිත පිළිතුරු ලබා ගන්න. පිළිතුරු ලබා ගැනීමට නිශ්චිත කාලයක් ලබා දෙන්න.
උදාහරණ:-

ගමයාට දැන් බඩගින්න ඉවසුම් නැත. හේ වටපිට බැලුවේ ය. කෑමට යමක් සෙව්වේ ය. කිසිවක් නැත. හාල් ටිකක් සෝදා ලිප තැබුවේ ය. වහ වහා ගිනි දැල් වූ නමුත් ඔහුගේ ඉක්මන තරමට එය ද ඇවිලුණේ නැත. හේ ලිපට පිඹියි. දර කඩා දමයි. කොතෙක් පිම්බත් ගින්න ගමයාට කළ අනුකම්පාවක් නැත. ලිප නිවුණි. (කුමාරෝදය)

✶ ඔබ ගමයා නම් මෙබඳු අවස්ථාවක කුමක් කරන්නේ ද?

උදාහරණ :-

දහඩිය පෙරා ගෙන වෙහෙස මහන්සි වී දවස තිස්සේ කැපූ ඉනි ටික දොළ පාරේ පා කර හැරි බැව් දැන ගත් ගමරාලගේ කෝපය නිම්හිම් නැති විය.

"මූ වාගේ එකෙකුගෙන් මට වැඩක් නැහැ" යි සිතූ ගමරාල කොලුවා අල්වා දර කොටයක බැඳ දොළේ පා කර හැරියේ ය.

✶ දොළේ පා කර හැරි දරුවා ඔබ නම් කුමක් කරන්නේ ද?

නිපුණතා මට්ටම
1.1.4.3 කතන්දර හා සිදුවීම්වලට සවන් දී පෙර කියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
කතන්දර හා සිදුවීම්වලට සවන් දීමට සිසුන් යොමු කරන්න.
එම කතා පුරෝකථනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
වාචික ලිඛිත පිළිතුරු ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- පහත සඳහන් සිදුවීම් ඉදිරිපත් කර ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම මඟින් සිසුන් තුළ චින්තනය පුබුදුවාලන්න.
- නාගරීකරණය හා කාර්මීකරණය නිසා ඇති වන කසළ ගොඩ ගැසීම. මං මාවත් උචිත පරිදි සකස් නොවීම වැනි හේතු නිසා ඇති වී තිබෙන ගැටලු ඉදිරිපත් කර, ඒ ගැන සිතා අනාගතයේ සිදු විය හැකි දේවල් පිළිබඳ ව පෙර කීම සඳහා සිසුන් යොමු කරවන්න.

උදාහරණ :- එක් ගමක ජනගහනය වැඩි වී ඇත. බොහෝ දෙනා ඈත රැකියාවලට යති. රථ වාහන ප්‍රමාණය ද අධික ය. මෙහි මහා මාර්ගය හරහා දුම්රිය මාර්ගය වැටී ඇත. ඒත් රේල් ගේට්ටුවක් නැත. මේ ගමේ මිනිසුන්ට අනාගතයේ ඇති විය හැකි ප්‍රශ්න මොනවා ද?

උදාහරණ :- පටු පාරක එක් තැනක විශාල කුණු ගොඩකි. වාහනවලින් යන අය ද මෙතනට ම කුණු විසි කර යති. ඒ අසලින්, ගඟ කරා ගලා යන ඇළකි. කුඹුරුවලට වතුර යන්නේ ද ඒ ඇළෙනි. අනාගතයේ මේ ගමේ මිනිසුන්ට සිදු විය හැකි කරදර මොනවා ද?

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 1.2 කතා කිරීම

නිපුණතාව

1.2.1 කතා කිරීම මගින් සුහදත්වය වර්ධනය කර ගනියි.

නිපුණතා මට්ටම

1.2.1.1 සුහද ව කතා බහේ යෙදෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

සුහද කතා බහේ යෙදීම සඳහා විනෝදජනක වැඩ හා ක්‍රියාකාරකම් යොදා ගන්න.

උදාහරණ :-

1. සෙල්ලම් දුරකථනයෙන් කතා කිරීම.
   - ★ සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
   - ★ දෙදෙනකුට එක බැගින් සෙල්ලම් දුරකථන සපයා ගන්න.
   - ★ එළිමහනට කැඳවා ගෙන යන්න.
   - ★ සිසුන්ට දුරකථනයෙන් සුහද කතා බහේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
   - ★ සියලු සිසුන් මෙම ක්‍රියාකාරකමට යොමු කරන්න.

උදාහරණ :-

2. යුගළ චිත්‍රයක් ඇඳීම
   - ★ සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
   - ★ පෑන් දෙකක් සහ චිත්‍රයක් ඇඳීමට සුදුසු කඩදාසියක් සපයන්න.
   - ★ දෙදෙනාට ම සුහද ව කතා බහේ යෙදෙමින් එක ම චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න.
   - ★ අඳින ලද චිත්‍රය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට දෙදෙනාට ම අවස්ථාව ලබා දෙන්න.
   - ★ පන්තියේ සියලු ම සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
   - ★ එම චිත්‍රය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සෙසු සිසුන්ට ද අවස්ථාව සලසා දෙන්න.

නිපුණතා මට්ටම

1.2.1.2 කතන්දර කියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

සිසුන් දන්නා කතන්දර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. කතන්දරය ඉදිරිපත් කිරීමේ දී හඬ පාලනය කරමින් අංග චලනයෙන් යුතු ව විවිධ අවස්ථා අනුකරණය කරමින් ඉදිරිපත් කිරීමට සිසුන් මෙහෙය වන්න. කතන්දර ඉදිරිපත් කිරීමේ දී වෙස් මුහුණු හා රූකඩ (ඇඟිලි/හිල්/දඬු/උර/සෙවනැලි/ගොටු/අත් ආදී රූකඩ වර්ග භාවිතයට ගන්න.

දිනපතා මව්බස විෂයය උගන්වන වේලාවේ දී එක් සිසුවකුට කතන්දරයක් බැගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.2.1.3 තේරවිලි කියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
තමාට සමීප වෙනත් වැඩිහිටියකුගෙන් තේරවිලි අසා ගැනීමටත් තේරවිලි එකතුවක් සකස් කිරීමටත් සිසුන් යොමු කරන්න.
සිසුන් කණ්ඩායම් කර තේරවිලි වටයක් පවත්වන්න. තේරවිලි සොයා ගැනීම සඳහා සිසුන්ට කලින් දැනුම් දෙන්න.
සිසුන්ට ද තේරවිලි නිර්මාණය කර ඉදිරිපත් කිරීමේ අවස්ථා සංවිධානය කරන්න.

නිපුණතා මට්ටම
1.2.1.4 කවි, ගී ගායනය කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සිසුන් හතර දෙනා බැගින් කණ්ඩායම් කරන්න.
පද හතරක කවියක්/ගීතයක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
නිර්මාණය කළ කවි/ගී තාලානුකූල ව ගායනයට අවස්ථාව ලබා දෙන්න.
මේ ආකාරයට සියලු කණ්ඩායම්වල කවි/ගී ගායනයට අවස්ථාව ලබා දෙන්න.
නිර්මාණය කරන ලද කවි/ගී එකතුවක් තබා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
පෙළ පොතේ සඳහන් කවි/ගී මේ සඳහා උපයෝගි කර ගන්න.
උදාහරණ :-
පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
එළිමහනට කැඳවා ගෙන යන්න.
කුඩා වේදිකාවක් සකසා ගන්න.
සිසුන්ට ගැළපෙන මාතෘකාවක් ලබා දෙන්න.
එක් කණ්ඩායමකට සාමූහික ව කවි නිර්මාණය කළ හැකි බව පෙන්වා දෙන්න.
කණ්ඩායම් විසින් නිර්මාණය කරන ලද කවි සාමූහික ව හෝ තනි තනි ව හෝ ඉදිරිපත් කළ හැකි බව පෙන්වා දෙන්න.
F M මයික් එකක් භාවිත කරන්න.
කවි පටිගත කර සිසුන්ට නැවත අසන්නට සලස්වන්න.

ඉහත වේදිකා අවස්ථාව ම පහත සඳහන් ආකාරයට ගීතයෙන් ගීතය වැඩසටහන සඳහා ද යොදා ගන්න. ගීතයක කොටසක් ගායනා කිරීමට සිසුවකුට අවස්ථාව දෙන්න. සංඥාවක් ලබා දී ගීතය නතර කෙරෙන අවසාන අකුරෙන් පටන් ගන්නා ගීතයක් ගායනා කිරීමට උපදෙස් දෙන්න.
මේ සඳහා සිසු මට්ටමට ගැළපෙන සරල නීති රීති කීපයක් ද ඉදිරිපත් කරන්න.

මෙම ක්‍රියාකාරකමේ දී සිසුන් ශ්‍රවණය කර ඇති ගීත පිළිබඳ ඔබට ඉඟියක් ලැබෙනු ඇත. ඒ අනුව නොගැළපෙන ගීත රස විඳීමෙන් මුදවා ළමා ලොවට උචිත ගීත රස විඳීමට සිසුන්ට වැඩිපුර අවස්ථා උදා කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.2.1.5 අත්දැකීම් පවසයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
එදිනෙදා ජීවිතයේ දී සිසුන් පෞද්ගලික ව අත්විද ඇති හෝ වැඩිහිටියන්ගෙන් අසා දැන ගත් සිද්ධීන් පිළිබඳ ව හෝ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.
 * ජන විශ්වාස හා ඇදහිලි සම්බන්ධ සිද්ධි
 * ස්වාභාවික විපත් හා ආපදා පිළිබඳ සිද්ධි
 * සංස්කෘතික හා ආගමික සිද්ධි
 * පරිසරයේ සතුන් ආශ්‍රිත සිද්ධි
 * වගාවන් ආශ්‍රිත සිද්ධි
 * යාන වාහන හා ගමන් බිමන් ආශ්‍රිත සිද්ධි

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.2.2 නිසි උච්චාරණය සහිත ව කතා කරයි.

නිපුණතා මට්ටම
1.2.2.1 තාලානුකූල ව කවි, ගී ගායනය කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්
තාලානුකූල ව කවි ගී ගායනා කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න.
 * තාලානුකූල ව ගායනා කළ හැකි කවි සහ ගීත තෝරා ගැනීම
 * චිත්ත රූප මැවිය හැකි වීම
 * අපූර්ව භාෂා යෙදුම් තිබීම
 * රස විඳීමට හැකි වීම

හතරවන ශ්‍රේණියේ සිසුන්ට යෝග්‍ය තාලානුකූල ව ගායනා කළ හැකි කවි සහ ගීත තෝරා ගෙන කණ්ඩායම් ලෙස හෝ තනිව හෝ ගායනා කිරීමට යොමු කරවීම අවශ්‍ය වේ.
කවි සහ ගීත සිසුන්ට හුරු වූ පසු රංගනය සහිත ව ගායනයට අවස්ථා ඇති කරන්න.
උදාහරණ :-
1. ජනකවි
 * දරු නැළවිලි කවි
 * මේවර කවි
 * කරත්ත කවි
 * පාරු කවි
 * පතල් කවි
 * බඹර කවි
 * නෙළුම් කවි
 * ඔළිඳ කවි
 * ඔන්චිලි වාරම්
 * නෙතඟු කවි ආදී ජනකවි තාලානුකූල ව සිසුන්ට ඉදිරිපත් කරන්න.

2. ගීත

✡ ආදරේ ඇයි පොඩි හඳ මාමේ
නුඹට මෙතරම් දරුවෝ ....
(පදමාලාව - ආනන්ද සරත් විමලවීර)

✡ ඕලු පිපිලා විල ලෙළ දෙනවා
සුදට සුදේ නංගෝ ......
(පදමාලාව - සුනිල් ශාන්ත)

✡ දියා ගොඩ සැම තැන කිරි ඉතිරේ
ගස්වැල් කිරි මුහුදේ කිමිදේ ....
(පදමාලාව - සුනිල් ශාන්ත)

✡ තැන තැන රවුමට ඉඳ ගෙන
ඉඳහිට එබිකම් කර කර ...
(පදමාලාව - අමරසේන කංකානම්ගේ)

✡ රන් ටිකිරි සිනා මුව මුව පාලා
ළං වී අත් අල්ලා ගෙන ඇස් දැල් වූවා
(පදමාලාව - ඔගස්ටස් විනයාගරත්නම්)

✡ මිදුලේ වැලි මාලිගාවේ
සක්විති පදවිය ලබන්න ....
(පදමාලාව - කුමාරදාස සපුතන්ත්‍රී)

✡ අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ
පුළුන් වලා යටින් ඉඳන් එබිල බලන්නේ .....
( පදමාලාව - අර්. එන්. එච්. පෙරේරා)

✡ මොනව ද මුත්තේ මොකද කරන්නේ
කුමට ද නුඹ ඔය බිම හාරන්නේ ....
(ගායනය - අනුෂා නානායක්කාර, රෝහරණ වීරසිංහ)

✡ පාන තියා බුදු සාදුට හිමිදිරියේ
සැමදා දෙන්නා ගෙදරින් යනවා ....
(පදමාලාව - බන්දුල නානායක්කාරවසම්)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

3. ධීවර ගීතය

1. හොයියා හෝයියා
   දැල් අදිමුකො හෝයියා //
      මන්නඩි රාලත් ඇවිල්ල
      අණ දෙනවා හෝයියා //
   හොයියා හෝයියා ... //

2. තෝරු මෝරු අංජිලාවො
   පොකිරිස්සො ද කුම්බලාවො //
      මේ අස්සේ පොඩි මාළුත්
      මාළු ගොඩයි හෝයියා //
   හොයියා හෝයියා //

3. දැල පිරිලා හෝයියා
      ගජ වාසියි හෝයියා //
      වැල්ල පුරා සතුට බෙදා
      අපේ මඩිය පිරිලා //
   හොයියා හෝයියා ... //

4. විරිය දිරිය වඩාලා
   එක් වී දැල ඇදීලා //
      දෙවියෝ අපෙ මූණ බලා
      ගමට සතුට ගෙනැල්ලා //
   හොයියා හෝයියා //

## නිපුණතා මට්ටම

1.2.2.2 වාචික අභිනය සහිත ව හඬ නඟා කතා කරයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

#### ක්‍රියාකාරකම

වාචික අභිනය සහිත ව හඬ නගා කතා කිරීමේ අවස්ථා සඳහා සිසුන් යොමු කරන්න. එහි දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය දක්වන්න.

* හඬ පාලනය කරමින් කතා කිරීම.
* අංග චලනය සහිත ව කතා කිරීම.
* උචිත ඉරියව් භාවිතය
* වේගය
* අවස්ථාවට ගැළපෙන බව

උදාහරණ :-

* වෙළෙඳ දැන්වීමක් ඉදිරිපත් කිරීම.
* ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම.
* ක්‍රීඩා විචාරාත්මක වැඩසටහනක් ඉදිරිපත් කිරීම.
* නාට්‍යමය අවස්ථාවක් ඉදිරිපත් කිරීම.

## නිපුණතා මට්ටම

1.2.2.3 අවධාරණයෙන් කතා කරයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

#### ක්‍රියාකාරකම

දෙන ලද තේමාවක අදහස රැක ගනිමින් කතා කිරීමට සිසුන් යොමු කරවන්න. කතාව ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරේ අවධානය දක්වන්න.

- මාතෘකාවට අදාළ කරුණු තිබීම.
- කතාවේ දී එම කරුණු ඉස්මතු කිරීම.
- අසන්නාට කරුණු පැහැදිලි කිරීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ :-
* සතුනට ආදරය කරමු
* ජලය අපතේ නොහරිමු
* සමගියෙන් සෙල්ලම් කරමු

කුඩා වේදිකාවක් සකසා වේදිකාව මත සිට කතා කිරීමේ අවස්ථා ලබා දීම. එහි දී සිට ගැනීම, අසන්නන් දෙස ඍජුව බැලීම, උචිත අංග චලනය, හඬ පාලනය පිළිබඳ ව අවධානය යොමු කරමින් සිසුනට කැමති මාතෘකාවක් යටතේ මිනිත්තු තුනක් පමණ කතා කිරීමට අවස්ථා සලසා දීම සුදුසු ය.

නිපුණතාව
1.2.3 සන්නිවේදන අවශ්‍යතා සඳහා කතා කරයි.

නිපුණතා මට්ටම
1.2.3.1 පණිවිඩ පවසා පිළිතුරු රැගෙන එයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
පණිවිඩයක්, අසන්නකුට නිවැරදි ව යොමු කර අසන්නාගේ පිළිතුරු ආපසු රැගෙන විත් නියමිත පුද්ගලයාට පැවසීමට අවස්ථාව ලබා දෙන්න.
සන්නිවේදන කුසලතා වර්ධනය සඳහා පණිවිඩ යොදා ගැනීමේ දී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න.

- ★ පණිවිඩය පවසන්නෙක්, පණිවිඩය ගෙන යන්නෙක් හා පණිවිඩය ලබන්නෙක් සිටීම.
- ★ පණිවිඩයක් තිබීම එය ලබා ගැනීම, හිතේ තබා ගෙන රැගෙන යාම, පණිවිඩය නිවැරදි ව ලබා දීම,පිළිතුරු ලබා ගැනීම, මතක තබා ගෙන රැගෙන ඒම, පිළිතුර පණිවිඩය ලබා දුන් අයට පැවසීම. යන ක්‍රියාවලියක් පැවතීම.
- ★ පාසලේ සිටින අනෙක් ගුරුවරුන් මේ පිළිබඳ දැනුවත් කර පණිවිඩ ලබා ගන්නන් ලෙස ඔවුන්ට ක්‍රියා කිරීමට අවස්ථාව ලබා දිය හැකි ය.
- ★ වෙනත් ගුරුවරුන් සමඟ කතා බහට යොමු වීමට සිසුන් වැඩි උනන්දුවක් දැක්විය හැකි ය.
- ★ නිවසට සුදුසු පණිවිඩ යවා අදාළ ප්‍රතිචාර ලබා ගත හැකි ය.

උදාහරණ 1 :-
පන්තියේ සියලු ම සිසුන්ට තමන්ගේ උස සහ බර නිවසේ දී දෙමාපිය සහාය ඇති ව මැන ගෙන ඒමට උපදෙස් දෙන්න.
පසු ව සිසුන්ගෙන් ප්‍රතිචාර ලබා ගන්න. ප්‍රතිචාර නිවැරදි දැයි තක්සේරු කිරීම සඳහා පන්ති කාමර තුළ දී නැවත සිසුන්ගේ උස, බර මැන බලන්න.

| |
|---|
| මෙම ක්‍රියාකාරකම මඟින් අපේක්ෂා කරනුයේ සිසුන් පණිවිඩ පවසා පිළිතුරු සිත්හි තබා ගෙන රැගෙන ඒම පමණි. |

උදාහරණ 2 :-
කෑඳ සෑදීමට ගන්නා කොළ වර්ග මොනවා දැයි තම දෙමාපියන්ගෙන් අසා ගෙන පැමිණෙන ලෙස සිසුන්ට දන්වන්න. පසු ව පිළිතුරු රැගෙන පැමිණියේ දැයි යන්න සොයා බලන්න. ඒ අනුව තක්සේරු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.2.3.2 අත්දැකීම් සෙසු අයට පවසයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
විවිධ නිරීක්ෂණවලට සිසුන් යොමු කරමින් ඒවා පියවරෙන් පියවර තම කණ්ඩායමට ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙන්න.
උදාහරණ :- ★ බීජයක් සිටුවා ගසෙහි වැඩීම
★ ගොලුබෙල්ලාගේ ගමන් රටාව
★ කුරුලු කූඩුවක් නිරීක්ෂණය (පැටව් සහිත)
★ පූසා ගොදුරකට කුරුමානම් ඇල්ලීම
★ සමනලයකුගේ උපත
★ වැස්සට පෙර පරිසරය
★ රෑ අහස

වඩා සිත් ගත් අත්දැකීම් ප්‍රකාශය තෝරා ගැනීමට කණ්ඩායමේ සිසුන් යොමු කරන්න. එම ප්‍රකාශ මුළු පන්තියට ම ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

ක්‍රියාකාරකම 2
ක්ෂේත්‍ර චාරිකාවක් මගින් ලබා ගත් අත්දැකීම් කණ්ඩායමේ අන් අයට ප්‍රකාශ කිරීමට අවස්ථා ලබා දෙන්න.
උදාහරණ :- තැපැල් හල, ප්‍රධාන බස් නැවතුම් පොළ, වෙළෙඳ පොළ, බැංකුව

ක්‍රියාකාරකම 3
සරුංගලයක්, වෙසක් කූඩුවක්, ගව ලෙනක්, නත්තල් ගසක් හෝ වෙසක් නිර්මාණයක් කළ අකාරය පිළිබඳ තම අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 4
ගොටුකොළ සලාදයක්, පලතුරු බීමක්, තේ කෝප්පයක් වැනි පහසුවෙන් සකස් කර ගත හැකි ආහාරයක් හෝ පානයක් හෝ නිවසේ දී සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. පසු ව එම අත්දැකීම් පන්ති කාමරය තුළ දී ඉදිරිපත් කිරීමට අවකාශ සලසා දෙන්න.
අත්දැකීම් ප්‍රකාශවල දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න.
✶ සිත් ගන්නා අයුරින් ඉදිරිපත් කිරීම.
✶ සවිස්තර ව කරුණු ගෙන හැර පෑම.
✶ පැහැදිලි හා නිරවුල් බව.
✶ අසන්නාට එය තමා ලද අත්දැකීමක් ලෙස හැඟී යෑම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.2.3.3 උගත් අලුත් දැනුම අන්‍යයන් හා බෙදා ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
මෙහි දී අලුත් දැනුම සෙවීම සඳහා සිසුන් යොමු කළ යුතු ය.
පුවත් පත්. සඟරා, ලිපි, ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි සන්නිවේදන මාධ්‍ය ආශ්‍රිත ව විවිධ කොටස් කියවා/නරඹා/අසා ඒ පිළිබඳ ව පන්තිය ඉදිරියේ කතා කිරීමට අවස්ථා සලසන්න.

* දැනුම මිනුම තරග සංවිධානය කරන්න.
* සිසුන් සොයා ගන්නා අලුත් දැනුම පන්තියේ සියලු දෙනා අතර බෙදා ගන්නා අඛණ්ඩ වැඩ සටහනක් සංවිධානය කරන්න.
* අලුත් දැනුම වාර්තා කරන්න. එම වාර්තා බිත්ති පුවත් පතට යොමු කරන්න.

මෙම වාර්තා ඇතුළත් සඟරාවක් පිළියෙල කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 1.3 කියවීම

නිපුණතාව

1.3.1 නිවැරදි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි.

නිපුණතා මට්ටම

1.3.1.1 සියලු මහාප්‍රාණ අක්ෂර සහිත මිශ්‍ර සිංහල හෝඩියේ අක්ෂර නිසි ලෙස උසුරුවමින් කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

සියලු මහාප්‍රාණ අක්ෂර සහිත මිශ්‍ර සිංහල හෝඩියේ අක්ෂර නිසි ලෙස උසුරුවමින් කියවීම.

පෙළ පොතේ සුදුසු කොටස් තෝරා ගෙන ඉදිරිපත් කරන්න.

ඊට අමතර ව හතරවන ශ්‍රේණියේ ශිෂ්‍යයාට උචිත අමතර පොත්වලින් උපුටා ගත් කොටස් ද යොදා ගන්න.

මෙහි දී යාන්ත්‍රික කියවීමක් සිදු වුව ද ශිෂ්‍යයාට අර්ථය වටහා ගෙන රස විඳිය හැකි යමක් ඉදිරිපත් කරන්නේ නම් එය වඩා ප්‍රියජනක ඉගෙනුමක් බවට පත් කළ හැකි ය.

ඉදිරිපත් කරන ගද්‍ය කොටස්වල ශබ්ද රසය ගැන මෙන් ම අර්ථ රසය ගැන ද සැලකිලිමත් වන්න.

මෙබඳු ගද්‍ය කොටස් හැකි තරම් ප්‍රමාණයක් පත්‍රිකාවල ලියා සකස් කර තබා ගන්න.

- සකස් කර ගත් ගද්‍ය ඡේදවල ඇති, උච්චාරණ හුරුව ලබා දීමට බලාපොරොත්තු වන වචන කළුලෑල්ලේ ලියන්න.
- ඉන් පසු සවන් දී සිටීම සඳහා සිසුන් යොමු කර, පන්තියට ම ඇසෙන සේ මුලින් ම එක් වරක් එම පාඨය කියවන්න.
- අනතුරු ව, ශිෂ්‍යයන් එකිනෙකා ගෙන්වා, කාඩ්පත් ඉදිරිපත් කර, ශබ්ද නඟා කියවීමට යොමු කරන්න.
- සිසුන්ගේ කියවීමට හොඳින් සවන් දී සිට, කළුලෑල්ලේ ලියා ඇති වචන නිවැරදි ව උච්චාරණය කරනවා දැයි බලන්න.
- මේ ආකාරයට සකස් කර ගත් පත්‍රිකා සියල්ල සිසුන් ලවා හඬ නඟා කියවීමට යොමු කරන්න.

උදාහරණ 1 :-

..... එසමයෙහි එක් වැද්දෙක් බෝධි සත්වයන් වසන්නා වූ ගස සමීපයෙහි වර මන්දෙන් ඉදි කරන ලද උගුලක් සලස්වා ලී ය. බෝධි සත්වයෝ උගුලෙහි පෙරයම බැඳුණාහ. එමල වරපට කඩා ගත නොහී මරණ ප්‍රාප්ත රාග වශයෙන් ඇඬූහ. ඒ අඬ අසා කැරලා හා ඉදිබුවා එතැනට අවුත් යාළුවාට දුක්බය පැමිණි කල ගලවා ගන්නට උවමනා වේ දැයි සිතා ... (ජාතක පොත)

..... එක් බ්‍රාහ්මණයෙක් ගවයන් දෙන්නා වූ දායකයන්ගේ සමීපයට ගොස් ගවයෙක් ලැබ ගෙන නන්දිවිශාල යයි කියා නමක් කොට පුත්‍ර ස්ථානාන්තරයෙහි තබා ඕ හට බොහෝ ප්‍රිය වෙමින් කැඳ බත් ආදිය දී පෝෂ්‍ය කරන්නේ ය .....

..... ස්වාමීනි මනුෂ්‍ය ඝාතක චණ්ඩ පරුෂ වූ නාලාගිරි හස්තියා මේ වීථියට පැමිණියේ ය. එතෙම බුද්ධාදීන්ගේ ගුණයක් නොදන්නේ ය. එසේ හෙයින් භාග්‍යවත් වූ සර්වඥයන් වහන්ස, .....

උදාහරණ 2 :- සැම දන මන දිනූ
සුජාත ධරණී
සෞභාග්‍ය නිධානය ලංකා
වොරලදේ වොරලදේ වොරලදේවා
සෞභාග්‍ය නිධානය ලංකා

උදාහරණ 3 :- ජගත් මෝහිනී
මධුර භාෂිණී
චාරු දේහිනී
ශාස්ත්‍ර ධාරණී
සරස්වතී දේවී
වන්දේ සරස්වතී
ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

## නිපුණතා මට්ටම

1.3.1.2 වේගය වර්ධනය කර ගනිමින් කියවයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

ප්‍රිය ජනක ගද්‍ය කොටස් හැකි තරම් තෝරා ගෙන පත්‍රිකා සකස් කර ගන්න.
ගද්‍ය කොටස් තෝරා ගන්නා විට මුලින් ම සරල බසින් ලියැවුණු දේ යොදා ගන්න.
ඉන් පසු ක්‍රමයෙන් සංකීර්ණ ගද්‍ය කොටස් ඉදිරිපත් කරන්න.
වේගයෙන් කියවීමේ තරග සංවිධානය කරන්න.
උදාහරණ

... අනේ, මා මරන්නට එපා, මා හොරකමට ආවා නොවෙයි. හොරුන් මා ගෙට ඇතුළු කළා. බඩු ගෙන දෙන්නට කීවා. අර පෙට්ටිය තනිය ම ගෙන යන්නට බැරි නිසයි මා ඔබට කතා කළේ. හොරකමට ආවා නම් කතා කරනවා යැ? මා හිතුවා. හොරුන් මේ ගෙදර අයත් සමහ කලින්, දොඩා ගෙන බඩු ගෙන යනවා ය කියා කිරි හාමි මෙසේ කියත් සියල්ලෝ කොක් හඬ ලන්නට වූහ. ...(හත්පණ)

... ගල් ගුහාව සුද්ධ කොට අපි, අපේ බඩුත් කොට්ටා පැදුරුත් එහි තබා ටිකක් හති ඇරියෙමු. අනතුරු ව අපි ගල් ගුහාව ළඟ සිට තොටුපොළ තෙක් කැළේ කපා අඩි පාරක් තැනුවෙමු. එදින දවල් ආහාරය වශයෙන් අප කෑවේ කුරුම්බා ය. හවස කජු කඩා පළා මද කෑවෙමු. රැයෙහි ජීන්නා බත් ඉව්වේ ය. මම පොල් ගා සම්බලයක් සැදුවෙමි. බත් කා, ගල් තලාවෙහි අතුළ පැදුරු උඩ වැටී නිදන්නට වූ අප අවදි වූයේ පසු දා උදේ කුරුල්ලන්ගේ නාදය ඇසීමෙනි ... (මඩොල්දූව)

... ගමන ආරම්භ විය. පණුවන් කදෙක් ද, කැරලපොත්තන් කදෙක් ද පළමු කොට පිටත් විය. බෙර වයන, නළා පිඹින, නටන පිරිසෙක් ඊළඟට නික්මුණාහ. වීණා වයන, සින්දු කියන කිහිප දෙනෙක් තුන්වැනි ව ගියහ. ඉක්බිති පැමිණියේ මනමාලයා ය. පෙළ ගැසුණු ඔහුගේ නෑදෑ පිරිස ඔහු පස්සෙන් වැටුණාහ. ඉතා මහලු වුවත් ද කුඩා දරුවන් ද හැර ඉතිරි සිවලුන්ගෙන් එදා හිවලාවල නැවතුණු එකෙකුත් නැති ... (මඟුල් කෑම)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිහඬ ව වේගවත් ව කියවීමේ කුසලතා වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

i මේ සඳහා අපිළිවෙළට ඉදිරිපත් කරන වැකි කිහිපයක් අර්ථයක් එන පරිදි පිළිවෙළට සැකසීම.

ii වම්පස ඇති ප්‍රකාශ හෝ ඡේදවලට ගැළපෙන ප්‍රකාශ හෝ ඡේද දකුණු පසින් සොයා ගැළපීමේ අභ්‍යාස

iii පෙළ පොතේ පාඩම් නිහඬ ව කියවා, අසන ලද ප්‍රශ්නවලට ඉක්මනින් පිළිතුරු සැපයීමේ අවස්ථා සංවිධානය කිරීම.

උදාහරණ :-

ක්‍රියාකාරකම

පහත සඳහන් අංක1 හි සඳහන් වාක්‍ය පත්‍රිකාවක ලියා ගන්න.

අංක 2 පත්‍රිකාව පහත දැක්වෙන ආකාරයට හිස් තැනක් සහිත ව සකස් කර ගන්න.

අංක 3, 4, 5 පත්‍රිකා අංක 2 පත්‍රිකාවේ හිස් තැනෙහි ප්‍රමාණයට සකස් කර ගන්න.

අංක 3, 4, 5 පත්‍රිකාවලින් ගැළපෙන පත්‍රිකාව තෝරා ගෙන අ ංක 2 පත්‍රිකාවේ සඳහන් වාක්‍යය සම්පූර්ණ කර කියවීමට සලස්වන්න.

ඡේදය නිවැරදි දැයි බැලීමට නැවත වරක් කියවීමට උපදෙස් දෙන්න.

මෙය තරඟකාරී ආකාරයට කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස කරවන්න.

අංක1 පත්‍රිකාව

| |
|---|
| මනුෂ්‍යයන්ට සතුරෝ බොහෝ සිටිති සිංහ, ව්‍යාඝ්‍ර, කොටි, වලස්, නයි, පොළොං ආදී සතුන් ඉතා අන්තරායදායක බව ප්‍රකටය. |

අංක 2 පත්‍රිකාව

| |
|---|
| මනුෂ්‍යයන්ට සතුරෝ බොහෝ සිටිති. [ ] කොටි වලස් [ ] ආදී සතුන් ඉතා අන්තරාදායක බව ප්‍රකට ය. |

| අංක 03 පත්‍රිකාව | අංක 04 පත්‍රිකාව | අංක 05 පත්‍රිකාව |
|---|---|---|
| සිංහ, ව්‍යාඝ්‍ර, නයි, පොළොං | සතුරෝ, සතුන්, සිංහ ව්‍යාඝ්‍ර | මනුෂ්‍යයෝ, සතුරෝ වලස්, සතුන් |

උදාහරණ :-

අංක 1 පත්‍රිකාවක සකස් කර ගන්න.

අංක 2 පත්‍රිකාවට අදාළ කාඩ්පත් තුන වෙන වෙන ම එම හැඩයට ම සකස් කර ගන්න.

අංක 1 පත්‍රිකාවේ හිස්තැන පිරවීමට සුදුසු කාඩ්පත අංක 2 පත්‍රිකාවේ කාඩ්පත් තුනෙන් තෝරා ගෙන හිස් තැනෙහි තබා කියවීමට යොමු කරවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙවැනි ක්‍රියාකාරකම් නිශ්චිත කාලසීමාවක් තුළ අවසන් වන ආකාරයට තරගකාරී ව කරවන්න.

අංක 1 පත්‍රිකාව

මැඩියෙක් වරකට විශාල ගණනක් බිජුවට දමයි. නිතර
දිය පිරුණු අහලවල හෝ ඇළවල හෝ මැඩියන් දමන
බිත්තර එහි වෙසෙන ______ ජලජ සතුන්ටත්
ආහාර වෙයි. ඇළවල හෝ ______ ඉස්ගෙඩියන්
බහුල නොවන්නේ එහෙයිනි.

අංක 2 පත්‍රිකාව

| ඇළවල හෝ<br>මාළුවන් | මාළුවන්ටත් අනෙක්<br>අගලවල හෝ | මාළුවන්ටත් අනෙක්<br>ජලජ සතුන්ටත් |
|---|---|---|

මෙවැනි වෙනත් ක්‍රියාකාරකම් යොදා ගන්න.

## නිපුණතා මට්ටම

1.3.1.3 නැවතීම, කොමාව, ප්‍රශ්නාර්ථය, විශ්මයාර්ථය යන විරාම ලක්ෂණවලට අවනත ව කියවයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

- පහත සඳහන් විරාම ලක්ෂණ අඩංගු ඡේද ලියූ පත්‍රිකා සකසා ගන්න.
- ඡේද ප්‍රිය ජනක විස්තරවලින් යුක්ත වුවහොත් සිසුන් ඒවා ආසාවෙන් කියවනු ඇත.
- ලොකුවට ලියා ප්‍රදර්ශනය කළ හැකි සේ ඡේද සකස් කර ගැනීම වඩා ප්‍රයෝජනවත් වනු ඇත.
- ඡේදයක් තෝරා ගෙන එය සිසුන්ට පෙනෙන සේ ප්‍රදර්ශනය කර ඔවුන්ට ඇසෙන සේ, විරාම ලක්ෂණවලට අවධානයෙන් යුතු ව එම ඡේදය කියවන්න.
- සිසුන් එකිනෙකා ගෙන්වා, විරාම ලක්ෂණවලට අවනත ව එම ඡේද කියවීමට යොමු කරන්න.

තිත (.) හෙවත් නැවතීමේ ලකුණ

සම්පූර්ණ අදහසක් ප්‍රකාශ කරන වාක්‍යයක, අවසානයට යෙදීම.

උදාහරණ :

> .... දිනක් එළි වන යාමයේ දී ගොවියාගේ කුඹුරට හරක් පැන්නෝ ය. කිරි හාමි දිග රිටක් ගෙන උන් එළවා ගියේ ය. පහරක් දෙන්නට පළමු හරක් කඩුල්ලෙන් ම පැන ගියෝ ය. රිටි පහරක් දෙන්නට බැරි වීම කිරි හාමිගේ හිතට පහරෙකි. එහෙයින් හේ කඩුල්ල උඩ හිඳ රෙද්දෙන් අමුඩය ගසා ගත්තේ ය. රිට ද ගෙන හරකුන් පස්සේ යන්නට නැගුණේ ය.....

තිත හෙවත් සමාප්තිය හඟවන මෙම විරාම ලක්ෂණය.

i වචනයක් කෙටි කළ බව හැඟවීමට ද

ii විධාන වාක්‍යයක් අවසානයේ දී ද යොදන බව පහදා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

වචන කෙටි කිරීමට

උදාහරණ:

| | | |
|---|---|---|
| බුද්ධ වර්ෂය | - | බු. ව. |
| නියෝජ්‍ය විදුහල්පති | - | නි. වි. |
| පෙරවරු | - | පෙ. ව. |
| උතුරු මැද පළාත | - | උ. මැ. ප. |

විධානයක් අවසානයේ දී

උදාහරණ :

ළමයා, මෙහෙ එන්න.

ප්‍රශ්නාර්ථය (?)

මේ ලකුණ ප්‍රශ්නයක් කෙළවර යෙදෙන බව උදාහරණ ඉදිරිපත් කරමින් පහදා දෙන්න.

උදාහරණ :

ඔබේ නම මොකක් ද?
ඔබ එන්නේ කොහි සිට ද?
ඔබ පමා වුයේ ඇයි?
ඔබේ පුතා කෝ?

විශ්මයාර්ථය (!)

පුදුමය, කෝපය, ප්‍රීතිය ප්‍රාර්ථනය ආදී සිතේ ඇති වන හැඟීම් දක්වන්නට මේ ලක්ෂණ යොදන බව පහදා දෙන්න. මෙම වැකි උසුරුවන ආකාරය අනුව විශ්මයාර්ථ දැනෙන බව ආදර්ශනය කරන්න.

උදාහරණ :

කෝපය - අනේ ! අනේ ! ඔහොම වැරදි වැඩ කරන්න හොඳ නෑ
පුදුමය - මේ තියෙන්නේ මගේ නැති වුණු පොත ! හරිපුදුමයි!
ඒ පොත මගේ මේසෙ උඩ ම තිබිල නෙ !
ප්‍රීතිය - හෙට එනවා කියූ ඔබ අද ම ඇවිත් !
ප්‍රාර්ථනය - ජය වේවා ! සැප වේවා !

ඉහත විරාම ලක්ෂණ සියල්ල ම යෙදී ඇති මෙබඳු කොටස් ද තෝරා ගෙන ඉදිරිපත් කරන්න.

උදාහරණ :-කිරි හාමි, ඔබට පිස්සු ද? නැගිටිනවා, නැගිටිනවා
මා මළා, නැගිටින්නේ කෙසේ ද?
මළා ! මළා නම් දොඩන්නේ ?
මළ අය දොඩන්නේ නැද්ද ?

- පෙළ පොතෙහි පාඩම් අදාළ විරාම ලක්ෂණවලට අවනත ව කියවීමට යොමු කිරීම.
- මීට අමතර ව, හීන්සැරය, මඟුල් කෑම, හත්පණ, අපේ ගම, මඩොල් දූව වැනි අමතර පොත් භාවිතයට ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.3.1.4 විවිධ ශෛලීන්ගෙන් යුතු ව කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
- කෙටි වැකි සහිත ගද්‍ය කොටස්, දීර්ඝ වැකි සහිත ගද්‍ය කොටස්, අනුප්‍රාස සහිත ගද්‍ය කොටස් ආදිය මේ සඳහා යොදා ගන්න.
- තෝරා ගත් කොටස් පත්‍රිකාවල ලියා සකස් කර ගන්න.
- පත්‍රිකාවල ඇති කොටස් උචිත ශෛලීන්ගෙන් යුතු ව සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- සිසුන්ට ද එම කොටස් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් උදාහරණවල දැක්වෙන ප්‍රවෘත්ති, මරණ දැන්වීම්, වෙළෙඳ දැන්වීම්, ජාතක කතා යනාදියට උචිත ශෛලීන් අනුව ම කියවීමට යොමු කරන්න.

උදාහරණ 1 :-

ප්‍රවෘත්ති ප්‍රකාශය

<u>ආයුබෝවන්</u>

මේ, දසුන ළමා ගුවන් විදුලි සේවය යි.

<u>ප්‍රවෘත්ති ප්‍රකාශය</u>

<u>ඉදිරිපත් කිරීම</u> - සත්සරණි ගීතදේවි

<u>සංස්කරණය</u> - විශ්වජිත් ලියනආරච්චි

<u>ප්‍රථමයෙන් සිරස්තල</u>

★ හිමාලය කඳු මුදුනේ ඇති අයිස් තට්ටු දියවීමේ තර්ජනයක්.
★ අපගේ සෞරග්‍රහ මණ්ඩලයට අලුත් සාමාජිකයෙක්.
★ ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් අතර පරිගණක භාවිතය ඉහළ යයි.

✶ හිමාලය කඳු මුදුනේ ඇති අයිස් තට්ටු දියවීමේ තර්ජනයකට ඉදිරි කාලයේ දී අපට මුහුණ දීමට සිදු විය හැකි බව ලොව පරිසර විද්‍යාඥයෝ පෙන්වා දෙති. වායුගෝලය උණුසුම් වීමත් සමඟ ලොව උස් කඳු මුදුන්වල පිහිටි අයිස් තට්ටු දිය වී සාගරයේ ජල මට්ටම ඉහළ යා හැකි බව පෙන්වා දෙන විද්‍යාඥයෝ හිමාලය කඳු මුදුනේ ඇති අයිස් තට්ටු දියවීම ප්‍රමුඛ ව සිදු වනු ඇති බව ද පෙන්වා දෙති.

✶ අපගේ සෞරග්‍රහ මණ්ඩලයට අලුත් සාමාජිකයෙක් එක් වී තිබේ. යූ.බී.313 යනුවෙන් නම් කර ඇති මෙම අලුත් ග්‍රහලෝකය නෙප්චූන් ග්‍රහයා සොයා ගැනීමෙන් පසු හමු වූ විශාලතම ග්‍රහලෝකය වේ. 2003 වසරේ ඔක්තෝබර් 21 දින පළමුවරට විද්‍යාඥයන් විසින් මෙම ග්‍රහලෝකය දැක ඇත.

✶ ශ්‍රී ලංකාවේ පාසල්වල ඉගෙන ගන්නා සිසුන් අතර පරිගණක භාවිතය ඉහළ ගොස් ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය පවත්වන ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත. පසු ගිය කාලය පුරා අමාත්‍යාංශය දියත් කරන ලද විශේෂ වැඩසටහන් නිසා පාසල් සිසුන් අතර පරිගණක භාවිතය ඉහළ ගොස් ඇති බව හෙළි වී තිබේ.

<u>ප්‍රවෘත්ති සමාප්ත යි.</u>

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ 2 :-

මරණ දැන්වීම

සඳගිරි තැන්න, මුවන්ගම, සීසිල නිවසෙහි පදිංචි ව සිටි විශ්‍රාමික විදුහල්පති සාම විනිසුරු කිර්ති පණ්ඩිතරත්න මහතා.
විශ්‍රාමික පාඨශාලාචාරිනී පුන්‍යවතී මහත්මියගේ ආදරණීය ස්වාමි පුරුෂයා වූ ද
සකුන්තලා - සංචාරක අමාත්‍යාංශය, විපුල - මහාධිකරණය, සාගරගම හා මේනකා යන අයගේ ආදරණීය පියාණන් වූ ද සඳගිරි තැන්න මුවන්ගම, සීසිල නිවසෙහි පදිංචි ව සිටි විශ්‍රාමික විදුහල්පති සාම විනිසුරු කිර්ති පණ්ඩිතරත්න මහතා අභාවප්ප්‍රාප්ත විය. අවසාන කටයුතු ජුනි මස හත්වෙනි බදාදා පස්වරු 4.00ට පවුලේ සුසාන භූමියේ දී සිදු කෙරේ.

මෙයට ශෝකයට පත්
භාර්යාව ඇතුළු දරු පිරිස

සීසිල, සඳගිරිතැන්න,
මුවන්ගම.

උදාහරණ :-

වෙළෙඳ දැන්වීම

ආරෝග්‍යා පරමා ලාභා !
නිරෝගිකම පරම ලාභයයි !
නිරෝගීමත් ජීවිතයක් සඳහා
ඔබගේ ආහාර වේලට

**අයඩින් මිශ්‍ර ලක් ලුණු**

එකතු කර ගන්න.
අයඩින් ඌණතාවය නිසා
ගලගණ්ඩය වැනි රෝග තත්ත්වයන්
ඇති වේ. ගලගණ්ඩ රෝගයෙන් මිදීමට

**අයඩින් මිශ්‍ර ලක් ලුණු**

භාවිතයට හුරු වන්න.

දිවයින පුරා පිහිටි
ලක් සතොස වෙළෙඳසල්වලින්
දැන් මිලදී ගත හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ :-

ජාතක කතා

දඹදිව මියුලු නුවර රජ කළ වෛදේහ රජතුමාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමට පත් වූ මහෞෂධ පණ්ඩිතයන් වහන්සේ නගරයෙහි ආරක්ෂා සංවිධාන තර කළ ආකාරය උම්මග්ග ජාතකයෙහි මෙසේ විස්තර වෙයි.

එතැන් පටන් කොටැ පණ්ඩිතයන් වහන්සේ මැ රජ්ජුරුවන්ට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන සේක. උන් වහන්සේ රජ්ජුරුවනට ධවලඡත්‍රය මැයැ. එතැන් පටන් පණ්ඩිතයන් වහන්සේ රාජ්‍යය විචාරන්නේ නම් මම් මැයැ. එසේ හෙයින් මා විසින් නොපමා විය යුතු යැ යි සිතා, සත් යොදුන් මියුලු නුවර වටා, ක්ෂීර සාගරයෙන් නැඟි තරංග මාලාවක් සේ ධවල වූ, අටළොස් රියන් පමණ උස මහා සීමා පවුරක් ලැවූ සේකැ. ඒ පවුර ගාව ඇතුළතින් තරය පිණිස මහ පදනමක්ද, වට කොටැ සිය ගණන් සාරි ගෙවල් හා වටා බඳ වෙට්ටම් ද ලවා, වාසලක් පාසා පිටතැ පුලිමුඹම් ද, ඒ ඒ ස්ථානයෙහි බලකොටු ද කැරැවූ සේක. සීමා පවුර වටා පිටතින් ශිශුමාර මකරාදි චණ්ඩ මත්ස්‍යයන් විසින් ගහණ වූ පඤ්චවිධ පද්මයෙන් සඤ්ජන්න දිය පිරුණු අගළක් ද ඒ වටා කලල් අගලක් ද ඒ වටා වියළි අගලක් දැයි තුන් අගළක් බිඳ වූ සේකැ. ඇතුළු නුවර මාලු ගෙවල් මුළුල්ල කටුකෝල් පෙරුළ වූ සේකැ. ඒ ඒ ස්ථානයෙහි මහ පොකුණු බින්දවා එහි දිය පිරැවූ සේක. නුවරැ සියලු ගෙවල් වී පිරැවූ සේකැ. හිමාලය වන ප්‍රදේශයෙන් කුළුපග තාපසවරුන් ලවා අරුණු වන් මඩ හා ඇඹුල බිජුවට ගෙන්වා තැබ්බූ සේකැ. බොහෝ කලක් රොන් බොර ගසා වැලි බොර ගසා වැලි අශුද්ධ ඇළ හෝ ආදිය සකස් කරවා වාරි මාර්ගවල් සුනුමැටි කවා ශුද්ධ කරවා පිටි නුවරැ ද සුන් බුන් තැන් පිරියම් කැරැවූ සේකැ. මේ හැම කුමක් නිසා ද යතහොත් මත්තෙහි සතුරන් විසින් වන භය වළකනු පිණිස යැ.

( උම්මග්ග ජාතකය )

උදාහරණ :-

... සුසුම් ලා යකින්නී, නෙත් කඳුළු ඉසින්නී, මෙලෙස සිට කියන්නී, සිංහ පුරවර සොඳා, රජ ඉසුරු විඳ විඳා, කරන නොපණත් සදා, නැව් නගා හළ සඳා, ලක් දිවට බැස එදා, නුග සෙවන වන මැදා, තනි ව උන් සඳ එදා, බත් බුලත් දී සොඳා, මවා විමනක් සොඳා, .......
(කුවේණි අස්න)

මෙවැනි වෙනත් ගද්‍ය කොටස් ද කියවීමට සිසුන් යොමු කරන්න.

## නිපුණතා මට්ටම

1.3.1.5 ඉස්පිලි, පාපිලි, හල් කිරීම්, ඇලපිලි, ඇදපිලි (ඇදය) රකාරංශය, යංශය හා ගයනුකිත්ත යෙදුණු වචන නිවැරදි ව උසුරුවමින් කියවයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

ඉහත පිල්ලම් යෙදුණ ඡේද පෙළ පොතින් සොයා ගෙන සිසුන්ට ඉදිරිපත් කරන්න.
මීට අමතර ව වෙනත් බාහිර පොත පත ද භාවිතයට ගන්න.
එක් එක් සිසුවා ලවා ඡේද කියවීමට අවස්ථාව ලබා දෙන්න.
එක් එක් සිසුවා වෙත අවධානය යොමු කරන්න.
මේ සඳහා ගුරු ආදර්ශන සකස් කිරීමේ දී හඳුන්වා දෙන පිල්ලම් වර්ණ කර දක්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පිල්ලම් යොදා වචන වගන්ති කියවීම සඳහා වෙනත් ක්‍රියාකාරකම් යොදා ගන්න.

උදාහරණ :-

(1) සරත් පනතයට ආවෙ ය
(සරත් පන්තියට ආවේ ය)

(2) අප පධන අහරය බතය.
(අපේ ප්‍රධාන ආහාරය බත්ය)

(3) මව පටව අමම ළහට ගයය
(මුව පැටවා අම්මා ළහට ගියා ය)

මෙවැනි වෙනත් විනෝදජනක ක්‍රියාකාරකම් සිසුන් වෙත ඉදිරිපත් කරන්න.

## නිපුණතාව
1.3.2 කියවා අවබෝධ කර ගනියි.

## නිපුණතා මට්ටම
1.3.2.1 සන්නිවේදන සලකුණු කියවා අවබෝධ කර ගනියි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
### ක්‍රියාකාරකම
විවිධ අදහස් දැක්වීමට යොදා ගන්නා සංඥා ලකුණු රැස් කර ගන්න. එම සංඥාවලින් දක්වන අදහස් ලිඛිත ව හා වාචික ව ඉදිරිපත් කරන්න. ඒවා ගැන සාකච්ඡා කරමින් අවශ්‍ය දැනුම ලබා දෙන්න. අඳින ලද සංඥා විශාල ප්‍රමාණයෙන් සකස් කර ඉදිරිපත් කරන්නේ නම් වඩාත් සුදුසු ය. ඉගැන්වීම් ක්‍රියාවලියෙන් පසු, සංඥාව ඉදිරිපත් කළ විට එහි අදහස කීමටත්, අදහස ඉදිරිපත් කළ විට, අදාළ සංඥාව පෙන්වීමටත් සිසුන් යොමු කර, ඉගෙනුම් ක්‍රියාවලිය තහවුරු කරන්න.

උදාහරණ :-

* තොරතුරු දැක්වෙන මාර්ග සංඥා
* විධාන දැක්වෙන මාර්ග සංඥා
* ඇසුරුම්වල දැක්වෙන උපදේශන සංඥා


වස


පාවහන් පැළඳීම තහනම්


දුම්බීම තහනම්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.



නෝනාවරුන්ට
පමණි
(ස්ත්‍රී)



මහත්වරුන්ට
පමණි
(පුරුෂ)

නිපුණතා මට්ටම
1.3.2.2 සරල දැන්වීම් කියාවා අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
හතරවන ශ්‍රේණියේ සිසුන්ට කියවීමට සුදුසු සරල දැන්වීම් එකතුවක් සකස් කර ගන්න.
උදාහරණ :-
වෙළෙඳ දැන්වීම්
* ළමා චිත්‍ර ප්‍රදර්ශන
* පොත් ප්‍රදර්ශන
* නිර්මාණ ප්‍රදර්ශන
* ළමා නාට්‍ය උත්සව
* පොත් දොරට වැඩීමේ උත්සව හා සම්බන්ධ දැන්වීම්

මෙම දැන්වීම් ඇසුරෙන් ප්‍රශ්න සකස් කර සිසුන්ට ඉදිරිපත් කරන්න. නිශ්චිත කාලයක් තුළ දැන්වීම් කියවා වාචික හා ලිඛිත ප්‍රතිචාර ලබා ගන්න.
මෙම ක්‍රියාකාරකම නිරන්තර/ස්ථාවර වැඩක් ලෙස පවත්වා ගෙන යන්න.

නිපුණතා මට්ටම
1.3.2.3 ආරාධනා පත් කියවා අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
විවිධ ආරාධනා පත්‍ර එකතුවක් සකස් කර ගන්න. එම ආරාධනා පත්‍රවලට අදාළ ව ඉදිරිපත් කළ හැකි ප්‍රශ්න පත්‍රිකාවල ලියා සිසුන්ට ලබා දෙන්න.
එක් එක් පත්‍රිකාවට අදාළ පිළිතුරු සොයා කියවීමට යොමු කරන්න. මේ සඳහා නිශ්චිත කාලයක් ලබා දෙන්න. මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් වශයෙන් යොදා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ආරාධනයයි
මුතුකැට ළමා සමාජයේ
දරු දැරියන්
කරළියට ගෙන එන
පුංචි තාරකා
විවිධ ප්‍රසංගය
මැයි මස විසි හයවෙනි බදාදා
පස්වරු 06.00ට
සමගිගම
සත්සරපාය ශ්‍රවණාගාරයේ දී
වේදිකා ගත වේ.
උඩවත්ත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
ස්වර්ණපාල ලේල්ලවල මහතා
ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි වන
මෙම අවස්ථාවට ඔබතුමාට/ඔබතුමියට
ගෞරවයෙන් ආරාධනා කරමු.
මෙයට
මුතුකැට ළමා සමාජයේ සාමාජික පිරිස

ප්‍රශ්න
1. ආරාධනය කර ඇත්තේ කුමක් සඳහා ද?
2. ආරාධනය කර ඇත්තේ කවුරුන් විසින් ද?
3. ආරාධනා පත්‍රයේ සඳහන් දිනය කුමක් ද?
4. ප්‍රධාන ආරාධිතයා කවුරුන් ද?

විවිධ ආරාධනා පත්‍ර එකක් සකස් කර ගැනීමට සිසුන් යොමු කරවන්න.

## නිපුණතා මට්ටම
1.3.2.4 සරල කවි කියවා අවබෝධ කර ගනියි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
### ක්‍රියාකාරකම
ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන සරල කවි එකතුවක් සකස් කර තබා ගන්න.
සිසුන්ට ඉදිරිපත් කිරීමට තෝරා ගත් කවි කළුලැල්ලේ ලියා හෝ පත්‍රිකාවල ලියා හෝ සිසුන්ට ඉදිරිපත් කරන්න.
පත්‍රිකාවල ලියා ඉදිරිපත් කරන්නේ නම් සිසු කණ්ඩායම් ගණනට සරි ලන සේ කවි සහ එම කවිවලට අදාළ ප්‍රශ්න සකසා ගන්න. (උදාහරණ :- කණ්ඩායම් හතර නම් කවි හතරක් හා ඊට අදාළ ප්‍රශ්න)
සිසු කණ්ඩායම් හතරට පත්‍රිකා හතර දෙන්න. පිළිතුරු ලිවීමට මිනිත්තු දහයක කාලයක් දෙන්න. මිනිත්තු දහය අවසානයේ පත්‍රිකා මාරු කරන්න. මෙසේ හතර වරක් මාරු කළ විට සියලු ම කණ්ඩායම්වලට කවි හතරක් කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලිවිය හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පළමු වර පත්‍රිකා මාරු කර දුන් අවස්ථාවේ සිට කණ්ඩායම්වලට යමින් සිසුන් ලියූ පිළිතුරු ලකුණු කිරීම කළ හැකි ය.

උදාහරණ :-

| |
|---|
| සිලි සිලි ගා සුළඟ හමන |
| කන්ද පහළ අඳුරු මැවෙන |
| ලන්දෙ කුරුළු සින්දු මැකෙන |
| හැන්දෑ යාමේ .......... |
| (එච්. ඩී. ජයතිලක) |

ප්‍රශ්න

1. සුළඟේ ශබ්දය කුමක් ද?
2. කවියෙන් කියැවෙන්නේ දවසේ කුමන වේලාවක් ගැන ද?
3. කවියේ සඳහන් කුරුල්ලන් සිටින්නේ කොහේ ද?
4. කන්ද පහළ අඳුර මැවෙන යන්නෙහි අදහස ඔබේ වචනයෙන් ලියන්න.

උදාහරණ :-

| |
|---|
| මොනර කැලේ මොර ගස් යට මොනරු නටනවා |
| මොනර පැටව් මොර අතු අග බලා සිටිනවා |
| මොනර කිකිළියෝ පැටවුන් ළඟ දැවටෙනවා |
| මොර සුරන මහ වැස්සක ලකුණු පෙනෙනවා |
| (ළමා පෙළට කවි - එච්. ඩී. ජයතිලක) |

ප්‍රශ්න

1. මොනරු නටන්නේ කොහේ ද?
2. පැටව් ළඟ සිටින්නේ කවුරුන් ද?
3. මෙහි සඳහන් ගස් වර්ගයක් නම් කරන්න
4. මෙහි සඳහන් ප්‍රාණවාචී බහුවචන නාම පද 3ක් ලියන්න
5. නටනවා, සිටිනවා, දැවටෙනවා, පෙනෙනවා යන ක්‍රියා පද ලේඛන වහරට හරවා ලියන්න.

උදාහරණ :-

| |
|---|
| හිරු දෙවි කන්දෙන් එබී බලනවා |
| තැන තැන වන මල් පොකුරු පිපෙනවා |
| රන් හිරු රැස් කෙඳි ගස් අතරින් විත් |
| වනයේ ඇත්තන් අවදි කරනවා |

ප්‍රශ්න

1. මෙහි ඇති විශේෂණ පද දෙකක් ලියන්න
2. කවියෙන් කියැවෙන්නේ කුමන වේලාවක් ගැන ද?
3. කන්දෙන් එබී බලන්නේ කවුරුන් ද?
4. වනයේ ඇත්තන් යනුවෙන් අදහස් කරන්නේ කවු ද?
5. හිරු පායයි යන අදහස දෙන කවි පදය උපුටා ලියන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
3.2.5 සරල ඡේද කියවා අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
තෝරා ගත් ඡේද පත්‍රිකාවල ලියා ගන්න. සිසුන් කියවා ලබා ගත් අවබෝධය මැන ගැනීම සඳහා සුදුසු පැවරුම් ද එම පත්‍රිකාවල ම යොදන්න. මේ පැවරුම් පිළිතුරු ලිවීමට දෙන ඒවා ද නිවැරදි පිළිතුර තේරීමට දෙන ඒවා ද යන අංශ දෙකට ම අයත් වීම සුදුසු ය. පත්‍රිකා කියවා තම පොතේ පිළිතුරු ලිවීම සඳහා සිසුන් යොමු කරන්න. ළමා කතන්දර පොත්, පුවත්පත්වල සිසුන්ට කියවීමට සුදුසු ලිපි අමතර කියවීම් පොත් මව්බස පෙළ පොතේ සියලු පාඩම්වලින් තෝරා ගත් කොටස් ආදිය මේ සඳහා යොදා ගන්න. මේවා තෝරා ගන්නා විට සිසුන්ගේ සිත් ඇද ගන්නා ප්‍රියජනක ඒවා තෝරා ගැනීමට උනන්දු වන්න. එවිට ඒ පොත් කියවීමේ ආසාවක් සිසුන් තුළ ජනිත වනු ඇත.
උදාහරණ :-

| |
|---|
| සිංහල අවුරුද්ද නිමිත්තෙන් කැවිලි සෑදීමට ගැනීම පිණිස කිරිබබා ගෙනා පැණි මුල් දෙක බිරිඳ දුම උඩ තැබුවා ය. රැයෙහි මීයකු එක පැණි මුලක් කපා පැණි බිව් බැවින් ඉතුරු පැණි දුම යට ගැලී ය. පසුදා උදේ ලිප ළඟට ගිය කිරිබබාගේ බිරිඳ හිස් වූ පැණි මුල දැක කිපී මීයාගෙන් නිදහස් වන්නට සිතුවා ය. ඇය කිරිබබා අමතා මීයා අල්ලා ගෙන ගොස් ගඟේ දමන්නට යැයි කීවේ එයට අනතුරුව ය. (අපේ ගම -මාටින් වික්‍රමසිංහ) |

ප්‍රශ්න
1. කිරිබබා පැණි මුල් දෙකක් ගෙනාවේ කුමක් සඳහා ද?
2. පැණි මුල කපා පැණි බීවේ කවු ද?
3. මෙම සිදුවීමෙන් තරහ ගියේ කාට ද?

පහත ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.
4. කිරිබබාගේ බිරිඳ පැණි මුල් දෙක තැබුවේ
   i. දුම උඩය ii. මේසය යට ය iii. ලිප ළඟ ය iv. දුම යට ය
5. මේ සිද්ධිය සිදු වන්නට ඇත්තේ
   i. ජුනි මාසයේ දී ය ii. දෙසැම්බර් මාසයේ දී ය
   iii. අප්‍රේල් මාසයේ දී ය iv. පෙබරවාර මාසයේ දී ය
6. මීයාගෙන් නිදහස් වීමට කිරිබබාගේ බිරිඳගේ යෝජනාව වූයේ
   i. ගඟේ දැමීම ii. කැවිලි සෑදීම ය
   iii. පැණි මුල ලිප තැබීම ය iv. දුම උඩ තැබීම ය

මෙම ප්‍රශ්නවලට ලිඛිත හා වාචික පිළිතුරු ලබා ගන්න.

උදාහරණ

| |
|---|
| දිව පිනවන රඹුටන් |
| මැලේසියාව නිජ බිම කර ගත් රඹුටන් සිසුන් අතර ඉතාමත් ජනප්‍රිය පලතුරකි. ශ්‍රී ලංකාවේ මල්වාන ප්‍රදේශය රඹුටන් වගාව සඳහා ප්‍රසිද්ධ ය. පැළය සිටුවා වසර හතරක් හෝ පහක් පමණ කාලයක් ගත වීමෙන් පසු ගෙඩි හටගන්නා රඹුටන් ඉදුණු පසු රතු සහ කහ පාටින් යුක්ත වේ. රඹුටන් ගෙඩි ඉදෙන විට ඒවා ලේනුන්ගෙන් හා කුරුල්ලන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ඉමහත් වෙහෙසක් දැරීමට සිදුවේ. |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ප්‍රශ්න
1. උපන් බිම යන්නට සමානාර්ථවත් පදයක් ඡේදයෙන් සොයා ලියන්න.
2. ශ්‍රී ලංකාවේ රඹුටන් වගාවට වඩාත් ම ප්‍රසිද්ධ ප්‍රදේශය කුමක් ද?
3. රඹුටන් ගෙඩි හට ගන්නේ පැළය සිටුවා වසර කීයකින් ද?
4. රඹුටන් ගෙඩි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා යොදන උපක්‍රමයක් ලියන්න.

පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.
5. ඉදුණු රඹුටන් ගෙඩි
 i. කහ සහ නිල්පාට ය. ii. කහ සහ රතුපාට ය.
 iii. රතු සහ කොළ පාට ය. iv. නිල් සහ රතුපාට ය.
6. රඹුටන් ගසේ නිජබිම
 i. ශ්‍රී ලංකාව ය. ii. ඉන්දියාව ය.
 iii. මැලේසියාව ය. iv. ජපානය ය.

උදාහරණ

වැදි නායකයකු ව සිටි තිසාහාමි තම වැදි පරපුර හා වැදි සංස්කෘතිය රැක ගැනීමට ඇප කැප වී කටයුතු කළ අයෙකි. මහවැලි සංවර්ධන ව්‍යාපාරය ක්‍රියාත්මක වූ නිසා තිසාහාමි ඇතුළු වැදි ජනයාට තමන් වාසය කළ දඹානේ කොටබකියාව ගම්මානයෙන් ඉවත් වීමට සිදු විය. එහෙත් තිසාහාමි ඇතුළු වැදි පවුල් 79ක් පමණ තම ගම් පියසේ ම රැඳී සිටියහ. සමහර වැදි පිරිස් හෙන්නියගල හා රතුගල යන ප්‍රදේශවලට ගියහ. වැදි පිරිසේ උරුමය රැක ගැනීම සඳහා ඇප කැප වූ තිසාහාමි මෙසේ පැවසීය.

මේ ඇත්තෝ පුච්චනමකින් පුච්ච කැවුවත් ගම්පොජ්ජෙන් මං ගච්චනවා කොදොය්

(අපට වෙඩි තබා මරා දැමුවත් ගම්වලින් යන්නේ නැත)

ප්‍රශ්න
1. මෙහි සඳහන් වැදි නායකයාගේ නම කුමක් ද?
2. වැදිනායකයා වාසය කළ ගමේ නම කුමක් ද?
3. වර්තමානයේ වැදි ජනතාව ජීවත් වන ගම් තුනක නම් ලියන්න.
4. ගම යන වචනයට වැදි භාෂාවෙන් කියන නම කුමක් ද?

මෙවැනි වෙනත් සැපයීම් වර්ගයේ සහ තේරීම් වර්ගයේ ප්‍රශ්න ඇතුළත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.3.3 වාග්මාලාව පෝෂණය සඳහා කියවයි.

නිපුණතා මට්ටම
1.3.3.1 විවිධ වෘත්තීන් හා බැඳුණු වචන කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
එක් එක් වෘත්තීන් සඳහා භාවිත කරන උපකරණ හා ක්‍රියාකාරකම් දැක්වෙන රූපසටහන් හා අදාළ වචන රැස් කිරීමට සිසුන් යොමු කරන්න. (මෙම ක්‍රියාකාරකම සඳහා පූර්ව සූදානමක් අවශ්‍ය වේ)
සිසුන් විසින් රැස් කරන ලද වචන අදාළ වෘත්තියට ගැළපෙන ලෙස ලැයිස්තු ගත කරන්න. එම වචන සිසුන්ට කියවීමට හා ලිවීමට සලස්වන්න.
මෙම ක්‍රියාකාරකම නිරන්තර/ස්ථාවර වැඩක් ලෙස පවත්වා ගෙන යන්න.
උදාහරණ :
* වී ගොවිතැන
* හේන් ගොවිතැන
* ධීවර කර්මාන්තය
* පතල් කර්මාන්තය
* පෙදරේරු කර්මාන්තය
* වඩු කර්මාන්තය
* වෛද්‍ය වෘත්තිය සහ
* පරිගණක ආශ්‍රිත වචන

උදාහරණ :

| වෘත්තිය | උපකරණයේ නම | ක්‍රියාකාරකමේ නම |
|---|---|---|
| වී ගොවිතැන | දෑකැත්ත, යතුර<br>උකුණු ගහ<br>ගොයි පෝරුව, බෝල් අත්ත | මැඩුවන් බානවා<br>රාහි කරනවා<br>යාල්ලනවා |
| හේන් ගොවිතැන | ගෙදැල්ල කරුව<br>වාහන් පතුරු<br>ලබු කැටය<br>ඉනි වැට<br>දඬු වැට<br>පැල | ගෙදැල්ල ගානවා<br>කොළ ගානවා<br>ගිනි මැල් ගහනවා |

සිසුන් විසින් සොයා ගන්නා ලද විවිධ වෘත්තීන් හා බැඳුණු වචන මේ ආකාරයට වගු ගත කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම

1.3.3.2 සමානාර්ථවත් පද කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1


සමානාර්ථ පද ඇතුළත් ඩොමිනෝ කාඩ්පත් සකස් කර ගන්න. කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ක්‍රියාකාරකම කරවන්න.

ක්‍රියාකාරකම පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

එම සමානාර්ථ පද කළුලෑල්ලේ ලියන්න.

මේ පද සඳහා ඇති වෙනත් සමානාර්ථ පද ඇත්නම් ඒවා ද හඳුන්වා දෙන්න.

උදාහරණ :-




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## ක්‍රියාකාරකම 2

පහත සඳහන් ඡේදය ලොකුවට ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න. ඉරි ඇඳි පදවලට ගැළපෙන වෙනත් සමානාර්ථවත් පදය බැගින් ලියූ පත්‍රිකා සකස් කර ගන්න. පදවලට ගැළපෙන සමානාර්ථවත් පද තෝරා ඒවා යොදා නැවත කියවීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ :-

මව සහ පියා සමඟ අලුයම අවදි වූ තරිඳු සුදානම් වූයේ තම සගයා වූ සුපුන් සමඟ සිංහරාජ වනාන්තරය නැරඹීමට යාම සඳහා ය. නවීන පන්නයේ රථයට ගොඩ වූ ඔවුහු මහමග දිගේ ටික වේලාවක් ඉදිරියට ගමන් කළහ. අවට සිරි නරඹමින් යන ඔවුන්ට උසට වැඩී ඇති වෘක්ෂ හා ගුවන කරා විහිදුණු ගිරි මුදුන් නෙතට මනරම් දසුනක් විය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පාන්දර | වනය | යහළුවා | අහස | රියට | අලුත් | අම්මා |
| ගස් | කඳු | තාත්තා | | | | |

## ක්‍රියාකාරකම 3

පෙළ පොතේ කොටස් තෝරා සමානාර්ථවත් පද සෙවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
ඒවා ලැයිස්තුගත කරන්න.
බාහිර පොත පතින් මෙවැනි වෙනස් සමානාර්ථවත් පද සෙවීමට සිසුන් යොමු කරවන්න.
මෙම වචන පද පොතෙහි ඇතුළු කරවන්න. මෙය නිරන්තර වැඩක් ලෙස පවත්වා ගෙන යාමට උපදෙස් දෙන්න.
(පද පොත යනු , වාග්මාලා පෝෂණය සඳහා විවිධ පද වර්ග ඒකරාශී කර ගෙන සිසුන් විසින් සකස් කර ගන්නා පොත)

## නිපුණතා මට්ටම

1.3.3.3 විරුද්ධාර්ථවත් පද කියවයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

විරුද්ධාර්ථවත් පද හඳුන්වා දීමට සුදුසු වචන පත්‍රිකාවල ලියන්න. එයට ගැළපෙන විරුද්ධාර්ථවත් පද ද වෙන වෙන ම පත්‍රිකාවල ලියන්න.
මේවා කුහර පුවරුව තුළ රඳවන්න. වචනය සහ එයට ගැළපෙන විරුද්ධාර්ථවත් පදය යුගළ කරවා සිසුන් ලවා කියවීමට සලස්වන්න.

උදාහරණ :-

| | |
|---|---|
| ශීලාචාර | වක්‍ර |
| ගැළපෙන | පරාර්ථකාමී |
| පැරදුණු | ආනයන |
| හොඳ | නූගත් |
| ගන්නා | පැරණි |
| මළ | අවම |
| නවීන | නොමළ |
| උගත් | නොගන්නා |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

| | |
|---|---|
| අපනයන | නොහොඳ |
| ආත්මාර්ථකාමී | නොපැරදුණු |
| සෘජු | නොගැළපෙන |
| උපරිම | අශීලාචාර |

### ක්‍රියාකාරකම 2

යම් වචනයකට විරුද්ධාර්ථවත් පද යොදා අර්ථය වෙනස් කර වැකි කියවීමේ හා ලිවීමේ අභ්‍යාසවල යෙදවීම.

උදාහරණ :-

1. එය මංගල රථයකි.
2. මේ රඹුටන් දුලබ කාලය යි.
3. හේමා නිතර ම පැරණි පොත් පරිහරණය කරයි.
4. ගුවන් යානය වලාකුළට ඉහළින් ගමන් කරයි.
5. අපේ පන්තියේ උස ම ළමයා මනුකා ය.
6. ඒ ආරංචිය ලත් තරිඳු සොම්නසට පත් විය.
7. උදයට හිරු පායයි.

### ක්‍රියාකාරකම 3

පෙළ පොතේ තෝරා ගත් කොටස්වලින් විරුද්ධාර්ථවත් පද සෙවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
ඒවා ලැයිස්තුගත කරන්න.
බාහිර පොත පතින් ද මෙවැනි වෙනත් විරුද්ධාර්ථවත් පද සෙවීමට සිසුන් යොමු කරන්න.
මෙම වචන පද පොතට ඇතුළු කරවන්න. මෙය නිරන්තර වැඩක් ලෙස පවත්වා ගෙන යාමට උපදෙස් දෙන්න.

### නිපුණතා මට්ටම

1.3.3.4 මව්බස පෙළ පොතෙහි හමු වන භාෂාමය යෙදුම් කියවයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

### ක්‍රියාකාරකම

මව්බස පෙළ පොතෙහි ඇති භාෂාමය යෙදුම් සොයා ලැයිස්තුගත කරන්න.
ඒවා සිසුන්ට ඉදිරිපත් කරන්න.
ඒවායේ අදහස ඉස්මතු වන අයුරින් වගන්තිවල යොදා කියවීමට සිසුන් යොමු කරන්න.

උදාහරණ :-

- ✶ හිරිගඩු පිපෙන තරම් සීතලක් දැනුණි
- ✶ කෝලියාස් පඳුරු පෙනෙන්නේ පොළොවේ ඇතු රූ මල් සැරසිල්ලක් වාගේ
- ✶ රාලහාමිගේ මහ හඬ නිසා මුළු වනය ම ඇස නොපියා සිටියේ ය.
- ✶ අලිහාමි බමරයක් මෙන් කැරකැවෙන්නට විය.
- ✶ වතුරෙගම දී නා ගන්නේ
- ✶ කෝපෙන් දහදිය ලන්නේ
- ✶ වෙල්යාය ගොයම් පැළ නිසා නිල්ල ගැසී ඇත.
- ✶ වෙල්යායේ ඈත කොනකින් එන බට නළා වාදනයක හඬක් සුළඟ සමඟ මුසු වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.3.4 රසාස්වාදය සඳහා කියවයි.

නිපුණතා මට්ටම
1.3.4.1 කාටූන් කියවා රස විඳි යි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
සිසුන්ට ගැළපෙන කාටූන් චිත්‍ර සපයා ගන්න. සිසුන්ට විනෝදයක් ලැබෙන අයුරින් ඒවා ඉදිරිපත් කරන්න.
සිසුන් ලවා ද කාටූන් ඉදිරිපත් කරවන්න.
කාටූන් රැස් කිරීමට හා නිර්මාණය කරවීමට සිසුන් යොමු කරන්න.

නිපුණතා මට්ටම
1.3.4.2 ළමා කතන්දර කියවා රස විඳියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
විවේක වේලාවන්හි දී කතන්දර පොතක් හෝ කතාවක් හෝ කියවා අවසන් වූ විට කිය වූ එක් එක් කතන්දරය/කතාව සඳහා පත්‍රිකාවක් බැගින් සකස් කිරීමට උපදෙස් දෙන්න.
වැඩි ම පත්‍රිකා සංඛ්‍යාවක් සකස් කළ සිසුන් ඇගයීමට ලක් කොට එමඟින් කියවීම සඳහා උනන්දුවක් ඇති කරන්න.
පහත සඳහන් කරුණු ඇතුළත් ආකෘතියකට අනුව, සකස් කළ කාඩ්පතක් පිරවීමට යොමු කරන්න.

* කියවූ පොතේ හෝ කතාවේ නම
* කර්තෘ
* කිය වූ දිනය
* කතාව හා සම්බන්ධව ළමයා විසින් අඳින ලද චිත්‍රයක්
* කතාව කෙටියෙන් ලියා ඉදිරිපත් කිරීම

<table>
<tr><td colspan="2">කියවූ පොතෙහි නම :</td></tr>
<tr><td>කර්තෘ නාමය :</td><td>කියවූ දිනය :</td></tr>
<tr><td>කතාව පිළිබඳ චිත්‍රය :</td><td>කතාව කෙටියෙන්</td></tr>
<tr><td></td><td></td></tr>
</table>

කියවන ලද පොත් විවේක වේලාවන්හි දී සිසුන් අතර හුවමාරු කර ගනිමින් කියවීමේ පුරුද්ද ඇති කිරීම.
සතියකට වතාවක් සියලු ම සිසුන්ට ඇසෙන සේ ළමා කතා පොතක් කියවීමේ පන්ති ප්‍රතිපත්තියක් සකස් කර ගැනීම. එක් එක් සතියක දී කියවන පොත ළමුන්ට සපයා ගෙන පැමිණිය හැකි අතර හැකිනම් පුස්තකාලයකින් රැගෙන විත් කියවීමට හෝ යොමු කළ හැකි ය. මෙය කියවිය යුත්තේ පන්තිය ඉදිරියට පැමිණ එක් එක් ළමයා විසින් ම ය.
මේ සඳහා පන්ති පුස්තකාලය හා පොත් මල්ල භාවිත කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.3.4.3 ළමා කවි කියවා රස විඳියි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
- ඔබ රැස් කර ගත් ළමා කවි එකතුවෙන් එකින් එක කවි හෝ කවි පන්ති හෝ වරින් වර ඉදිරිපත් කරන්න.
  ඒවා හඬ නගා ගායනා කර, සිසුන් තුළ ද ඒවා ගැයීමට පෙළඹීමක් ඇති කරන්න.
- පුවත්පත්වල හා ළමා කවි පොත්වල පළ වෙන කවි රැස් කරන ලෙස සිසුන් යොමු කරන්න.
- සති අන්ත පුවත්පත්වල ළමා පිටුව හෝ ළමා පුවත්පත්වලින් හෝ මේවා තෝරා ගත හැකි ය.
- ඒවා සතියේ එක් දිනක පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කවි පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  ඉන් කියවෙන්නේ කුමක් ගැන ද?
  ඒ ගැන කියා ඇත්තේ මොනවා ද?
  ඒ කවිවල රසවත් බවක් ඇති වී ඇත්තේ කෙසේ ද? (උපමා, විශේෂ යෙදුම් ආදිය පිළිබඳ ව සාකච්ඡා කරන්න)

නිපුණතා මට්ටම
1.3.4.4 ළමා නාට්‍ය කියවා රස විඳියි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
✶ සිසුන්ට ගැළපෙන ළමා නාට්‍ය පොත් සපයා ගන්න.
✶ දෙබස් ආකාරයෙන් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
✶ රූකඩ වෙස් මුහුණු ආදේශ වාද්‍ය භාණ්ඩ යොදා ගනිමින් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරවන්න.
✶ මෙම ක්‍රියාකාරකම ස්ථාවර වැඩක් ලෙස නිරන්තරයෙන් ප්‍රගුණ කරන්න.
✶ පාසලේ ශිෂ්‍ය සමිති/නාට්‍ය තරග සඳහා ද ඉදිරිපත් කරවන්න.
✶ වාර අවසානයේ විවිධ ප්‍රසංගයක් සංවිධානය කරන්න.

නිපුණතාව
1.3.5 කියවීමේ පුරුද්ද ඇති කර ගනියි.

නිපුණතා මට්ටම
1.3.5.1 පොත් එකතු කර හුවමාරු කර ගෙන කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
✶ පන්ති පුස්තකාලයට/පොත් මල්ලට/කියවීම් ඒකකයට හැකි තරම් සිසුන්ගේ මට්ටමට ගැළපෙන පොත් එකතු කර ගන්න.
✶ විවේක කාලවල දී සිසුන්ට ඒවා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
✶ පොත් කියවූ පසු තමා කියවූ පොත් පිළිබඳ නාම ලේඛනයක් ලියා තබා ගැනීමට සිසුන් යොමු කරවන්න.
✶ නිවසේ දී ද මෙවැනි පුස්තකාලයක්/පොත් මල්ලක් පවත්වා ගැනීමට දෙමාපියන් දැනුවත් කරන්න.
✶ ප්‍රදේශයේ ඇති වෙනත් පුස්තකාලවලට සිසුන් සම්බන්ධ කරවීමට දෙමාපියන් දැනුවත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.3.5.2 ළමයින්ට සැකැසූ සරල ගද්‍ය, පද්‍ය නිර්මාණ කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
- ✶ සිසුන්ට සැකසූ සරල ගද්‍ය පද්‍ය නිර්මාණ එකතු කරන්න.
- ✶ මේ සඳහා ළමා සඟරා, ළමා පුවත් පත් සහ ළමා ගද්‍ය, පද්‍ය පොත් යොදා ගන්න.
- ✶ විවේක කාලවල දී සිසුන් මේවා කියවීමට යොමු කරවන්න.
- ✶ එවැනි ගද්‍ය පද්‍ය නිර්මාණ එකතුවක් තබා ගැනීමට සිසුන් පොළඹවන්න.
- ✶ මේ සම්බන්ධ ව දෙමාපියන් දැනුවත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.


## 1.4 ලිවීම

සාර්ථක ලිවීමක් සඳහා

1. ලිවීමේ ඉරියවු අනුගමනය කරන්න.



නිවැරදි ව අසුන්ගත වීම



පැන්සල නිවැරදි ව අල්ලා ගැනීම

2. පැන්සලේ දිග ප්‍රමාණය හා තුඩ පිළිබඳ සැලකිලිමත් වන්න.

3. අභ්‍යාස පොත නිවැරදි ව තබා ගැනීමට හුරු කරවන්න.

4. සාමාන්‍ය රූල් පොත භාවිත කරන්න.

5. අකුරක ප්‍රමාණය සාමාන්‍ය තනිරූල් පොතේ රූල් දෙක අතර ප්‍රමාණයෙන් ¾ වන සේ, ලිවීමට හුරු කරවන්න.

6. අකුරක ආරම්භය, ලියන නිවැරදි දිශාව හා අවසානය පිළිබඳ සැලකිලිමත් වන්න.

7. අකුරු අතර පරතරය හා වචන අතර පරතරය ගැන වඩාත් අවධානය යොමු කරන්න.


8. නිවැරදි අත් අකුරු ආදර්ශනයක් සකස් කර පන්ති කාමරය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.

9. පන්ති කළුලෑල්ලේ එක් කොටසක් රූල් ගසා අකුරු ආදර්ශන ඉදිරිපත් කරන්න.

10. නිවැරදි ව ලිවීම ප්‍රගුණ කිරීම සඳහා නිරන්තර අභ්‍යාසවල යොදවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මධ්‍ය අක්ෂර, අවරෝහණ අක්ෂර, ආරෝහණ අක්ෂර පිළිබඳ ව නිදසුන් සඳහා මෙම අකුරු ලියා ඇති ආකාරය අධ්‍යයනය කරන්න.






Copyright © 2007 National Institute of Education - Sri Lanka.


Copyright © 2007 National Institute of Education - Sri Lanka.


පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා අකුරු ලිවීම විකාශය වන ආකාරය


*පළමුවන ශ්‍රේණිය*
*රූල් නොමැති කඩදාසිය මත ලිවීම.*

















*රූලක් මත ලිවීම.*




*සැ. යු .*
*අකුරක ආරම්භය, ලියන නිවැරදි දිශාව හා අවසානය පිළිබඳ ව අවධානය යොමු කිරීම වැදගත් ය.*


## රූල් අතර ලිවීම

දෙවන ශ්‍රේණිය





තුන්වන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් ¾ කි.





හතරවන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් 2/3 කි.




පස්වන ශ්‍රේණිය

අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් 1/2කි.





Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.4.1 ලිවීමේ ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම
1.4.1.1 සිංහල හෝඩියේ අක්ෂරවල අංග, ප්‍රමාණය, හැඩය අනුව නිවැරදි ව ලියයි.


ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
මිශ්‍ර සිංහල හෝඩියේ අකුරු නිවැරදි ව ලියන ලද ආදර්ශන පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
බලා ලිවීමට විවිධ අවස්ථා ලබා දෙන්න.
සෑම සිසුවකුට ම තමාගේ අත් අකුරෙන් ලියූ දේ සතියකට වරක් බිත්ති පුවත් පතට යොමු කරවන්න. මේ සඳහා සිසුන්ගේ ම නිර්මාණ මෙන් ම උපුටා ගැනීම් ද යොදා ගන්න.
අකුරක ප්‍රමාණය මෙම රූල් දෙක අතර ප්‍රමාණයෙන් 2/3කි.




නිපුණතා මට්ටම
1.4.1.2 අකුරු හා වචන අතර පරතරය ගැන සැලකිලිමත් ව ලියයි.


ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
තුන්වන ශ්‍රේණිය අවසානයේ සිසුන් ලියූ පරිදි හැඩය, ප්‍රමාණය හා අංග රැකෙන සේ හතරවන ශ්‍රේණියද ලිවීමට බලාපොරොත්තු වේ. මේ සඳහා දී ඇති අකුරු ආදර්ශනය සැලකිල්ට ගන්න.
නිරන්තර වැඩක් ලෙස පෙළ පොතේ කොටසක් බලා ලිවීමට සිසුන් යොමු කරවන්න.
සිසුන් විසින් ලිවීමේ දී කරනු ලබන පහත සඳහන් දෝෂ අවම කිරීමට කටයුතු කරන්න.

* වචනයක අකුරු එකිනෙක ගැටෙන සේ ලිවීම.
* අසමතුලිත බවෙන් යුතු අකුරු ලිවීම.
* වචන අතර පරතරයක් නොමැති ව ලිවීම.
* පද වැරදි ලෙස බෙදා ලිවීම.


අකුරු එකිනෙක ගැටෙන සේ ලිවීම.


අසමතුලිත බවෙන් යුතු අකුරු ලිවීම.


පද නොබෙදීම.


වැරදි ලෙස පද බෙදීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.4.1.3 නැවතීමේ ලකුණ හා ප්‍රශ්නාර්ථය යොදා ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපය
ක්‍රියාකාරකම
කියවීමේ දී හඳුනා ගත් නැවතීමේ ලකුණ හා ප්‍රශ්නාර්ථ ලකුණ ලිවීමේ දී නිවැරදි ව භාවිත කිරීමට හුරුවක් ලබා දීම මෙහි දී අපේක්ෂා කෙරේ.
එමෙන් ම ලබා ගත් දැනුම එදිනෙදා කරන ලිවීම්වල දී සිසුන් භාවිත කරනවා දැයි සොයා බැලීමත් ගුරුවරයා අතින් හැම විට ම සිදු විය යුතු දෙයකි.

නැවතීමේ ලකුණ (.)
නැවතීමේ ලකුණ යෙදූ වැකි බලා ලිවීම තුළින් නියමිත තැනට නැවතීමේ ලකුණ යෙදීමට හුරු කරන්න.
දෙනු ලබන වැකිවලට නැවතීමේ ලකුණ යෙදීමේ ක්‍රියාකාරකම් හා ලිඛිත අභ්‍යාසවල යොදවන්න.
ඡේදයක නියමිත ස්ථානවලට නැවතීමේ ලකුණ යෙදීමේ ක්‍රියාකාරකම් ඉදිරිපත් කරන්න.

ප්‍රශ්නාර්ථ ලකුණ (?)
නැවතීමේ ලකුණ සඳහා දී ඇති පළමුවැනි ක්‍රමෝපාය මේ සඳහා ද යොදා ගත හැකි ය.
යහළුවකු සොයා ගන්න. ඔහුගෙන්/ඇයගෙන් ප්‍රශ්නයක් අසන්න. එය පොතේ ලියා ගන්න. ප්‍රශ්නාර්ථ ලකුණ යොදන්න. මෙම ක්‍රියාකාරකමේ යෙදෙමින් වෙනත් යහළුවන්ගෙන් ප්‍රශ්න අසා ලියා ගෙන, ප්‍රශ්නාර්ථ ලකුණු යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
නැවතීමේ හා ප්‍රශ්නාර්ථයේ ලකුණ බහුල ව යෙදී ඇති හතරවන ශ්‍රේණියේ පෙළ පොත්වල කොටසක් තෝරා ගන්න. එය ගුරුවරයා කියවන විට එම විරාම ලකුණු දෙක නිවැරදි ව යෙදීමට සලස්වා පසුව පොත් බලා තමාට ම නිවැරදි කර ගැනීමට යොමු කරවන්න.
අනිකුත් විෂයයන්වල ලිවීමේ අවස්ථාවල දී ද නැවතීමේ ලකුණ හා ප්‍රශ්නාර්ථ ලකුණ යෙදීම කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
ගුරුවරයාගේ අවධානය ද විශේෂයෙන් මේ කෙරේ යොමු විය යුතු ය.

නිපුණතා මට්ටම
1.4.1.4 අර්ථය සඳහා අවශ්‍ය අකුරු හා පිලි යොදා වාක්‍ය ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
අදාළ අක්ෂරය යොදා අර්ථවත් වචන ලිවීමේ හැකියාවත් එවැනි වචන යොදා අර්ථවත් වැකි ගොඩ නැගීමේ හැකියාවත් ලබා දීම මෙහි දී අපේක්ෂා කෙරේ.
උදාහරණ :-
විවිධ පිල්ලම් සහිත අකුරු යොදා වාක්‍ය නිර්මාණය කිරීම මේ සඳහා පෙළ පොතේ පාඩම් යොදා ගන්න.
1. අඩු අකුර පිරවීම
2. වචන යොදා හිස්තැන් පිරවීම
3. පිල්ලම යොදා නැවත ලිවීම
4. ප්‍රහේලිකා සම්පූර්ණ කිරීම වැනි ක්‍රියාකාරකම්වල යොදවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.4.1.5 උපුටා ගෙන නිවැරදි ව ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
මෙහි දී අදහස් කරන්නේ යම් මුද්‍රිත කෘතියක අඩංගු කොටසක් එපරිද්දෙන් ම ලිවීම යි. කෘතියේ නම, කතුරවරයාගේ නම හා පිටු අංකය සඳහන් කිරීමට හුරු කිරීම වැදගත් ය. කවියක් උපුටා ලියන විට එහි සිව්පද එක ම සීමාවකින් අවසන් වන ආකාරය කෙරෙහි ද සිසුන්ගේ අවධානය යොමු කරන්න. පොත්වලින් ගත් කොටස් උපුටා ලිවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
කොටසක් උපුටා ගැනීමේ දී සහළ උඩු කොමා ( " " ) යෙදිය යුතු බවත් උපුටා ගත් පොතේ නම සහ කර්තෘගේ නම සඳහන් කළ යුතු බවත් සිසුන් දැනුවත් කරන්න.
උපුටා ගන්නා ලද කොටසේ මෙවැනි යෙදීම් ඇතුළත් කිරීමේ වැදගත්කම සිසුන්ට පැහැදිලි කර දෙන්න.
උදාහරණ :-

සභාව බලන්නට එන්නවුන්ගෙන් සභා භූමිය අවට දැන් පිරී ගෙන එයි. සතර දිශාවෙන් සභාවට පැමිණෙන්න වුනට මග තබා, හාත්පස සෙසු ඉඩ සභා බලන්නවුනට හැරිණ. තරුණ මහීෂ භටය අට දෙනෙක් පිරිස් හසුරුවති, ඔවුනොවුන් අතර කෝලාහල ඇති නොවන පරිද්දෙන් එක් තැන් වන්නට සුදුස්සවුන් ම එක් තැන් වන සේ පිරිස් විධාන කිරීම මහිෂ භටයන් විසින් කරන ලද්දේ ය.
(හීන් සැරය - කුමාරතුංග මුනිදාස)

ගොඩ මඩ දෙක ම සරුසාර ය පල බරය
කටුරොද ගම්මාන තරමක පිටි සරය
ඒ ගම මැදින් ගලනා ගඟ මන හරය
කඩ මණ්ඩිය පිහිටියේ ගම කෙළ වරය
(සුදෝ සුදු - කේයස්)

නිපුණතා මට්ටම
1.4.1.6 පවසන දේ අසා නිවැරදි ව ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
මෙය පන්තියේ දී අසා ලිවීම සඳහා වචන, වාක්‍යාංශ, වැකි, ඡේද හා සරල පද්‍ය ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. වචන, වැකි, ඡේද හා පද්‍ය ඉදිරිපත් කරන විට නිවැරදි ව උච්චාරණය කරමින් සිසුන්ට ලියා ගැනීමට ප්‍රමාණවත් කාලයක් දෙමින් ඉදිරිපත් කරන්න. එසේ ම සරල බවේ සිට සංකීර්ණ බව දක්වා පෙළ ගැස්වීමක් වර්ෂය පුරා ඉදිරිපත් කිරීමත් සිදු විය යුතු ය.
පවසන දේ අසා ලිවීමේ දී
- අක්ෂරවල ප්‍රමාණය
- විරාම ලකුණ
- අක්ෂර හා වචන අතර පරතරය
- නිවැරදි පිල්ලම් යෙදීම
- නිවැරදි අකුරු යෙදීම

කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
1.4.2 අවශ්‍යතා සඳහා ලියයි.

නිපුණතා මට්ටම
1.4.2.1 පෞද්ගලික ලිපි ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
ලිපියක ආකෘතිය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
ඒ පිළිබඳ සාකච්ඡා කරන්න. නිවැරදි ලෙස ලියූ සැබෑ ලිපි කියවීමට අවස්ථාව දෙන්න. මෙවැනි ලිපි ලිවීමට ද සිසුන් යොමු කරන්න.
ඥාතියකුට හෝ මිතුරකුට හෝ ලිපියක් ලියා තැපැල් කරවීමට සිසුන් යොමු කරන්න. (ප්‍රායෝගික ක්‍රියාකාරකමකි)
උදාහරණ :-

යවන්නාගේ ලිපිනය
ලියන දිනය
ආශිර්වාදය
ආමන්ත්‍රණය
අඩංගුවන කරුණු
අවසානය

පහත දැක්වෙන ලිපිය සිසුන්ට පිටපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

සඳරුවන් පෙරේරා,
අංක 71,
පන්සල පාර,
ගම්පහ.
2000 .07. 12.

ජයවේවා !

ආදරණීය සුසන්ත මල්ලී,

ඔබේ තොරතුරු කෙසේ ද? සුවයෙන් ඇතැයි මම සිතමි. අපේ පාසල් නිවාඩුවත් අත ළඟ ම නේ ද? නිවාඩුව ගත කිරීමට අපේ නිවසට ඔබ පැමිණෙන්නේ නම් ඉතා සතුට වෙමි. එවිට අපට වෙල්යායේ සරුංගල් යැවීමට හැකිවේවි. මේ දිනවල පල බර වී ඇති රඹුටන්, දුරියන්වල රස බැලීමටත් ඔබට හැකි වේවි.

ඔබෙන් පිළිතුරක් එනතුරු මම බලා සිටිමි. මාමාත් නැන්දාත් ආදරයෙන් මතක් කරමි.

මෙයට,
ආදරණීය අයියා
සඳරුවන්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම

1.4.2.2 ආකෘති පත්‍රයක් ඇසුරෙන් පෞද්ගලික තොරතුරු සපයයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

සිසුන්ගේ පෞද්ගලික තොරතුරු ඇතුළු කර ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

ආකෘති පත්‍රයක ආදර්ශනයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

සිසුන් ලවා මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කරවන්න.

විවිධ වර්ගයේ හා විවිධ ආයතනවල ආකෘති පත්‍ර ගොනුවක් තබා ගන්න.

උදාහරණ :-

ආකෘති පත්‍රය

1. ළමයාගේ සම්පූර්ණ නම :- ..............................................................................................
2. වයස :- ..............................................................................................
3. ඉගෙනුම ලබන පාසල :- ..............................................................................................
4. මවගේ නම :- ..............................................................................................
5. පියාගේ නම :- ..............................................................................................
6. සහෝදර සහෝදරියන් ගණන :- ..............................................................................................

උදාහරණ :-

ආකෘති පත්‍රය

වාසගම සහිත සම්පූර්ණ නම : ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

ලිපිනය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී : ☐ පුරුෂ : ☐ (අදාළ කොටුව තුළ x ලකුණ යොදන්න)

ආගම : බෞද්ධ ☐ කතෝලික ☐ හින්දු ☐ ඉස්ලාම් ☐ (අදාළ කොටුව තුළ x ලකුණ යොදන්න)

ඉගෙන ගන්නා පාසල : ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

අවසන් වරට සමත්වූ ශ්‍රේණිය : ☐☐

පියා/මව/භාරකරුගේ නම : ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

පදිංචි ස්ථානයේ සිට පසලට ඇති දුර : 03km දක්වා ☐ 03km-07km ☐ 07km ට වැඩි ☐

(අදාළ කොටුව තුළ x ලකුණ යොදන්න)

ශිෂ්‍යයාගේ අත්සන ............................

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.4.2.3 විදුලි පුවතක් මගින් පණිවිඩයක් යවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
විදුලි පණිවිඩයක අවශ්‍යතාව පහදා දෙන්න.
විදුලි පණිවිඩ පෝරමය හොඳින් කියවීමට සලස්වන්න.
ගුරු උපදෙස් ඇති ව පෝරමයක් පිරවීමට අවස්ථාව ලබා දෙන්න.
පෝරමයක් පුරවා යහළු යෙහෙළියන්ට විදුලි පණිවිඩයක් යැවීමේ ක්‍රියාකාරකම් කරවන්න.
දුර සිටින ඥාතියකුට හදිසි පණිවිඩයක් යැවීම සඳහා පෝරමයක් පිරවීමට අවස්ථාව ලබා දෙන්න.

නිපුණතාව
1.4.3 නිර්මාණාත්මක ව ලියයි.

නිපුණතා මට්ටම
1.4.3.1 දෙබස් නිර්මාණය කර ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
දෙබස් වාක්‍ය වශයෙන් ලිවීමට පෙර ඒවා වාචික ව ප්‍රකාශ කිරීමට සිසුන් පොළඹා ගැනීම වඩාත් සුදුසුය. එසේ කිරීමෙන් යම් චරිතයක් ප්‍රකාශ කරන දේවල් තම චින්තනය මෙහෙයවා නිර්මාණය කර ගැනීමට සිසුන්ට ඉඩකඩ ලැබෙනු ඇත. මේ සඳහා විවිධ වර්ගයේ රූකඩ, පින්තූර ආදිය උදවු කර ගන්න. පින්තූරයක ඇති චරිතවලට ආරූඪ වී දෙබස් නිර්මාණය කරන ඒවා ලියා දක්වන්න.

චරිත කීපයක් දැක්වෙන දර්ශනීය පින්තූරයක් තෝරා ගන්න.
සිසුන් දෙදෙනෙක් එහි යම් චරිත දෙකක් ලෙස නම් කරන්න.
එම චරිත දෙක ලෙස සංවාදයේ යෙදීමට සිසුන් යොමු කරන්න.
පසුව ඒවා ලියා ගැනීමට යොමු කරන්න.

කතන්දරයක් අසා සිට එහි චරිත දෙකක් අතර ඇති වන දෙබසක් ගොඩ නගා ලිවීමට යොමු කරවන්න.
පෙළ පොතේ සඳහන් කතා ද මේ සඳහා යොදා ගන්න.
දෙබස් නිර්මාණය කළ හැකි කවි/ගී ඇසුරෙන් ද දෙබස් නිර්මාණය කරවීමට සිසුන් යොමු කරවන්න.
උදාහරණ :-

* සුරතල් නංගියෙ අපෙ අම්මා
* අකුරට යනවයි කියලා ටිකිරි අයියා බැඳිවලම යි
* මොනවද අම්මේ අකුරු ජාතියක්
* මොනවද මුත්තේ මොකද කරන්නේ
* සුළඟක් වී මං එන්නම්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම

1.4.3.2 රචනා නිර්මාණය කර ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

තුන්වන ශ්‍රේණිය අවසන් වන තෙක් සිසුන් යොමු කර ඇත්තේ අදහස් වාක්‍ය වශයෙන් ලිවීමට යි. වාක්‍ය කීපයක් ඇතුළත් විස්තරයක්, ඡේදයක් හෝ ඡේද කීපයක් ලිවීමේ නිපුණතාව ලබා දීම මෙම වසරේ දී අපේක්ෂා කෙරේ.

මේ සඳහා,

- ✶ යම් මාතෘකාවකට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරවන්න.
- ✶ එම කරුණු අනුපිළිවෙළට පෙළ ගස්වන්න.
- ✶ නිවැරදි ලෙස වාක්‍ය ගළපා ලේඛන වහරින් ලිවීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ✶ නිවැරදි අක්ෂර, අකුරු හා වචන අතර පරතරය, විරාම ලක්ෂණ හා නිවැරදි පිළි භාවිතය කෙරේ අවධානය යොමු කරන්න.
- ✶ කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස හෝ තනි තනි ක්‍රියකාරකමක් ලෙස හෝ කරවන්න.
- ✶ තෝරා ගත් සිසු නිර්මාණ බිත්ති පුවත් පතේ ප්‍රදර්ශනය කරන්න.
- ✶ රචනා නිර්මාණ එකතු කර සහරාවක් එළි දක්වන්න.
- ✶ මෙය නිරන්තර හා ස්ථාවර වැඩක් ලෙස පවත්වා ගෙන යන්න.

නිපුණතා මට්ටම

1.4.3.3 චිත්‍ර හෝ සිදුවීම් ඇසුරෙන් සරල කතා නිර්මාණය කර ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

චිත්‍ර කීපයක් උදවු කර ගනිමින් කතාවක් නිර්මාණය කර ලිවීම සඳහා පහත සඳහන් චිත්‍ර සිසුන් වෙත පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

උදාහරණ :-
- ➤ කුරුලු කූඩුවක් සෑදීම.
- ➤ සර්පයෙක් කූඩුවට ළංවීම.
- ➤ කුරුලු අම්මාගේ කෑ ගැසීම.
- ➤ ළමයි පිරිසක් එතැනට පැමිණීම.

මෙතැන් සිට කතාව ඉදිරියට ගොඩ නගා ලිවීම සඳහා සිසුන් ව යොමු කරන්න.

සිදුවීම් කීපයක් ඇතුළත් පද්‍ය පන්තියකට සවන් දී කතාවක් නිර්මාණය කර ලිවීම සඳහා පහත සඳහන් පද්‍ය පන්තිය ලියා සිසුන් වෙත ඉදිරිපත් කරන්න.

උදාහරණ :-

දවසක් කොටියකු කැලේ
ඇවිදින විට කල බලේ
වතුර සිඳුණු පාළු ළිඳක
ඇද ගෙන වැටුණා

ළිඳ ඇතුළේ බොහො වෙලා
සිටිනා කල උඩ බලා
ගමයකු එතැනින් යනවා
කොටියා දැකලා

යහළුවෙ යහළුවෙ කියා
කෑ ගැසුවා කට අයා
ගමයා ඒ හඟ අසමින්
ළිඳ වෙත ආවා

(කේ. පී. පෙරේරා)

මෙතැන් සිට කතාවේ ඉතිරි කොටස නිර්මාණය කර ලිවීමට සිසුන්ව යොමු කරවන්න.

සිසුන්ගේ නිර්මාණවල වැරදි ඇත්නම් ඒවා නිවැරදි කරන්න.

මෙවැනි ක්‍රියකාරකම් නිරන්තර වැඩක් ලෙස පවත්වා ගෙන යන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතා මට්ටම
1.4.3.4 සරල කවි නිර්මාණය කර ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
- ✶ පින්තූරයක් හෝ සැබෑ වස්තුවක් හෝ දෙස බලා සිසුන් සමඟ කවි නිර්මාණය කරන්න.
- ✶ එය ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ✶ සිසුන් කණ්ඩායම් කර එක් එක් කණ්ඩායමට චිත්‍ර, සිදුවීම්වලට අදාළ, මතෘකා බෙදා දී ඒ අනුව කවි නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.

එම නිර්මාණ ගුරුවරයා විසින් වැරදි නිවැරදි කිරීමෙන් අනතුරු ව බිත්ති පුවත් පතේ සඟරාවකට යොමු කරවන්න.
උසස් මට්ටමේ නිර්මාණ, ළමා පුවත් පත්, ජාතික මට්ටමේ පුවත් පත්වල ළමා පිටු, සඟරා, විවිධ තරග සඳහා ඉදිරිපත් කරවන්න.

නිපුණතාව
1.4.4 නිවැරදි ලේඛන වහරට යොමු වෙයි.

නිපුණතා මට්ටම
1.4.4.1 නිවැරදි වාක්‍ය රටා (උක්ත රූපී වාක්‍ය)

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
ලේඛන වහරින් ලිවීමට සිසුන්ට හුරුවක් ලබා දීම අරඹන ලද්දේ තුන්වන ශ්‍රේණියේ දී ය. මෙහි දී කාලය පිළිබඳ සටහන් කොට නොතිබුණ ද ආඛ්‍යාතය නිවැරදි ව ලිවීමට කාල භේදය ගැන යම් අදහසක් සිසුන් තුළ තිබිය යුතු ය. ඒ සඳහා වාක්‍ය රටා සියල්ලම වර්තමාන කාලයෙන් ඇරඹීම සුදුසු ය.
වර්තමාන කාලය පිළිබඳ සිසුන්ට තහවුරු වූ පසු එම වාක්‍ය රටා අතීත කාලයෙන් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
උදාහරණ :-

1. උක්තය මම යෙදෙන වාක්‍ය (වර්තමාන කාලය)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| මම ගමට යනවා. | මම ගමට යමි. |
| මම සෙල්ලම් කරනවා. | මම සෙල්ලම් කරමි. |

2. උක්තය අපි යෙදෙන වාක්‍ය (වර්තමාන කාලය)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| අපි සරුංගල් යවනවා | අපි සරුංගල් යවමු |
| අපි ගී ගයනවා | අපි ගී ගයමු |

1. උක්තය මම යෙදෙන වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| මම ගමට ගියා. | මම ගමට ගියෙමි. |
| මම සෙල්ලම් කළා. | මම සෙල්ලම් කළෙමි. |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

2. උක්තය අපි යෙදෙන වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| අපි සරුංගල් යැවුවා. | අපි සරුංගල් යැව්වෙමු. |
| අපි ගී ගැයුවා. | අපි ගී ගැයුවෙමු. |

1. උක්තය ඔහු යෙදෙන වාක්‍ය (වර්තමාන කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| ඔහු ඔරු පදිනවා. | ඔහු ඔරු පදියි. |
| ඔහු වැඩ කරනවා. | ඔහු වැඩ කරයි. |

2. උක්තය ඈ යෙදෙන වාක්‍ය (වර්තමාන කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| ඈ මල් නෙළනවා. | ඈ මල් නෙළයි. |
| ඈ ගවුම මසනවා. | ඈ ගවුම මසයි. |

1. උක්තය ඔහු යෙදෙන වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| ඔහු ඔරු පැද්දා. | ඔහු ඔරු පැද්දේ ය. |
| ඔහු වැඩ කළා. | ඔහු වැඩ කළේ ය. |

2. උක්තය ඈ යෙදෙන වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| ඈ මල් නෙළුවා. | ඈ මල් නෙළුවා ය. |
| ඈ ගවුම මැසුවා. | ඈ ගවුම මැසුවා ය. |

ප්‍රාණවාචී ඒක වචන පුරුෂ ලිංග නාම පද උක්තය සඳහා යෙදුණු වාක්‍ය (වර්තමාන කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| තාත්තා පොළට යනවා. | තාත්තා පොළට යයි. |
| බල්ලා සඳට බුරනවා. | බල්ලා සඳට බුරයි. |

ප්‍රාණවාචී ඒක වචන පුරුෂ ලිංග නාම පද උක්තය සඳහා යෙදුණු වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| තාත්තා පොළට ගියා. | තාත්තා පොළට ගියේ ය. |
| බල්ලා සඳට බිරුවා. | බල්ලා සඳට බිරුවේ ය. |

1. ප්‍රාණවාචී බහු වචන පුරුෂ ලිංග නාම පද උක්තය සඳහා යෙදෙන වාක්‍ය (වර්තමාන කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| ගොවියෝ කුඹුරු කොටනවා. | ගොවියෝ කුඹුරු කොටති. |
| අශ්වයෝ වේගයෙන් දුවනවා. | අශ්වයෝ වේගයෙන් දුවති. |

2. ප්‍රාණවාචී බහු වචන පුරුෂ ලිංග නාම පද උක්තය සඳහා යෙදෙන වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| ගොවියෝ කුඹුරු කෙටුවා. | ගොවියෝ කුඹුරු කෙටූහ/කෙටුවෝ ය. |
| අශ්වයෝ වේගයෙන් දිවුවා. | අශ්වයෝ වේගයෙන් දිවූහ/දිවුවෝ ය. |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

1. ප්‍රාණවාචී එක වචන ස්ත්‍රී ලිංග නාම පද උක්තය සඳහා යෙදෙන වාක්‍ය (වර්තමාන කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| නංගී ගී ගයනවා. | නංගී ගී ගයයි. |
| කිරිල්ලී කෑම සොයනවා. | කිරිල්ලී කෑම සොයයි. |

2. ප්‍රාණවාචී ඒක වචන ස්ත්‍රී ලිංග නාම පද උක්තය සඳහා යෙදෙන වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| නංගී ගී ගැයුවා. | නංගී ගී ගැයුවා ය. |
| කිරිල්ලී කෑම සෙවුවා. | කිරිල්ලී කෑම සෙවුවා ය. |

1. ප්‍රාණවාචී බහු වචන ස්ත්‍රී ලිංග නාම පද උක්තය සඳහා යෙදෙන වාක්‍ය (වර්තමාන කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| කාන්තාවෝ මල් නෙළනවා. | කාන්තාවෝ මල් නෙළති. |
| එළදෙන්නු තණ කොළ කනවා. | එළදෙන්නු තණ කොළ කති. |

2. ප්‍රාණවාචී බහු වචන ස්ත්‍රී ලිංග නාම පද උක්තය සඳහා යෙදෙන වාක්‍ය (අතීත කාල)

| කථිත බස | ලිඛිත බස |
|---|---|
| කාන්තාවෝ මල් නෙළුවා. | කාන්තාවෝ මල් නෙළුවෝ ය/නෙළූහ. |
| එළදෙන්නු තණ කොළ කෑවා | එළදෙන්නු තණ කෙළ කෑවෝ ය. /කෑහ. |

- ★ මෙවැනි වෙනත් වාක්‍ය මේ සඳහා යොදා ගන්න.
- ★ පෙළ පොතේ පාඩම්වල වාක්‍ය ද යොදා ගන්න.
- ★ මෙම වාක්‍ය රටා ආදර්ශන කීපයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

නිපුණතා මට්ටම

1.4.4.2 අක්ෂර වින්‍යාසයේ රටා අනුව ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම

භාවිතයේ යෙදෙන මහාප්‍රාණ අක්ෂර සහිත වචන එකතුවක් තබා ගන්න.

සිසුන් මේ ඇසුරෙන් පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල සිසුන් යොමු කරවන්න.

උදාහරණ

මහප්‍රාණ අක්ෂර සහිත වාක්‍ය ලිවීමේ ක්‍රියාකාරකම්

* නිවැරදි මහාප්‍රාණ අක්ෂර තේරීමේ ක්‍රියාකාරකම්
* හිස්තැන් පිරවීමේ ක්‍රියාකාරකම්
* පෙළ පොතේ මහාප්‍රාණ අක්ෂර සොයා ලිවීමේ ක්‍රියාකාරකම්

මෙම ක්‍රියාකාරකම් නිරන්තර වැඩක් ලෙස පද පොතෙහි ලිවීමට සිසුන් යොමු කරවන්න.

උදාහරණ

න, ණ, ල, ළ, යෙදුණු වචන සහිත වාක්‍ය ලිවීමේ ක්‍රියාකාරකම්

* අඩු අකුරු පිරවීමේ ක්‍රියාකාරකම්
* න, ණ, ල, ළ යෙදුණු වචන යොදා හිස්තැන් පිරවීමේ ක්‍රියාකාරකම්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ

ස, ශ, ෂ යෙදුණු වක්‍ය ලිවීමේ ක්‍රියාකාරකම්

* නිවැරදි ස, ශ, ෂ අකුර/අකුරු යෙදීමේ ක්‍රියාකාරකම්
* හිස්තැන් පිරවීමේ ක්‍රියාකාරකම්
* ප්‍රහේලිකා සම්පූර්ණ කිරීමේ ක්‍රියාකාරකම්
* පෙළ පොතින් එවැනි වචන සොයා ලිවීමේ ක්‍රියාකාරකම්

මෙම නිපුණතාව ලබා දීම සඳහා පෙළ පොත, වෙනත් පොත් ආශ්‍රිත ව වචන එකතුවක් තබා ගැනීමට සිසුන් යොමු කරවන්න. එම වචන පද පොතට ඇතුළත් කරන්න.
මෙය නිරන්තර වැඩක් ලෙස කරවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

**තක්සේරු කිරීමේ පරිමාණය**

සාර්ථක ව කරයි ✓

දුෂ්කරතා පෙන්නුම් කරයි/ නව දුරටත් උදවු අවශ්‍යයි •

| සිසුන්ගේ නම් | | | |
|---|---|---|---|
| 1. නිවේදනයකට සවන් දී වැදගත් කරුණු ප්‍රකාශ කරයි. | | | |
| 2. කතන්දරයක් හෝ සිදුවීමක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි. | | | |
| 3. සිදුවීමක කොටසකට සවන් දී ඉන් පසු වන දේ උපකල්පනය කර ප්‍රකාශ කරයි. | | | |
| 4. කතන්දරයක් කියයි. | | | |
| 5. කවි/ගී තාලානුකූල ව මතකයෙන් ගායනා කරයි. | | | |
| 6. තමා පවසන දේ අන්‍යයන්ට වැටහෙන සේ නිරවුල් ව කතා කරයි. | | | |
| 7. ලබා ගත් පණිවිඩයක් අදාළ තැනැත්තාට නිවැරදි ව පවසා ලබා ගත් පිළිතුරු නිවැරදි ව ප්‍රකාශ කරයි. | | | |
| 8. පෙළ පොතෙන් ඉදිරිපත් කරනු ලබන කොටසක් නිවැරදි ව උච්චාරණය කරමින් විරාම ලක්ෂණවලට අවනත ව කියවයි. | | | |
| 9. පෙළ පොතෙන් උපුටාගත් ඡේදයක් කියවා, එයින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. | | | |
| 10. සරල කවි කියවා අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. | | | |
| 11. එදිනෙදා ජීවිතයේ දී බහුල ව දක්නට ලැබෙන සන්නිවේදන සලකුණු පහක් කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. | | | |
| 12. ආරාධනා පත්, දැන්වීම් කියවා, එහි ඇති වැදගත් කරුණු අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි. | | | |
| 13. දෙන ලද වචනවලට සමානාර්ථ පද ප්‍රකාශ කරයි. | | | |
| 14. දෙන ලද වචනවලට විරුද්ධාර්ථ පද ප්‍රකාශ කරයි. | | | |
| 15. පුවත්පතකින් සරල ලිපියක් කියවා එහි ඇති වැදගත් කරුණු ප්‍රකාශ කරයි. | | | |
| 16. සරල වැකි අසා ලියයි. | | | |
| 17. අකුරු හා වචන අතර නිවැරදි පරතරය ඇති ව ලියයි. | | | |
| 18. අක්ෂරවල නියමිත අංග, ප්‍රමාණය හා හැඩය අනුව සරල ඡේද ලියයි. | | | |
| 19. තමාගේ තොරතුරු දැක්වෙන පරිදි ආකෘති පත්‍රයක් සම්පූර්ණ කරයි. | | | |
| 20. යහළුවකුට/නෑයකුට තම තොරතුරු දන්වා ලිපියක් ලියයි. | | | |
| 21. දෙන ලද මාතෘකාවකට අනුව රචනයක් ලියයි. | | | |
| 22. උක්තය සඳහා මම/අපි යෙදුණු වාක්‍ය, උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ලියයි. | | | |
| 23. උක්තය සඳහා ඔහු/ඇ යෙදුණු වාක්‍ය, උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ලියයි. | | | |
| 24. උක්තය සඳහා ප්‍රාණවාචී ඒක/බහු පුරුෂ ලිංග නාම යෙදෙන වැකි, උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ලියයි. | | | |
| 25. උක්තය සඳහා ප්‍රාණවාචී ඒක/බහු ස්ත්‍රී ලිංග නාම යෙදෙන වැකි, උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව ලියයි. | | | |

## 2.0 පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තේමා

## 2.1 පැළෑටි හා ගස්වැල්

නිපුණතා
★ පැළෑටි වැඩීම සඳහා විවිධ සාධක බලපාන ආකාරය වාර්තා කරයි.
★ ශාකයක ප්‍රධාන කොටසක් ලෙස මල් හඳුනාගෙන ඒවායින් ලැබෙන ප්‍රයෝජන අගය කරයි.
★ ශාක හා සතුන් අතර ඇති සම්බන්ධය හඳුනා ගනිමින් වාර්තා කරයි.
★ ඖෂධීය වටිනාකමක් සහිත ශාක සංරක්ෂණයට දායක වෙයි.
★ ශාක කොටස් ඇසුරින් විවිධ නිර්මාණ කරයි.
★ ශාකවල වටිනාකම මතු වන පණිවිඩ රැගත් ගායන හා රංගනවල නිරත වෙයි.
★ ගස්වැල් හා සම්බන්ධිත නිර්මාණාත්මක ක්‍රීඩාවල වින්දනාත්මක ව නියැලෙයි.

අන්තර්ගතය
✓ ශාකයක වැඩීමට බලපාන සාධක
✓ ශාකයක ප්‍රධාන කොටස්
✓ ශාක හා සතුන් අතර ඇති සම්බන්ධය
✓ ඖෂධීය වටිනාකමක් සහිත ශාක සංරක්ෂණය
✓ ශාක කොටස් ඇසුරින් කළ හැකි නිර්මාණ
✓ ශාකවල වටිනාකම මතු කෙරෙන ගායන හා රංගන
✓ ගස්වැල් ආශ්‍රිත නිර්මාණාත්මක ක්‍රීඩා

## 2.2 අප අවට සතුන්

නිපුණතා
★ ආසන්න පරිසරයේ වෙසෙන සතුන් පිළිබඳ තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
★ සතුන්ගේ ස්වභාවික ලක්ෂණ හා විශේෂ හැකියා පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ සතුන්ගෙන් ඇති විය හැකි රෝග පිළිබඳ ව දැනුවත් වෙමින් ඒවායින් ආරක්ෂාවීමට ක්‍රියා කරයි.
★ විවිධ මාධ්‍ය භාවිත කරමින් සතුන් පිළිබඳ නිර්මාණ ඉදිරිපත් කරයි.
★ සත්ත්ව චරිත නිරූපණය කරමින් ගායනා රංගනවල නිරත වෙයි.
★ සතුන් ද පරිසරයේ කොටසක් ලෙස පිළිගනිමින් සතුන් ආරක්ෂා කර ගැනීමට දායක වෙයි.
★ සත්ත්ව චර්යා නිරූපණය කෙරෙන ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය
✓ ආසන්න පරිසරයේ වෙසෙන සතුන් පිළිබඳ තොරතුරු
✓ සතුන්ගේ සුවිශේෂී ලක්ෂණ හා හැකියා
✓ සතුන්ගෙන් ඇති විය හැකි රෝග හා ඒවායින් වැලකිය හැකි ක්‍රම
✓ විවිධ මාධ්‍ය භාවිතයෙන් සත්ත්ව නිර්මාණ
✓ සත්ත්ව චරිත නිරූපණය කෙරෙන ගායන හා රංගන
✓ සත්ත්ව චරිත නිරූපණය කෙරෙන විනෝදාත්මක ක්‍රීඩා

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.3 අප පරිහරණය කරන දේ

නිපුණතා

★ එදිනෙදා පරිහරණයේ දී භාණ්ඩ හා උපකරණවල පවිත්‍රතාවය හා නිසි නඩත්තුව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කටයුතු කරයි.
★ තම සමීප පරිසරයේ විවිධ රැකියාවල නියුතුවන්නන් භාවිත කරන උපකරණ පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ එදිනෙදා භාවිත කරන උපකරණ කිහිපයක් නිවැරදි ව පරිහරණය කරයි.
★ පරිසරයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය ආශ්‍රයෙන් නිවසේ/පාසලේ පරිහරණයට සුදුසු භාණ්ඩයක් නිර්මාණය කරයි.
★ පරිසරයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද වාද්‍ය භාණ්ඩ භාවිත කරමින් සාමූහික වාදන ගායන සහ නර්තනවල නියැලෙයි.
★ එදිනෙදා භාවිතය සඳහා ගත හැකි සෑම අවස්ථාවකම දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ හා උපකරණ තෝරා ගනියි.
★ දේශීය ද්‍රව්‍ය භාවිත කරමින් සකස් කෙරෙන උපකරණ ඇසුරින් ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ භාණ්ඩ හා උපකරණවල නිසි නඩත්තුව හා පවිත්‍රතාව
✓ විවිධ රැකියා හා ඔවුන් භාවිත කරන උපකරණ පිළිබඳ තොරතුරු
✓ එදිනෙදා භාවිත කරන උපකරණ නිවැරදි පරිහරණය
✓ පරිසරයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය භාවිත කරමින් භාණ්ඩ නිර්මාණය
✓ තමා නිර්මාණය කර ගන්නා ලද භාණ්ඩ භාවිත කරමින් කරන ගායන, වාදන, රංගන
✓ එදිනෙදා භාවිතය සඳහා ගන්නා දේශීය භාණ්ඩ හා උපකරණ

## 2.4 අපේ ආහාර

නිපුණතා

★ මිශ්‍ර ආහාර වේලක ඇති වැදගත්කම හඳුනාගෙන හැකි සෑම විටම මිශ්‍ර ආහාර වේලක් ගැනීමට පෙළඹෙයි.
★ ආහාර අපිරිසිදු වන විවිධ ක්‍රම පිළිබඳ ව සොයා බලා ආහාර පවිත්‍රව තබා ගැනීමට ක්‍රියා කරයි.
★ අනාරක්ෂිත ආහාරවලින් තමාට මෙන් ම අන් අයට ද වැළඳිය හැකි රෝගාබාධ වැළැක්වීම සඳහා දායක වෙයි.
★ තම ආසන්න පරිසරයෙන් සපයා ගත හැකි දෑ ඇසුරින් ආහාරයක් පිළියෙල කර පිළිගන්වයි.
★ අපේ වර්ධනය සඳහා ආහාර ගැනීමේ ඇති වැදගත්කම මතු වන විවිධ නිර්මාණ කරයි.
★ ආහාර වර්ග හා ඒවායේ ගුණාංග මතු වන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
★ ආහාරවල නම් සඳහන් කරමින් නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ මිශ්‍ර ආහාර වේලක ඇති වැදගත්කම
✓ ආහාර අපිරිසිදුවන ක්‍රම හා පවිත්‍රව තබා ගැනීම
✓ අනාරක්ෂිත ආහාරවලින් වැළඳිය හැකි රෝගාබාධ හා ඒවායින් වැලකිය හැකි ක්‍රම
✓ ආසන්න පරිසරයෙන් සපයා ගත හැකි දෑ ඇසුරින් ආහාරයක් පිළියෙල කිරීම
✓ වර්ධනය සඳහා ආහාර ගැනීමේ වැදගත්කම මතුවන නිර්මාණ
✓ ආහාරවල නම් සඳහන් නිර්මාණාත්මක ක්‍රීඩා
✓ ආහාර වර්ග හා ඒවායේ ගුණාංග මතු වන කවි, ගී, ගායන හා රංගන

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.5 අපි ලක්වැසියෝ

නිපුණතා

★ ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යයෙන් පිරි රටක් ලෙස අගය කරයි.
★ ලක් වැසියන්ගේ අනන්‍යතාව පිළිබිඹු වන ලක්ෂණ හඳුනාගෙන වාර්තා කරයි.
★ ශ්‍රී ලාංකික ජන කොටස් අතර මිත්‍රශීලී ආකල්ප ගොඩ නැගෙන අයුරින් ක්‍රියා කරයි.
★ ජාතික කොඩිය පිළිබඳ තොරතුරු විමසා බලා වාර්තා කරයි.
★ දේශාභිමානී කවි, ගී, කතන්දර හා රංගන ඉදිරිපත් කරයි.
★ ශ්‍රී ලාංකිකයන්ට අනන්‍ය වූ ක්‍රීඩාවල වින්දනාත්මකව නිරත වෙයි.
★ දේශීය ද්‍රව්‍ය උපයෝගී කර ගෙන කළ හැකි නිර්මාණ කරයි.

අන්තර්ගතය

✓ ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යයෙන් පිරි රටක් බව
✓ ලක්වැසියන්ට අනන්‍ය වූ ලක්ෂණ
✓ ජන කොටස් අතර ගොඩනැංවිය යුතු මිත්‍රශීලි ආකල්ප
✓ ජාතික කොඩිය පිළිබඳ තොරතුරු
✓ දේශාභිමානී කවි, ගී, කතන්දර හා රංගන
✓ ශ්‍රී ලාංකිකයන්ට අනන්‍ය වූ ක්‍රීඩා
✓ දේශීය ද්‍රව්‍ය ආශ්‍රයෙන් කළ හැකි නිර්මාණ

## 1.6 ආරක්ෂාව හා පරිස්සම

නිපුණතා

★ අනාරක්ෂිත අවස්ථා සහ ස්ථාන හඳුනා ගෙන ඒවායින් ආරක්ෂා වීමට පියවර ගනියි.
★ ආහාරපාන විෂ විය හැකි තත්ත්වයන් හා ඉන් සිදුවිය හැකි අහිත කර බව සොයා බලා ඒවා වැළැක්වීමට පියවර ගනියි.
★ විවිධ වෘත්තීන්හි යෙදෙන පුද්ගලයන් තම ආරක්ෂාව සඳහා යොදා ගන්නා මෙවලම්/උපකරණ/ඇඳුම් පැළඳුම් පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ වාහනවල ගමන් කිරීමේ දී විය හැකි අනතුරු පිළිබඳ දැනුවත් වී ඒවායින් වැළකී සිටීමට පියවර ගනියි.
★ ආරක්ෂිත පිළිවෙත් රකිමින් ක්‍රීඩාවල යෙදෙයි.
★ විවිධ වෘත්තීන්හි නියැලෙන්නන් ආරක්ෂාව හා පරිස්සම සඳහා යොදා ගන්නා උපකරණ හා මෙවලම්වල ආකෘති නිර්මාණය කරයි.
★ ආරක්ෂාව හා පරිස්සමට උපයෝගී කර ගත් විවිධ මෙවලම් නිර්මාණය කරයි.

අන්තර්ගතය

✓ අනාරක්ෂිත අවස්ථා සහ ස්ථාන
✓ ආහාරපාන විෂ විය හැකි අවස්ථා සහ එහි ඇති අහිතකර තත්ත්වයන්
✓ ආරක්ෂාව සඳහා යොදා ගන්නා මෙවලම්/උපකරණ/ඇඳුම් පැළඳුම් පිළිබඳ තොරතුරු
✓ ගමන් බිමන් යාමේ දී විය හැකි අනතුරු හා ඒවායින් වැළකී සිටිය හැකි ක්‍රම
✓ ක්‍රීඩාවල නිරත වීමේ දී ආරක්ෂිත බව
✓ ආරක්ෂාව හා පරිස්සම සඳහා යොදා ගන්නා උපකරණ සහ මෙවලම්වල ආකෘති නිර්මාණ

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.7 ජලය

නිපුණතා

★ ජලයේ හැඩය හා ස්වරූපය වෙනස් වන විවිධ අවස්ථා සොයා බලා වාර්තා කරයි.
★ විවිධ ද්‍රව්‍ය ජලය සමඟ ක්‍රියා කරන ආකාරය හඳුනාගෙන වාර්තා කරයි.
★ ජලය අපිරිසිදු වන ආකාර හඳුනාගෙන ඒවා වළක්වා ගැනීමට දායක වෙයි.
★ ජලය උපයෝගයෙන් ක්‍රියා කරවිය හැකි උපකරණයක ආකෘතියක් නිර්මාණය කරයි.
★ අපිරිසිදු ජලය භාවිතයෙන් රෝග බෝවීම වළක්වා ගත හැකි ක්‍රම නිරූපණය වන පෝස්ටර් සාමූහිකව නිර්මාණය කරයි.
★ ජලය හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
★ ජලයේ වැදගත්කම හා ආරක්ෂා කර ගැනීමේ ඇති වටිනාකම කියවෙන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ ජලයේ හැඩය හා ස්වරූපය වෙනස්වන විවිධ අවස්ථා
✓ ද්‍රව්‍ය ජලය සමඟ ක්‍රියාකරන ආකාර
✓ ජලය අපිරිසිදුවන ආකාර
✓ ජලය අපිරිසිදු වීම වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග
✓ ජලය භාවිතයෙන් ක්‍රියා කරවිය හැකි උපකරණවල ආකෘති නිර්මාණ
✓ අපිරිසිදු ජලය භාවිතයෙන් රෝග බෝවන බව දැක්වෙන පෝස්ටර් නිර්මාණ
✓ ජලය හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩා
✓ ජලයේ වැදගත්කම හා ආරක්ෂාකර ගැනීමේ වැදගත්කම ඇතුළත් කවි, ගී, ගායන හා රංගන

## 2.8 ගමනාගමනය

නිපුණතා

★ අන් අයට අවහිරයක් නොවන පරිදි මංමාවත් පරිහරණය කරයි.
★ මංමාවත් භාවිත කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ අවබෝධයකින් යුතුව ක්‍රියා කරයි.
★ සමීප පරිසරයේ ඇති මංමාවත් හඳුනාගෙන ඵලදායී ලෙස භාවිත කරයි.
★ පොදු වාහනවලින් අපට ලැබෙන සේවය අගය කරමින් ඒවා සුරැකීමට දායක වෙයි.
★ පොදු ප්‍රවාහන සේවාවලින් ඉටු කෙරෙන සේවය විවිධ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කරයි.
★ වාහනවලින් ඉටුවන සේවය පිළිබඳ කියැවෙන කවි, ගී ගායනා කරයි. රංගනයේ යෙදෙයි.
★ විවිධ ගමන් විලාශ ඉදිරිපත් කෙරෙන ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය

✓ නිවැරදි මංමාවත් පරිහරණය
✓ මංමාවත් භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු
✓ සමීප පරිසරයේ මංමාවත් ඵලදායී ලෙස භාවිතය
✓ පොදු වාහනවලින් ලැබෙන සේවය
✓ පොදු වාහන සුරැකීම
✓ පොදු වාහනවලින් ලැබෙන සේවය ඇසුරු කරගත් නිර්මාණ
✓ වාහානවලින් ඉටුවන සේවය පිළිබඳ කියැවෙන කවි, ගී හා රංගන
✓ විවිධ ගමන් විලාශ ඉදිරිපත් කෙරෙන ක්‍රීඩා

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.9 ගෙවත්ත

නිපුණතා
- ★ ගෙවතු වගාවට දායක වීම තුළින් වින්දනයක් ලබයි.
- ★ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම භාවිත කරයි.
- ★ විවිධ නිර්මණ මගින් ගෙවත්තක සුන්දරත්වය මතු කර දක්වයි.
- ★ ගෙවතු වගාවේ වැදගත්කම අගය කරයි.
- ★ ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී, දෙබස් හා රංගනවල නිරත වෙයි.

අන්තර්ගතය
- ✓ ගෙවතු වගාවට ලබා දිය හැකි දායකත්වය
- ✓ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම
- ✓ ගෙවත්තක සුන්දරත්වය මතු කරන නිර්මාණ
- ✓ ගෙවතු වගාවේ වැදගත්කම
- ✓ ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී, දෙබස් හා රංගන

## 2.10 වැඩ පහසු කිරීමේ මං

නිපුණතා
- ★ වැඩක් සාමූහික ව කිරීම තුළින් එහි වැඩි සාර්ථකත්වයක් අත් විඳියි.
- ★ සරල යන්ත්‍ර භාවිතයෙන් වැඩ පහසු කර ගනියි.
- ★ චුම්භක භාවිතයෙන් වැඩ පහසු කර ගත හැකි ආකාර නිර්මාණය කරයි.
- ★ විදුලි භාවිතයෙන් වැඩ පහසු කර ගන්නා ආකාර අත්හදා බලයි.
- ★ වැඩ පහසු කර ගැනීමට යොදා ගත හැකි සරල උපකරණ ඇසුරින් විවිධ නිර්මාණ කරයි.
- ★ කණ්ඩායම් ක්‍රීඩාවලට දායක වෙමින් වින්දනයක් ලබයි.
- ★ කණ්ඩායම් වැඩ හා සාමූහික වැඩ කිරීමේ දී එකමුතුව කිරීමේ වැදගත්කම මතුවන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
- ★ විවිධ වෘත්තීන්වල නිරතවීමේ දී වෙහෙස නිවා ගැනීම සඳහා ගායනා කළ ජන ගී සාමූහික ව ගායනා කරයි.
- ★ සාමූහික ව එක් ව ක්‍රියා කළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙමින් වින්දනයක් ලබයි.

අන්තර්ගතය
- ✓ සාමූහික කාර්යයන්වල සාර්ථකත්වය පිළිබඳ අත්දැකීම්
- ✓ සරල යන්ත්‍ර විදුලිය හා චුම්බක භාවිතයෙන් වැඩ පහසු කරගත හැකි ආකාර
- ✓ වැඩ පහසු කරගත හැකි විවිධ ක්‍රම භාවිත කරමින් කරන නිර්මාණ
- ✓ විදුලිය භාවිතයෙන් වැඩ පහසු කරගන්නා ආකාර
- ✓ වැඩ පහසු කර ගැනීමට සොයා ගත හැකි සරල උපකරණ ඇසුරින් විවිධ නිර්මාණ
- ✓ එකමුතුකමේ වැදගත්කම මතුවන කවි, ගී, ගායන හා රංගන
- ✓ විවිධ වෘත්තීන්වල දී ගායනා කළ ජන ගී
- ✓ සාමූහික ව එක් ව ක්‍රියා කළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩා

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.11 මිනිස් හැසිරීම්

නිපුණතා
★ අන් අයගේ ගරුත්වය ආරක්ෂා වන ලෙස ආචාරශීලී ව හැසිරෙයි.
★ සිය අදහස් සහනශීලී ලෙස ප්‍රකාශ කරයි.
★ තමා පිළිබඳ ව ප්‍රතිජනනාත්මක ව අගය කරයි.
★ අන් අය අගය කරමින් සාමූහික කටයුතුවල නියැලෙයි.
★ මානව ගරුත්වය අවධාරණය කෙරෙන සිද්ධි කතන්දර ඉදිරිපත් කරයි.
★ මානව වටිනාකම් අවධාරණය කෙරෙන කවි, ගී ගායනා කරයි. රංගනවල නිරත වෙයි.

අන්තර්ගතය
✓ අන් අයගේ ගරුත්වය රැකෙන ආචාරශීලී හැසිරීම්
✓ සහනශීලී අදහස් ප්‍රකාශනය
✓ තමා පිළිබඳ ප්‍රතිජනනාත්මක අගය කිරීම්
✓ අනුන් අගය කරමින් කරන සාමූහික කටයුතු
✓ මානව ගරුත්වය අවධාරණය කෙරෙන සිද්ධි, කතා, කවි, ගී, රංගන

## 2.12 පොළොව හා අහස

නිපුණතා
★ භූමියේ මතු පිට විවිධත්වය තුළින් මතු වන සුන්දරත්වය අගය කරයි.
★ ස්වභාව ධර්මයේ අපට ලැබී ඇති දේ ඵලදායී ව පරිහරණය කරයි.
★ අහසේ දක්නට ලැබෙන දෑ පිළිබඳ තොරතුරු රැස් කර විවිධ අයුරින් වාර්තා කරයි.
★ සුළං ලබා ගැනීම සඳහා විවිධ ක්‍රම භාවිත කරයි.
★ සුළඟින් ඇති ප්‍රයෝජන විමර්ශනය කර වාර්තා කරයි.
★ ස්වභාව ධර්මයේ බලපෑමෙන් සිදු විය හැකි හානි පිළිබඳ ව විමසිලිමත් ව ක්‍රියා කරයි.
★ සුළඟින් ක්‍රියා කර විය හැකි සරල නිර්මාණ කරයි.
★ අහස පොළොව සුළං වැස්ස තේමා කරගත් කවි, ගී ගායන හා විවිධ රංගනවල නිරත වෙයි.
★ භූමියේ විවිධත්වය මතුවන අන්දමේ නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
★ අවකාශ භාවිත කරමින් කළ හැකි ක්‍රීඩාවන්හි නියැලෙයි.
★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් අහස පෙළොව සුළං වැස්ස පිළිබිඹු කෙරෙන විවිධ නිර්මාණවල නිරත වෙයි.
★ අවකාශ භාවිතයෙන් කළ හැකි ක්‍රීඩා

අන්තර්ගතය
✓ භූමියේ විවිධත්වය හා එහි සුන්දරත්වය
✓ ස්වභාව ධර්මය හරවත්ව පරිහරණය
✓ අහසේ දක්නට ලැබෙන දෑ පිළිබඳ තොරතුරු
✓ සුළං ලබා ගැනීමේ විවිධ ක්‍රම
✓ සුළඟින් ඇති ප්‍රයෝජන
✓ ස්වභාව ධර්මයෙන් බලපෑමෙන් සිදුවිය හැකි හානි හා ආරක්ෂාකාරී පිළිවෙත්
✓ සුළඟින් ක්‍රියා කරවිය හැකි සරල නිර්මාණ
✓ අහස පොළොව සුළං වැස්ස තේමා කරගත් කවි, ගී ගායන හා රංගන
✓ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් අහස පෙළොව සුළං වැස්ස පිළිබිඹු කෙරෙන විවිධ නිර්මාණ

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.13 අපට කළ හැකි වෙනස්කම්

නිපුණතා
- ★ පාසල් පරිසරයේ/නිවෙස් පරිසරයේ සිදු කළ හැකි වෙනස්කම් අධ්‍යයනය කර වාර්තා කරයි.
- ★ යහපත් වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ සැලසුම් සකස් කරයි.
- ★ සැලසුම්වල දී එකිනෙකාගේ හැකියාවන් මත වගකීම් බෙදා ගනියි.
- ★ වගකීම් ඉටු කිරීම හා සම්පත් භාවිතය මගින් අදාළ වෙනස්කම් කිරීමේ ලා නිරත වෙයි.
- ★ වෙනස්කම් පිළිබඳ කණ්ඩායම් ලෙස වාර්තා සකස් කර ඉදිරිපත් කරයි.
- ★ වෙනස්කම් පිළිබඳ ව සැලසුමට පෙර තත්ත්වය, සැලසුම හා පසු තත්ත්වය, සන්සන්දනාත්මක ව තොරතුරු තක්සේරු කරයි.
- ★ යහපත් වෙනස්කම් ඇති කිරීමේ ලා එකිනෙකාගේ දායකත්වය හා වගකීම් ඉටු කිරීම පිළිබඳ ව ප්‍රතිජනනාත්මක ව අගය කරයි.
- ★ යහපත් වෙනස්කම් පිළිබඳ ව නිර්මාණාත්මක කතන්දර ඉදිරිපත් කිරීම, කවි, ගී, ගායන, රංගන හා විවිධ සම්පත් භාවිත කරමින් කළ හැකි නිර්මාණවල නිරත වෙයි.
- ★ යහපත් ස්ථානයක් ලෙස ක්‍රීඩා පිටිය හඳුනා ගනිමින්, නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය
- ✓ පාසල් පරිසරයේ/නිවෙස් පරිසරයේ සිදුකළ හැකි වෙනස්කම්
- ✓ යහපත් වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ සැලසුම්
- ✓ සැලසුම්වල දී එකිනෙකාගේ හැකියාවන් මත වගකීම් බෙදා ගැනීම හා යෙදිය හැකි සම්පත් ගවේෂණය
- ✓ වගකීම් ඉටු කිරීම හා සම්පත් භාවිතය මගින් කළ හැකි වෙනස්කම්
- ✓ වෙනස්කම් පිළිබඳ කණ්ඩායම් ලෙස වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම
- ✓ වෙනස්කම් පිළිබඳ ව සැලසුමට පෙර තත්ත්වය, සැලසුම හා පසු තත්ත්වය, සන්සන්දනාත්මක ව තොරතුරු තක්සේරුව
- ✓ යහපත් වෙනස්කම් ඇති කිරීමේ ලා එකිනෙකාගේ දායකත්වය හා වගකීම් ඉටු කිරීම පිළිබඳ ව ප්‍රතිජනනාත්මක ව අගය කිරීම
- ✓ යහපත් වෙනස්කම් පිළිබඳ ව නිර්මාණාත්මක කතන්දර ඉදිරිපත් කිරීම, කවි, ගී, ගායන, රංගන හා විවිධ සම්පත් භාවිත කරමින් කළ හැකි නිර්මාණ
- ✓ යහපත් ස්ථානයක් ලෙස ක්‍රීඩා පිටිය හඳුනා ගනිමින්, කළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩා

## 2.14 මිනිසා හා තොරතුරු

නිපුණතා
- ★ විවිධ අවශ්‍යතා සඳහා එදිනෙදා හුවමාරු වන තොරතුරු පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
- ★ අතීතයේ දී තොරතුරු හුවමාරු කර ගත් ආකාරය පිළිබඳ ව සොයා බලා වාර්තා කරයි.
- ★ විද්‍යුත් මාධ්‍ය හා ඒවා භාවිතය පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
- ★ සන්නිවේදන සේවා කටයුතු සිදු වන ආකාරය විමර්ශනය කර වාර්තා කරයි.
- ★ කාලීන ගැටලු, සිදු වීම් සඳහා යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කරයි.
- ★ සන්නිවේදන කටයුතු සිදු වන ආකාර නිරූපණය කරයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

අන්තර්ගතය
- ✓ විවිධ අවශ්‍යතා සඳහා එදිනෙදා හුවමාරු වන තොරතුරු
- ✓ අතීතයේ තොරතුරු හුවමාරු කරගත් ආකාර
- ✓ විද්‍යුත් මාධ්‍ය හා ඒවා භාවිතය පිළිබඳ තොරතුරු
- ✓ සන්නිවේදන සේවාවක් සිදුවන ආකාර
- ✓ කාලීන ගැටලු, සිදුවීම් හා යෝජශා විසඳුම්
- ✓ සන්නිවේදන සේවා කටයුතු නිරූපණය

## 2.15 අපේ අතීත විත්ති

නිපුණතා
- ★ තම ප්‍රදේශයේ හෝ පළාතේ ඓයිතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන/පුද්ගලයන්/කලා කෘති පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
- ★ ඓතිහාසික තොරතුරු අනාවරනය කර ගැනීම සඳහා ස්ථාන නිරීක්ෂණය කිරීමේ හා පුද්ගලයන් සමඟ කතා බහ කිරීමේ අත්දැකීම් වාර්තා කරයි.
- ★ පළාතේ ඓතිහාසික උරුමයන් අභිමානයෙන් යුතු ව අගය කරයි.
- ★ පළාතේ ඓතිහාසික උරුමයන් රැක ගැනීමට තුඩු දෙන නිර්මාණ ඉදිරිපත් කරයි.
- ★ පළාතේ ඓතියාසික වටිනාකමක් ඇති ජන කවි, ගී, ගායනය, රංගන හා කතන්දර ඉදිරිපත් කරයි.
- ★ තම පළාතේ අතීතයේ සිට පැවත එන ජන ක්‍රීඩාවල සාමූහික ව නිරත වෙයි.

අන්තර්ගතය
- ✓ තම ප්‍රදේශයේ හෝ පළාතේ ඓයිතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන/පුද්ගලයන්/කලා කෘති පිළිබඳ තොරතුරු
- ✓ ඓතිහාසික තොරතුරු අනාවරනය කර ගැනීම සඳහා ස්ථාන නිරීක්ෂණය කිරීමේ හා පුද්ගලයන් සමඟ කතා බහ කිරීම
- ✓ පළාතේ ඓයිතිහාසික උරුමයන්
- ✓ පළාතේ ඓයිතිහාසික උරුමයන් රැක ගැනීමට තුඩු දෙන නිර්මාණ
- ✓ පළාතේ ඓයිතියාසික වටිනාකමක් ඇති ජන කවි, ගී, ගායනය, රංගන හා කතන්දර
- ✓ තම පළාතේ අතීතයේ සිට පැවත එන ජන ක්‍රීඩා

## 2.16 අපේ යහපැවැත්ම

නිපුණතා
- ★ පවුලේ යහපැවැත්ම කෙරෙහි ක්‍රියාශීලි ව දායක වෙයි.
- ★ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා උචිත ක්‍රමවේද භාවිත කරයි.
- ★ පොදු ස්ථාන හා පොදු කාර්යයන්හි දී නිවැරදි චර්යා ප්‍රදර්ශනය කරයි.
- ★ සහයෝගී ක්‍රීඩාවල නිරත වෙමින් ජය හෝ පරාජය සාමූහික ව විඳ දරා ගනියි.
- ★ සාමූහික ව විවිධ නිර්මාණවල යෙදෙයි.
- ★ සාමූහික ව කටයුතු කිරීමේ අගය දැක්වෙන කවි, ගී, ගායන, රංගන ඉදිරිපත් කරයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

අන්තර්ගතය

- ✓ පවුලේ යහපැවැත්මට ක්‍රියාශීලි දායකත්වය
- ✓ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා පුරුදු පුහුණු කළ යුතු මානසික හා ශාරීරික ක්‍රියාකාරකම්
- ✓ පොදු ස්ථානවල දී හා පොදු කාර්යයන්හි පවත්වා ගත යුතු නිවැරදි චර්යා
- ✓ සහයෝගීව කළ හැකි ක්‍රීඩා
- ✓ සාමූහික ව කළ හැකි විවිධ නිර්මාණ
- ✓ සාමූහික ව කටයුතු කිරීමේ අගය දැක්වෙන කවි, ගී, ගායනය හා රංගන

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යනු ඉගැන්වීමට වඩා ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් සහිත විෂයයකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තිය ම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගත යුතු ය. එක ම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යොමු කළ හැකි ය.  ඒ මගින් එක ම කාලසීමාවන් තුළ පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනිමට ද හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, අත්හදා බැලීම්, කෙටි ව්‍යාපෘති, රැස් කිරීම්,  භූමිකා රංගන වැනි විවිධ ඉගෙනුම් ක්‍රමෝපාය ද පුද්ගලයන්ගෙන්, පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍යවලින් ද ගුවන්විදුලිය, රූපවාහිනිය සහ අන්තර්ජාලය වැනි විද්‍යුත් මාධ්‍යවලින් ද තොරතුරු රැස් කිරීම් අඩංගු විය හැකි ය. තොරතුරු වාර්තා කිරීම සඳහා විවිධ ක්‍රම මගින් වාර්තා කිරිමට සැලැස්වීම වැදගත් ය.

## හැඳින්වීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපැම් කළා වූ හෝ කරන්නා වූ හෝ භෞතික, සමාජයීය සහ ජෛව පද්ධතීක් පිළිබඳ ව ඒවා පදනම් කර ගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටාපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර ක්‍රමයෙන් එම වටාපිටාව සමඟ සාර්ථක ව අන්තර් ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි.  මෙම ක්‍රියාවලියේ දී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කනය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි.  එසේ ම ඒ ඔස්සේ සිය වාග්මාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටාපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම රැස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවන ක්‍රියාවලියේ ම අංගයකි. දරුවාගේ එම නැඹුරුව පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩනැගීමේ පදනම විය.

එදිනෙදා ජීවිතයේ දී හමු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකුගේ විවිධ නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙම කාර්යයට බෙහෙවින් දායක වේ. මීට පෙර ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවන්හි සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා ආරම්භක විද්‍යාව වැනි විෂයයන් එම කාර්යයට දායක විය. නව විෂයමාලාවේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නම් වූ පුළුල් විෂය ක්ෂේත්‍රය යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූල ව මතු කර ගැනීමට ඉඩ සලසා ඇත. එම නිසා මෙය සමෝධානික විෂයයක් ලෙස හැඳින්විය හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තුන්වන, හතරවන ශ්‍රේණි සඳහා තේමා 16 බැගින් ද පස්වන ශ්‍රේණිය සඳහා තේමා 16ක් ද මත විෂය නිර්දේශය ගොඩ නගා ඇත. සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණ ක්‍රියාකාරකම් හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාළ නිපුණතා මතු කර ගැනීම මෙන් ම ආගම, මව්බස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය. දරුවන්ගේ කතා බහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් මෙම ක්‍රියාකාරකම් මගින් මතු කර ගත යුතු ය. දරුවන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පාරිසරය සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

## ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්‍රියාකාරකම් සාර්ථක ව නිම කිරීම මගින් සිසුන් තුළ පහත දැක්වෙන දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- ✓ සිය වටාපිටාවේ චමත්කාරය හඳුනාගෙන ඒ තුළින් වින්දනයක් ලබයි
- ✓ ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා ප්‍රමාණවත් පරිදි ඒවා සිය දින චර්යාවට මුසු කර ගනියි
- ✓ සෞන්දර්යය අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යන්හි දී භාවිත කරයි
- ✓ නිරෝගී දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ප්‍රදර්ශනය කරයි
- ✓ මිනිසාගේ නිර්මාණ අගය කරයි
- ✓ සිය වටාපිටාවේ සිටින ජීවීන් පිළිබඳ ව සහ ඔවුන්ගේ අන්තර් ක්‍රියා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි
- ✓ මිනිස් සමාජය පිළිබඳවත් විවිධ මිනිසුන්ගේ හැසිරීම් හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳවත් අවබෝධයෙන් යුතුව කටයුතු කරයි.
- ✓ පෘථිවිය, එහි සම්පත් හා අවකාශය පිළිබඳ මූලික අවබෝධයක් හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ සරල අවබෝධයක් ලැබීම
- ✓ පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කර ගැනීම සහ ඒ අනුව ක්‍රියාත්මක වීම
- ✓ සිය වටාපිටාවේ සිදු කෙරෙන ශක්තිය පරිහරණය පිළිබඳ මූලික අවබෝධයක් ලැබීම හා ඒවා ප්‍රජාවේ අනාගතයට බලපාන ආකාරය පිළිබඳ ව විමසිලිමත් මනසක් ඇති කර ගැනීම
- ✓ ද්‍රව්‍ය සමඟ කරන වැඩ මගින් සිය අනාගත ඉගෙනුමට හා දිවි පැවැත්මට අවශ්‍ය හසුරු කුසලතා අත් කර ගැනීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## දෙවන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා

- ✓ අවට පරිසරයේ වැඩෙන ශාක පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.
- ✓ ශාකවල පැවැත්මෙහි ඇති වැදගත්කම අගය කරයි.
- ✓ තොරතුරු රැස් කිරීම සඳහා ගවේෂණය කරයි.
- ✓ සතුන්ගෙන් ලබන ප්‍රයෝජන අගයමින් සතුන් ද පරිසරයේ කොටසක් ලෙස පිළිගනියි.
- ✓ සතුන්ගෙන් සිදුවන හානි හා අනතුරු පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- ✓ එදිනෙදා භාවිත කරන භාණ්ඩ හා උපකරණ නිවැරදි ව ආරක්ෂාකාරී ව සහ නිසි නඩත්තුවකින් යුතු ව පරිහරණය කරයි.
- ✓ නිරෝගිමත් දිවිපෙවෙතක් සඳහා යහපත් පුරුදු අනුගමනය කරයි.
- ✓ නීරෝගී දිවිපෙවෙතක් සඳහා උචිත ආහාර පාන තෝරා ගනියි.
- ✓ එදිනෙදා කටයුතුවල දී තම නිවැරදි ඉරියව් පවත්වා ගනියි.
- ✓ පොදු ස්ථානවල දී මෙන් ම පොදු කටයුතුවල දී තම චර්යා නිවැරදි ව හසුරුවයි.
- ✓ තම දෛනික කටයුතු ක්‍රමවත් ව පවත්වා ගනියි.

- ✓ ජාතික කොඩිය කෙරෙහි ගෞරවයෙන් යුතු ව හැසිරෙයි.
- ✓ ජාතික ගීය අභිමානයෙන් යුතු ව ගායනා කරයි.
- ✓ තමාගේ හා අන් අයගේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කටයුතු කරයි.
- ✓ විවිධ ජන කොටස්වල සංස්කෘතීන් අගයමින් කටයුතු කරයි.
- ✓ ජලය ස්වභාවික සම්පතක් ලෙස අගය කරමින් අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරයි.
- ✓ පාරේ ගමන් කිරීමේ දී අනුගමනය කළ යුතු නීති රීතිවලට අනුව කටයුතු කරයි.
- ✓ වාහනවලින් සිදුවන අහිත කර බලපෑම් අවම කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි.
- ✓ ගෙවත්තක ඇති වැදගත්කම අගය කරමින් ගෙවත්තක් ක්‍රමවත් ව පවත්වා ගැනීමට දායක වෙයි.
- ✓ එදිනෙදා වැඩ පහසු වෙන් කර ගැනීම සඳහා කරන වැඩ ක්‍රමවත් ව හා පිළිවෙළට අනුව සිදු කරයි.
- ✓ සරල උපකරණ නිවැරදි ව උචිත පරිදි යොදා ගනිමින් එදිනෙදා වැඩ පහසු කර ගනියි.
- ✓ අන් අයට ක්‍රියාශීලී ව සවන් දෙමින් ප්‍රියජනක ලෙස අදහස් ඉදිරිපත් කරයි.
- ✓ තම හැකියා අගයන්නාක් මෙන් අන් අයගේ හැකියා ද අගයයි.
- ✓ භූමියේ මතු පිට විවිධත්වය පිළිබඳ විමර්ශනය කරමින් තොරතුරු රැස් කර වාර්තා කරයි.
- ✓ වැස්ස, සුළඟ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව විමසිලිමත් වීම හා විය හැකි අනතුරුවලින් ආරක්ෂා වීමට පියවර ගනියි.
- ✓ ශරීරය මනාව පවත්වා ගැනීමට අවශ්‍ය ව්‍යායාම්වල නිරත වෙයි.
- ✓ තම ආසන්න පරිසරයේ යහපත් වෙනසක් ඇති කිරීමෙහි ලා සාමූහික එකඟතාවයකින් යුතු ව උචිත කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කරයි.
- ✓ සැලසුම් සකස් කිරීමේ දී මෙන් ම ක්‍රියාත්මක වීමේ දී තම දායකත්වය පිළිබඳ ව ස්වයං ඇගයීමක යෙදෙයි.
- ✓ තමාගේ මෙන් ම අන් අයගේ හැකියා අගය කරයි.
- ✓ තොරතුරු හුවමාරුවේ දී විවිධ ක්‍රම භාවිත කරයි.
- ✓ තොරතුරු හුවමාරුවේ දී අන් අයට හිරිහැර නොවන පරිදි චර්යා පවත්වා ගනියි.
- ✓ පාසලේ මෑත අතීතයේ සිදු වූ සංවර්ධනාත්මක වෙනස්කම් අගයයි.
- ✓ අතීතයේ විවිධ අවස්ථාවන්හි දී යොදා ගත් ජන කථා රසවිඳියි.
- ✓ ජන ගායනා, හා ජන ක්‍රීඩා සඳහා චින්දනාත්මක ව සහභාගී වෙයි.
- ✓ විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් අතීතයේ විවිධ අවස්ථාවන්හි දී යොදා ගත් සැරසිලි නිර්මාණ කරයි.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

නිර්මාණාත්මක, සෞන්දර්යාත්මක හා ශාරීරික නිපුණතා හා සම්බන්ධ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් පරාසයක ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් සපුරාලීමේ අවශ්‍යතාවය නව විෂය නිර්දේශයෙහි දක්නට ලැබෙන පැහැදිලි වෙනසකි. එවැනි වෙනසක් සඳහා පන්ති කාමරය පමණක් නොව සම්පූර්ණ පාසල් පරිසරය ද, සිසුන් ඒ දෙස බලන දෘෂ්ටි කෝණය ද වෙනස් විය යුතු ය.

එබැවින් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය විය යුත්තේ දවස පුරා අසුන්ගත ව සිටීම වෙනුවට විවිධ තැන්වල විවිධ ඉරියව්වෙන් හා සතුටෙන් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් පිරිසක් දැකිය හැකි වන පරිදිය.

මේ සඳහා සැලසුම් කරනු ලබන පන්තියක තිබිය යුතු ලක්ෂණ මෙසේ ය.

- ✓ පාසල් කාලය තුළ දී සිසුනට ප්‍රධාන වශයෙන් ක්‍රියාකාරකම්වල නිරත වීමට උචිත අයුරින් ඉගෙනුම් පරිසරය සකස් කිරීම.
- ✓ එළිමහන් ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීම.
- ✓ පාසලේ ක්‍රීඩා, සෞන්දර්යාත්මක කටයුතු හා වෙනස් විෂය සමගාමී කටයුතු කෙරෙහි ද අවධානය යොමු කිරීම.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා සම්බන්ධ තක්සේරු කිරීමේ දී එම ඉගෙනුම් ක්‍රියාවලිය තුළින් සිසුනට ලබා දීමට බලාපොරොත්තු වන දැනුම, කුසලතා ආකල්ප හා පිළිබඳ සැලකිල්ලට ගත යුතු ය. එසේ ම සමාජීය දක්ෂතා කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

ඒ ඒ සිසු කණ්ඩායම් හෝ තනි තනි සිසුන් තුළ හෝ ඇති ඌනතා, ඉදිරි ඉගෙනුම් කටයුතුවල දී මග හරවා ගනිමින් ඉක්මනින් ඉගෙනුම් හැකියා පෙන්නුම් කරන සිසුන් සඳහා තව දුරටත් පෙළඹීමක් ඇති වන අරමුණෙන් මෙම තක්සේරු කිරීම් කළ යුතු ය.

මෙහි දී බොහෝ විට විධිමත් ඇගයීම් ක්‍රමවලට පරිබාහිර ක්‍රම අනුගමනය කිරීමට සිදු වේ. සිසුන් වැඩෙහි යෙදී සිටින අවස්ථාවල ඔවුන් නිරීක්ෂණයෙන්, සවන් දීමෙන් සහ ඔවුන් සමඟ සාකච්ඡා කිරීම වැනි ක්‍රියාවලින් මඟින් මෙම අවස්ථා මතු කර ගත හැකි වනු ඇත. ඒවා ක්‍රමවත් ව වාර්තා කර ගැනීමට ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇතුළත් තක්සේරු වාර්තා සටහන් භාවිත කළ හැකි ය.

## ගෙදර වැඩ පැවරීම

✶ පන්ති කාමරය තුළ දී ඉගෙන ගන්නා වූ විෂය කරුණු තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා සිසුවාට දැරිය හැකි ප්‍රමාණයට ගෙදර වැඩ පවරන්න.
✶ ගෙදර වැඩවල දී කළ යුතු දේ හා වැඩ කරන ආකාරය පිළිබඳ ව සිසුන්ට වැටහෙන සේ පැහැදිලි උපදෙස් දෙන්න.
✶ පන්ති ක්‍රියාකාරකම් සඳහා නිවසින් ගෙන ආ යුතු දෑ පිළිබඳ ව කල්වේලා ඇති ව සිසුන් හා දෙමාපියන් දැනුවත් කරන්න.
✶ දෙමාපියන් දැනුවත් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරේ අවධානය යොමු කරන්න.
    ✦ පවරන සීමිත ගෙදර වැඩ කොටස් සිසුන් විසින් ම කළ යුතු බව
    ✦ ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් තෝරා ගැනීමට උදවු කළ යුතු බව
    ✦ නිවසේ දී කළ යුතු වැඩ සඳහා උදවු දීම
    උදාහරණ : රාත්‍රි අහස නිරීක්ෂණ, ඖෂධ පැළෑටි හඳුනා ගැනීම, ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථාන පිළිබඳ තොරතුරු රැස් කිරීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.1 පැළෑටි හා ගස්වැල්

අතීතයේ අපේ මුතුන් මිත්තන් හා ඔවුන්ට සමීප පරිසරයේ පැළෑටි හා ගස්වැල් අතර වූයේ විශිෂ්ට සබඳතාවකි. කෙමෙන් කෙමෙන් මෙම සබඳතාව පිරිහීයාම පිළිබඳ ව කම්පාවීම පමණක් ප්‍රමාණවත් නොවේ. අපේ බාල පුරපුර පෙර කී විශිෂ්ට සබඳතාව සඳහා යොමු කිරීම යුගයේ කාර්යය භාරයකි.
මෙම තේමාවේ දී පැළෑටි හා ගස්වැල් වැඩීමට අවශ්‍ය පරිසර සාධක විද්‍යාත්මක ව සොයා බලන අතර ම අපේ පරිසරයේ ඇති වටිනා පැළෑටි හා ගස්වැල් හඳුනා ගැනීමට, රැක ගැනීමට හා වැවීමට යොමු කෙරේ.එපමණකින් නොනැවතී විශේෂයෙන් ඖෂධීය වටිනාකමක් ඇති පැළෑටි හා ගස්වැල්වලින් යුත් පරිසරයක් ඇති කිරීමට දායක වීම ද සිදු වේ. තමන්ට ද අනුන්ට ද සුවදායී ජීවිතයක් ගත කිරීම සඳහා හදා වඩා රැක බලා ගන්නා පරිසරයක් දායාද කිරීමට ද මෙහි දී හුරුවක් ඇති කිරීම අපේක්ෂිත ය.

### නිපුණතා

- ★ පැළෑටි වැඩීම සඳහා විවිධ සාධක බලපාන ආකාරය වාර්තා කරයි.
- ★ ශාකයක ප්‍රධාන කොටසක් ලෙස මල් හඳුනාගෙන ඒවායින් ලැබෙන ප්‍රයෝජන අගය කරයි.
- ★ ශාක හා සතුන් අතර ඇති සම්බන්ධය හඳුනා ගනිමින් වාර්තා කරයි.
- ★ ඖෂධීය වටිනාකමක් සහිත ශාක සංරක්ෂණයට දායක වෙයි.
- ★ ශාක කොටස් ඇසුරින් විවිධ නිර්මාණ කරයි.
- ★ ශාකවල වටිනාකම මතු වන පණිවිඩ රැගත් ගායනා හා රංගනවල නිරත වෙයි.
- ★ ගස්වැල් හා සම්බන්ධිත නිර්මාණාත්මක ක්‍රීඩාවල වින්දනාත්මක ව නියැලෙයි.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත වීමට අවස්ථාව සිසුන්ට ලබා දෙන්න.

✠ පාසල් වත්තට සිසුන් රැගෙන යන්න. මල් ඇති ගසක් හෝ වැලක් හෝ එම වර්ගයේ ම කුඩා පැළයක් සමඟ සැසඳීමට අවස්ථා ලබා දෙන්න. සංසන්දනය කරන ලද එම තොරතුරු පන්තියට වාර්තා කිරීමට උපදෙස් දෙන්න.
කුඩා පැළ, ගසක් හෝ වැලක් වී කාලයෙන් කාලයට මල් පිපෙන බවත්, අප මෙවැනි කුඩා පැළ වවා රැක බලා ගැනීම අවට පරිසරය අලංකාර වීමට හේතු වන බවත් අවධාරණය කරන්න.

- කාලයකට පමණක් පිපෙන මල් වර්ග පිළිබඳ තොරතුරු රැස් කිරීමට යොමු කරන්න.
- අඹ, රඹුටන් ආදී ගස්වල ගෙඩි හට ගැනීමට හා මල් හට ගැනීමට විශේෂ කාල ඇත. තම ප්‍රදේශයේ බහුල ව වැවෙන පලතුරු වර්ගවල මල් පිපෙන කාල පිළිබඳ ව ද ප්‍රදේශය අනුව රබර්, තේක්ක, අඹ ආදී වෙනත් ශාක පිළිබඳ ව ද මෙහි දී සලකා බැලිය හැකි ය.

උදාහරණ :

| මල | කාලය |
|---|---|
| එරබදු | අවුරුදු කාලය |
| ඇසල | ඇසල මාසය |
| | |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙම සටහන පන්තියේ ප්‍රදර්ශනය කරමින් විටින් විට මල් පිපෙන කාලය පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න. එය අඛණ්ඩ ව පවත්වා ගෙන යන්න.

✠ මල් පිපෙන කාලය ගැන කියවෙන කවි, ගී පිළිබඳ සොයා බැලීමට යොමු කරන්න.

උදාහරණ :- ඇහැල මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි ... (නරබෑනා නාට්‍ය)
එරබදු මල් මොට්ටු මොට්ටු
අවුරුද්දත් කිට්ටු කිට්ටු ...

හැකිනම් මෙම මල් සොයා සිසුනට නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- කාල නියමයක් නැති ව මල් පිපෙන පැළෑටි හා ගස්වැල් ආදිය පිළිබඳ ව සොයා බැලීමට සිසුන් යොමු කරන්න. උදාහරණ :- පොල්, කෙසෙල්, ගිරිතිල්ල සිසුන්ගේ ද අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ පිළිබඳ ව තොරතුරු කතා බහ කරන්න.
- පාසල හා නිවස අවට පරිසරයේ වැඩෙන පැළෑටි හා ගස්වැල් පිළබඳ ව ද විශේෂ අවධානයක් යොමු කරන්න. එම තොරතුරු වාර්තා කිරීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

✠ සිසුන්ට මල් කීපයක් සහ එම වර්ගයේ ම පත්‍ර ගෙනෙන ලෙස පවසන්න.
ශාකයක ප්‍රධාන කොටසක් ලෙස මල්, අවධාරණය කරන්න.

- එම මල් වියළා පොතක ඇලවීමට යොමු කරන්න. (මල හා පත්‍රය නොකැඩෙන සේ පරණ පුවත් පතක පිටු අතර තබා, එම පිටු මත බරක් තැබීමෙන් ඇලවීමට සුදුසු ලෙස සකස් කර ගත හැකි ය.) එක පිටුවක එක මලක් හා එම වර්ගයේ ම පත්‍රය බැගින් ඇලවීම සුදුසු ය.
මල්, පොතක පිටුවල ඇලවීමෙන් පසු, පහත සඳහන් ආකාරයට එම තොරතුරු ඇතුළත් කරන්න.
මලේ නම :
වියළීමට පෙර පාට :
වියළීමෙන් පසු පාට :
- මේ ආකාරයට සකස් කර ගත් පොත අගය කරන්න.

✠ මල්වලින් පිරි ගෙවත්තක් නැරඹීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- එම චාරිකාවේ දී මල් වැඩිපුර හට ගන්නේ පැළෑටිවල/ගස්වැල්වල කුමන අතුවල දැ යි නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
- මල් වැඩිපුර හට ගෙන ඇති හිරු එළිය කෙලින් ම ලැබෙන අතුවල ද? නැතිනම් සෙවන සහිත අතුවල දැ යි සිසුන්ගෙන් විමසන්න.
- අලංකාර මල් සහිත ගෙවත්තක් තිබීමෙන් අපට ඇති ප්‍රයෝජන මොනවා දැ යි සාකච්ඡා කරන්න.
- තම පාසල් වත්ත අලංකාර කිරීම සඳහා මල් වවා ඇති ආකාරය පිළිබඳ ව විමසිලිමත් ව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. තව දුරටත් පාසල් වත්ත මල්වලින් අලංකාර කිරීමට අපට කළ හැකි දේ යෝජනා කර ක්‍රියාත්මක කිරීමට දිරි දෙන්න.

✠ දෙමාපිය සහයෝගය ඇති ව ශාක හා සතුන් අතර ඇති සම්බන්ධතාව සොයා බැලීමට සිසුන් යොමු කරන්න. කල් තබා දෙමාපියන් මේ පිළිබඳ දැනුවත් කර තොරතුරු රැස් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

- පහත සඳහන් පරිදි ශාක හා සතුන් අතර ඇති සම්බන්ධතා සොයා බැලීමට සිසුන් යොදවන්න.

ආහාර ලබා ගැනීමට ශාක වෙත එන සතුන් :
මල්වල පැණි බීමට එන සමනලුන්, මී මැස්සන් හා බට්ටිච්චන්
ගෙඩි කෑමට එන ලේනුන්, වඳුරන් හා ගිරවුන් ආදී කුරුල්ලන්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

කොළ කන දළඹුවන්, ගොළුබෙල්ලන්, වඳුරන් සහ ගවයන් ආදී සතුන්
ශාකවල මුල් හා කඳන් කා දමන වේයන්

ශාක ආශ්‍රිත ව නිවාස තනා ගන්නා සතුන් :
ශාක මත කූඩු තනන විවිධ කොක්කු, වඩු කුරුල්ලන් ආදී පක්ෂීන්
ශාක මත කූඩු තනන ලේනුන් හා වෙනත් සතුන්
ශාකවල පත්‍ර ආශ්‍රයෙන් කූඩු තනා ගන්නා දිමියන් වැනි සතුන්

අවු වැසි පීඩාවලින් බේරීම සඳහා ශාකවල සෙවන සොයන සතුන් :
ශාක පත්‍රවල ආරක්ෂාව සොයන කුරුල්ලන්
ගසේ සෙවන යටට දිව එන ගවයන් ආදී සතුන්

ශාක මත රාත්‍රිය ගත කරන සතුන් :
බකමූණන්, උගුඩුවන් වැනි සතුන්

මෙයට අමතර ව බොහෝ සතුන් රාත්‍රි කාලයේ ආරක්ෂාව පිණිස ගස් මත ගත කරන බව පෙන්වා දෙන්න. (උදාහරණ : කොකුන්, මයිනන්, වැහිළිහිණියන් ආදී පක්ෂීන් හා රිලවුන්, වඳුරන් ආදී ලොකු සතුන්)

- මෙම අත්දැකීම් ඇසුරු කර ගෙන සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපත හා අයහපත පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  උදාහරණ:
  සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපත :
  - මල් පැණි බීමට එන සමනලුන්, මී මැස්සන් ආදී සතුන් මගින් මල්වල පරාග පෝෂණය සිදුවීම
  - පලතුරු හා වෙනත් ගෙඩි වර්ග කෑමට එන වවුලන්, ගිරවුන් ආදී සතුන් මගින් ශාකවල බීජ විවිෂ ස්ථානවලට විසිරීයාම
  - ගවයන්, එළුවන් ආදී සතුන්ගේ මල මූත්‍ර ශාකවලට පොහොරවීම

  සතුන්ගෙන් ශාකවලට සිදුවන අයහපත :
  - සතුන් ශාකවල දළු, පත්‍ර, මල්, ගෙඩි හා කරල් ආදිය කා දැමීම නිසා ශාකවලට හානි සිදුවීම
  - දිමියන් ආදී සතුන් ශාක පත්‍ර එකතු කොට කූඩු (දිමි ගොටු) තැනීම නිසා ශාකවල වර්ධනය බාලවීම
  - වල් අලි, වල් ඌරන් සහ ඉත්තෑවන් ආදි සතුන් ගස්වල අතු කඩා දැමීම හා ගස් පෙරළා දැමීම

- සතුන්ගෙන් සිදුවන යහපත හා අයහපත පිළිබඳ ව සිසු අදහස් ද උදවු කර ගන්න. ශාක හා සතුන් අතර ඇති සම්බන්ධය පිළිබඳ සිසුන් ලබා ගත් අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසන්න. ඒවා ඇසුරින් කවි හා ගීත නිර්මාණය කිරීමට, ඒවා ගායනා කිරීමට, චිත්‍ර ඇඳීමට, සතුන්ගේ හැසිරීම් අනුකරණය කිරීමට, කෙටි නාට්‍ය නිර්මාණය කර රඟ දැක්වීමට අවස්ථා ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2

✠ පෙර දින කරනු ලබන දැනුම් දීමකින් සිසුන් ලවා විවිධ මල් වර්ග ගෙන්වා ගන්න.

- සිසුන් කණ්ඩායම් කර එක් එක් කණ්ඩායම සුදු, කහ, රතු, රෝස හා තැඹිලි ආදී වශයෙන් නම් කරන්න. එකතු කර ගත් මල් අතරින් තම කණ්ඩායම හඳුන් වන පාට සහිත මල් තමන්ගේ කණ්ඩායම වෙත ලබා ගැනීමට ඉඩ සලස්වන්න.
- ඉන් පසු තම කණ්ඩායමට ලැබුණු මල් වෙනත් ලක්ෂණයන් සහ ගුණයන් මත කාණ්ඩ කිරීමට සලස්වන්න.
  උදාහරණ : පෙති ප්‍රමාණ
  පෙතිවල හැඩය



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

රේණුවල ස්වභාවය
පැහැයේ අඩු වැඩි බව
නටුවේ ස්වභාවය ... වැනි ලක්ෂණ

- එක සිසුවකුට එක මලක් බැගින් තෝරා ගැනීමට කියන්න. එම මල ප්‍රවේශමෙන් කොටස්වලට වෙන් කිරීමට කියන්න. එක මලක කොටස් සියල්ල වෙන වෙන ම සුදුපාට කඩදාසියක් මත තැබීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායමේ එක් එක් සිසුවා නිරීක්ෂණය කළ මල් පිළිබඳ තොරතුරු පහත දැක්වෙන වගුවට ඇතුළත් කරන්න.

| මලේ නම | පෙති සංඛ්‍යාව | වර්ණය | වෙනත් උපාංග |
|---|---|---|---|
| | | | |

- මල් වර්ගවල පාට හා නම් උදව් කර ගෙන ගීතයක් නිර්මාණය කර ගෙන අත්පොඩි ගසමින් හා ආදේශ වාදන භාණ්ඩ වාදනය කරමින් ගායනයට අවස්ථා සලසන්න.

උදාහරණ :- අක්ෂර දෙකෙන් දෙක තාල තැබීම

| | | | |
|---|---|---|---|
| x | x | x | x |
| සුදු | රතු | කහ | නිල් |
| x | x | x | x |
| අතු | අග | පිපි | මල් |
| x | x | x | x |
| අර | ගෙන | බැති | යෙන් |
| x | x | x | x |
| අපි | යමු | පන් | සල් |

(තාලයට තබන අක්ෂරය උඩ x යොදා ඇත)

උදාහරණ :- අක්ෂර තුනෙන් තුන තාල තැබීම

| | | | |
|---|---|---|---|
| x | x | x | x |
| ඉද්ද | සමන් | පිච්ච | කැකුළු |
| x | x | x | x |
| වගෙයි | අපිත් | පුංචි | කැකුළු |

(තාලයට තබන අක්ෂරය උඩ x යොදා ඇත)

උදාහරණ :- අක්ෂර හතරෙන් හතර තාල තැබීම

| | | | |
|---|---|---|---|
| x | x | x | x |
| වතුසුදු | අරලිය | වදමල් | රත්මල් |
| x | x | x | x |
| ගස්වල | වැල්වල | විල්වල | පිපිමල් |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.


(තාලයට තබන අක්ෂරය උඩ x යොදා ඇත. මෙම ගායනවල තාල ස්ථානය ලකුණු කර ඇත්තේ ගුරුවරයාගේ දැන ගැනීම සඳහා පමණි.)

- මල් වත්ත හා මල් සම්බන්ධව කෙරෙන රංගනයක් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. මේ සඳහා ගැළපෙන ගායනයක් යොදා ගත හැකි ය.

- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා ගෙනෙන ලද මල් ගෙන මල් මාලා සකස් කිරීමට සිසුන් යොමු කරන්න.
- සකස් කර ගත් මල් මාලා දෑතට ගෙන මල් නැටුමක් සඳහා සිසුන් යොමු කරන්න. ගායන වාදන යොදා ගැනීමට උපදෙස් දෙන්න.
- ගස් වැල් සම්බන්ධව කතාන්තර ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථා සලස්වන්න.
  උදාහරණ:- ශ්‍රී පාදය සොයා ගත් හැටි

ක්‍රියාකාරකම 3

- පහත දැක්වෙන ක්‍රීඩාවෙහි නිරත වීමට සිසුන්ට අවස්ථා සලසන්න.
- කණ්ඩායම් දෙකකට එක හා දෙක වශයෙන් සිසුන් බෙදන්න.
- සෑම සිසුවකුට ම නිරීක්ෂණය කරන ලද මලක නම ලියන ලද කාඩ්පතක් පැළඳ ගැනීමට සලස්වන්න.
- කණ්ඩායම් දෙකෙහි ම විවිධ ලක්ෂණ ඇති මල් වර්ග එක සමානව පැතිරී තිබීම අවශ්‍ය වේ.
- සිසුන්ට ඒ මේ අත දුවන්නට සලස්වන්න.
  ගුරුතුමිය මලක සුවිශේෂ ලක්ෂණයක් පවසන්න.
  උදාහරණ : කහපාට මල්
  පෙති පහක මල්　　　කෑමට, බීමට ගන්නා මල්
  පෙති පහක සුදු මල්　　　රෑට පිපෙන මල්
  දියේ පිපෙන මල්
- එම ලක්ෂණය ඇති මල පැළඳ ගෙන සිටින සිසුන් වෙන් වී රවුමක් ද එම ලක්ෂණය නොමැති මල් පැළඳ ගෙන සිටින සිසුන් වෙනත් රවුමක් ද වශයෙන් සකස් වීමට උපදෙස් දෙන්න.



- කණ්ඩායම් දෙකෙහි ම සිසුන් දෙදෙනකු ලවා එකිනෙක කණ්ඩායම්වල නිවැරදි තාවය පරීක්ෂා කිරීමට සලස්වන්න. ඒ අනුව ලකුණක් /කොඩියක් ලබා ගැනීමට සලස්වන්න.
- අනතුරුව සිසුන් ඒ මේ අත දුව වන්න. විධානයකින් පසුව ඉහත ක්‍රියාකාරකම නැවත නැවත කරවන්න.
- ගුරුවරයා සෑම වාරයක් පාසාම කණ්ඩායම් වීමේ නිවරද තාවය පරීක්ෂා කර බලන්න.
- අවසානයේ දී සිසුන් කණ්ඩායම් වූයේ මල්වල කවර ලක්ෂණ පදනම් කර ගෙන දැයි සාකච්ඡා කරන්න.
- නිදහස් අවස්ථාවල දී සිසුන්ට මෙම ක්‍රියාකාරකම් කිරීමට අනුබල දෙන්න.


ක්‍රියාකාරකම 4

✠ වර්ණ කඩදාසි, සිහින් කම්බි, ඉරටු, නූල්, ගම්/පාප්ප සපයා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන් කැමති ආකාරයට මලක්/මල් පොකුරක් නිර්මාණය කිරීමට සලස්වන්න. අවශ්‍ය මග පෙන්වීම ද කරන්න.
- එසේ ම සමනලයෙක් නිර්මාණය කිරීමට ගැළපෙන වර්ණ කඩදාසි කැබලි කිහිපයක් සහ දිග



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ඉරටුවක් සපයා ගැනීමට උපදෙස් දෙන්න.



- ය කිරීමට සිසුන් යොමු කරන්න.
    i. මදක් ඝනකම ඇති සමනලයාට ගැළපෙන ලොතරැයි, ටොපි දවටන වැනි ඉවත ලන වර්ණවත්කඩදාසියකින් සමනලයකුගේ හැඩය ගත් එකම ප්‍රමාණයේ හැඩතල දෙකක් කපා ගන්න.
    ii. ඉරටුවේ නැමෙන සුළු කොටස මැදිකොට මැලියම්/පාප්ප ගෑ රූප හැඩතල දෙක එකට තබා හොඳින් අලවා ගන්න. අවශ්‍ය නම් තව දුරටත් සායම්වලින් සමනලයා අලංකාර කර ගත හැකි ය.
    iii. හොඳින් වේලුණු පසු සමනලයා සවි කළ ඉරටුවේ මුල අතට ගෙන අත උස් පහත් කරමින් ඇඟිලි දෙකකින් දෙපසට කරකවන්න.
    iv. කලින් නිර්මාණය කළ මල සමීපයට පියාඹන ආකාරයට සමනලයා ඉහත පරිදි චලනය කරවන්න.

- මල් හා සතුන් සම්බන්ධ කවි, ගී සිසුන් සමඟ නිර්මාණය කරන්න.
- සාදා ගත් නිර්මාණ භාවිතයට ගනිමින් මල් සහ සමනලුන් ආශ්‍රිත කවි, ගී සින්දු ගායනය කිරීමට කණ්ඩායම්වලට අවස්ථා ලබා දෙන්න.
  මෙහි දී ආදේශ වාද්‍ය භාණ්ඩවලින් තාල තබමින් නිර්මාණය කරන ලද කවි, ගී ගායනය තුළින් වින්දනයක් ලබා ගැනීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් විසින් නිර්මාණ කර ගන්නා ලද නාටක පන්තියේ ඉදිරිපත් කිරීමට ද අවස්ථාව සලස්වන්න.

ක්‍රියාකාරකම 5

✠ ආහාර සඳහා ගන්නා මල් කිහිපයක් පන්තියට ගෙන එන ලෙස සිසුන්ට දැනුම් දෙන්න. ඒවායේ ආහාරයට ගනු ලබන කොටස් මොනවා දැ යි සිසුන් කණ්ඩායම් කර නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- ආහාර පාන සඳහා පමණක් නොව ඖෂධ සඳහා ද පත්‍ර හා මල් ප්‍රයෝජනයට ගන්නා බව පෙන්වා දෙන්න. රණවරා හා බෙලි ආදී මල් වර්ග ද, හාතාවාරිය හා ගොටුකොළ ආදී පත්‍ර ද මීට උදාහරණ වේ.
- සිසුන් ද සම්බන්ධ කර ගෙන ඖෂධීය මල්වලින් පානයක් සකස් කරන්න. එහි දී වැඩ බෙදා ගෙන ඒ ඒ වැඩ කොටස් කිරීමට සිසු කණ්ඩායම් යොමු කරන්න. සෑම සිසුවකු ම වගකීමක් දැරීම සඳහා දිරිගන්වන්න.
- පසුව මෙම පානය සිසුන් සමඟ බෙදා හදා ගන්න. මෙබඳු ආහාරවලින් ශරීරයට ඉටු වන යහපත පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- පසු ප්‍රයෝජනය සඳහා කල් තබා ගැනීමට පිළියෙල කර ගත් මල්වලට උදාහරණ ඉදිරිපත් කරන්න. (බොහෝ නිවෙස්වල මෙබඳු ද්‍රව්‍ය තැන්පත් කර ගෙන ඇත. නැතිනම් බෙහෙත් බඩු කඩයකින්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ ලබා ගත හැකි ය) වියළීම මල් කල් තබා ගත හැකි එක් ක්‍රමයක් බව මෙයින් පෙන්වා දෙන්න.

- ප්‍රදේශයෙන් ලබා ගත හැකි ඖෂධීය වශයෙන් ප්‍රයෝජනවත් මල් එකතු කිරීමට සලස්වන්න. ඒවා වියළා ගත හැකි ආකාරය හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම්වලට යොමු කරන්න.

ඔසු පැන් මෙන් ම කොළ කැඳ වර්ග සකසා ගැනීම සඳහා ද ඖෂධීය ශාකවල වැදගත්කම අවධාරණය කර එබඳු එක් පැලයක් හෝ සිටුවා සාත්තු කර රැක බලා ගැනීමට යොමු කරන්න.

✠ අලංකාරය පිණිස තබන මල් බඳුන්වල මල් හා පත්‍ර වැඩි දිනක් තබා ගන්නේ කෙසේ දැ යි සිසු අත්දැකීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

උදාහරණ :- දින කිහිපයකට වරක් නටුවල මුල කොටසින් ස්වල්පයක් කපා දැමීම.
ඇස්ප්‍රීන් පෙති ¼ පමණ ජලයට දැමීම.
දිනපතා පරණ වතුර ඉවත් කොට බඳුනට අලුත් වතුර දැමීම.
..............................................................................................
..............................................................................................

- තම කණ්ඩායම් මේසය මත තැබීමට අලංකාර මල් බඳුනක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න. මල් බඳුන සකස් කිරීමේ දී මල් තෝරා ගැනීම. වියළී ගිය හා හානි වූ කොටස් කපා ඉවත් කිරීම, බඳුනට ජලය ප්‍රමාණවත් තරම් දැමීම, නියමිත හැඩයට මල් තැන්පත් කිරීම ආදිය පිළිබඳ ව විශේෂ අවධානය යොමු කරවිය යුතු ය.
- මල් යොදා ගනිමින් පන්ති කාමරයේ බිත්ති අලංකාර කිරීම සඳහා බිත්ති සැරසිලි නිර්මාණය කිරීමට සිසුන්ට කණ්ඩායම් වශයෙන් අවස්ථා සපයන්න.
- ආගමික, සමාජයීය හා සංස්කෘතික කටයුතුවල දී මල් හා පත්‍ර යොදා ගන්නා ආකාරය පිළිබඳ ව ද සිසුන් තුළ විමසිලිමත් බවක් ඇති කරන්න.

  ආගමික කටයුතු : මල් පූජා කිරීම, ........................, .......................
  සමාජයීය කටයුතු : මංගල අවස්ථා, අවමංගල අවස්ථා, .......................
  මේවා පිළිබඳ ව සිසු අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම තේමාවේ සඳහන් ක්‍රියාකාරකම්වල දී සුදුසු අවස්ථාවන් සඳහා කණ්ඩායම් වශයෙන් ව්‍යාපෘති පැවරිය හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.2 අප අවට සතුන්

පැළෑටි හා ගස්වැල් සතුන් මෙන් ම අප ද මෙම පරිසරයේ ම කොටස් කරුවන් ය. වඩා බුද්ධිමත් ජීවියකු ලෙස අප ක්‍රියා කළ යුත්තේ අප හා සමානවම පරිසරයට උරුමයක් ඇති සතුන් ආරක්ෂා කිරීමේ ආකල්පයකින් යුතුව ය. එමෙන් ම සතුන්ගෙන් බෝවන රෝග අවම වන පරිසරයක් නිර්මාණය කිරීමේ වගකීම ද අප වෙත පැවරේ.
මෙම තේමාවේ දී සතුන්ගේ විශේෂ ලක්ෂණ පිළිබඳ ගවේෂණශීලී වීමට ද, සතුන් ආරක්ෂා කිරීමට යොමු වීමට ද සිදු වේ. එමෙන් ම සතුන්ගෙන් හට ගන්නා රෝග පිළිබඳ ව අවදියෙන් සිට ආරක්ෂා වීමට ද මෙම තේමාවෙන් යොමු වේ.

නිපුණතා
- ★ ආසන්න පරිසරයේ වෙසෙන සතුන් පිළිබඳ තොරතුරු විමර්ශනය කර වාර්තා කරයි.
- ★ සතුන්ගේ ස්වභාවික ලක්ෂණ හා විශේෂ හැකියා පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
- ★ සතුන්ගෙන් ඇති විය හැකි රෝග පිළිබඳ ව දැනුවත් වෙමින් ඒවායින් ආරක්ෂා වීමට ක්‍රියා කරයි.
- ★ විවිධ මාධ්‍ය භාවිත කරමින් සතුන් පිළිබඳ නිර්මාණ ඉදිරිපත් කරයි.
- ★ සත්ත්ව චරිත නිරූපණය කරමින් ගායන හා රංගනවල නිරත වෙයි.
- ★ සතුන් ද පරිසරයේ කොටසක් ලෙස පිළිගනිමින් සතුන් ආරක්ෂා කර ගැනීමට දායක වෙයි.
- ★ සත්ත්ව චර්යා නිරූපණය කෙරෙන ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1

✠ මෙම තේමාව ආරම්භයේ දී හෝ දින කිහිපයකට පෙර හෝ සතුන් නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න. එසේ ම අනතුරු සිදු නොවන අයුරින් පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි සතුන් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. හඳුනා ගන්නා සතුන් පිළිබඳ වාර්තා තබා ගත හැකි ක්‍රම පෙන්වා දෙන්න. (උදාහරණ: තොරතුරු ලියා ගැනීම, සතුන්ගේ හැසිරීම්, කටු රූප සටහන් ඇඳීම)
නිවස තුළ හා නිවස අවට පරිසරයේ දිවා කාලයේ දී මෙන් ම රාත්‍රි කාලයේත් හැසිරෙන විවිධ සතුන් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න. නොයෙකුත් කුරුල්ලන්, කෘමීන්, මකුළුවන්, සිවුපාවුන්, උරගයන්, පණුවන්, බෙල්ලන් දිවා කාලයේ දී පහසුවෙන් දැකිය හැකි ය. පාසලට යන එන මග තොට දී ද සතුන් දැක ගත හැකි ය.
උදාහරණ:- විදුලි කම්බි මත වසා සිටින සතුන්, කුඹුරුවල සිටින් සතුන් වැනි
පොකුණක හෝ ජලාශයක නම් විවිධ මත්ස්‍ය වර්ග ඇතුළු ජලජ සතුන් දැක ගත හැකි වේ. (වවුලන්, බකමූණන්, කෘමීන් වැනි නිශාචර සතුන් ද සමහර සිවුපාවුන් හා සර්පයින් ද රාත්‍රි කාලයේ දැක ගත හැකි ය.)
මෙම සතුන්ගේ නම්, ඔවුන් බහුල ව දකින වේලාවන් ස්ථාන, ගමන් විධි, ශබ්ද නගන ආකාරය ආදිය හඳුනා ගෙන පන්තියට වාර්තා කිරීමට සලස්වන්න. වැසි අවස්ථාවල වැඩිපුර හැසිරෙන්නට කැමැත්තක් දක්වන සතුන් ද හඳුනා ගැනීමට සැලැස්විය හැකි නම් වැදගත් වේ.
ගුරුවරයාගේ මග පෙන්වීම යටතේ තව දුරටත් සතුන් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න. ප්‍රමාණවත් පරිදි ඉහත ක්‍රියාකාරකම් දෙකෙහි යෙදීමට නොහැකි වූ සිසුන්ට මේ නිසා තව දුරටත් අත්දැකීමක් ලබා ගැනීමට හැකි වනු ඇත. පාසල් ගොඩනැගිලි තුළත්, ඉන් පිටත භූමියේත් හැසිරෙන සතුන් අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
පන්තියේ සිසුන් එකතු කර ගත් තොරතුරු අනුව ඔවුන් නිරීක්ෂණය කළ සතුන් වර්ග කිරීමට සිසුන් ට උපදෙස් දෙන්න.

උදාහරණ 1 : පාද පිහිටීම අනුව : පාද රාශියක් ඇති, පාද අටක් ඇති, පාද හයක් ඇති, සිවු පා, දෙපා සහ පාද නැති වශයෙන්

උදාහරණ 2 : ශරීර වර්ණය අනුව : සුදු පාට, කළු පාට, දුඹුරු පාට, කහ පාට හා විවිධ පාට ආදී වශයෙන්

උදාහරණ3 : ආහාර වර්ගය අනුව : ශාක පත්‍ර, ගෙඩි හෝ කරල්, මල්, මල් පැණි, සීනි හෝ පැණි, කුඩා සතුන්, මස්, මාළු, වෙනත් සතුන්ගේ ලේ හෝ සියලු දේ ආහාරයට ගන්නා සතුන් වශයෙන්

- මෙම සතුන් තවත් ආකාරයන්ට වර්ග කළ හැකි දැ යි බැලීමට සිසුනට අවස්ථාව දෙන්න.
- මෙම වර්ග කිරීම් වගුවකට ඇතුළත් කර එය සිසුන්ගේ අභ්‍යාස පොත්වල සටහන් කර ගැනීමට ඉඩ සලසන්න.

ක්‍රියාකාරකම 2

✠ තමාගේ සිත් ගත් සතකුගේ රූපයක් නෙළීමට සිසුන් යොමු කරන්න. මැටි කුට්ටියක් හෝ රිජිෆෝම් කැබැල්ලක් හෝ ගෙන පිහි තලයකින් හෝ ලී පතුරක් භාවිත කරමින් හෝ මෙය කළ හැකි ය. පසුව සිසුන් සියලු දෙනාගේ නිර්මාණ එකතු කොට පන්ති මට්ටමින් ප්‍රදර්ශනයක් පවත්වන්න. සිසු නිර්මාණ අගයන්න.

ක්‍රියාකාරකම 3

✠ සතුන්ගේ විශේෂ හැකියා යන මාතෘකාව යටතේ බිත්ති පුවත් පතක් ආරම්භ කිරීමට සලස්වන්න. එම මාතෘකාව යටතේ තොරතුරු රැස් කර ලිපි ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. පින්තූර හා ඡායාරූප සමඟ ලිපි ඉදිරිපත් කිරීම වැදගත් ය.

- එදිනෙදා පුවත් පත්වල පළවන ඡායාරූප හා තොරතුරු ආදිය මේ සඳහා යොදා ගත හැකි ය. එක් ලිපියක වගන්ති කිහිපයක් පමණක් ඇතුළත් වීම ප්‍රමාණවත් වේ.

ක්‍රියාකාරකම 4

✠ මිනිසා සතු ව නොපවතින සමහර හැකියා සතුන්ට ඇති බව පෙන්වා දෙන්න.

සමහර සතුන්ට ඉව ඇති බව, තියුණු ලෙස කන් ඇසීම, ඇස් පෙනීම ඇති බව

උදාහරණ :- බල්ලා, පූසා

පරිසර තත්ත්වයන් වෙනස් වන විට සමහර සතුන් හැසිරෙන ආකාරය

උදාහරණ :

- වැහිළිහිණියන් පියාඹීම

- මෙවැනි අවස්ථා දැක්වෙන කතන්දර සිසුන්ට ඉදිරිපත් කරන්න.
    - සුනාමි විපත් අවස්ථාවේ ඉව පිහිට කොට ගත් සත්තු ඊට හසු නොවී ආරක්ෂා ස්ථාන සොයා යාම
- සතුන්ගේ මෙබඳු විශේෂ හැකියා මිනිසා විසින් ද ප්‍රයෝජනයට ගත් හා ගන්නා ආකාරය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සමහර සතුන් අතීතයේ කෘෂිකාර්මික කටයුතු සඳහා සහ වෙනත් විවිධ ප්‍රයෝජන සඳහා යොදා ගත් ආකාරය පෙන්වා දෙන්න. ගමනාගමනය සඳහා යොදා ගැනීම, තවලම්වල බඩු ගෙන යාම, තම ආරක්ෂාව, සතුන් දඩයම් කිරීමේ දී සහාය වීම, පණිවුඩ ගෙන යාම කෘෂිකාර්මික කටයුතුවලට උදවු කිරීම... වැනි උදාහරණ : ඇටි කුකුලා, වගාවට හානි කරන ගොලුබෙල්ලා විනාශ කිරීම ... වැනි
- සතුන් ප්‍රයෝජනයට ගනු ලබන වර්තමාන ක්‍රියාකාරකම් පිළිබඳ ව ද කතා කරන්න. තම ආරක්ෂාව, අපරාධකරුවන් හඳුනා ගැනීම, මත් ද්‍රව්‍ය හඳුනා ගැනීම, බිම් බෝම්බ හඳුනා ගැනීම, උදවු අවශ්‍ය අයට උදවු වීම, ක්‍රීඩා සඳහා යොදා ගැනීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තමන් දන්නා සතකුගේ විශේෂ හැකියාවන් (උදාහරණ : වචන හසුරුවන ගිරවෙක්, පීනන්නට දක්ෂ බල්ලෙක්) අළලා කවි/ගීත රචනා කිරීමට යොමු කරන්න. පන්තිය ඉදිරියේ මෙම කවි/ගීත ගායනා කිරීමට සලස්වන්න.

උදාහරණ :

ගුම් ගුම් හඬ දීලා
හොඳම තැනක් බලලා
මුං ඇට තරමේ මැටි ගුලි ගෙනල්ලා
එක පිට එක තබලා
රන් කුඹලා උළුවස්සේ උඩ අපේ
පුංචි ගෙයක් හැදුවා
පොඩි පොඩි කාමර වෙන් කෙරුවා
සන්තෝසෙන් රුං හඬ දීලා
අද හෙට තව තව වැඩි වෙනවා
පැතුම් ගොඩක් ඇත හිත යට සැඟවීලා
ගුම් ගුම් .......
හදාපු ගෙය පුච්චා දැමුවා
කොහු මිටකින් ඇනලා කැඩුවා
ඉකි බිඳ බිඳ කුඹලා හැඬුවා
කුඹලෝ නුඹ මෙන් මමත් එදා හැඬුවා
ගුම් ගුම් ...
එහා ගෙදර අපේ සුමනක්කා
එක්කල මම ගේකුත් හැදුවා
ඒකත් අම්මා ඇවිත් කැඩුවා
ඔයයි මමයි හැදු පුංචි ගෙවල් කැඩුවා
ගුම් ගුම් ...

(පද රචනය :ක්ලෝඩ් ද සොයිසා)

ක්‍රියාකාරකම 5

✠ මැත දී අසනීප වූ පවුලේ කෙනකු හෝ අසල්වැසියකු හෝ පිළිබඳ තොරතුරු සිසුන් ගෙන් විමසන්න.

- මෙම අසනීප පිළිබඳ ව ඔවුන් දන්නා තොරතුරු ඉදිරිපත් කිරීමට සලස්වන්න. මෙම අසනීප මැලේරියාව, ඩෙංගු, චිකුන් ගුන්යා, පාචනය, ජල භීතිකාව වැනි රෝග විය හැකි ය.
- මේ රෝග සියල්ලක් ම වැළඳෙන්නේ විවිධ විෂබීජ වර්ග ශරීර ගත වීම නිසා බවත්, විෂබීජ අපේ ශරීරවලට ඇතුළුවන්නේ සතුන් මඟින් බවත් පෙන්වා දෙන්න.

උදාහරණ:

| | රෝගය | රෝග බීජ ගෙන එන්නා | අප සිරුරට ඇතුළු වන ආකාරය |
|---|---|---|---|
| 1 | මැලේරියාව | මදුරුවෙකි | ලේ උරාබීම සඳහා ශරීරය විද තුවාල කිරීමේ දී |
| 2 | ඩෙංගු | මදුරුවෙකි | ලේ උරාබීම සඳහා ශරීරය විද තුවාල කිරීමේ දී |
| 3 | චිකුන් ගුන්යා | මදුරුවෙකි | ලේ උරාබීම සඳහා ශරීරය විද තුවාල කිරීමේ දී |
| 4 | පාචනය | ගෙමැස්සා | අපේ අහාර මත ඇවිදීමේ දී හා ඒවා ලෙව කෑමේ දී |
| 5 | ජල භීතිකාව (පිස්සු බලු රෝගය) | බල්ලා, බළලා නරියා, වඳුරා | හපා කා තුවාල කළ විට කෙළවල තිබෙන විෂබීජ ශරීර ගත වීමෙන් |
| 6 | මහමාරිය | මීයා | මීයාගේ ඇඟේ වසන මැක්කෙක් මඟින් |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

| | | | |
|---|---|---|---|
| 7 | බරවා | මදුරුවා | ලේ උරාබීම සඳහා ශරීරයට දෂ්ඨ කිරීමේ දී |

- මදුරුවා, ගෙමැස්සා, බල්ලා, මීයා ආදී සතුන්ගේ තරමක විශාල පින්තූර සිසුන්ට ඉදිරිපත් කරමින් මෙම තත්ත්වයන් විස්තර කිරීම වඩා ඵලදායක වනු ඇත.
- මෙම රෝග භයානක බවත්, බොහෝ විට මාරාන්තික බවත් පෙන්වා දෙන්න.
- මෙම රෝග වැළඳීම වළක්වාලීමට අපට කළ හැකි දේ කුමක් දැ යි විමසන්න.
  මේ සඳහා
  - මදුරුවන් බෝවීම වැළැක්වීමට කටයුතු කිරීම (මේ සඳහා මදුරුවන් බෝවන ස්ථානවන වතුර එකතු වන තැන් නැති කර දැමීම ගැන සාකච්ඡා කරන්න)
  - මදුරුවන් තමන් වෙත ළඟා වීම වළක්වන ක්‍රම භාවිතය (මදුරුවන් බොහෝ විට නිවෙස්වලට ඇතුළු වන්නේ සවස් කාලයේ බැවින්, ඊට පෙර නිවසේ දොර ජනෙල් වසා දැමීම, දොර ජනෙල්වලට සවි කොට ඇති වාකවුළුවලට සියුම් දැල් සවි කිරීම, නිදන විට මදුරු දැල් භාවිතය)
  - මදුරුවන් පලවා හැරීමේ උපක්‍රම භාවිත කිරීම (මදුරුතලා ශාකය පුළුස්සා දුම් ගැසීම, පැඟිරි තෙල් ඇඟේ තවරා ගැනීම)
  - ගෙමැස්සන් අපේ ආහාර මතට පැමිණීම වැළැක්වීමේ උපක්‍රම යෙදීම (නිවස හා අවට පිරිසිදු ව තබා ගැනීම මඟින් මැස්සන් බෝවීම වැළැක්වීම, අපේ ආහාර වසා තැබීම)
  - මීයන් බෝවන්නේ අපිරිසිදු ස්ථානවලත්, අනවශ්‍ය ලෙස බඩු ගොඩ ගැසුණු ස්ථානවලත් බැවින් නිවස හා ඒ අවට පිරිසිදුවත්, ක්‍රමානුකූලවත් තබා ගැනීම.
  - මීයන් නිවසට ඇතුල් විය හැකි ස්ථාන වසා දැමීම.
  - නුපුරුදු හැසිරීම් පෙන්නුම් කරන බල්ලන් හා බළලුන් වෙතින් ඉවත් වීම, එවැනි සතුන් සුරතල් කිරීමට නොයාම, එවැනි සතුන් තමන් ඉදිරියට එන විට මග හැර ගොස් ආරක්ෂක ස්ථානයකට යාම.
  - අපිරිසිදු බල්ලන්ගෙන් හා බළලුන්ගෙන් කුෂ්ඨ ආදී නොයෙකුත් සමේ රෝග බෝවිය හැකි නිසා ඔවුන් සමඟ සුරතලයට නොයාම. (සතුන්ගේ ලොම් නාසයට යෑම)
- රෝග බෝ කරන සතුන්ගෙන් ප්‍රවේශම් වන ආකාරය පැහැදිලි කෙරෙන සේ දෙබස් සකස් කොට පන්තිය ඉදිරියේ ඒවා ඉදිරිපත් කිරීමට සිසුන්ට සලස්වන්න.
- රෝග බෝ කරන සතුන්ගෙන් ප්‍රවේශම් වන ආකාරය පැහැදිලි කෙරෙන පෝස්ටර් නිර්මාණය කර සුදුසු ස්ථානවල ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය මග පෙන්වීම් කරන්න. මෙහි දී සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කිරීම වඩාත් වැදගත් ය.

ක්‍රියාකාරකම 6

✠ ගස්වැල් හා පැළෑටි තේමාවේ දී ගස්වැල් හා සතුන් අතර ඇති සම්බන්ධකම් කිහිපයක් ම සිසුන් විසින් හඳුනා ගෙන ඇත. මේවාට අමතර ව සතුන්ගෙන් අවට පරිසරයට හා එහි ජීවත් වන මිනිසා ඇතුළු වෙනත් සතුන්ට සේවාවන් සැපයෙන අනෙකුත් ක්‍රම කෙරෙහි ද සිසුන්ගේ අවධානය යොමු කරවන්න.

- පොළොව මත එකතු වන විවිධ අප ද්‍රව්‍ය, කැබලි කොට ඒවා දිරාපත් කරවන්නට උදවු වීම (උදාහරණ : වේයා, ගැඩවිල් පණුවා)
- කුණු කසල කා දැමීම (උදාහරණ : කපුටා)
- මිනිසා ඇතුළු අනෙක් සතුන්ට ආහාර ලබා දීම (උදාහරණ : එළදෙනගෙන් කිරි)
- ඖෂධ ලබා දීම (උදාහරණ : කස්තූරි මුවාගෙන් කස්තූරි)
- බොහෝ සතුන්ගේ රූපය හෝ හඬ නිසා අපේ පරිසරය ප්‍රියමනාප එකක් වීම (උදාහරණ : සමනලුන් හා පක්ෂීන්)
- මිනිසුන් හා ඔවුන්ට අයත් බඩු බාහිරාදිය ප්‍රවාහනයේ දී උදවු වීම (උදාහරණ : අලියා)
- කෘෂිකාර්මික කටයුතුවලට සහාය වීම (උදාහරණ : ගවයා)
- පරිසරයක් තුළ යම් ශාක වර්ගයක හෝ සත්ත්ව වර්ගයක හෝ ගහණය වුවමනා ප්‍රමාණයට වඩා වැඩි වුවහොත් එය පරිසරයේ සමබරතාවයට අහිතකර ය. වනයක එක් ශාක වර්ගයක්



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

(උදාහරණ : ලෝකපාලු වැල්) පමණක් හෝ එක් සත්ත්ව වර්ගයක් (උදාහරණ : මුවන්) පමණක් හෝ වැඩිවුවහොත් වනයට කුමක් සිදු විය හැකි ද? මේ නිසා වනයේ ශාක හා සතුන් බෝවීම පාලනය විය යුතු ය. ශාක ආහාරය ගන්නා සතුන් මගින් ශාකවල ගහනය වැඩිවීම ද මාංශ පරිභෝජනය කරන සතුන් මගින් සත්ත්වයින්ගේ ගහනය වැඩිවීම ද පාලනය කෙරෙන බව සිසුන්ට පහදා දෙන්න.

- මේ ආකාරයට සෑම සතකුගෙන් ම පාහේ පරිසරයට යම් සේවයක් ඉටු වන බව පෙන්වා දෙන්න. විනාශකාරී අන්දමින් සතුන් මරා දැමීමෙන් පරිසරයේ සමබරතාවට විශාල හානියක් සිදුවන බව ද පෙන්වා දෙන්න.


ක්‍රියාකාරකම 7

✠ සතුන් රැක ගැනීමේ වැදගත්කම සහ අපට හානි කරන සතුන්ගෙන් ආරක්ෂාවීම වැනි අදහස් මතු කෙරෙන කෙටි නාට්‍යයක් සැලසුම් කරන්න. එය රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

- සතුන්ගේ ස්වභාවික ලක්ෂණ, ගතිගුණ, ප්‍රයෝජන ගැන කියැවෙන කවි, ගී ගායනයට හා රංගනයට අවස්ථා සලස්වන්න.

ක්‍රියාකාරකම 8

✠ පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. එක් එක් කණ්ඩායමට රූප සටහනේ දැක්වෙන



ඉම් රේඛාව ආරම්භක රේඛාව සීමා රේඛාව

කණ්ඩායම් එක්ව සාකච්ඡා කර එක් එක් ක්‍රීඩා අවස්ථාවේ අනුකරණය කරන සත්ත්වයා තීරණය කිරීමට සිසුන්ට මග පෙන්වන්න. ඒ සඳහා මෙම තේමාවේ දී සිසුන් විසින් නිරීක්ෂණය කරන ලද සතුන් අතරින් චරිත තෝරා ගැනීමට යොමු කරන්න.

සීමා රේඛාවේ සිටින සිසුන් දෙන ලද ස ංඥාවකට අනුව ආරම්භක රේඛාව වෙතට යොමු කරන්න. දෙවන සංඥාවේ දී ආරම්භක රේඛාවේ සිට නියමිත සත්ත්වයා අනුකරණය කරමින් ඉම් රේඛාව වෙත ගොස් නැවත ආරම්භක රේඛාවට පැමිණීමට අවශ්‍ය ය.

එසේ පැමිණෙන සිසුන් ඒ වන විට ආරම්භක රේඛාවට පැමිණ සිටින සිසුන්ට තට්ටු කර තමා සිටි පේළියේ පිටුපසින් සිට ගැනීමට යොමු කරන්න.

මේ අන්දමට කණ්ඩායමේ සියලු ම සිසුන් නියමිත සත්ත්ව අනුකරණය අවසන් කළ විට වාඩිවීමට සලස්වන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නියමිත පරිදි සත්ත්ව චර්යාව අනුකරණය කර අවසන් කරන කණ්ඩායම අනුව ජයග්‍රහණය පිරිනමන්න.

## 2.3 අප පරිහරණය කරන දේ

භාණ්ඩ හා උපකරණ නිසි පරිදි භාවිත කිරීමක්, නඩත්තු කිරීමක් අනාගත වැඩ ලෝකයට අත්‍යවශ්‍ය වන්නකි. ඒ සඳහා මූලික පදනම සඳහා භාණ්ඩ හා උපකරණ නිසි අයුරින් පරිහරණය කිරීමට මෙම තේමාවේ දී යොමු වේ. එමෙන් ම පරිසරයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් භාණ්ඩ හා උපකරණ සකස් කිරීමට ද යොමු වේ.

නිපුණතා

★ එදිනෙදා පරිහරණයේ දී භාණ්ඩ හා උපකරණවල පවිත්‍රතාවය හා නිසි නඩත්තුව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් කටයුතු කරයි.

★ තම සමීප පරිසරයේ විවිධ රැකියාවල නියුතුවන්නන් භාවිත කරන උපකරණ පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.

★ එදිනෙදා භාවිත කරන උපකරණ කිහිපයක් නිවැරදි ව පරිහරණය කරයි.

★ පරිසරයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය ආශ්‍රයෙන් නිවසේ/පාසලේ පරිහරණයට සුදුසු භාණ්ඩයක් නිර්මාණය කරයි.

★ පරිසරයෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද වාද්‍ය භාණ්ඩ භාවිත කරමින් සාමූහික වාදන ගායන සහ නර්තනවල නියැලෙයි.

★ එදිනෙදා භාවිතය සඳහා ගත හැකි සෑම අවස්ථාවකම දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ හා උපකරණ තෝරා ගනියි.

★ දේශීය ද්‍රව්‍ය භාවිත කරමින් සකස් කෙරෙන උපකරණ ඇසුරින් ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ නිවසේ භාවිත කරන විවිධ භාණ්ඩ හා උපකරණ මොනවා ද? ඒවායින් ලබා ගන්නා ප්‍රයෝජන පිළිබඳ ව සිසු අදහස් විමසන්න.

- එම භාණ්ඩ හා උපකරණ වර්ගීකරණය කර දැක්වීමට සලස්වන්න.

  උදාහරණ :- තමා පෞද්ගලික ව ම පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ
  නිවසේ අය පොදුවේ පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ

- පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට බෙදන්න. මෙහි දී රෙදි, දැව, වීදුරු, ප්ලාස්ටික් වැනි විවිධ වර්ගවලින් නිෂ්පාදිත උපකරණ හෝ භාණ්ඩ හෝ තෝරා ගන්න. මේ යටතේ, පනාවක්, කෝප්පයක්, ලේන්සුවක් වැනි නිතර පරිහරණය කරන උපකරණ සහ භාණ්ඩ කිහිපයක් සිසු කණ්ඩායම්වලට ඉදිරිපත් කිරීම සඳහා සපයා ගැනීම සුදුසු ය.


- කණ්ඩායම්වලට එක් උපකරණයක් හෝ භාණ්ඩයක් හෝ ඇසුරෙන් දෙනු ලබන පැවරුමේ දී පහත සඳහන් ක්‍රියාකාරකම්වල යෙදීමට සලස්වන්න.
  - විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් සාදා ඇති භාණ්ඩ හා උපකරණ නිරීක්ෂණය කිරීම.
  - හැඩ ගැන විමසිලිමත් වීම.
  - දී ඇති භාණ්ඩයේ/උපකරණයේ අපිරිසිදු ස්ථාන හඳුනා ගැනීම.
  - අපිරිසිදු වීමට හේතු අනුමාන කිරීම.
  - මෙම අනුමාන කිරීම සඳහා භාණ්ඩ හා උපකරණ සාදා ඇති ද්‍රව්‍යයේ හා හැඩයේ බලපෑමක් වී තිබේ ද
  - එම ස්ථානය පිරිසිදු කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම.
  - පිරිසිදු කිරීම.
  - නිසි අයුරින් තැබීම.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.


- මේ ආකාරයට නිවැසියන් පොදුවේ පරිහරණය කරන වෙනත් යමක් නිසි අයුරින් පරිහරණය කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ ව අත්දැකීම් නිවසේ දී ලබා ගැනීමට යොමු කර ඒ අත්දැකීම් පන්ති කාමරයේ දී කණ්ඩායම් වී සාකච්ඡා කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න. ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න.
- යහපුරුදු පිළිබඳ ව නිතර නිතර සිහිපත් කරමින් ප්‍රායෝගික ජීවිතයේ හැකි සෑම අවස්ථාවක දී ම ඒවා ගැන සැලකිලිමත් වේ දැ යි විමසන්න. ඒ පිළිබඳ ව සොයා බලන්න.

  උදාහරණ :- පාවහන් පිරිසිදු ව තබා ගැනීම හා පාවහන් නිවැරදි ව භාවිත කළ යුතු ආකාරය
  පොත් ටික සහ පොත් බෑගය පිරිසිදු ව තබා ගැනීම
  ක්‍රීඩා භාණ්ඩ නිසි පරිදි පරිහරණය කිරීම හා නඩත්තු කිරීම .... වැනි
  තමන් භාවිත කරන පාවහන් නිවසේ තබන ස්ථානය පිළිබඳ විමසන්න.
  ගෙතුලට පිවිසෙන ආසන්න ස්ථානයක පාවහන් නිසි පරිදි ගලවා තබා ගෙතුලට ඇතුලුවීමේ සෞඛ්‍යමය වැදගත්කම සාකච්ඡා කරන්න.
  සිය පාවහන් නිසි අයුරින් පරිහරණය කිරීමෙන් හා නඩත්තු කිරීමෙන් ඇවිදීමේ නිවැරදි ඉරියව් පවත්වා ගැනීමේත් ඇති වැදගත්කම අවධාරණය කිරීමට පහත ක්‍රියාකාරකම් සඳහා යොමු කරන්න.



- සිසුන් පැළඳ ඇති පාවහන් නිරීක්ෂණය කිරීමට සලස්වන්න. පාවහන් සියල්ල යුගල වශයෙන් ක්‍රමවත් ව එක් ස්ථානයක තබා අඩිය ගෙවී ඇති අයුරු නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ :- රූප සටහනේ දැක්වෙන ආකාරයට සපත්තු අඩි පැත්තකට ගෙවී තිබිය හැක.
  සපත්තු අඩියේ පිටුපස කොටස සමබර ව ගෙවී යා යුතු ය.
  සපත්තු අඩිය පැත්තට ගෙවී ගිය අයගේ පා තැබීමේ ඉරියව්වල වැරදි තිබිය හැක.
- නිවැරදි ව ඇවිදීම පිළිබඳ ක්‍රියාකාරකම්වල යෙදීමට අවස්ථා සලසන්න.



රේඛාවක් අඳින්න. රේඛාව මත පා තබා ඇවිදීමට සලස්වන්න. එහි දුෂ්කර බව මතු කරමින් එය නිවැරදි ඉරියව්වක් නොවන බව සාකච්ඡාවක් මගින් අවධාරණය කරන්න.
ඉර දෙපස පා (ඇඟිලි පෙරට එන සේ) තබා ඇවිදීමට අවස්ථා සලසන්න.
විළුඹේ සිට පා ඇඟිලිවලට බර සමානව මාරු කරන්නේ දැයි පරීක්ෂාකාරී වන්න.
හිර සපත්තු, ලොකු සපත්තු, සමබර ව ඇවිදීමට අපහසු සපත්තු භාවිතයේ අවාසි පැහැදිලි කරන්න.

උදාහරණ :- පාසල් පොත් බෑගය පරිහරණය කිරීම.
පන්ති කාමරයේ දැනට පොත් බෑග් තබා ඇති ස්ථානය නිරීක්ෂණයට ලක් කරන්න.
බෑගය තැබීමට වඩාත් ම සුදුසු ස්ථානය ගැන විමසන්න.
නිසි තැන නොතැබූ විට ඇති වන බාධක හා අපහසුතා මොනවා දැයි විමසන්න.
එක් එක් ළමයාගේ බෑගය තුළ පොත් හා උපකරණ අසුරා ඇති ආකාරය ළමුන් ලවා නිරීක්ෂණය කරවන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පොත් හා උපකරණ ඇසිරීම සඳහා වඩාත් සුදුසු ආකාරය විමසන්න.
එක් එක් සිසුවා ලවා නිසි අයුරින් තම පොත් හා උපකරණ බෑගයේ නිසි අයුරින් ඇසිරීමට පවසන්න.

- මේ ආකාරයෙන් තමා පරිහරණය කරන භාණ්ඩයක් නිසි අයුරින් පරිහරණය කිරීම පිළිබඳ අත්දැකීම් හා අදහස් හුවමාරු කර දැනුවත් කරන්න. පවත්වා ගෙන යාම සඳහා නිතර නිතර පොත් බෑග ළමයින් ලවා නිරීක්ෂණය කරවා වාර්තා කරවන්න.
- පරිහරණය කරන භාණ්ඩ නිසි අයුරින් පරිහරණය කිරීම, ආරක්ෂා කිරීම මාතෘකා කොට ගත් යහපුරුදු ගැන කියැවෙන කවි, ගී නිර්මාණ කර ගායනය කිරීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 2

✠ සමීප පරිසරයේ වෙසෙන මිනිසුන් කරන විවිධ වෘත්තීන් පිළිබඳ ව ඒ සඳහා ඔවුන් භාවිත කරන උපකරණවල තොරතුරු ද රැස් කිරීමට යොමු කරන්න. මේ සඳහා වඩාත් වැදගත් වන්නේ නිරීක්ෂණය සඳහා සිසුන්ට අවස්ථාව සැලසීම ය. පන්ති මට්ටමින් මේ සඳහා චාරිකාවක් සැලසුම් කිරීම වඩාත් ප්‍රතිඵල දායකය.

උදාහරණ:- වඩු/පෙදරේරු ... වැනි වෘත්තීන් හා සම්බන්ධ උපකරණ

- ප්‍රදේශයේ බහුල වශයෙන් රැකියාවල යෙදෙන්නන් (භාවිත කරන උපකරණ අතුරින්) සිසුන්ට වඩාත් ඵලදායී වන උපකරණ කිහිපයක තොරතුරු රැස් කිරීමට පමණක් උපදෙස් දෙන්න. සුදුසු අවස්ථාවලදී ඒවායේ රූප ඇඳ නම් ලිවීමට යොමු කරන්න.
උපකරණවල ස්වභාවය එම උපකරණ භාවිත කරන ආකාරය, නිරීක්ෂණයට යොමු කරන්න.
තොරතුරු දැන ගැනීම සඳහා ප්‍රශ්න විමසීමට යොමු කරන්න. රැස් කරන තොරතුරු පන්ති කාමරයේ දී කණ්ඩායම් වශයෙන් ගොනු කර ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම 3


✠ ඒ ඒ පරිසරයේ ඇති විවිධ සම්පත් උපයෝගී කොට ගෙන තමාට හෝ නිවසට හෝ පාසලට හෝ එදිනෙදා භාවිතයට ප්‍රයෝජනවත් පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ නිර්මාණයක් කිරීමට කණ්ඩායම් පැවරුම් හා අවශ්‍ය උපදෙස් දෙන්න.


උදාහරණ :-


පවිත්‍ර කිරීම සඳහා අවශ්‍ය උපකරණ (යොදා ගත හැකි ද්‍රව්‍ය : ගෝනි නූල්, රෙදි කැබලි)
ආදේශ සංගීත භාණ්ඩ (යොදා ගත හැකි ද්‍රව්‍ය : පොල්කටු, ටොනික් මූඩි, උණ බට කැබලි, එස්රේ කොළ)
සෙල්ලම් භාණ්ඩ (යොදා ගත හැකි ද්‍රව්‍ය : රබර් ඇට, රබර් ගෙඩි, කුරුම්බැට්ටි)
විසිතුරු භාණ්ඩ (යොදා ගත හැකි ද්‍රව්‍ය : මැටි, උණ බට, පොල් හනසු )

- පරිසරයෙන් පහසුවෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් මෙම භාණ්ඩ සෑදීමට උනන්දු කරවන්න.

උදාහ







දූවිලි පිස්නාවක් බටනලාව බඹර කරත්තය

අවශ්‍ය වේ නම් මෙහි දී සම්පත් පුද්ගලයකුගේ සේවය ද ලබා ගත හැකි ය.
පන්ති කාමරය අපිළිවෙළ නොවන ලෙස නිමි භාණ්ඩ ප්‍රදර්ශනය කිරීමට අවුරුද්ද මුලදීම සැලසුම්



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

කර ගන්න.

- එක් එක් සිසුවකු හෝ සිසුන් කිහිපදෙනකු එකතු වී කළ නිර්මාණය අගය කර තව දුරටත් ඒ පිළිබඳ ව උනන්දු කර විවේක කාලවල දී ඵලදායී වැඩක යෙදවීමට යොමු කිරීම සඳහා දෙමව්පියන් දැනුවත් කරන්න.
- සිසුන් විසින් සකස් කරන ලද සංගීත භාණ්ඩ වාදනය කරමින් සමූහ වාදනවල නියැලීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

ක්‍රියාකාරකම 4

✠ පන්ති කාමරයේ දී හෝ නිවසේ දී හෝ පරිහරණය කරනු ලබන ඒ ඒ උපකරණ නිසි තැන තැබීම පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කර වඩාත් සුදුසු ආකාරයෙන් නිසි අයුරින් තැබීමට හුරුවක් ලබා දීම සඳහා ප්‍රායෝගික අවස්ථාවකට ඉඩ සලසන්න.
- ඒවා නිසිතැන තැබීම නිසා වැඩ පහසු වීම හා උපකරණවල ආරක්ෂාව සහ උපකරණවලින් සිදු විය හැකි ආපදාවලින් ආරක්ෂා වීම සිදුවන ආකාරය පිළිබඳ සිසුන්ගේ අදහස් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- භාණ්ඩ හා උපකරණ පරිහරණයෙන් පසු සෑම අවස්ථාවක දී ම ඒවා පිළිවෙළට නිසි තැන තැබීම යහපුරුද්දක් ලෙස පවත්වා ගැනීමට සිසුන් යොමු කරන්න.
- මේ ආකාරයට පන්තියේ දෛනික වැඩ කොටස් සිසු කණ්ඩායම්වලට පවරා ගෙන වැඩ කිරීමට යොමු කරන්න.
- වැඩපලක විවිධ කාර්ය සඳහා උපකරණ පරිහරණය කරමින් වැඩෙහි යෙදෙන ආකාරය දැක්වෙන නිර්මාණ කර ගත් නාටක රංගන හා අභිරූපන ඉදිරිපත් කිරීමට සිසු කණ්ඩායම් යොමු කරන්න. අවශ්‍ය උපදෙස් දෙන්න. අවශ්‍ය තැන ගායනා ද ඉදිරිපත් කිරීමට උනන්දු කරන්න. සිසුන්ගේ ම කවි, ගී දෙබස් නිර්මාණය කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ:- (අවස්ථාව - වඩුමඩුවක්)

  වඩුමඩුවක වැඩ කරන විට ඇසෙන විවිධ ශබ්ද ආදේශ භාණ්ඩ ඇසුරෙන් ප්‍රතිනිර්මාණය කිරීම.

  වැඩ කරන සේවකයන්ගේ දෙබස්
- සිසුන් ඉදිරිපත් කළ රංගන, කවි, ගී අගය කරන්න. ඒවා තව දුරටත් පෝෂණය කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

ක්‍රියාකාරකම 5




✠ උපකරණ ඇසුරෙන් ක්‍රීඩා කිහිපයක නිරත වීමට අවස්ථාව සලස්වන්න.

1. පොල්කටු ගමන (බොරු කකුල්)

   අවශ්‍ය උපකරණ

   ඇස්ස සහිත ප්‍රමාණයෙන් සමාන පොල්කටු දෙකක් හොඳින් ශුද්ධ කර එක් සිදුරක් විදින්න.
   සිසුවාගේ උස අනුව මීටර 2ක් පමණ දිග ශක්තිමත් කොහු ලණුවක් ගන්න.
   කොහු ලණුව පොල්කටු සිදුරුවලින් යවා නොගැළවෙන සේ ලොකු ගැටයකින් හිරකර ගන්න.
   කැමති ලෙස පොල් කටුව අලංකාර කර ගැනීමට යොමු කරන්න.

- එක් එක් සිසුවා න නැග ඇවිද යාමට උපදෙස් දෙන්න.

පළමු පියවර : පොල්කටුව මතට නගින්න. මාපටහිල්ල හා දෙවැනි ඇඟිල්ල අතරින් ලණුව යන සේ තබා දැතින් ලණුව ඇද අල්ලා ගන්න.

දෙවන පියවර : සෙමෙන් ඉදිරියට ඇවිදීමට උපදෙස් දෙන්න.

තෙවන පියවර : ක්‍රමයෙන් වේගය වැඩි කරලීමට අවස්ථාව දෙන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- පොල්කටු ගමන යොදා ගනිමින් ඇවිදීමේ තරග අවස්ථාවක් සංවිධානය කරන්න. මෙහි දී සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වන්න.

## 2.4 අපේ ආහාර

වෙළෙඳ පොළෙන් ආහාර තෝරා ගන්නා විට පාරිභෝගිකයන් මුලාවට පත් වීම බොහෝ විට සිදු වේ. ආහාරවල අගය පිළිබඳ තීරණ ගැනීමේ දී බොහෝ විට බලපාන්නේ ආහාර ද්‍රව්‍ය පිළිබඳ වෙළෙඳ දැන්වීම්වලින් පෙන්වන කරුණු බව ද පෙනේ. අනාගත පාරිභෝගිකයන් වඩාත් බුද්ධිමය භාවිතයකට යොමු කිරීම අපට පැවරෙන වගකීමකි.
මෙම තේමාවේ දී සිය වර්ධනය සඳහා අවශ්‍ය වන ආහාර තෝරා ගැනීමට, ආහාර පිරිසිදු ව හා ආරක්ෂිත ව ලබා ගැනීමට යොමු වේ. එමෙන් ම අනාරක්ෂිත ආහාරවලින් වැළකී සෞභාග්‍යමත් ජීවිතයක් ගත කිරීමට යොමු වන ආකල්ප හා කුසලතා ද සංවර්ධනය වේ.

නිපුණතා
★ මිශ්‍ර ආහාර වේලක ඇති වැදගත්කම හඳුනාගෙන හැකි සෑම විට ම මිශ්‍ර ආහාර වේලක් ගැනීමට පෙළඹෙයි.
★ ආහාර අපිරිසිදු වන විවිධ ක්‍රම පිළිබඳ ව සොයා බලා ආහාර පවිත්‍ර ව තබා ගැනීමට ක්‍රියා කරයි.
★ අනාරක්ෂිත ආහාරවලින් තමාට මෙන් ම අන් අයට ද වැළඳිය හැකි රෝගාබාධ වැළැක්වීම සඳහා දායක වෙයි.
★ තම ආසන්න පරිසරයෙන් සපයා ගත හැකි දෑ ඇසුරින් ආහාරයක් පිළියෙල කර පිළිගන්වයි.
★ අපේ වර්ධනය සඳහා ආහාර ගැනීමේ ඇති වැදගත්කම මතු වන විවිධ නිර්මාණ කරයි.
★ ආහාර වර්ග හා ඒවායේ ගුණාංග මතු වන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
★ ආහාරවල නම් සඳහන් කරමින් නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
✠ උදය/දවල්/රාත්‍රී සිසුන් ගත් ආහාර මොනවා දැ යි ලැයිස්තුවක් ලෙස කඩදාසියක හෝ කාඩ්පතක ලිවීමට සලස්වන්න. (සිසුන්ගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවේ) ඒවා එක ගොඩකට දමා මිශ්‍ර කරන්න. සිසුන්ට කැමති ලැයිස්තුවක් ගැනීමට ඉඩ හරින්න. ඒවායේ ඇති ආහාර වර්ග කියවීමට අවස්ථාව ලබා දෙන්න. එම එක් එක් ආහාර වේල මිශ්‍ර ආහාර වේලක් වීම සඳහා අවශ්‍ය කෙරෙන අඩු පාඩු සාකච්ඡා කරන්න. මිශ්‍ර ආහාර වේලක අන්තර්ගත විය යුතු ආහාර මොනවා දැ යි සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- දිනපතා මිශ්‍ර ආහාර වේලක් ගැනීමේ වැදගත්කම පෙන්වා දෙන්න.
ආහාර ගැනීමෙන් සිරුරේ වර්ධනය ශරීර ශක්තිය ලබා ගැනීමට ආරක්ෂාවට හේතු වන බව පැහැදිලි කර සිසුන් සමඟ සාකච්ඡා කරමින් පහත දැක්වෙන ආකාරයේ වගුවක් ගොඩ නගන්න.

| | | |
|---|---|---|
| ශක්තිය වඩන ආහාර<br>බත්, කොස්, දෙල්, අල වර්ග<br>ආප්ප, කුරක්කන් රොටී,<br>ඉඳිආප්ප, පාන්, පොල්<br>තෙල්, සීනි, හකුරු | ශරීරය වර්ධනය කරන ආහාර<br>කිරි, සෝයා කිරි, බිත්තර, මස්,<br>මාළු, කරවල, පරිප්පු, බෝංචි<br>ඇට, මුං ඇට, සෝයා බෝංචි | රෝගවලින් ආරක්ෂා කරන ආහාර<br>ගොටුකොළ, නිවිති,<br>මුගුණුවැන්න, වම්බටු, බණ්ඩක්කා<br>කැරට්, අඹ, අන්නාසි, කෙසෙල්,<br>දොඩම් |

ශරීරයේ පැවැත්මටත්, වර්ධනයටත් ඉහත කාණ්ඩ තුනට ම අයත් ආහාර වේලක් ගැනීම අවශ්‍ය වන බවත්, මෙවැනි ආහාර වේලක් මිශ්‍ර ආහාර වේලක් වශයෙන් හඳුන් වනු ලබන බවත් පෙන්වා දෙන්න. ආහාර මෙන් ම පිරිසිදු ජලය ප්‍රමාණවත් තරම් පානය කිරීමේ අවශ්‍යතාව ද පෙන්වා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ආහාර වේල නියමිත වෙලාවට ගැනීමේ වැදගත්කම ඉස්මතු කරන්න.
- විවිධත්වයෙන් යුතු ආහාර වේලක් පිළියෙල කර ගැනීමට පරිසරයෙන් ගත හැකි දෑ ගැන සාකච්ඡා කරන්න.
- සිසුන් ඉදිරිපත් කළ ආහාර වර්ග ඔවුන්ගේ සහභාගිත්වය සහිත ව වගු ගත කරන්න.
  - වටාපිටාවෙන් ලබා ගත්/ගෙවත්තෙන් ලබා ගත්
  - වගා කර ගත හැකි
  - පහසුවෙන් මිල දී ගත හැකි


  ආදී වශයෙන් වෙන් කරන්න.
- ආහාරයට ගන්නා ද්‍රව්‍ය ගෙවත්තේ වගා කර ගැනීමේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ ව සාකච්ඡා කරන්න.
  (මෙහි දී නැවුම් බව, රසායනික ද්‍රව්‍යවලින් තොර වීම, ආර්ථික ලාභ වැනි කරුණු ඉස්මතු කරන්න.)

✠ ආහාර වේලක විවිධත්වය වැඩි කිරීමෙන් සිරුරේ වර්ධනයට ආරක්ෂාවට ශක්තිය ලබා ගැනීමට අත්‍යවශ්‍ය පෝෂක ලැබෙන බව තහවුරු වන ආකාරයේ පෝස්ටර් විවිධ මාධ්‍ය තුළින් නිර්මාණය කිරීමට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න. පෝස්ටරයක් නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කරන්න.
  - පෝස්ටරයෙන් දෙන පණිවිඩය
  - වර්ණ යෙදීම
  - නිමාව
- පෝස්ටර් ප්‍රදර්ශනය කරමින් ඇගයීමට ලක් කරන්න.

ක්‍රියාකාරකම 2

✠ ශක්ති ජනක ආහාර, වර්ධන ආහාර සහ ආරක්ෂක ආහාර පිළිබඳ වගුව කෙරෙහි අවධානය යොමු කරන්න. එම වගුවේ සඳහන් ආහාර වර්ගවල නම් සඳහන් කාඩ්පත් එක් වර්ගයකට අට බැගින් සකස් කර ගන්න.

එ... මබලකවයට සමාන දුරකින් පි...




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- පන්තියේ සිසුන් කණ්ඩායම් අටකට බෙදා එක් එක් කොඩිය අසලට යොමු කරන්න. කොඩිය අසල එක් ආහාරයකින් එක් කාඩ්පත බැගින් කාඩ්පත් රුසක් විසුරුවා හරින්න.
- නලා හඬට එක් එක් කණ්ඩායමේ එක් එක් සිසුවා කාඩ්පත් තුන බැගින් ගෙන ආරම්භක රේඛාවේ සිට සමබලකවයට දිවීමට යොමු කරන්න. කාඩ්පත් තුනෙන් එකක් ශක්ති ජනක ආහාරයක් ද එකක් වර්ධක ආහාරයක් ද අනෙක ආරක්ෂක ආහාරයක් ද නම් එකක් පිරිනමන්න. එසේ නොවන කාඩ්පත් තුනකට ලකුණු නොලැබෙන බව දන්වන්න.
- එක් වරකට සමබලකවයට පැමිණෙන සිසුන් අට දෙනාගේ ලකුණු සටහන් පතේ සලකුණු කරන තුරු එම සිසුන් සමබල කවය තුළ තබා ගන්න. ලකුණු දී අවසන් වූ පසු නලා හඬට සමබලකවයේ සිසුන් නැවත කොඩිය අසලට දිවයාමට උපදෙස් දෙන්න. තමන් රැගෙන ආ කාඩ්පත් තුන නැවත කොඩිය අසල කාඩ්පත් ගොන්නට දමා පසු පසට ගොස් වාඩිවීමට උපදෙස් දෙන්න.
  කණ්ඩායමේ සියලු ම සිසුන් අවසන් කළ පසු ලකුණු සටහන අනුව කාණ්ඩායම්වලට ජයග්‍රහණ පිරිනමන්න.

ක්‍රියාකාරකම් 3

✠ ආහාර පිරිසිදු ව තබා ඇති හා ආහාර අපිරිසිදු ලෙසට තබා ඇති කුස්සි/මුළුතැන් ගෙවල් දෙකක චිත්‍ර දෙකක් ඉදිරිපත් කරන්න. එම චිත්‍ර හොඳින් නිරීක්ෂණය කළ හැකි වන තරම් ප්‍රමාණවත් විය යුතු ය.
  පිරිසිදු මුළුතැන්ගෙය දැක්වෙන චිත්‍රයෙහි ක්‍රමවත් ව බඩු තබා ඇති ආකාරයත් ආහාර වසා තබා ඇති ආකාරය පෙන්නුම් විය යුතු ය. අපිරිසිදුව මුළුතැන්ගෙයි අක්‍රමවත් ලෙස බඩු තබා ඇති ආකාරය හා කෑම විවෘතව තබා ඇති ආකාරය පෙන්නුම් විය යුතු ය. ඒ අසල පූසන්, කැරපොත්තන්, හූනන් ගැවසෙන ආකාරය හෝ එම සතුන් කිහිප දෙනෙක් භාජනවලින් කෑම කන ආකාරය දැක්විය යුතු ය.
- චිත්‍ර දෙක නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න. දැකිය හැකි වෙනස්කම් සාකච්ඡා කරන්න.
- තම නිවසේ දී ද මේ අයුරින් ආහාර අපිරිසිදු විය හැකි ආකාර පිළිබඳ සිතීමට සිසුන්ට මද වේලාවක් ලබා දෙන්න. ඒවා පිළිබඳ සාකච්ඡා කරන්න.
- මේ තොරතුරු අනුව ආහාර අපිරිසිදු වන ආකාර ලියා දක්වමින් වාර්තා කිරීමට සලස්වන්න.
- සිසුන් හෝ ගුරුවරයා හෝ විසින් පන්ති කාමරයට ගෙනෙන ලද පැණි රස කෑම වර්ග කිහිපයක් තැටියක තබා නිරාවරණය කර එයට සිදු වන දේ විමසිලිමත් ව බැලීමට මද වේලාකවත් දෙන්න. (කුඩා කණ්ඩායම් වශයෙන් නිරීක්ෂණ කිරීමට අවස්ථාව ලබා දෙන්න.)
- නිරීක්ෂණයේ දී දුටු දේ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ආහාර අපිරිසිදු වීම පිළිබඳ ව අනාවරණය වූ අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- ඉන් පසු ආහාර අපිරිසිදු වන ආකාරය පහත දැක්වෙන කරුණු ඇසුරෙන් තව දුරටත් පැහැදිලි කරන්න.
    - සතුන් නිසා
    - පාරිසරික හේතු නිසා (දූවිලි වැදීම)
    - මිනිසුන්ගේ නොසැලකිලිමත් ක්‍රියා නිසා
- ආහාර පිරිසිදු ව තබා ගැනීමට අපට කළ හැකි දේ කෙරෙහි අවධානය යොමු කරන්න.
- කෑම පිළියෙල කරන ස්ථානය/මුළුතැන්ගෙය සහ භාවිත කරන භාණ්ඩ හා උපකරණ පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.
- කෑම පිළියෙල කරන අවස්ථාවල දී ඒ සඳහා විශේෂ වූ ඇඳුම් සහ ආවරණ පිළිබඳ ව සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට යොමු කරන්න. ඇඳුම් අපිරිසිදු වන වැරදි පුරුදු ගැන ද කතා බහ කිරීමට යොමු කරන්න.
  ආහාර පිළියෙල කරන විට ඒප්‍රනයක් ඇඳීමේ ප්‍රයෝජන සාකච්ඡාවේ දී මතු කරන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- පාසලේ ගෘහ විද්‍යාගාරයක් තිබේ නම් එහි කෑමක් සාදන අවස්ථාවක් නැරඹීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. එසේ නොමැති නම් ඒප්‍රනයක් ඇඳි අයෙක් වැඩ කරන පින්තූරයක් ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න.
- මුළුතැන්ගෙය ද භාවිත වන උපකරණ ද පිරිසිදු ව තබා ගැනීමට කළ හැකි දේ කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කර ලිඛිත ව වාර්තා කිරීමට යොමු කරන්න. සකස් කරන ලද වාර්තා කියවීමට අවස්ථා ව සලසන්න. ඉදිරිපත් කරන ලද වාර්තා ඉටු කළ දේවල් අගය කරමින් දිනපතා එවැනි දේ කිරීමට හුරු වීමේ වැදගත්කම පහදා දෙන්න.
- මුළුතැන්ගෙයි විදුලි උපකරණ ඇතොත් ඒවා භාවිතයේ දී ද ආරක්ෂාකාරී විය යුතු බව අවධාරණය කරන්න.

✠ ආහාර පිළියෙල කිරීමේ දී භාවිත කිරීම සඳහා ඒප්‍රනයක් මැසීමට පහත සඳහන් උපදෙස් සිසුන්ට ලබා දෙන්න.

(i) පරණ ගවුමක් හෝ කමිසයක්/රෙදි කැබැල්ලක් ගන්න. එය හතරැස් කොටුවක් ලෙස කපා ගන්න. එහි වාටි මසා ගන්න.
(ii) ඉන ප්‍රදේශයේ වට මැන පටි තීරුවක් කපා ගන්න.
(iii) එය කලින් කැපු රෙදි කැබැල්ලට තබා මසා ගන්න. නූල් දුවවීම ප්‍රමාණවත් ය.
(iv) ශරීරයේ උඩ කොටසට ප්‍රමාණවත් හතරැස් රෙදි කැබැල්ලක් ගන්න. වාටි මසා ගන්න. එහි ඉහළ කොටසේ ගැට ගැසීමට තරම් දිග පටි දෙකක් සම්බන්ධ කරන්න.
(v) දැන් කැබලි දෙක එකතු කරන්න.
(වාටි නැවීම, නූල් දුවවීම, වාටිය මැසීම වැනි හැකියා සිසුවා තුළ ගොඩ නැගී ඇත. එම හැකියා යොදා ගනිමින් ඒප්‍රනය මැසීමට සලස්වන්න. විසිතුරු මැහුම් ක්‍රමයක් (ප්ලැන්කට් මැස්ම, නැටි මැස්ම, දම්වැල් මැස්ම) භාවිත කරමින් ඒප්‍රනය අලංකාර කර ගන්න.)

ක්‍රියාකාරකම 4

✠ කණ්ඩායම් වශයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය එක් කර පිළියෙල කළ හැකි අහාර පිළිබඳ ව සාකච්ඡා කරන්න. සිසු අදහස් ද විමසමින් එක් එක් කණ්ඩායමට සරල ලෙස සකස් කර ගත හැකි ආහාරයක් පිළියෙල කිරීමට මග පෙන්වන්න. අවශ්‍ය ද්‍රව්‍ය ගෙන ඒම සඳහා වගකීම් බෙදා ගැනීමට යොමු කරන්න. සකස් කරන ලද ඒප්‍රනය ඇඳ කණ්ඩායම් වශයෙන් තීරණය කළ ආහාරය පිළියෙල කිරීමට මග පෙන්වන්න. එක් එක් කණ්ඩායම සකස් කළ සරල ආහාර අනෙකුත් කණ්ඩායම්වලට ද පිළිගැන්වීමට අවස්ථාව දෙන්න.

- මුළුතැන්ගෙය හෝ ආහාර පිළියෙල කරන ස්ථානය හා උපකරණවල පිරිසිදුකම මෙන් ම පෞද්ගලික පිරිසිදුකම ද වැදගත් හෙයින් ඒ පිළිබඳ ව ද සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එසේ ම ගුරුවරයා විසින්

  සිසුන් නියපොතු කපා නියපොතු පිරිසිදුව තබා ගෙන දැ යි පරීක්ෂා කර බැලීම.
  සිසුන් දිනපතා ආහාර ගන්නා අවස්ථාවේ දී සබන් ගා අත් සේදීම ගැන විමසිල්ලෙන් සිටීම.
  සිසුන් කෑම කීම සඳහා පාවිච්චි කරන උපකරණ පිරිසිදු ව තබා ගනි දැ යි සොයා බැලීම.
  වැසිකිළි පාවිච්චියෙන් පසු සබන් දා දෙඅත් හොඳින් පිරිසිදු කර ගන්නේ දැ යි විමසිලිමත් වීම වැනි යහපුරුදු පාසල් කාලය තුළ ද ක්‍රියාත්මක වේ දැ යි නිරන්තරයෙන් සොයා බලන්න.

- ආහාර ගැනීමේ දී භාවිත කරන භාජන පල්ප මාධ්‍යයෙන් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.
උදාහරණ :- ප්ලාස්ටික් පිඟානක් ගන්න.
  එය මුනින් අතට තබන්න.
  කඩදාසි කැබලි ඉරා වතුර භාජනයක දමන්න.
  පාප්ප ටිකක් පිළියෙල කර ගන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මුල් වරට කඩදාසි කැබලි වතුරෙහි ගිල්වා පිහාන මත තබන්න. (පාප්ප නොගෑ තෙත කඩදාසි වීම විශේෂයි.)
පිහාන මත තැබූ තෙත කඩදාසි මත පාප්ප ගාන්න.
නැවත තෙත කඩදාසි තට්ටුවක් තබන්න.
මෙසේ ඝන තට්ටුවක් සෑදෙන තෙක් නැවත නැවත අලවන්න.
අලවන විට රැළි නොවැටෙන සේ අතින් පිරිමැද අලවන්න.
අවසානට අලවන කොළය වැඩි වශයෙන් කැබලි නොකර අලවන්න. පාට කොළයක් නම් වඩාත් හොඳය.
වේලෙන්නට තබා (දවසකට පමණ පසු) ගලවා ගන්න.
තමා කැමති ආකාරයෙන් වර්ණ හා රටා භාවිත කරමින් පිහාන අලංකාර ලෙස සකස් කර ගන්න.

එළවළු හා පළා වර්ග වැඩි වේලාවක් තැම්බීමෙන් ද එළවළු හා පළා වර්ග කපා සේදීමෙන් ද පෝෂණ ගුණය අඩු වන බවත් එළවළු හා පළා වර්ග අමුවෙන් කෑමට හෝ බාගෙට තම්බා ගැනීමට හුරු වීම වැදගත් බවත් සිසුන්ට පැහැදිලි කර දෙන්න.

- සාකච්ඡා කරන ලද එළවලු, පලතුරු, පලා වර්ගවල නම් කියමින් අත්තාල තැබීමට යොමු කරන්න.

උදාහරණ :- 1. වැටකොලු, වම්බටු වචනයේ මුල් අක්ෂරය මත තාල තබමින් කීමට යොමු කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| x | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| වැ | ට | කො | ලු | ව | ම් | බ | ටු |

පළා වර්ග - ගොටුකොළ, කංකුං

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| x | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ගො | ටු | කොළ | | ක | ං | කු | ං |
| ග | ම් | බ | ද | එ | ළ | ව | ලු |
| ව | ව | මු | ද | වැ | ඩි | යෙ | න් |

- මෙම ක්‍රියාකාරකම් අක්ෂර 4ට හා 2ට යන ක්‍රම දෙකට ම ඉටු කර ගත හැකි ය. තාලය වදින අක්ෂරය අංක 1 වශයෙන් සැලකිය යුතු ය.

උදාහරණ :-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| x | | x | | x | | x | |
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 |
| වැ | ට | කො | ලු | ව | ම් | බ | ටු |
| ගො | ටු | කොළ | | ක | ං | කු | ං |

මේ අයුරින් ගැළපෙන එළවළු, පළා වර්ග යොදා ගෙන අක්ෂර 3ට අත්තාල තැබීමට හුරුව ලබා දෙන්න.

උදාහරණ :-

| | | | | | |
|---|---|---|---|---|---|
| x | | | x | | |
| 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කැ | කි | රි | ද | ඹ | ල |

- අක්ෂර 3 යෙදෙන එළවලු, පලා වර්ගවල දී අංක අනුව අත්තල තැබීමට යොමු කරන්න.
- ආදේශ වාදන භාණ්ඩවලින් ද තාල තැබීමට අවස්ථා සලසන්න.
- ආහාර වර්ග වැඩි වේලාවක් තැම්බීමෙන් පෝෂක කොටස්වලට හානි සිදු වන බව මතු වන අයුරින් නිර්මාණශීලී නාටකයක යෙදීමට සිසුන් ව යොමු කරන්න. (රූකඩ හා වෙස් මුහුණු භාවිතයට ද උපදෙස් දෙන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 5

✠ අනාරක්ෂිත ආහාර නිසා වැළදෙන රෝගී අවස්ථාවන් භූමිකා රංගන ඇසුරින් නිරූපණයට සිසුන් යොමු කරන්න.

- එම රංගන උදවු කර ගෙන අනාරක්ෂිත ආහාර පාන ගැනීමෙන් වැළදිය හැකි රෝග පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- එම රෝග වළක්වා ගැනීමට කළ හැකි දේ ඇතුළත් උපදෙස් පත්‍රිකා පිළියෙල කරන්න.
  උදාහරණ :-ආහාර පිළියෙල කර වසා තබමු
  පලතුරු සෝදා කමු.
  ............................
- වැළඳිය හැකි රෝග හා ඒවා වළක්වා ගත හැකි ක්‍රම දැක්වෙන වගුවක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.

- පිරිසිදුකම රැකෙන පරිදි ජීවත් වීමේ දී අප අනුගමනය කළ යුතු සිරිත් විරිත් සාකච්ඡා කරන්න.
  උදාහරණ :-ආහාර පිසීමේ දී හිස, නාසය, අතගෑමෙන් වැළකීම.
  අත් පිස්නාවක් පාවිච්චි කිරීම.
- රෝග වළක්වා ගැනීමේ වැදගත්කම දැක්වෙන ආදර්ශ පාඨ සිසුන් ලවා ලියවන්න. ඒවා පුවරුවල සවි කර පාසල් වත්තේ ස්ථානයක ප්‍රදර්ශනය කරවන්න. වැඩියෙන් අවධාරණය විය යුතු ආදර්ශ පාඨ කිහිපයක් පන්තියේ එල්ලා තබන්න.

ක්‍රියාකාරකම 6

✠ ආහාර කල් තබා ගැනීම සඳහා ටින් ලෙස, පැකට් ලෙස ... ආදී වශයෙන් ඇසුරුම් කරන බව සාකච්ඡාවක් තුළින් මතු කරන්න.

- වෙළෙඳ පොළහි මිල දී ගැනීමට ඇති එවැනි භාණ්ඩ කිහිපයක ලේබල් ගෙනෙන ලෙස සිසුන්ට පවසන්න.
- කල් ඉකුත් වූ භාණ්ඩ හඳුනා ගන්නේ කෙසේ දැ යි සිසුන්ට පැහැදිලි කර ගෙනෙන ලද ලේබල් කියවා කල් ඉකුතු වීම පරීක්ෂා කිරීමට යොමු කරන්න.
- කෘත්‍රිම රසකාරක සහ වර්ණක යෙදූ ක්ෂණික ආහාර භාවිතය ශරීරයට අහිතකර බව සිසුන්ට සාකච්ඡාව තුළින් අවධාරණය කරන්න.
- එවැනි ආහාර වර්ග මොනවා දැ යි සිසුන් සමඟ සාකච්ඡාවක් තුළින් මතු කර පෙන්වන්න. (වෙළෙඳ නාම සඳහන් නොකරන්න)
- ආහාර කල් තබා ගැනීම සඳහා භාවිත කරන විවිධ ක්‍රම ඉදිරිපත් කරන්න.
  උදාහරණ :- වේලීම, වැලි යට තැබීම, මී පැණිවල බහා තැබීම, ... වැනි)
- මෙවැනි ක්‍රම පැරැන්නන් විසින් ද භාවිත කළ බව උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
- බිලිං, දෙහි, කරවිල වේලීම සහ දෙහි වැලියට තැබීම වැනි අත්හදා බැලීම්වලට යොමු කරන්න. මේවායින් නිවසේ දී ආහාර කල් තබා ගන්නා ක්‍රමයක් අත්හදා බැලීමට උපදෙස් දෙන්න.

ක්‍රියාකාරකම 7

✠ ආහාර වර්ගවල ඒවායේ ගුණාංග මතු වන කවි, ගී, ගායන, රංගනවල නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.

මේ සඳහා සිසුන් කණ්ඩායම් කර ඒ එක් එක් කණ්ඩායමකට තේමාවෙන් ඉගෙන ගත් ප්‍රධාන කරුණු කිහිපයක් මාතෘකා ලෙස නම් කර ඒවාට උචිත කවි/ගී නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.එම කවි/ගී ගායනා කරමින් රංගනය කිරීමට අවශ්‍ය උදවු ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.5 අපි ලක්වැසියෝ

විවිධ ජන කොටස් සහයෝගයෙන් ජීවත් වන අප රටේ පුරවැසියකු ලෙස අප වෙත පැවරී ඇති යුතුකම් වගකීම් බොහෝ ය. සොබා සොඳුරු පිරි රටක් ලෙස අගය කරන සෑම ජන කොට්ඨාසයකට අයත් පුරවැසියන් සමඟ සහයෝගයෙන් ජීවත් වන අපගේ ජාතික කොඩියට ගරු කරන පුරවැසියන් බිහි කිරීම අධ්‍යාපනයට පැවරෙන ප්‍රධාන වගකීමක් වෙයි. දේශයට හිතැති රටේ අනන්‍යතාවට ගරු කරන මිත්‍රශීලී ව හැසිරෙන දේශීය ද්‍රව්‍යවලින් විවිධ නිර්මාණ බිහි කරන පරිණත පුරවැසියකු තැනීම ඒ අතර ප්‍රධාන ය. එබඳු දේශයට හිතැති පරිනත පුරවැසියකු බිහි කිරීමෙහි ලා මූලික පදනම ඇති කිරීමේ අරමුණින් මෙම තේමාව සැලසුම් කර ඇත.

නිපුණතා

- ★ ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යයෙන් පිරි රටක් ලෙස අගය කරයි.
- ★ ලක් වැසියන්ගේ අනන්‍යතාව පිළිබිඹු වන ලක්ෂණ හඳුනාගෙන වාර්තා කරයි.
- ★ ශ්‍රී ලාංකික ජන කොටස් අතර මිත්‍රශීලී ආකල්ප ගොඩ නැගෙන අයුරින් ක්‍රියා කරයි.
- ★ ජාතික කොඩිය පිළිබඳ තොරතුරු විමසා බලා වාර්තා කරයි.
- ★ දේශාභිමානී කවි, ගී, කතන්දර හා රංගන ඉදිරිපත් කරයි.
- ★ ශ්‍රී ලාංකිකයන්ට අනන්‍ය වූ ක්‍රීඩාවල වින්දනාත්මකව නිරත වෙයි.
- ★ දේශීය ද්‍රව්‍ය උපයෝගී කරගෙන කළ හැකි නිර්මාණ කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පහත දැක්වෙන ආකාරයෙන් ජාතික කොඩිය හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම්වල නිරත වීමට සිසුනට අවස්ථාව සලසන්න.

- මේ සඳහා ජාතික කොඩියක් සපයා ගන්න.
- පන්තියේ සිසුන් එළිමහනට රැගෙන යන්න.
- ශ්‍රී ලංකාවේ හැඩය බිම අඳින්න. අඳින ලද ශ්‍රී ලංකා හැඩය වටේ සිට ගැනීමට උපදෙස් දෙන්න.
- ජාතික කොඩිය සිසුන් එකිනෙකා අතට දී එය හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ජාතික කොඩිය පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
    - ◆ සිංහල වර්ගයා නියෝජනය කිරීම සඳහා රතු පැහැති පසුබිමේ කහ පැහැයෙන්, කඩුව අතින් ගත් සිංහ රූපය ද
    - ◆ තැඹිලි පාට තීරුවෙන් දෙමළ වර්ගයා නියෝජනය කිරීම ද
    - ◆ කොළ පාට තීරුවෙන් මුස්ලිම් වර්ගයා නියෝජනය කිරීම ද
    - ◆ මුළු කොඩියම වට කර යෙදු කහ පාට තිරුවකින් කොඩියේ නිමාව මෙන් ම ජාතික එකමුතු ව ද
    - ◆ කොඩිය ඇතුලේ බෝ කොළ හතරක් දක්වා ඇත්තේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණය සංකේතවත් වන බව ද එය බුදු දහම මෙන් ම හින්දු ආගමට ද පොදු වූ ධර්මතාවයන් බව ද පෙන්වා දෙන්න.
- ජාතික කොඩිය පෙනෙන දුරකින් ඔසවා තබන්න. කොඩිය දෙසට මුහුණලා සීරුවෙන් සිට ගැනීමට උපදෙස් දෙන්න.
- ජාතික ගීය ගැයීම සඳහා සූදානම් විය යුත්තේ කෙසේ ද ජාතික ගීය ගයන විට සිටිය යුත්තේ කෙසේ ද යන්න තුන්වන ශ්‍රේණියේ දී අවධාරණය කරන ලද කරුණු යළි සිහිගන්වා නිසි අයුරින් ජාතික ගීය ගැයීමට අවස්ථාව ලබා දෙන්න.
- ජාතික ගීය ගායනයට පෙර ගුරුවරයා විසින් හෝ සිසුවකු ලවා හෝ ජාතික කොඩිය එසවීමට අවස්ථාව ලබා ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ජාතික ගීය ජාතියට කරන ගෞරවයක් සේ සලකන බව පහදා දෙන්න.
- ජාතික ගීය පෙළ පොත්වල මුද්‍රණය කර ඇති අතර එය නිවැරදි ව උච්චාරණය කරමින් ගායනා කිරීමටත් අර්ථය වටහා ගෙන ගායනා කිරීමටත් හුරු වීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

ක්‍රියාකාරකම 2

✠ සිසුන් කණ්ඩායම් කිහිපයක් බෙදන්න.
- කණ්ඩායම්වලට ආදර්ශ ලෝක ගෝලයක් සපයා දෙන්න. එය නිරීක්ෂණයට අවස්ථාව දෙන්න. ශ්‍රී ලංකාව පිහිටි ස්ථානය හඳුනා ගැනීමට සලස්වන්න. ශ්‍රී ලංකාවේ පිහිටීම ප්‍රකාශ කළ හැක්කේ කෙසේ දැ යි සිසුන්ගෙන් විමසන්න.
  උදාහරණ :- ශ්‍රී ලංකාව ඉන්දියාවට දකුණින් ඉන්දියාවට ආසන්නව පිහිටා ඇත.
  ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇත.
- ශ්‍රී ලංකාව පිළිබඳ ව ආදර්ශ ලෝක ගෝලය ඇසුරින් තව දුරටත් ප්‍රකාශ කළ හැකි තොරතුරු විමසන්න. ඒ අනුව ශ්‍රී ලංකාව වටා ජලයෙන් වට වී ඇති බැවින් එය දූපතක් බව පෙන්වා දෙන්න.
- ශ්‍රී ලංකාවට ආසන්නව පිහිටා ඇති රටවල් කිහිපයක් ආදර්ශ ලෝක ගෝලය ඇසුරින් නිරීක්ෂණය කර හඳුනා ගැනීමට සලස්වන්න.
  උදාහරණ :- ඉන්දියාව, මාලදිවයින, බංගලිදේශය, පකිස්ථානය, නේපාලය, භූතානය... වැනි
- කණ්ඩායම් වශයෙන් එකතු වී හඳුනා ගත් තොරතුරු ඇසුරින් ශ්‍රී ලංකාව පිළිබඳ ව වාක්‍ය කිහිපයක් ගොඩ නගා සෑම සිසුවකුගේ ම අභ්‍යාස පොත්වල ලියා ගැනීමට සලස්වන්න. සටහන් කර ගත් තොරතුරු කණ්ඩායමේ නායකයා මගින් පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 3

✠ තව දුරටත් ශ්‍රී ලංකාවේ හැඩය හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යෙදීමට සලස්වන්න.
- කණ්ඩායමකට ශ්‍රී ලංකාවේ සිතියමක් බැගින් දෙන්න.
- සවි කඩදාසියක් ගෙන පිටපත් ඇඳ ගැනීමට යොමු කරන්න.
- සුදු කොළයක් මත ඒ පිටපත තබා පැන්සලකින් තදින් ඇඳීමට උපදෙස් දෙන්න.
- ඉන් පසු සවි කඩදාසිය ඉවත් කර රේඛා මත පැන්සලයෙන් ඇඳ ශ්‍රී ලංකා සිතියම මතු කර ගන්න කියා දෙන්න. (හැකිනම් පාට කර ගැනීමට සලස්වන්න.) සිතියමේ බාහිර කොටස් කපා ඉවත් කර එම සිතියම තද නිල් පැහැති වාර්නිෂ් කොළයක් මත ඇලවීමට උපදෙස් දෙන්න.
- නිල් පැහැති කොටස මුහුද ලෙසත් පාට කළ පෙදෙස ගොඩ බිම ලෙසත් හඳුන්වා දෙන්න. ප්‍රධාන නගර කිහිපයක් ලකුණු කිරීමට යොමු කරන්න.
  උදාහරණ :- ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ, ගාල්ල, මහනුවර වැනි ප්‍රධාන නගර කිහිපයක් සහ තම පළාතේ ප්‍රධාන නගරය ද ලකුණු කිරීමට යොමු කරන්න.
- මෙම නිල් පසුබිම සහිත ශ්‍රී ලංකා සිතියම සිසු නිර්මාණ පුවරුවේ අලවන්න. ප්‍රදර්ශනය කරවන්න. අගය කරන්න.

ක්‍රියාකාරකම 4

✠ රාජ්‍ය ලාංඡනය පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම වැදගත්ය. මේ සඳහා ඉදිරිපත් කර ඇති තොරතුරු භාවිත කරන්න.
- රාජ්‍ය ලාංඡනය සඳහා යොදා ඇති සංකේත මගින් සෞභාග්‍යමත් ස්වයං පෝෂිත රටක ඉර හඳ පවත්නා තාක් කල් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා යි යන අදහස පිළිබිඹු කරන බව පැහැදිලි කරන්න.
  - පුන්කලසින් සෞභාග්‍ය ද
  - වී කරලින් සවයං පෝෂිත භාවය ද



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- කඩුවක් රැගත් පලාපෙති වටය මැද සිටින සිංහයාගෙන් රට හා විනය ගරුක ජාතිය ද
- ධර්ම චක්‍රයෙන් ධර්මය ද
- ඉර හඳ දෙකෙන් සදාකාලික පැවැත්ම ද මූර්තිමත් කෙරෙයි.




රාජ්‍ය ලාංඡනය හොඳින් පෙනෙන සේ විශාල කර ප්‍රදර්ශනය කරන්න.

- තම පෙළ පොත්වල මෙම ලාංඡනය තිබේ දැ යි බැලීමට යොමු කරන්න.
- රාජ්‍ය ලාංඡනය ඇති සලකුණු හඳුන්වා දෙන්න.
- ශ්‍රී ලංකා රජයේ සෑම ලියවිල්ලක ම මෙම ලාංඡනය තිබිය යුතු බව මතක් කර දෙන්න.
- රජයේ දෙපාර්තමේන්තුවල මෙම ලාංඡනය ප්‍රදර්ශනය කර ඇති බව මතක් කරන්න.
- මෙම ලාංඡනය යොදා ඇති ස්ථාන ගොඩනැගිලි පිරික්සීමට හා වාර්තා ගත කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම 5

✠ ශ්‍රී ලංකාවේ ජාතික සංකේත හඳුනා ගැනීමට සලස්වන්න.

ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා - වලිකුකුළා
ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය - නා ගස
ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය - නිල් මානෙල්
ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව - අත්පන්දු (වොලිබෝල්)

- ඔබ පරිසරයේ ජාතික සංකේත නිරීක්ෂණයට අවස්ථා තිබේ නම් ඒ සඳහා සිසුන්ට අවස්ථාව සලසන්න.
- සංකේතවල වැදගත්කම කතා බහ කරන්න.

උදාහරණ :- ජාතික වෘක්ෂය - නා ගස

මෙම ශාකයේ දක්නට ලැබෙන ලක්ෂණ මොනවා ද?

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 6

✠ අප රටේ ජාතික ක්‍රීඩාව අත්පන්දු (වොලිබෝල්) බව පැහැදිලි කර දෙන්න. වොලිබෝල් ක්‍රීඩා කරන අවස්ථාවක් නිරීක්ෂණයට සලස්වන්න.

පන්දු ආශ්‍රිත ව ක්‍රීඩා කිරීමට යොමු කරන්න. මෙහි දී පන්දු විසි කිරීම හා ඇල්ලීම පිළිබඳ ව මූලික හුරුකම් ලබා දීමට අවස්ථාව සලසන්න.


උදාහරණ :-



1 වන කණ්ඩායම



2 වන කණ්ඩායම සීමා රේඛාව



හිස්වැසුම් සහිත නායකයා

හිස්වැසුම් සහිත නායකයා

- පන්තිය සමාන කණ්ඩායම් කිහිපයකට බෙදන්න. හිස්වැසුම් ලා ගත් නායකයා කණ්ඩායමට ඉදිරියෙන් ඈතින් සිටිමට සලස්වන්න. සීමා රේඛාවේ සිට එකිනෙකා පසුපස සිටින කණ්ඩයමෙන් පළමු වැන්නා වෙත නායකයා පන්දුව එවීමට යොමු කරන්න. පන්දුව ඉහළින් විසි කිරීම හෝ පෙරලීම හෝ කළ හැකි ය. ඔහු/ඇය එය අල්ලා නැවත නායකයා වෙත යවා පසු පසට දිව යන අතර අනෙකා ඊළඟට සීමා රේඛාවට පැමිණ පෙර පරිදි ම ක්‍රියාකාරකමේ යෙදීමට සලස්වන්න. කණ්ඩායම් සියල්ල ක්‍රීඩාව එක වර ආරම්භ කරන අතර මුලින් ම අවසන් කරන කණ්ඩායමට ජය හිමි වේ.

ක්‍රියාකාරකම 7

✠ තව දුරටත් මෙවැනි ක්‍රීඩා නිර්මාණය කර ගනිමින් සිසුන්ට ක්‍රීඩාවල නිරත වීමට අවස්ථා ලබා දෙන්න.

- ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසරය තුළ හඳුනා ගත හැකි දෑ පිළිබඳ ව සෞන්දර්යාත්මක ව අගය කරමින් කතා බහ කරන්න. මෙහි දී සිසු අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ :- සිසුන් විසින් නරඹන ලද ගංගා දිය ඇලි වනාන්තර කඳු ... වැනි

- අපේ රටේ පිහිටා ඇති මෙම ස්වභාවික ස්ථාන කිහිපයක් හඳුන්වා දෙන්න.

  උදාහරණ :- කඳු : පිදුරුතලාගල, කිරිගල්පොත්ත, ශ්‍රී පාදය .. වැනි මෙයින් ශ්‍රී ලංකාවේ උස ම කන්ද පිදුරුතලාගල බව

  දියඇලි : බඹරකන්ද, දියලුම, දුන්හිඳ .. මෙයින් ශ්‍රී ලංකාවේ උසම දිය ඇල්ල බඹරකන්ද දිය ඇල්ල බව

  ගංගා : මහවැලි, කැලණි, කළු, වලවේ, ගිංගඟ, මල්වතු ඔය ... මෙයින් මහවැලි ගඟ ශ්‍රී ලංකාවේ දිග ම ගංගාව බව

  වනාන්තර: සිංහරාජ, බඩගමුව (කුරුණෑගල පිහිටා ඇත)

- ශ්‍රී ලංකා සිතියමක් ඇසුරින් මේවා පිහිටි ස්ථාන හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. (සිතියමක ලකුණු කිරීම අවශ්‍ය නැත) මේවා පිළිබඳ අත්දැකීම් සහිත සිසුන්ට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. පින්තූර, රූප ඇසුරු කර ගනිමින් මේවායේ ස්වභාවික අලංකාරය වැදගත්කම සරල ව, කතා බහ කරන්න. හැකිනම් මේවායින් ස්ථානයක් හෝ දෙකක් හෝ නිරීක්ෂණය සඳහා අධ්‍යයන චාරිකාවක් සැලසුම් කරන්න.

- ශ්‍රී ලංකාවේ ස්වභාවික සෞන්දර්ය අලලා පොත් පිංචක් හා බිත්ති පුවත් පතක් සකස් කිරීමට යොමු කරන්න. මේ සඳහා විවිධ නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. (ලිපි, කොලාජ් නිර්මාණ, චිත්‍ර ... වැනි)

- කැමති මාධ්‍යයක් භාවිත කරමින් සිත් ගත් ස්ථානයක ආකෘතියක් නිර්මාණය කිරීමට ද අවස්ථාව සලස්වන්න.

- තව ද ස්වභාව සෞන්දර්ය විදහා දැක්වෙන චිත්‍රයක් ඇඳීමට ද අවස්ථාව ලබා දෙන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 8

✠ ජාතික අභිමානී දනවන කවි ගී ගායනය සඳහා අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා සුවිශේෂී සෞන්දර්යාත්මක වැඩසටහනක් සැලසුම් කරන්න. වැඩසටහනට පෙර දේශාභිමානී කවි ගී රැස් කිරීමට යොමු කරන්න.

- ගායනා රංගන සහ ආදේශක භාණ්ඩ වාදනය මගින් වර්ණවත් කළ හැකි වේ. අවශ්‍ය නම් සෞන්දර්ය ගුරුවරයා හෝ වැඩිහිටි සිසුන්ගේ හෝ සහාය ලබා ගැනීමෙන් වැඩසටහන වඩාත් අලංකාරවත් කර ගන්න.
- විශේෂයෙන් සිසුන් තුළ අභිමානයක් ඇති වන ලෙස ඉදිරිපත් කිරීමෙන් ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය ඇති කළ හැකි වේ.
- මෙම වැඩසටහන සඳහා යොදා ගත හැකි කවි, ගී ගායනා කිහිපයකට උදාහරණ පහත දැක්වේ.

හෙල ජාතික අභිමානේ
වැඩූ විරුවන් සේ පොරනේ
දිනූ මව්බිම සව් සරියෙන් සරසව්
පිබිදෙව් පිබිදෙව් සැරසෙව් //
　වීර විකුම් පෑ හෙළ දරුවෝ
　දෙස රැස මුර කෙරුවෝ
　ඒ ලෙස ඇති සිරි සුර විරවෝ
　නොමවව් ණය කරුවෝ
දැය දියුණට හද යන නැවියා
ගොවියා බිම දෙවියා
විපතෙහි සැපතෙහි
නොසැලෙයි නොතැලෙයි
අට ලෝ දම හුරු හෙළයා
　මුහුදට ඇදෙන මහ ගංගා
　කුඹුරට යළි හරවා
　ධාන්‍ය වගා කොට සිරිලක මේ
　පෙරදිග කෙත කරවව්
අර පිරිමැස්මට පුරුදුවෙලා
සිඳලව් දුක සංකා
පැරකුම් යුගයක් නැවතත් අරබව්
නිජ භූමි තලේ ලංකා

(පද රචනය - කරුණාරත්න අබේසේකර)
(ගායනය - සී. ටී. ප්‍රනාන්දු )

ක්‍රියාකාරකම 9

✠ ශ්‍රී ලංකාවේ වෙසෙන ප්‍රධාන ජන කොටස් පිළිබඳ තොරතුරු රැස් කිරීමට සිසුන් යොමු කරන්න. සිසුන් කණ්ඩායම් හතරකට බෙදා පහත සඳහන් තොරතුරු රැස් කිරීමට යොමු කරන්න. මේ සඳහා පහත සඳහන් ආකාරයේ වගුවක් උපයෝගි කර ගත හැකි ය .

| ජන වර්ගය | ආහාරපාන | ඇඳුම් පැළඳුම් | උත්සව හා සංස්කෘතික ලක්ෂණ | වෙනත් |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- සිසුන් රැස් කළ තොරතුරු ඉදිරිපත් කිරීමට සලස්වන්න. කණ්ඩායම් ඉදිරිපත්කරන සටහන් මුල් කර ගත් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- වර්තමානයේ සෑම ජන කොට්ඨාසයක් ම පාහේ විශේෂයක් නොමැතිව සමහර ආහාරපාන සහ ඇඳුම් පැළඳුම් මිශ්‍රව භාවිත කරන බව සාකච්ඡා මඟින් මතු කර ගන්න. උදාහරණ : තෝසෙ, වඩේ, සල්වාරිය සෑම ජන කොටසක් ම ප්‍රිය කරන බව

ක්‍රියාකාරකම 10

✠ මෙම එක් එක් සංස්කෘතික ලක්ෂණ රැස් කළ තොරතුරු යොදා ගනිමින් සංස්කෘතික ප්‍රදර්ශනයක් සැලසුම් කරන්න.

- මෙම ප්‍රදර්ශනය සඳහා

  එක් එක් ජනවාර්ගිකයන්ට සුවිශේෂී වූ ආහාර පාන ඇඳුම් පැළඳුම් ආකෘති සකස් කිරීම

  උත්සව අවස්ථා පිළිබිඹු වන චිත්‍ර නිර්මාණය කිරීම

  එක් එක් උත්සවවල දී ලබා ගත් ඡායාරූප, පින්තූර යොදා ගැනීම

  මේ සඳහා කණ්ඩායම්වලට අවශ්‍ය ද්‍රව්‍ය රැස් කිරීමට හා ආකෘති සකස් කිරීමට යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.6 ආරක්ෂාව හා පරිස්සම

වගකිව යුතු පුරවැසියන්ගෙන් යුත් සමාජයක ප්‍රවේසම පිළිබඳ සංකල්පය (SAFETY CONCEPT) සහිත ව ක්‍රියා කරති. දෛනික ක්‍රියාකාරකම්හි දී ද සමාජ කාර්යයන්හි දී ද එවැනි පුරවැසියන් හැසිරෙනුයේ තමා පිළිබඳ ව මෙන් ම අනුන් පිළිබඳ ව ද වගකීමකින් යුතුව ය. ප්‍රවේසම පිළිබඳ සංකල්ප සහිත ව වගකීමෙන් යුතු ව ක්‍රියා කරන අනාගත පුරවැසියන්ගේ පදනම සකස් කරනු පිණිස මෙම තේමාව සැකසී ඇත. මෙහි දී අනාරක්ෂිත අවස්ථා හා ස්ථාන හඳුනා ගෙන ඒවායින් ආරක්ෂා විම, ආහාර පාන විෂ වීම හා ඉන් සිදු විය හැකි අහිතකර තත්ත්ව වළක්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත. විවිධ වැඩවල නිරත වීමේ දී තම ආරක්ෂාව සඳහා පියවර ගැනීම වාහනවල ගමන් කිරීමේ දී සිදු විය හැකි අනතුරු හා ඒවායින් වැළකී සිටීම හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල යෙදී අත්දැකීම් ලබනු ඇතැයි අපේක්ෂිත ය.

නිපුණතා

- ★ අනාරක්ෂිත අවස්ථා සහ ස්ථාන හඳුනා ගෙන ඒවායින් ආරක්ෂා වීමට පියවර ගනියි.
- ★ ආහාරපාන විෂ විය හැකි තත්ත්වයන් හා ඉන් සිදුවිය හැකි අහිතකර බව සොයා බලා ඒවා වැළැක්වීමට පියවර ගනියි.
- ★ විවිධ වෘත්තීන්හි යෙදෙන පුද්ගලයන් තම ආරක්ෂාව සඳහා යොදා ගන්නා මෙවලම්/උපකරණ/ ඇඳුම් පැළඳුම් පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
- ★ වාහනවල ගමන් කිරීමේ දී විය හැකි අනතුරු පිළිබඳ දැනුවත් වී ඒවායින් වැළකී සිටීමට පියවර ගනියි.
- ★ ආරක්ෂිත පිළිවෙත් රකිමින් ක්‍රීඩාවල යෙදෙයි.
- ★ විවිධ වෘත්තීන්හි නියැලෙන්නන් ආරක්ෂාව හා පරිස්සම සඳහා යොදා ගන්නා උපකරණ හා මෙවලම්වල ආකෘති නිර්මාණය කරයි.
- ★ ආරක්ෂාව හා පරිස්සමට උපයෝගී කර ගත් විවිධ මෙවලම් නිර්මාණය කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට හෝ කිහිපයකට හෝ බෙදන්න. අනාරක්ෂිත ස්ථාන අනාරක්ෂිත අවස්ථා මොනවා දැ යි හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. අවශ්‍ය උදවු ලබා දෙන්න. සිසුන් රැස් කරන ලද තොරතුරු පන්ති කාමරයේ ඉදිරිපත් කිරීමට සලස්වන්න. ඒ පිළිබඳ ව කතා බහ කරන්න. එම තොරතුරු ආශ්‍රයෙන් කළුලෑල්ලේ හෝ ඩිමයි කඩදාසියක හෝ අනාරක්ෂිත ස්ථාන හා අවස්ථා වෙන වෙන ම ගොනු කරන්න.

උදාහරණ:- අනාරක්ෂිත අවස්ථා

ගංවතුර අවස්ථාවක දී දිය නෑමට යාම/ඔරු පැදීමට යාම
අකුණු අවස්ථාවක දී එළිමහනේ ගමන් බිමන් යෑම
වාහන තද බදය ඇති අවස්ථාවක පාර හරහා මාරු වීම
දුම්රිය දකිමින් දුම්රිය මාර්ගය හරහා ගමන් කිරීම
දුම්රිය මාර්ගයේ ගමන් කිරීම
පයින් ගමන් කරන විට පාරේ වම් පසින් ගමන් කිරීම
රතිඤ්ඤා පත්තු කිරීම
වීදුරු බඳුන් අතැතිව දිවීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

අනාරක්ෂිත ස්ථාන
අතුරු මාර්ගයක් ගේට්ටුවක් නොමැතිව දුම්රිය මග හරහා වැටී ඇති ස්ථාන
දිය සුලි, උල් කටු, වීදුරු කටු ආදිය බහුල ජලය පිරි ස්ථානයක්
පඩි පෙළක/ලිස්සන සුළු ප්‍රදේශයක්
නාය යන ස්ථානයක්
අලි ඇතුන් ගමන් කරන මාර්ගයක්/මංකඩක්
සර්පයින් සහිත තුඹසක්/සර්පයින් සිටින ස්ථානයක්

- එදිනෙදා පුවත්පත්වල ඇතුළත් අනාරක්ෂිත අවස්ථා හා ස්ථාන ආශ්‍රිත ව සිදු වූ අනතුරු පිළිබඳ කියවෙන තොරතුරු පින්තූර ආදිය පන්තියට රැස් කර ගැනීමට සිසුන් යොමු කරන්න. එම කොටස්වල සඳහන් වන අනාරක්ෂිත ස්ථානය හෝ අනාරක්ෂිත අවස්ථාව නිසා සිදු වූ අනතුර කුමක් ද යන්න හඳුනා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. ඒවා සටහනක් ආකාරයෙන් කළුලෑල්ලේ ගොඩ නගන්න.
- පසුව සුදුසු කොටස් ගෙන තරමක් විශාල කඩදාසියක ඒවා ඇලවීමට සිසුන්ව යොමු කරන්න. එය බිත්ති පුවත්පතක් ලෙසින් ප්‍රදර්ශනය කරන්න.

✠ තෝරා ගත් අනාරක්ෂිත ස්ථාන හා අනාරක්ෂිත අවස්ථා පිළිබඳ විදහා දැක්වෙන භූමිකා රංගන, අභිරූපණ ඉදිරිපත් කිරීම සඳහා ද සිසුන් යොමු කරන්න. තෝරා ගත් අනාරක්ෂිත ස්ථාන හා අවස්ථා පිළිබඳ ව චිත්‍ර ආකෘති වැනි දෑ නිර්මාණය කිරීමට ද සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 2

✠ ආහාරපාන විෂ වූ අවස්ථා පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න. සාකච්ඡාව තුළින් සිසු අත්දැකීම් ද මතු කර ගන්න. එම තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් වගු සටහන සම්පූර්ණ කිරීම සඳහා සිසුන්ව යොමු කරන්න.

උදාහරණ :

| සිසුවා | විෂ වූ ආහාරය | විෂ වීමෙන් පසු ඇති වූ රෝග ලක්ෂණ |
|---|---|---|
| සරත් | කල් ඉකුත් වූ සැමන් | බඩරිදීම/වමනය |
| ....... | .................................. | ...................................................... |
| ....... | ................................ | ...................................................... |
| ....... | ................................ | ...................................................... |
| ....... | ................................ | ...................................................... |

- ආහාරපාන විෂ වූ අවස්ථා පිළිබඳ වාර්තා වූ පුවත්පත් කොටස් පන්තියට රැස් කර ගන්න. එම තොරතුරු කිසියම් ආකාරයකට පෙළ ගැස්වීමක් කරන්න. (උදා :- ආහාරයට ගත් ද්‍රව්‍ය වශයෙන්) ඒ අනුව රැස් කරන ලද වාර්තා අතර කුමන කුමන ආහාර විෂ වූ අවස්ථා තිබේ ද ආදී වශයෙන් සාකච්ඡා කරන්න.
- ගෙනෙන ලද වාර්තා කොටස් විශාල කඩදාසියක ඩිමයි කොළයක/පුවත්පත් කොළයක අලවා බිත්ති පුවත් පතක් මෙන් ප්‍රදර්ශනය කිරීමට සිසුන් යොමු කරන්න.
  ආහාර විෂ වූ අවස්ථා දැක්වෙන රංගන ආදිය සඳහා ද සිසුන්ව තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.
- විෂ විය හැකි අවස්ථා සහිත ආහාර හෝ වෙන යම් තොරතුරු සිසුන් ලවා රැස් කර පන්ති කාමරයට ගෙන්වා ගන්න. හැකිනම් ආහාර කොටස් ගෙන්වා පාසලේ තබා ඒවා නරක් වන අයුරු/විෂ වන අයුරු පරීක්ෂා කරන්න.
  උදාහරණ:- කල් ඉකුත් වූ අහාර අඩංගු භාජනයක දවටනයක්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පුස් බැඳුණු පරණ වූ පාන් කැබැල්ලක්
පරණ වී දුගඳ හමන බත්, එළවළු වැනි කොටස්
සුළඟට හසු වූ මඤ්ඤොක්කා අල කැබැල්ලක්
බාල ඇලුමිනියම් භාජනවල ආහාර පිසීම.. වැනි

මෙවැනි කොටස් ගෙන්වා ගෙන සිසුන්ට සියුම්ව පරීක්ෂා කිරීමට අවස්ථා සලසන්න. ඒ අනුව ආහාර විෂ වන අයුරු පිළිබඳ ව අත්දැකීම් ලබා දෙන්න.

- පන්තියේ/පාසලේ ආහාර විෂ වූ අවස්ථාවලට මුහුණ පෑ සිසුන් කිහිප දෙනකු හමු වී ඔවුන්ට විෂ වූ ආහාරය, ඒ නිසා ඇති වූ රෝග ලක්ෂණ ආදී තොරතුරු විමසන්න. සාකච්ඡාවක් ඇසුරින් තොරතුරු ලබා ගැනීමට යොමු කරන්න. පසුව පහත සඳහන් සටහන සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.

| විෂ වූ ආහාරය | සිදු වූ හානි හා රෝග ලක්ෂණ |
|---|---|
| කල් ඉකුත් වූ සැමන්<br>පෝමලින් දැමූ මාළු ආහාරයට ගැනීම<br>අන්නාසි ගැට | බඩරිදීම/වමනය<br>තොල් ඉදිමීම<br>ශරීරයේ පලු ඇති වීම, සම කැසීම |

- සිසුන් සමඟ සිදු කරන සාකච්ඡාවේ දී ආහාර විෂ සහිත හා නරක් වන අවස්ථා පිළිබඳ හැකි තරමින් මතු කර ගන්න.

  උදාහරණ:- මැස්සන් වැනි සතුන් වැසීමෙන්, හොඳින් නොතැම්බීමෙන්, වස විෂ මිශ්‍ර ආහාරයට ගැනීමෙන්, ඇලුමිනියම් භාජන වල පිසූ ආහාර සඳහා ඇඹුල් දැමීමෙන් ආදී වශයෙන් මතු කර ගන්න.

ක්‍රියාකාරකම 3

✠ අවට පරිසරයේ සිටින උපකරණ/මෙවලම්/නිල ඇඳුම් භාවිත කරන රැකියාවල සහ ක්‍රීඩාවල නියුතු අය පිළිබඳ සිසුන් සමඟ සරල සාකච්ඡාවක් කරන්න. පසුව සිසුන් තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් යොමු කර විවිධ රැකියාවල නියුතු අය භාවිත කරන මෙවලම් උපකරණ ඇඳුම් පැළඳුම් පිළිබඳ තොරතුරු රැස් කිරීමට සලස්වන්න. (දෙමව්පියන් සමඟ යන ගමන්වල දී තොරතුරු රැස් කිරීම සඳහා අවස්ථා සලසා දෙන ලෙස අවුරුද්ද මුලදීම දෙමව්පියන්ට දන්වන්න) මෙම තොරතුරු සමඟ මේවා පිළිබඳ තිබෙන පින්තූර ඡායාරූප ආදිය ද පන්ති කාමරයට රැස් කර ගැනීමට කටයුතු කරන්න. සිසුන් සමඟ සාකච්ඡා කරමින් මෙම තොරතුරු ඇසුරින් පහත සඳහන් සටහන ගොඩ නැගීමට ක්‍රියා කරන්න.

| රැකියාව/ක්‍රීඩකයා | රැකියාව/ක්‍රීඩාව සඳහා අඳින පළඳින දෑ | භාවිත කරන උපකරණ/මෙවලම් |
|---|---|---|
| ලියුම් බෙදන්නා | කාකිපාට කලිසම, කෝට් එක<br>සපත්තු කුට්ටම්, තොප්පිය | |
| ක්‍රිකට් ක්‍රීඩකයා | සුදු කමිස, දිග කලිසම, හෙල්මටය<br>අත් හා පාද ආවරණ | පිත්ත/බැට්එක |
| කළුගල් කඩන්නන් | හිස් වැසුම | ගල් කඩන මිටිය |
| ......................... | ................. | .................. |

- පහත සඳහන් තොරතුරු ඇසුරින් පොත් පිංචක් සකස් කිරීම සඳහා ද සිසුන්ව යොමු කරන්න. මේවායේ පින්තූර, චිත්‍ර ආදිය ප්‍රදර්ශනය සඳහා තබන්න.
  - රැකියාව/ක්‍රීඩකයා අඳින පළඳින දෑ
  - භාවිත කරන මෙවලම් උපකරණ
  - රැකියාවට අදාළ ව සිදු කරන කටයුතු .. ආදි තොරතුරු

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මෙම ඇඳුම් පැළඳුම්, භාවිත කරන උපකරණ මෙවලම් තුළින් ඉටුවන සේවය ආරක්ෂාව ආදිය පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරන්න.
- මෙම උපකරණ මෙවලම් හා ඇඳුම් පැළඳුම් ආශ්‍රිත භූමිකා රංගන ආදිය සිදු කිරීම සඳහා ද සිසුන්ට අවස්ථා සලසන්න. මෙම රැකියා හා ආශ්‍රිත කවි එකතුවක් කරන්න.

  උදාහරණ :- පතල් කවි

  ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
  කන්නේ කරවලයි රට හාලේ බතට
  බොන්නේ බොර දියයි පුරුවේ කල පවට
  යන්නේ කවදා ද මව්පියෝ දකින්නට

  එම කවි ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- උපකරණවල ආකෘති නිර්මාණය සඳහා ද අවස්ථා සපයන්න.
- ක්‍රීඩාවට සුවිශේෂ වූ ඇඳුම් පැළඳුම්, උපකරණ භාවිත කරමින් යෙදෙන ක්‍රීඩාවල සිසුන්ට නිරත වීමට අවස්ථා සලසන්න. මෙහි දී පාසලේ සම්පත්, දරුවන්ගේ සම්පත් සොයා ගැනීමට ඇති ශක්තිය කෙරෙහි අවධානය යොමු කරමින් සුදුසු ක්‍රීඩා පමණක් තෝරා ගැනීම සුදුසු ය.


Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.7 ජලය

ජලයේ පිරිසිදු බව රැක ගැනීම සහ ජලය විවිධ කාර්යයන්ට උපයෝගී කර ගැනීම ද, ජලය සම්පතක් ලෙස සලකා කටයුතු කිරීම ද අද යුගයට ඉතාමත් ම වැදගත් ය. අනාගතයට එය අදටත් වඩා වැදගත් ය. අපේ අනාගත පරපුර ජලය පිළිබඳ ව ගවේෂණශීලී ව කටයුතු කරමින්, ජලයේ පිරිසිදු බව ආරක්ෂා කිරීමට අවශ්‍ය පදනම කුඩා අවධියේ සිටම ආරම්භ විය යුතු ය.
මෙම තේමාවෙන් ජලය උපයෝගී කර ගෙන විවිධ අත්හදා බැලීම් කිරීමට ද, ජලයේ පිරිසිදු බව ආරක්ෂා කර ගැනීම පිළිබඳ ව ද අවධානය යොමු වේ. එමෙන් ම අපිරිසිදු ජලය නිසා සුවදායී ජීවන පැවැත්මට සිදු වන බාධා පිළිබඳ ව අවබෝධයෙන් කටයුතු කිරීමට සිසුන් මෙහෙය වේ.

නිපුණතා
- ★ ජලයේ හැඩය හා ස්වරූපය වෙනස් වන විවිධ අවස්ථා සොයා බලා වාර්තා කරයි.
- ★ විවිධ ද්‍රව්‍ය ජලය සමඟ ක්‍රියා කරන ආකාරය හඳුනාගෙන වාර්තා කරයි.
- ★ ජලය අපිරිසිදු වන ආකාර හඳුනාගෙන ඒවා වළක්වා ගැනීමට දායක වෙයි.
- ★ ජලය උපයෝගයෙන් ක්‍රියා කරවිය හැකි උපකරණයක ආකෘතියක් නිර්මාණය කරයි.
- ★ අපිරිසිදු ජලය භාවිතයෙන් රෝග බෝවීම වළක්වා ගත හැකි ක්‍රම නිරූපණය වන පෝස්ටර් සාමූහිකව නිර්මාණය කරයි.
- ★ ජලය හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ★ ජලයේ වැදගත්කම හා ආරක්ෂා කර ගැනීමේ ඇති වටිනාකම කියවෙන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
- ✠ විවිධ හැඩයේ භාජන කිහිපයක් සපයා ගන්න.
  (උදාහරණ:- බෝතල්, කෝප්ප හෝ පාසලේ විද්‍යාගාරයක් තිබේ නම් එහි පරීක්ෂණ සඳහා යොදා ගන්නා භාජන කිහිපයක්) එක් එක් භාජනයට ජලය සමාන ප්‍රමාණයක් වත් කර ඒවායේ අඩංගු ජලයේ හැඩය භාජනයේ හැඩය අනුව වෙනස් වන ආකාරය නිරීක්ෂණය කිරීමට සලස්වන්න.



- මේ අනුව ජලයට නිශ්චිත හැඩයක් නොමැති බවත්, එක් එක් අවස්ථාවල දී යොදා ගනු ලබන භාජනයට අනුව හැඩය වෙනස් වන බවත් අවබෝධ කර ගැනීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 2
- ✠ ප්‍රායෝගික ජීවිතයට සමීප පහත දැක්වෙන අන්දමේ පරීක්ෂණ කිහිපයක් වෙත සිසුන් යොමු කරන්න.
- නිල් කුඩු ජලයේ හොඳින් දිය කිරීමට සුදුසු ක්‍රමයක් සොයා බලන්න.
  උදාහරණ :-
  - නිල් කුඩු ජලයට දමා කැලතීමෙන් නිල් වතුර සකස් කර ගැනීම.
  - නිල් කුඩු රෙදි කැබැල්ලක ඔතා ජලයේ දිය කිරීමෙන් නිල් වතුර සකස් කර ගැනීම.
  - අත්ල මත නිල් කුඩු දමා වතුර ස්වල්පයක් එකතු කොට අනික් අත්ලෙන් අතුල්ලා පසුව නිල් වතුර සකස් කිරීම.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- වර්ණ කිරීම සඳහා සුදුසු ප්‍රමිතියක් ලබා ගැනීමට කවර අනුපාතයකට ද්‍රව්‍ය හා ජල මිශ්‍රණය සකස් කළ යුතු ද යන්න සොයා බැලීමට සලස්වන්න. මේ අනුව චිත්‍ර මෝස්තරයක් නිර්මාණය කිරීමට යොමු කරන්න.
  උදාහරණ :- බිත්තියකට සමර/හුණු වැනි දෑ ගෑම
- සකස් කර ගත් නිල් වතුර දින කිහිපයක් නිසසල ව තබන්න. දිය වී තිබූ නිල්වලට සිදු වන්නේ කුමක්ද යන්න නිරීක්ෂණය කරන්න.
- ලුණු පහසුවෙන් දියවන්නේ කුමන උෂ්ණත්වයක තිබෙන ජලයේ දැයි සොයා බලන්න.
  උදාහරණ :- පැහැදිලි ව විනිවිද පෙනෙන උස බෝතල් තුනක් ගන්න. බෝතල් තුනම එකම ප්‍රමාණයේ වීම වැදගත් ය.
- පළමුවෙනි බෝතලයට උණු වතුර ද, දෙවැනි බෝතලයට සාමාන්‍ය උෂ්ණත්වයේ ඇති ජලය ද, අනෙක් බෝතලයට ශීත කල ජලය ද දමන්න.
- මහපට හා දබරැගිලි අගට ලුණු කුඩු ස්වල්පයක් ගන්න. පළමුවෙනි බෝතලයට දමන්න. ලුණු දියවීයාමට ගත වන කාලය සඳහන් කර ගන්න.
- මේ ආකාරයට ම දෙවැනි හා තෙවැනි බෝතල්වලට ලුණු කුඩු සමාන ප්‍රමාණවලින් හෙලන්න.
- උණු ජලයේ, සාමාන්‍ය ජලයේ හා ශීත කළ ජලයේ ලුණු කුඩු දියවීමට ගත වන කාලය සමාන හෝ වෙනස් දැයි නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✠ විනිවිද පෙනෙන බෝතල් හෝ වීදුරු කිහිපයක්, ජලය, තේ හැන්දක්, නිල් කුඩු, කහ කුඩු, කොන්ඩිස් කුඩු, සීනි, ලුණු කුඩු, තේ කහට, සායම් දියර, පාප්ප හා මැටි සපයා ගන්න.
විනිවිද පෙනෙන භාජනවලට සමාන ප්‍රමාණවලින් ජලය දමන්න. දැන් එක් එක් කුඩු හෝ කැට වර්ගය වෙන වෙන ම එම භාජනවලට දමන්න. මුලින් ම කැලතීමකින් තොර ව නිරීක්ෂණය කිරීමට සලස්වන්න. පසුව, හැන්දෙන් කැලතූ පසු සිදුවන දේ නිරීක්ෂණය කිරීමට සලස්වන්න. එක් එක් අවස්ථාවල දී සිදුවන දේ පිළිබඳ කතා බහ කරන්න. වාර්තා තබා ගැනීමට සලස්වන්න.

ක්‍රියකාරකම 3

✠ ජලය වාෂ්ප වන බව නිරීක්ෂණය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.
  - තුනී තහඩුවකට/බෝතල් මූඩියකට/මේස හැන්දකට ... වැනි දෙයකට ජලය ස්වල්පයක් දමා ඉටිපන්දම් දැල්ලකට අල්ලා රත් කිරීමෙන් ජලයට සිදුවන දේ නිරීක්ෂණය කිරීමට සලස්වන්න. මේ පිළිබඳ කතා බහ කරන්න.
  - කේතලයක් වැනි භාජනයකට ජලය දමා එය හොඳින් රත් කිරීමේ දී සිදු වන දේ නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
    කෙණ්ඩියෙන් හුමාලය පිටවන ආකාරය
    හුමාලයට පිහානක් ඇල්ලීමෙන් ජල බිඳු පිහිටන ආකාරය
- අනතුරු ව ප්‍රායෝගික ජීවිතයේ පැළැටි වියළී යෑම, තෙත රෙදි වේලීම වැනි ජලය වාෂ්ප වීමේ අවස්ථා ගෙන කතා බහ කරන්න.
- පතුල තෙත් කර සිමෙන්ති බිමක ඇවිදීමට සලස්වන්න. පාදයෙන් ඇති වූ තෙත සලකුණුවලට සිදුවන්නේ කුමක් දැයි නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- ජලය ශීත කළ විට කුමක් සිදු වන්නේ ද යන්න පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න. සිසුන්ට අයිස් කැට නිරීක්ෂණය කිරීමට ලබා දෙන්න.
  - භාජනයකට අයිස් කැට දමා ටික වේලාවක් තැබූ විට කුමක් සිදුවේ ද? (දිය වේ)
  - අයිස් කැටයක් ජලයට දැමූ විට කුමක් සිදු වේ ද? (ජලයේ පාවේ, ජලය ශීතල වේ)

ක්‍රියාකාරකම 4

✠ අවට පරිසරයේ අපිරිසිදු ජලය ඇති ස්ථාන කිහිපයක් තෝරා ගන්න. එම ස්ථානවල ජලය අපිරිසිදු වන ආකාරය පිළිබඳ තොරතුරු සොයා බැලීමට යොමු කරන්න. තොරතුරු වාර්තා කිරීමට සලස්වන්න.

- ජලය අපිරිසිදු වන ක්‍රම මොනවා ද?
  අපිරිසිදු යැ යි සිසුන් සිතන ජලය සාම්පල (නියැදි) රැස් කර නිරීක්ෂණය කිරීමත්, අපිරිසිදු වීමේ ක්‍රමය හෝ බලපෑ සාධක ගැන සාකච්ඡා කිරීමත් කළ හැකි ය.
  ජලය යොදා ගනු ලබන කාර්ය අනුව පිරිසිදුකමේ මට්ටම ගැන සැලකිලිමත් වීම වැදගත් බව ද ඒ ඒ කාර්යයට ප්‍රමාණවත් පරිදි ජලය පිරිසිදු කිරීම කළ යුතු බව ද සාකච්ඡාවකින් මතු කර ගන්න.
  ඒ සඳහා සුදුසු ක්‍රම නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න.
  ජලය පිරිසිදු කර ගැනීම සඳහා අගුරු පෙරණය, වැලි මගින් පෙරීම, ජලයේ ගිලී පාවෙන දේවල් තැන්පත් වීමට තැබීම. නටවා නිවා ගැනීම වැනි ක්‍රම උපයෝගී කර ගැනීම පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම මෙහි දී වඩා ප්‍රයෝජනවත් වනු ඇත.
- මෙම ක්‍රියාකාරකම යටතේ එක් එක් අවස්ථාවල දී සිදු වන දේ නිරීක්ෂණය කිරීමට යොමු කර ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.

ක්‍රියාකාරකම 5

✠ කොළරාව, පාචනය, සෙංගමාලය, උණසන්නිපාතය ආදී රෝග නිසා ඇති වන භයානක තත්ත්වය පැහැදිලි කරන්න. මේ සඳහා යෝග්‍ය පෝස්ටර් සහ දෛනික පුවත්පත් වාර්තා සපයා ගැනීමට සිසුන් උනන්දු කරවන්න.

- අපිරිසිදු ජලය පානය කිරීම නිසා ඇති වන රෝග පිළිබඳ ව සම්මන්ත්‍රණයක් සංවිධානය කරන්න. සිසුන්ගේ අත්දැකීම් සහ සපයා ගන්නා ලද තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. මෙම වැඩ සටහන සඳහා සෞඛ්‍ය පරීක්ෂක/පවුල් සෞඛ්‍ය සේවිකාව වැනි අයගේ සේවය ලබා ගන්න.
- ජලය හොඳින් නටවා නිවා පානය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. එය පුරුද්දක් ලෙස පවත්වා ගැනීමත් පිරිසිදු ජලය අවශ්‍ය ප්‍රමාණයක් දිනපතා පානය කිරීමේ වැදගත්කම ද පෙන්වා දෙන්න.
- විවිධ වර්ගයේ මදුරුවන් නිසා මිනිසාට වැළඳෙන රෝග පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. මේ සතුන් බෝවන ස්ථාන පිළිබඳ ව තොරතුරු සාකච්ඡා කරන්න. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් මේ පිළිබඳ නිකුත් කර ඇති පත්‍රිකා පුවත්පත් තොරතුරු සිසු කණ්ඩායම්වලට අධ්‍යයනය කිරීමට සලස්වන්න. ඒ ඇසුරින් මදුරුවන් හඳුනා ගත හැකි ලක්ෂණ හා බෝවන රෝග පිළිබඳ ව කතා බහ කරන්න.
- මෙම රෝගවලින් ආරක්ෂාවීම සඳහා කළ හැකි දේ විමසා බලන්න. මදුරුවන් බෝවන ස්ථාන නැති කිරීම සඳහාවැඩ සටහන් ක්‍රියාත්මක කරන්න.

✠ උචිත පණිවුඩ රැගත් පෝස්ටර්/චිත්‍ර නිර්මාණය කිරීම හා දැන්වීම් පත්‍රිකා සකස් කර ප්‍රදර්ශනය කරන්න.

✠ සිසුන් කණ්ඩායම් කරන්න. එක් එක් කණ්ඩායම්වලට නාටක අනුසාරයෙන් ලෙඩ රෝග පැතිරීම වළක්වාලීම සඳහා ද කෙටි රංගනයක යෙදීමට අවස්ථාව සලසන්න.

- ඉදිරිපත් කළ නාටක චරිත තව දුරටත් පෝෂණය කර ගත හැකි අවස්ථා පිළිබඳ ව කතා බහ කරන්න. ඒවා අගය කරමින් සිසුන් තව දුරටත් උනන්දු කරන්න.

ක්‍රියාකාරකම 6

✠ කුරුම් බැට්ටියක් හෝ රෙජිෆෝම් කැබැල්ලක් හෝ ගන්න.

- එහි මැදින් ඝන කූරක් දමන්න.
- එක සමාන දිග ඇති ඉරටුවල අග කුරුම්බැට්ටියක් හෝ රෙජිෆෝම් කැබැල්ලක් හෝ අමුණන්න.
- මෙම ඉරටු වළලු සුදානම් කර ගත් කුරුම්බැට්ටියේ හෝ රෙජිෆෝම් කැබැල්ලේ හෝ වටේට සමාන දුරකින් ගසන්න.
- ඝන කූර දෙපැත්තෙන් අල්ලා ගෙන අමුනන ලද පෙතිවලට වතුර වත් කරන්න. මෙසේ දිය බඹරයක් සාදා ගන්න. බලශක්තිය නිපදවීමට මෙම ක්‍රමය යොදා ගන්නා බව කියන්න. එවැනි ස්ථාන බැලීමට හැකි නම් අධ්‍යාපන චාරිකාවක නිරත වීමට සලස්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.8 ගමනාගමනය

මංමාවත්වල දී ප්‍රවේශම් සහිත (Road Safety) සංකල්පයෙන් යුතු ව හැසිරෙන පොදු වාහන ආරක්ෂා කරමින් සංයමයෙන් යුතු ව ඒවා පරිහරණය කරන ජනතාවගෙන් යුතු සමාජයක් ඵලදායී හා කාර්යක්ෂම සමාජයක් ගොඩ නැංවීම සඳහා දායක වේ.
අනාගතයේ දී එවන් පරිණත බවක් ඇති මහින්, රියදුරන්, ප්‍රවාහන ව්‍යවසායකයන් හා සේවකයන් ලෙස කටයුතු කිරීම සඳහා වන මූලික අත්දැකීම් ලබා ගැනීමට යොමු වන ක්‍රියාකාරකම් මෙම තේමාවේ දී ඉදිරිපත් කෙරේ.

නිපුණතා
★ අන් අයට අවහිරයක් නොවන පරිදි මංමාවත් පරිහරණය කරයි.
★ මංමාවත් භාවිත කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ අවබෝධයකින් යුතුව ක්‍රියා කරයි.
★ සමීප පරිසරයේ ඇති මංමාවත් හඳුනාගෙන ඵලදායී ලෙස භාවිත කරයි.
★ පොදු වාහනවලින් අපට ලැබෙන සේවය අගය කරමින් ඒවා සුරැකීමට දායක වෙයි.
★ පොදු ප්‍රවාහන සේවාවලින් ඉටු කෙරෙන සේවය විවිධ මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කරයි.
★ වාහනවලින් ඉටුවන සේවය පිළිබඳ කියැවෙන කවි, ගී ගායනා කරයි. රංගනයේ යෙදෙයි.
★ විවිධ ගමන් විලාශ ඉදිරිපත් කෙරෙන ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
✠ සිසුන් සහභාගි කර ගෙන අන් අයට අවහිර වන පරිදි මංමාවත් භාවිත කරන අවස්ථා නිරූපණය වන භූමිකා රංගන කිහිපයක් කලින් සැලසුම් කර ගන්න.
- පාසල් වත්තේ එළිමහන් ස්ථානයක මාවතක් කලින් සලකුණු කර ගන්න. එම පරිසරය උපයෝගී කර ගනිමින් කලින් සැලසුම් කළ භූමිකා රංගන අවස්ථා තුනක් පමණ නැරඹීමට අවස්ථා සලසන්න. සෑම රංගන අවස්ථාවක් අවසානයේ ම මං මාවත් භාවිතයේ දී අන් අයට අවහිර වීමෙන් සිදුවන හානි ද ඒවායින් වැළකීමේ අගය ද මතු කරන්න.

✠ අන් අයට අවහිරයක් ඇති වන පරිදි මං මාවත් භාවිත කරන අවස්ථා පිළිබඳ ව සිසු අවධානය යොමු කරන්න.
සිසුන් කුඩා කණ්ඩායම්වලට යොමු කර වැඩිදුරටත් තොරතුරු සොයා ගැනීම සඳහා යොමු කරන්න.
- මෙහි දී පුවත් පත්වලින් ලබා ගත් තොරතුරු, ඡායාරූප, පෝස්ටර්, පින්තූර ආදිය ද සොයා ගෙන ඉදිරිපත් කිරීමට සිසුන් පොළඹවන්න.
උදාහරණ :-මාර්ගයේ රංචු වශයෙන් ගමන් කිරීම
මාර්ගයට හානි කිරීම
යන එන්නන්ට උසුළු විසුළු කරමින් අවහිර කරමින් ක්‍රියා කිරීම
නීතියට අනුකූලව ක්‍රියා නොකිරීම
යන එන වාහලවලට ගල් ගැසීම
අනාරක්ෂිත ව වාහනවල එල්ලී ගමන් කිරීම
මාර්ගයේ බයිසිකල් හෝ වෙනත් දේවල් තැබීම
සතුන් බැඳීම
මග දෙපස ගස් කොලන්වලට හා වෙනත් නිවෙස්වල දේපලවලට හානි කිරීම
මාර්ගයට යම් යම් දෑ විසි කිරීම
වාහනවල සිට යම් යම් දෑ විසි කිරීම හා කෙළ ගැසීම ආදිය
- ඉදිරිපත් වූ තොරතුරු ඇසුරෙන් තමන්ට රිසි සේ චිත්‍ර සහ වෙනත් නිර්මාණ කිරීමට සිසුන් මෙහෙයවන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- චිත්‍රවලින් නිරූපණය වන අවස්ථාවල සිදුවන හානි ආදිය පිළිබඳ අවධානය යොමු කරමින් සිසුන් සමඟ සාකච්ඡා කර පහත සඳහන් වගුව ගොඩ නංවන්න.

| අවහිරතාව | සිදුවිය හැකි හානිය |
|---|---|
| උදාහරණ : පාරේ ක්‍රීඩා කිරීම | යන එන අයට අනතුරු සිදුවීම<br>ක්‍රීඩකයන් මාර්ග අනතුරුවලට ලක් වීම<br>වාහනවලට හානි වීම<br>වාහන තද බදය |

ක්‍රියාකාරකම 2

✠ මංමාවත් භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව තොරතුරු රැස් කිරීම සඳහා සිසුන් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ යොමු කරන්න. අවශ්‍ය සමහර තොරතුරු සඳහා වැඩිහිටියන්ගේ උදවු ලබා ගැනීමට උපදෙස් දෙන්න.

උදාහරණ :-

- තමා සහ අන් අයගේ ආරක්ෂාව කෙරෙහි අවධානයෙන් ගමන් කිරීම.
- පාරේ අනතුරුදායක අවස්ථා පිළිබඳ කල්පනාවෙන් ගමන් කිරීම.
- පාලු ස්ථානවලින් ගමන් කිරීමේ දී ප්‍රවේසම් වීම.
- අලි ඇතුන්, බල්ලන්, හරකුන් වැනි සතුන් සිටින ස්ථාන අසලින් ගමන් කිරීමේ දී ප්‍රවේසම් වීම.
- පයින් ගමන් කරන්නන් හැකි සෑම අවස්ථාවක දී ම තම දකුණු පසින් ගමන් කිරීම.
- අනාරක්ෂිත දෙයක් දුටු විට හෝ අවස්ථාවකට මුහුණ පෑ විට වැඩිහිටියකු දැනුවත් කිරීම.
- පොත් පත්, පත්තර, කියවමින් හෝ රංචු වශයෙන් කතා කරමින් හෝ වෙනත් කාර්යයක යෙදෙමින් හෝ අනවධානයෙන් ගමන් කිරීම.
- මාර්ග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීම.
- මාර්ගය පරීක්ෂා නොකොට එකවර පාරට දිවයාමෙන් වැළකීම.
- මංමාවත් පවිත්‍ර ව අලංකාර ව තබා ගැනීමට උදවු වීම.
- මහමග ගමන් කරන අසරණ අයට වැඩිහිටි අයට අවශ්‍ය වන උදවු කිරීම.
- තම නිවස පාසල අසල මහා මාර්ග ආරක්ෂා කිරීමට සහාය වීම.

සිසුන් රැස් කරන තොරතුරු කුඩා කණ්ඩායම්වල කතා බහ කිරීමට අවස්ථාව දෙන්න. එක් එක් කණ්ඩායම විසින් වඩාත් ම වැදගත් ය යි සලකන කරුණු තුනක් බැගින් පන්තියට ඉදිරිපත් කිරීමට යොමු කරන්න. කණ්ඩායමේ අදහස පන්තියට පැහැදිලි ව කියා ගත හැකි අයෙක් තෝරා ගැනීමට කුඩා කණ්ඩායම්වලට දිරි දෙන්න.

ක්‍රියාකාරකම 3

✠ පාසලට ආසන්න තෝරා ගත් ස්ථානයක්/පාසලට ආසන්න නගරයක්/මංසන්ධියක් තෝරා ගෙන සිසුන් සමඟ චාරිකාවක යෙදෙන්න. එම චාරිකාවේ දී මග දෙපස පාලම්, බස් නැවතුම්පළ, මාර්ගය හරහා යන කහ ඉරි වැනි ස්ථාන, වෙළෙඳ පොළවල්, පොදු ස්ථාන, විශේෂ ස්ථාන, ආදී වැදගත් වන ස්ථාන හඳුනා ගන්න.

- මෙම තොරතුරු පිළිබඳ ව සටහන් තබා ගැනීමට ද සිසුන් යොමු කරන්න. පසුව මෙම තොරතුරු ඇසුරින් දළ සටහනක් ලෑල්ලේ ගොඩ නගා ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ගුරුතුමිය නිවසේ සිට පාසලට එන මාර්ගය කඩදාසියක/කළුලෑල්ලේ ගොඩ නැංවීම කරන්න. අනතුරු ව පන්තියේ සිසුන් නිවසේ සිට පාසලට එන මාර්ගයේ දළ සටහන් ඇඳීමට සිසුන් යොමු කරන්න.
- මෙම සටහන් ඩිමයි කඩදාසියක/බ්‍රිස්ටල් බෝඩ් එකක/හෝ වෙන යම් සුදු කඩදාසියක අලවා පන්තියේ ප්‍රදර්ශනය කරන්න. ඒ සඳහා මාතෘකාවක් යොදන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✠ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා හෝ තනි තනිව හෝ පාසල අසල අවට මාර්ග විහිදී ඇති අයුරු පරීක්ෂා කිරීම සඳහා යොමු කරන්න. මෙහි දී ප්‍රධාන මාර්ග අතුරු මාර්ග ආදී තොරතුරු හඳුනා ගැනීම වැදගත් වේ.

- මේවා දළ සටහන් ලෙස ඇඳ ගැනීමට යොමු කරවන්න.
  මෙහි දී මහා මාර්ග, දුම්රිය මාර්ග, රෝහල, පාසල, පන්සල උසාවිය ආදි වැදගත් ස්ථාන දැක්වීමට නිවැරදි සංකේත භාවිත කිරීම සුදුසුය. පසුව මෙම තොරතුරු ඇසුරින් නිවැරදි සටහනක් පිළියෙල කරන්න.
  එය කඩදාසියක ඇඳ ප්‍රදර්ශනය කරන්න.

✠ සිසුන් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් තරමක් වාහන ගමන් කරන මාර්ගයකට යොමු කර නිරීක්ෂණයට අවස්ථාව සලසන්න. මෙහි දී ඒ ඒ සිසුන්ට හෝ කණ්ඩායමට නිරීක්ෂණය කළ යුතු තොරතුරු රැස් කළ යුතු වැඩ කොටස පැවරිය හැකි ය. එම නිරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධාරණය යොමු කරවීම සුදුසුය.
  - කිසියම් වේලාවක දී පාරේ ගමන් කළ ඒ ඒ වාහන මොනවා ද?
  - ඒවා සංඛ්‍යාත්මක වශයෙන් කොපමණ ද?
  - අනාරක්ෂිත ව ගමන් කළ වාහන මොනවා ද?
  - මේ අතර අනාරක්ෂිත ව ගමන් කළ මගීන් සිටියේ ද?

ආදී විවිධ තොරතුරු සොයා බලන්නට යොමු කරන්න.

- එම තොරතුරු පන්තියට විවිධ අයුරින් වාර්තා කිරීමට අවස්ථා සලසන්න. පහත සඳහන් සටහන එම තොරතුරු ඇසුරින් සම්පූර්ණ කිරීමට ද යොමු කරන්න.

| ගමන් කළ වාහන | රෝද සංඛ්‍යාව | ගමන් කළ වාහන සංඛ්‍යාව |
|---|---|---|
| බස් | | |
| කාර් | | |
| කන්ටේනර් | | |
| ................... | | |

- මෙම සටහන ඇසුරින් හැකිනම් ප්‍රස්තාර සටහන් ද ලැල්ලේ ප්‍රදර්ශනය කරමින් කතා බහ කරන්න.
- වාහනවල රෝද සංඛ්‍යාව පිළිබඳ අවධානය යොමු කරමින් ඒවායේ ආකෘති සකස් කිරීමට දිරි ගන්වන්න.
- පාසල අවට මාර්ග විහිදීමේ සටහන ඇසුරු කර ගනිමින් එහි ආකෘතියක් ගොඩ නගන්න.

ක්‍රියාකාරකම 4

✠ පොදු වාහන යනු මොනවා දැ යි සිසුන්ට පැහැදිලි කරන්න.
  උදාහරණ:-
  බස් රථය, දුම්රිය, ඇතැම් ප්‍රදේශවල බෝට්ටු, පාලම් පාරු ආදිය පොදු වාහන බවට පත් ව ඇති බව

- සිසුන් පොදු වාහනවල ගමන් කිරීමේ දී ලත් අත්දැකීම් මතකයට නැංවීමට සලස්වා ඒ පිළිබඳ චිත්‍ර ඇඳීමට යොමු කරන්න. කුඩා කණ්ඩායම්වල දී තම චිත්‍ර අනෙක් අයට විස්තර කිරීමට අවස්ථා සලසන්න.
- සිසුන්ව එළි මහනකට කැඳවාගෙන ගොස් කණ්ඩායම් කර විවිධ පොදු වාහන ලෙස හැසිරීමට යොමු කරන්න. කණ්ඩායම් මාරු කරමින් මෙම ක්‍රියාකාරකමේ යෙදීමට අවස්ථාව සලසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

✠ යුතුකම් නොදන්නා මගීන් කිහිපදෙනකු විසින් එම බස් රථයේ ගමන් කරන අන් මගීන්ට සිදු කෙරෙන අපහසුතා පිළිබඳ ව පෙන්නුම් කෙරෙන රංගනයක සිසුන්ව යොදවන්න.
මෙහි දී
බසයට ගොඩවීම හා බැසීම හා සම්බන්ධ අයහපත් හැසිරීම්
මහලු අය රෝගීන් ආබාධිතයන් හා ගර්භනී අයට අයහපත් ලෙස සැලකීම
පූජ්‍ය පක්ෂයට ගරු නොකිරීම

ආදී විවිධ අවස්ථාවල දී යුතුකම් නොදන්නා මගීන් හැසිරෙන අයහපත් ආකාරය මතු කරවන්න. එම සිද්ධි ඇසුරින් සිසුන් සමග සාකච්ඡාවක් කරන්න. යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම සාකච්ඡාව තුළින් මතු කරන්න. යුතුකම් ඉටු කරන මගීන් රැගත් බසයක දී එම මගීන් හැසිරෙන යහපත් ආකාරය පිළිබඳ ව ද රංගනයක යොදවන්න. ඒ හැසිරීම පිළිබඳ ව ද සිසුන් සමග සාකච්ඡා කරමින් යහපත් ආකල්ප සිසුන් තුළ ගොඩ නංවන්න.

✠ පොදු වාහනයකට ගොඩ වන මගියකු විසින් කළ යුතු දේවල් හා නොකළ යුතු දේවල් මොනවා ද යන්න පිළිබඳ ව කුඩා කණ්ඩායම්වල දී කතා බහ කිරීමට සිසුන් යොමු කරන්න. ඒ ඒ කණ්ඩායම විසින් තීරණය කළ පොදු වාහනයක මගියකු කළ යුතු හා නොකළ යුතු දේවල් අනෙක් අයට කීමට අවස්ථා ලබා දෙන්න.

- පොදු වාහනවලින් අපට සිදුවන සේවය පිළිබඳ ව කතා කරන්න. පොදු වාහන නොමැති වුවහොත් සිදුවන අපහසුතා පිළිබඳ ව අනුමාන කිරීමට සිසුනට අවස්ථාව දෙන්න.
- පොදු වාහන අප විසින් සුරැකිය යුතුය යන පණිවිඩය සිසුන් තුළ ගොඩ නගන්න. ඒවා විනාශ කිරීමෙන් අපට හා රටට වන පාඩුව අවධාරණය කරන්න. එහෙයින් මෙම සම්පත් සුරැකීම අපේ යුතුකම බව ද අවධාරණය කරන්න.
- පොදු වාහනවලට සම්බන්ධ පුද්ගලයන් අනුකරණයට යොමු කරන්න. විවිධ අභිරූපණ රංගනවල යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පොදු වාහන කාල සටහනකට ගමන් කරන බව ද, පොදුවේ මිනිසුන්ට ගමන් කළ හැකි බව ද, මගීන්ට පහසුකම් තිබීම ආදිය ද අවධාරණය කරන්න.
- පොදු වාහන හා බැඳුණු කවි, ගී නිර්මාණයට හා ගායනයටත් අවස්ථාවන් ඇති කරන්න.
- පොදු වාහන සුරැකීම පිළිබඳ ව පෝස්ටර් නිර්මාණය කිරීමට ද අවස්ථාව ලබා දෙන්න. පොදු වාහනවල පින්තූර සිසුන් ලවා ඇඳීමට සලස්වා ඒවා ඩිමයි/ලොකු කඩදාසියක අලවා පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- විවිධ ගමන් විලාස ඇතුළත් වන ක්‍රීඩාවල සිසුන් යොමු කරන්න.

✠ පන්තිය කණ්ඩායම් කිපයකට බෙදන්න.

- එක් වරකට එක් ගමන් විලාසය බැගින් යොදා ගෙන සීමා රේඛා අතර හුවමාරු වීමට හැකි ය .
  උදාහරණ :- විවිධ ගමන් විලාස දක්වමින් ඉදිරියටයාම
  වාහන මෙන් ගමන් කිරීම.
  වාහන පසුපසට යන්නාක් මෙන් ගමන් කිරීම.
  ගුවන් යානා පියාසර කරන්නාක් මෙන් ගමන් කිරීම.
- කණ්ඩායමක සීමා රේඛා දෙපස සමාන සිසුන් සංඛ්‍යාවක් සිටින අතර එක් පසෙක සිටින සියලු ම සාමාජිකයන් නියමිත ගමන් විලාසය දැක් වූ පසු සම්පූර්ණයෙන් ම අනෙක් පසට ගිය විට එම කණ්ඩායමේ තරගය නිම වේ. ගමන් විලාසය ගුරුවරයාට/සිසුවකුට නියම කිරීමට පුළුවන.
- තේමාවේ අවසානයේ දී තේමාව ඇසුරෙන් අඳින ලද චිත්‍ර සාදන ලද ආකෘති හා නිර්මාණය කරන ලද පෝස්ටර ඇතුළත් ප්‍රදර්ශයක් සංවිධානය කරන්න. එම ප්‍රදර්ශනය සැලසුම් කිරීමේ දී ද සිසු අදහස්වලට ඉඩ දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.9 ගෙවත්ත

ගෙවත්ත අපේ පෝෂණය කෙරෙහි වටිනා සේවයක් සැලසිය හැකි අංගයකි. පවුලක ආර්ථිකයට විශාල පිටිවහලක් වන අංගයක් ලෙස ද ගෙවත්ත හැඳින්විය හැක. වත්මන් කාලයේ දී ගෙවත්තක් සඳහා ඉඩකඩ නොමැති වීමේ ගැටලුවට මුහුණ දෙන බොහෝ දෙනෙක් සිටින්නේ සීමිත ඉඩකඩක වාසය කිරීමට සිදුවීම නිසා ය.

මෙම තේමාවෙන් ගෙවතු වගාවට දායක වී වින්දනයක් ලැබීමට ද ගෙවත්තක ඉඩකඩ නොමැති විටෙක විකල්ප වගා කිරීමේ ක්‍රම භාවිතය සඳහා ද අවධානය යොමු වේ. අනාගතයේ ගෙවතු වගාවට දායක වීමේ යහ ආකල්ප හා හුරුකම් ලැබීමට මෙම තේමාව ප්‍රයෝජනවත් වේ. එමෙන් ම අනාගතයේ දී බෙහෙවින් ප්‍රයෝජනයට ගත හැකි ලෙස විකල්ප වගා කිරීමේ ක්‍රමයක් උපයෝගී කර ගෙන ප්‍රයෝජනවත් යමක් වටා වින්දනයක් ලැබීමට හුරුවක් ද මෙම තේමාවෙන් අපේක්ෂිත ය.

නිපුණතා

★ ගෙවතු වගාවට දායක වීම තුළින් වින්දනයක් ලබයි.
★ බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම භාවිත කරයි.
★ විවිධ නිර්මාණ මගින් ගෙවත්තක සුන්දරත්වය මතු කර දක්වයි.
★ ගෙවතු වගාවේ වැදගත්කම අගය කරයි.
★ ගෙවත්තක සුන්දරත්වය මතු වන කවි, ගී, දෙබස් හා රංගනවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පාසලට ආසන්න ව සාර්ථක ව පවත්වාගෙන යන ගෙවත්තක් හෝ ගොවිපලක් හෝ නිරීක්ෂණයට සිසුන් කැටුව යන්න.
- පළමු ව කණ්ඩායම්වලට බෙදී ගෙවත්ත නැරඹීමට සලස්වන්න. ගෙවත්තේ විවිධ ස්ථාන හෝ වගාවන් හෝ පිළිබඳ ව තොරතුරු දැන ගැනීම සඳහා ගෙවතු හිමියා/කෘෂිකර්ම ගුරුවරයකු/කෘෂි උපදේශකවරයකු සමඟ කතා බහ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පාත්ති සකස් කරන ආකාරය බීජ පැළකරන ආකාරය, ජල සම්පාදනය, බෝග ආරක්ෂා කිරීම, පොහොර දැමීම පලිබෝධ නාශක භාවිතය ආදිය පිළිබඳ තොරතුරු සිසුන්ට දැන ගැනීමට සලස්වන්න.
- එම තොරතුරු වාර්තා කර ගැනීමට සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 2

පහත දැක්වෙන පැවරුම් ඇසුරින් සරල පරීක්ෂණ සැලසුම් කර ඒවායේ යෙදීමට සිසුන්ට අවස්ථා සලසන්න.

අත්හදා බැලීම් සඳහා පැවරුම් :

- ඉක්මනින් ම පැළයක් ඇති කරන බීජය කුමක් ද?
- ගෙවත්තක වැඩෙන වල් පැළෑටි වර්ග මොනවා ද?
- වල් පැළෑටි පැළවීම වැළැක්වීමට කළ හැකි දේ මොනවා ද?
- පැළෑටිවලට ජලය යෙදිය හැකි විවිධ ක්‍රම මොනවා ද?
- ලැබෙන හිරු එළිය ප්‍රමාණය අඩු හෝ වැඩිවීම සහ පැළෑටිය වැඩීම අතර සම්බන්ධය කුමක් ද?
- පැළෑටිවල කොළ (පත්‍ර)වලට සිදු වන හානි මොනවා ද?
- ඉක්මනින් ජලය උරා ගන්නේ වත්තේ කුමන ස්ථානයෙන් ලබා ගත් පස්වල ද?



Copyright © 2007 National Institute of Education - Sri Lanka.


- පෝච්චියක වවන ලද පැළැටියක මුල් විසිරෙන ආකාරය සහ පොළොවේ වවන ලද එම වර්ගයේ ම පැළැටියක මුල් විසිරී ඇති ආකාරය සමාන ද?
- වැට ඉන්නකට සිටුවීමට සුදුසු දඬු මොනවා ද?
- ඉක්මනින් කොළ දිරාපත් වන්නේ කවර පරිසර තත්ත්වයක දී ද?

- පාසල් වත්ත නිරීක්ෂණය කර වගා කිරීම සඳහා කුඩා පාත්තියක් සකස් කිරීමට සුදුසු ස්ථානයක් සොයා ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
  පාසල් වත්තේ හොඳින් හිරු එළිය ලැබෙන විශාල ගස් කොළන් නොමැති, ගල් හා අප ද්‍රව්‍ය රහිත බිම් කොටසක් මේ සඳහා සුදුසු ය. මනාව ජලය බැස යන තැනිතලා බිම් කොටසක් තෝරා ගැනීම කාර්යය සාර්ථක වීමට පහසුවකි.
- තෝරා ගත් ස්ථානයේ කුඩා පාත්තියක් සකස් කිරීමට යොමු කරන්න.
  පාත්තිය සකස් කිරීමේ දී බිම සෙන්ටිමීටර 15 ක් පමණ ගැඹුරට කොටා පස් බුරුල් කර ගල්, මුල් ආදිය ඇත්නම් ඉවත් කරන්න.
- වගා කරන දෑ ආරක්ෂා කර ගැනීම සඳහා පාත්තිය වටා දඬු වැටක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න. (පාසල් වත්තේ ප්‍රමාණවත් ඉඩකඩ නොමැති නම් විකල්ප ක්‍රම යොදා ගන්න.)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.


දඬු වැටක් සැකසිය හැකි ආකාර දෙකක් පහත දැක්වේ.

(i) සාමාන්‍ය පැළ ඉනි වැට



(ii) විකර්ණාකාරව පැළ ඉනි වැට

මේ සඳහා පැළ ඉනි යෙදූ වැට සෙන්ටිමීටර 30ක් පමණ දුරින් සකස් කිරීමට උපදෙස් දෙන්න. එකක් හැර එකක් තෝරා මුදුන් ගැට ගසා උඩ හා යට ආධාරක පටි ගැට ගසන්න. සතුන්ට රිංගීමට අපහසු වන සේ හරස් ලී ද යොදන්න.



සාදාගත් පාත්තිවල පසට දිරාපත් ගොම පොහොර, දිරාපත් කොළ පොහොර, කොම්පෝස්ට් ආදිය මිශ්‍ර කිරීමට සලස්වන්න.


- මෙම පාත්තියෙහි එක් බෝග වර්ගයක් හෝ පාත්තිය වෙන් කර බෝග වර්ග කිහිපයක් හෝ සිටුවන්න. සමහර පැළ වර්ග තවාන්වලින් ලබා ගැනීමට සිදු වනු ඇත. උදාහරණ : මිරිස්, මාළු මිරිස්, වම්බටු, තක්කාලි, ගෝවා, බීට්රූට්

සමහර බෝගවල බීජ කෙළින් ම පාත්තිවල සිටුවිය හැකි ය. උදාහරණ : බෝංචි, මෑ, වැටකොළු, රාබු, අබ, කැරට්, බඩ ඉරිඟු, වට්ටක්කා, බණ්ඩක්කා, නිවිති
සමහර බෝගවල සිටුවන්නේ දඬු කැබලි හෙවත් අතු කැබලි ය. උදාහරණ : මඤ්ඤොක්කා, බතල, මුගුණුවැන්න, කංකුං
තවත් සමහර බෝගවල අල කැබලි සිටුවනු ලබයි. උදාහරණ : රාජ අල, අර්තාපල්


- සිසුන් කණ්ඩායම් වශයෙන් එකතු වී දිනපතා ම පාත්තිය පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බවට උපදෙස් දෙන්න. මෙහි දී පැළයක පත්‍ර, රිකිලි, මල්, ගෙඩි/කරල් හට ගන්නා අවස්ථා, බෝග කරා එන සතුන් ඔවුන්ගෙන් සිදුවන හානි යනාදිය නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
  ඉහත සෑම පියවරක් ම වාර්තා කිරීමට සිසුන් යොමු කරන්න.
- පැළ මතු වී වැඩෙන ආකාරය දිනපතා නිශ්චිත වේලාවක දී නිරීක්ෂණය කර වාර්තා කිරීමටත් එක කණ්ඩායමකට එක වාර්තා පොතක් බැගින් පවත්වාගෙන යාමටත් සලස්වන්න.
- මෙම වාර්තා පන්තියේ යම් තැනක ප්‍රදර්ශනය කර තැබිය හැකි නම් වඩා සුදුසු ය.
- පැළ සිටුවීමෙන් පසුව පැළ මතු වී එන තෙක් ජලය යෙදීම වැනි වැඩවල යෙදීමට සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 3


✠ ඉඩකඩ ඇති වතුවල මෙන් ම ඉඩකඩ සීමා වූ ස්ථානවල ද බෝග වගා කිරීමේ විකල්ප ක්‍රම පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. මේ පිළිබඳ අත්දැකීම් සිසුන්ට ලබා දීම ද වැදගත් ය. හොඳින් හිරු එළිය ලැබෙන ස්ථානවල පහත දැක්වෙන ක්‍රම භාවිත කරමින් බෝග කිහිපයක් වගා කරන්න. සිසුන් කණ්ඩායම් කර වැඩ පැවරීම, වගා පිළිබඳ වාර්තා තැබීම ආදිය පෙර පරිදි වේ.




වැහිපීහිලි කැබැල්ලක



පොල්ලෙලි එකට තනාගත් බඳුනක




ඉවත ලන කිරි ඇතිලිවල




පරණ ටයර් විදිමත් හැඩයකට කපා තනා ගත් බඳුන්වල


Copyright © 2007 National Institute of Education - Sri Lanka.




ටින්වල



ලී පෙට්ටිවල



පරණ හැලි වළං ආදියේ



දැල් බඳුන්වල

මෙම විකල්ප ක්‍රම භාවිතයේ ඇති විශේෂ වාසි පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
උදාහරණ:

- ඉඩකඩ නොමැති තැන්වලට සුදුසු ක්‍රමයක් බව
- අව්වැසි ආදියෙන් හා සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමේ පහසුව
- සාත්තු සප්පායම් කිරීමේ පහසුව
- අවශ්‍ය විට එහා මෙහා ගෙනයාමේ හැකියාව
- අලංකාර බව

ක්‍රියාකාරකම 4

✠ වෙළෙඳ පොළෙන් මිලට ගන්නා දෙයකට වඩා තමන් වවා ගත් බෝගයක අස්වැන්න වැදගත් වන්නේ ඇයි දැ යි යන මාතෘකාව යටතේ කවි පන්තියක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න. මෙහි දී පාසල් ගොවි බිමේ දී තමන් ලත් අත්දැකීම් ඉස්මතු වන සේ තම නිර්මාණ සකස් කිරීමට සලස්වන්න.

ගෙවත්තෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් විවිධ නිර්මාණ කිරීමට සිසුන් යොමු කරන්න.
උදාහරණ :

- බිත්ති සැරසිල්ලක් සඳහා උචිත නිර්මාණයක්
- ගුරු මේසය මත තැබීමට මල් සැකසුමක්
- සුබ පැතුම් පතක්

යොදා ගත හැකි ද්‍රව්‍ය : පුළුන්, ගස්වල දිරා යන පොතු, වියළි මල්, කොළ, ගස්වල පට්ටා, ඇට වර්ග පිදුරු, තුත්තිරි වැනි කුඩා පැළෑටි වර්ග

- ගෙවත්ත පිළිබඳ සිය අත්දැකීම් චිත්‍රයට නැගීමට සිසුන් යොමු කරන්න. සිය චිත්‍රය පිළිබඳ ව කණ්ඩායමේ අනෙක් සිසුන් සමඟ කතා කිරීමට අවස්ථා සලසන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.10 වැඩ පහසු කිරීමේ මං

යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා මිනිසාට එදිනෙදා ජීවිතයේ බොහෝ කටයුතු ඉටු කර ගැනීමට සිදු වී තිබේ. එම කටයුතු කලට වේලාවට නිවැරදි ව කාර්යක්ෂම ව සිදු කර ගැනීම ජීවිතයට පහසුවකි. තව ද එය ජීවත් වීම සුන්දර කිරීමට ද ඉවහල් වේ.

කුඩා කල සිට ම වැඩ පහසු කර ගැනීම සඳහා භාවිත කරන සරල උපකරණ පිළිබඳ ව හුරුවක් ලබා දීම, තම ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් උපකරණ හැසිරවීම, කණ්ඩායමක් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම වැනි දෑ මෙම තේමාව තුළින් අත් විඳීමට අවස්ථා සලසා ඇත. ඒ සඳහා සිසුන් හැකි තරම් අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රායෝගික ව යොදවමින් අත්දැකීම් ලබා දීමට මෙම තේමාව තුළින් අපේක්ෂා කර ඇත.

නිපුණතා

★ වැඩක් සාමූහික ව කිරීම තුළින් එහි වැඩි සාර්ථකත්වයක් අත් විඳියි.
★ සරල යන්ත්‍ර භාවිතයෙන් වැඩ පහසු කර ගනියි.
★ චුම්භක භාවිතයෙන් වැඩ පහසු කර ගත හැකි ආකාර නිර්මාණය කරයි.
★ විදුලි භාවිතයෙන් වැඩ පහසු කර ගන්නා ආකාර අත්හදා බලයි.
★ වැඩ පහසු කර ගැනීමට යොදා ගත හැකි සරල උපකරණ ඇසුරින් විවිධ නිර්මාණ කරයි.
★ කණ්ඩායම් ක්‍රීඩාවලට දායක වෙමින් වින්දනයක් ලබයි.
★ කණ්ඩායම් වැඩ හා සාමූහික වැඩ කිරීමේ දී එකමුතුව කිරීමේ වැදගත්කම මතුවන කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.
★ විවිධ වෘත්තීන්වල නිරතවීමේ දී වෙහෙස නිවා ගැනීම සඳහා ගායනා කළ ජන ගී සාමූහික ව ගායනා කරයි.
★ සාමූහික ව එක් ව ක්‍රියා කළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙමින් වින්දනයක් ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ සිසුන් සැමට ම ගැළපෙන පන්ති කාමරයේ හෝ පාසලේ හෝ කළ හැකි කාර්යයක්/ක්‍රියාකාරකමක්/ක්‍රීඩාවක් තෝරා ගන්න.
- තෝරා ගත් දෙය සිසුන්ට තනි තනිව කළ හැකි වීම ද එසේ ම කණ්ඩායමක් වශයෙන් එකතු වී කළ හැකි එකක් වීම ද වැදගත් ය.
- පළමු වටයේ දී තෝරා ගත් කාර්යය/ක්‍රියාකාරකම්/ක්‍රීඩාව තනි තනි ව කිරීමට එක් එක් සිසුවකුට පවරන්න. කාර්යය මිනිත්තු 15කින් පමණ කළ හැකි දෙයක් වීම ද වැදගත් ය.
- දෙවන වටයේ දී එම කාර්යය නැවත කිරීම සඳහා පන්තියේ සිසුන් කණ්ඩායම් කර ගන්න. එක් කණ්ඩායමකට පස් දෙනකු පමණ ප්‍රමාණවත් වේ. කලින් තනි තනි ව කළ වැඩය දැන් කණ්ඩායමක් වශයෙන් කිරීමට අවස්ථාව සලසන්න.

  උදාහරණ:-

  (i) කඩදාසි පටිවලින් දම්වැලක් සෑදීම
  කඩදාසි සැපයීම
  කඩදාසි කැපීම
  ඒවා දම්වැලක් සේ සම්බන්ධ කිරීම

  අවස්ථා (i) තනි තනි ව කිරීම
  (ii) කණ්ඩායමක් වශයෙන් කිරීම

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ : (ii) පින්තූරයක් කැබලිවලට කපා කැබලි ගොඩ දුන් විට පින්තූරය යළි ගොඩ නැඟීම
අවස්ථා (i) තනි තනි ව කිරීම
(ii) කණ්ඩායමක් වශයෙන්

- මෙසේ දෙආකාරයට ම වැඩෙහි නිරත වූ පසු තනි තනි ව කිරීම සහා කණ්ඩායම් වී වැඩ කිරීම පිළිබඳ අදහස් සිසුන්ගෙන් විමසන්න. මෙහි දී කණ්ඩායම් වී වැඩ කිරීමෙන් සිදු වූ වාසිදායක බව පිළිබඳ කරුණු ඉස්මතු කරන්න. වැඩ පහසුවට වඩා ඵලදායී වන්නේ කණ්ඩායමක් වශයෙන් එකමුතු ව වැඩ කිරීම බව අවබෝධ වීමට සලස්වන්න.
- එදිනෙදා ජීවිතයේ දී එවැනි එකමුතු ව වැඩ කරන අවස්ථා පිළිබඳ ව අත්දැකීම් සිසුන්ට පැවසීමට ඉඩ දෙන්න. මෙහි දී වැඩ පහසුව සඳහා කණ්ඩායම් වී වැඩ කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
- සැලසුම් ගත කාර්ය කිරීමේ දී වැඩ පහසු කිරීම සඳහා ඒ ඒ පුද්ගලයන්ගේ දක්ෂතා කුසලතා හඳුනා ගෙන වැඩ කොටස් බෙදා ගැනීම හා පවරා ගැනීම උචිත බව ද එයින් වඩා ඵලදායී සේවයක් සිදු වන බව ද පහදා දෙන්න.
- සත්ත්ව ලෝකයේ එකමුතු ව වැඩ කරන ආකාර පිළිබඳ ව නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
  උදාහරණ :- කුහුඹුවන් බරක් ඔසවා ගෙන යාම
- සත්ත්ව ලෝකයේ එකමුතුකමින් කරන වැඩ ගැන ලියැවී ඇති කවි ගී අදාළ චලන මගින් නිරූපණය කිරීමට අවස්ථාව සලස්වන්න.
  උදාහරණ :- ගමන බිමන හරි කඩිසර - ඔසවාගෙන යයි බැරි බර
  අවිහිංසක කරුණා බර - කළු කුඹියෝ
  (පදමාලාව - ප්‍රේමකීර්ති ද අල්විස්)

ක්‍රියාකාරකම 2

✠ වැඩ පහසු කර ගැනීමට එදිනෙදා භාවිත කරන විවිධ උපකරණ පිළිබඳ ව කතා බහ කරන්න.
- පසුගිය වසරේදීත් වැඩ පහසු කිරීමේ මං තේමාව යටතේ කතුරු, අඬුමිටිය, අඬුව වැනි උපකරණවලින් කෙරෙන කාර්යයන් පිළිබඳ ව සොයා බැලු බව ද මේ අවස්ථාවේ සිහිපත් කරන්න.
- එවැනි තවත් උපකරණ කිහිපයක් පිළිබඳ ව සොයා බැලීමට සිසුන්ට යෝජනා කරන්න.
- බෝතල මූඩි විවෘත කරන උපකරණය : මූඩි අරිනය (Opener)
  මෙම උපකරණය අද විවිධ ස්වරූපයෙන් දක්නට ඇත. සිසුන් ලවා නිවෙස්වලින් මෙවැනි උපකරණ කිහිපයක් පන්තියට ගෙන්වා ගන්න. ඒවායේ ස්වරූප නිරීක්ෂණය කිරීමට කණ්ඩායම්වලට පළමු ව උපදෙස් දෙන්න. අබලන් නොවූ නොතැලුණු බීම බෝතල මූඩි කිහිපයක් ද කණ්ඩායමකට එක් බෝතලය බැගින් හිස් පැණිබීම බෝතල කිහිපයක් ද සපයා ගන්න. හිස් බෝතලයට මූඩියක් තද කොට හොඳින් සවි කර ගන්න. හොඳින් තද වූ මූඩිය උපකරණය භාවිත කොට පහසුවෙන් ගැලවීමට කණ්ඩායම් සිසුවකුට පවරන්න. නැවත මූඩියක් බැගින් සවි කොට අනික් සිසුන්ට ද නිවැරදි ව උපකරණ යොදා ගනිමින් මූඩිය ඉවත් කිරීමට අවස්ථාව සලස්වන්න. මේ අයුරින් නිවැරදි ව උපකරණ හසුරුවමින් බෝතලයෙන් මූඩිය ඉවත් කිරීමේ හුරුකම් සිසුන්ට ලබා දෙන්න. අනතුරු ව කාර්ය කිරීමට උපකරණය පහසු වූ ආකාරය පිළිබඳ ව කතා බහ කරන්න.

විල්බැරෝවකින් බරක් ගෙන යාම

විල්බැරෝවකින් කිසියම් බරක් උහුලා ගෙන යාමට සිසුන්ට අවස්ථාවක් පළමුව සලසා දෙන්න. තනියෙන් උසුලා ගෙන යා නොහැකි බරක් විල්බැරෝවෙන් පහසුවෙන් ගෙන යා හැකි බව කතා බහ තුළින් ඉස්මතු කරගන්න.


විල්බැරෝවක් නිරීක්ෂණය කිරීමට අවස්ථාවක් සලසන්න. එය සැකසී ඇති අයුරු බර උසුලාගෙන යාමට පහසු වන ආකාරය කතා බහ කරන්න.

බරක් පහසුවෙන් ගෙන යාමට එම බර විල්බැරෝව තැන්පත් කළ යුතු ආකාරයක් ඇති දැයි සොයා බැලීමට යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

වැඩි බරක් පහසුවෙන් උසුලා ගෙන යාම තව දුරටත් පහසු කර ගැනීමේ උපාය මාර්ග සොයා බැලීමට යොමු කරන්න.

උදාහරණ :- ඉදිරියෙන් ලණුවකින් ඇද ගෙන යාම




- විල්බැරෝ යන ආකාරය ක්‍රීඩාවක් ලෙස සිසුන් යුගල බැගින් කර එක් අයකු විල්බැරෝවක් ලෙස ද අනෙකා විල්බැරෝව තල්ලු කරන්නා ලෙස යෙදීමට සලස්වන්න. විල්බැරෝ ක්‍රීඩාව තරගයක් ලෙස සංවිධානය කිරීමෙන් වැඩි වින්දනයක් ලැබීමට සිසුන්ට ඉඩදිය හැකි ය. මේ සඳහා සිසුන්ට සුදුසු ඇඳුමක් ඇඳීමට උපදෙස් දෙන්න.

ගිරය (Nut Cracker)

සිසුන්ගේ නිවෙස්වල ඇති ගිර කිහිපයක් පන්ති කාමරයට රැගෙන ඒමට කටයුතු කරන්න. සිසුන් කණ්ඩායම් කර ගිරයෙන් කිසියම් දෙයක් ගෙන කැබලි කර ගැනීමට ගිරය භාවිත කරන ආකාරය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සලස්වන්න. කැබැලි කිරීමට ගිරය භාවිත කිරීම වඩාත් පහසු බව හඳුනා ගැනීමට සලස්වන්න. ගිරය නිරීක්ෂණය කරමින් කැපීමේ දී වැඩ පහසු වන ආකාරයන් පිළිබඳ තොරතුරු සොයා බැලීමටත් එවැනි කාර්යයවල යෙදීමටත් ඒ පිළිබඳ ව අදහස් ඉදිරිපත් කිරීමටත් යොමු කරු

ඩැහි අඬුව (Pincer)



ඉහත දැක්වෙන ආකාරයට ඩැහි අඬුවක් හෝ වැඩ පහසු කර ගැනීමට යොදා ගන්නා වෙනත් උපකරණ හෝ පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට සිසුන්ට අවස්ථා සලස්වන්න.

- ඉහත යොදා ගත් විවිධ උපකරණවලින් වැඩ පහසු වීම පිළිබඳ අත්දැකීම් මතු කර එවැනි උපකරණ භාවිත කරමින් සිදු කරන චරිතාරෝපිත රංගන සඳහා සිසුන් උනන්දු කරවන්න. ගායනා ද ගැළපෙන අයුරින් එකතු කර ගැනීමට ඉඩ සලසන්න.

ක්‍රියාකාරකම 3

✠ පාසල් වත්තේ වූ ගලක්, කොටයක් වැනි දෙයක් වෙනත් ස්ථානයකට ගෙන යාම සඳහා චලනය කිරීමට (උපකරණ කිසිවක් නොමැතිව) අවස්ථාව සලසන්න.

- අනතුරු ව දණ්ඩක්/ගල් ඉන්නක් වැනි දෙයක් ආධාරයෙන් එම ගල හෝ කොටය හෝ සඳහා චලනය කිරීමට උත්සාහ කරවන්න.
- මෙම ක්‍රම දෙකෙන් කාර්ය පහසු වූයේ කුමන ක්‍රමයෙන් ද යන්න අදහස් සාකච්ඡා කරන්න.
- ගල/කොටය පෙරලීමේ දී දණ්ඩ/ගල් ඉන්න තබා ගත් ආකාරය නිරීක්ෂණය කරවන්න.
- ඒ අනුව වැඩ පහසු කර ගන්නා වෙනත් අවස්ථා පිළිබඳ ව ප්‍රායෝගික අත්දැකීම් සිසුන් ගෙන් විමසන්න. මෙහි දී ලීවර ක්‍රම පිළිබඳ මූලධර්ම ඉගැන්වීම අපේක්ෂා නොකෙරේ.
- බර ලී කොටන් වැනි දෑ එක් තැනකට සිට තවත් තැනකට ගෙන යාමට රවුම් වට ඇති වෙනත් කුඩා කොට යොදා ගන්නා ප්‍රායෝගික අවස්ථාවක අත්දැකීමක් ලබා දෙන්න. එදිනෙදා ජීවිතයේ එවැනි අත්දැකීම් අවස්ථා සිසුන්ට ඉදිරිපත් කිරීමට සලස්වන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ආදී කාලයේ මෙවැනි ක්‍රම බහුල වශයෙන් යොදා ගත් බවත් පසු කාලයේ ඒ ඇසුරෙන් රෝද නිර්මාණය වී ඒවා යොදා ගෙන වැඩ පහසු කර ගත් ආකාරය පිළිබඳ තොරතුරු පැහැදිලි කර දෙන්න.
- වැඩ පහසු කිරීම සඳහා යන්ත්‍ර සූත්‍රවල දැතිරෝද යොදා ගැනීම පිළිබඳ ව ද සොයා බැලීමට යොමු කරන්න. දැතිරෝද සහිත උපකරණ මේ සඳහා යොදා ගන්න.
  උදාහරණ :- බයිසිකලය
  ඔරලෝසුව
- රෝද ආශ්‍රිත සරල නිර්මාණ සඳහා සිසුන් උනන්දු කරවන්න. වෙනත් සෙල්ලම් ආකෘති මෙන් ම ප්‍රායෝගික වැඩකට උචිත වන අයුරින් කරන සරල නිර්මාණ සඳහා ද සිසුන් උනන්දු කරවන්න.
  උදාහරණ :- රේසර් රෝද යොදා බර උසුලා ගෙන යා හැකි ලෑලි කරත්තයක් සෑදීම
  වට ලී කඳකින් රෝද කපා ඒවා සවි කොට සෙල්ලම් රෝද කරත්තයක් සෑදීම

ක්‍රියාකාරකම 4

✠ පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න. එක් එක් කණ්ඩායමකට එක් කාන්දම් දණ්ඩක් හා ලෝහ ද්‍රව්‍ය හා වෙනත් ද්‍රව්‍ය සපයා දෙන්න. කාන්දම් කැබැල්ලට ඇද ගන්නා දේවල් පිළිබඳ තොරතුරු සොයා බැලීමට යොමු කරන්න. ඒවා වාර්තා කිරීමට සලස්වන්න.
- කඩදාසියක් මත අල්පෙනෙත්ති/ටින්ටැක්ස් ඇණ ටිකක් විසිරුවන්න. කාන්දම් දණ්ඩක් ඒ මත තබන්න. එය ඒ මේ අත එහා මෙහා කරවන්න. කාන්දම් දණ්ඩ ඔසවා අල්පෙනෙත්ති වැඩියෙන් ඇලවී ඇත්තේ කාන්දමේ කවර කොටසේ දැයි පෙන්වීමට රූප සටහනක් ඇඳීමට සිසුන් යොමු කරන්න.




- එක් එක් කණ්ඩායමකට කාන්දම් දණ්ඩක් සපයා දෙන්න. දණ්ඩේ මැදින් නූලක් ගැට ගසා නිදහසේ එල්ලා රඳවා එය නිශ්චල වූ විට පිහිටන ආකාරය නිරීක්ෂණය කරවන්න. නැවත සොලවා අත හරින්න. එය පිහිටන ආකාරය නිරීක්ෂණය කිරීමට සලස්වන්න. ඒ අනුව දිශාව හඳුනා ගැනීමට කාන්දම් දණ්ඩකින් හැකි දැයි සිසුන්ගෙන් විමසමින් කරුණු සාකච්ඡා කරන්න.
- කාන්දම් දණ්ඩක් මැදින් නූලක් ගැට ගසා කාන්දම් දණ්ඩ පොළොවට සමාන්තර ව නිදහසේ තිබෙන සේ එල්ලා ගන්න.
- තවත් කාන්දම් දණ්ඩක කෙළවර එල්ලූ කාන්දම් දණ්ඩේ එක් කෙළවරකට ළං කරන්න.
  සිදු වන දේ නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
  එල්ලූ කාන්දමේ අනිත් කෙළවරට දෙවෙනි කාන්දම් දණ්ඩේ පළමු කෙළවර ළං කරන්න.
  සිදු වන දේ නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
  කෙළවර මාරු කරමින් මෙය කිහිප වතාවක් කරන්න.
- එදිනෙදා ජීවිතයේ කාන්දම් භාවිත වන අවස්ථා සොයා බැලීමට සිසුන් යොමු කරන්න. නිවසේ අප පරිහරණය කරන ඇතැම් භාණ්ඩ හා උපකරණවල කාන්දම් යොදා ඇති අවස්ථා හා ඒවායින් සිදුවන කාර්යයන් වාර්තා කිරීමට සලස්වන්න.




Copyright © 2007 National Institute of Education - Sri Lanka.


- ඉහත හඳුනා ගත් ලක්ෂණ භාවිත කරමින් කාන්දම් ඇසුරෙන් සෙල්ලම් භාණ්ඩ හා සරල ඇටවුම් නිර්මාණය කිරීමට සිසුන් උනන්දු කරවන්න.
  උදාහරණ :- කාන්දම් බෝට්ටුව
  කාන්දම් නයා

ක්‍රියාකාරකම 5

✠ එදිනෙදා කාර්යයන් සඳහා විදුලිය භාවිතයට ගන්නා අවස්ථා පිළිබඳ ව සිසුන්ගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට ඉඩ සලසන්න.
- විදුලිය නිසා වැඩ පහසුවීම පිළිබඳ ව කතා බහ කරන්න.
- විදුලිය ලබා ගන්නා ක්‍රම පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. කෝෂ මගින්, ජෙනරේටර් මගින් විදුලිය ලබා ගන්නා බව අත්දැකීම් තුළින් ඉස්මතු කරන්න.
- මේ පිළිබඳ ව සෘජු අත්දැකීම් ලබා ගැනීමට පහසුකම් තිබේ නම් ආරක්ෂා සහිත ව ඒ පිළිබඳ ව සොයා බැලීමට මැදහත් වෙන්න.
- විශේෂයේ විදුලි රැහැන් මගින් සපයන විදුලිය පරිහරණය කිරීමේ දී ආරක්ෂාව පිළිබඳ ව දැනුවත් කිරීමට අසා ඇති අනතුරු ඇසුරෙන් සිසුන් දැනුවත් කරන්න. මේ සඳහා විදුලිය සම්බන්ධ දන්නා බාහිර පුද්ගලයෙක් සමඟ සම්මුඛ සාකච්ඡාවක් කිරීමට ඉඩ සැලසිය හැකි ය.
- අනතුරු ව විදුලි පන්දම් සඳහා භාවිත කරන වියළි කෝෂයක්, වයර් කැබැල්ලක්, කුඩා බල්බයක් එක් එක් කණ්ඩායමකට සපයා තනි කම්බියක් භාවිතයෙන් බල්බය දැල්වීමට යොමු කරන්න. මෙහි දී වියළි කෝෂයේ පෘෂ්ඨය මත බල්බය තබමින් බල්බය දැල්වේ දැයි සොයා බැලීමට යොමු කරන්න.
  උදාහරණ:-



- මෙම ක්‍රියාකාරකම් ඇසුරෙන් + ධන හා - සෘණ අනුවලින් සම්බන්ධ කිරීමෙන් විදුලිය ලබා ගත හැකි බව හඳුනා ගැනීමට ඉඩ හරින්න.
- එසේ ම කම්බි දෙකක් භාවිතයෙන් තනි බල්බයක් දැල්වීම අත්හදා බැලීමට කණ්ඩායම් යොමු කරන්න.



- වෙළෙඳ පොළේ ඇති සරල විදුලි මෝටරයක් සපයා ගෙන වියළි කෝෂ ඇසුරෙන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් සැලසුම් කරන්න. එය ඇසුරෙන් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරන්න. රැස් මාලා සහ සැරසිලි ආදිය සඳහා විදුලි මෝටරය යොදා ගෙන නිර්මාණයක් කිරීමට යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- කණ්ඩායම් විසින් කළ සැරසිලි නිර්මාණ නිම කිරීමෙන් අනතුරු ව වින්දනය සඳහා ඒ මුල් කොට ගායන වැනි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල ද යොදවන්න.

ක්‍රියාකාරකම 6

✠ අතීතයේ දී මිනිසුන් වෙහෙස වී වැඩ කරන ලද අවස්ථා හඳුනා ගැනීමට සිසුන් සමඟ සාකච්ඡාවක් කරන්න. එහි දී පහත සඳහන් අවස්ථා කෙරෙහි අවධානය යොමු කරන්න.

උදාහරණ :- 1. ගොයම් කැපීම
2. පතල් වැඩ කිරීම
3. පැල් රැකීම
4. පාරු පැදීම
5. ගැල් පැදවීම (කරත්ත කවි කීම)

- මෙවැනි අවස්ථාවල දී ගායනය කරන ලද කවි රැස් කරවන්න.
- ඉන් කිහිපයක් තාලානුකූල ව හා රිද්මයානුකූල ව ගායනය කිරීමට යොමු කරන්න.

උදාහරණ :- ගොයම් කවි

ඉරු දෙවියන් ගේ ඉර ගල ගාවා රන් දැකැති ගෙන නිති සැරසෙනවා
සඳ දෙවියන් ගේ සඳ ගල ගාවා රත්රන් පටි ඉන වට දිලිසෙනවා
ගණ දෙවියන් ගේ කෝවිල ගාවා රිවිදුටු පිණි බිඳු ලෙස පහවෙනවා
අපිත් කියමු කවි ගොවිපල ගාවා දුම්බර කෙතෙ අපි ගොයම් කපනවා

පතල් කවි

ඉන්නේ දුම්බරයි මග කලු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බත ට
බොන්නේ බොරදියයි පුරුවෙ කළ පවට
යන්නෙ කවදා ද මව්පියෝ දකින්නට

පැල් කවි

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත් කම නිසයි මා පැල් රකින්නේ

පාරු කවි

ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන්
අත්ත බිදෙයි පය බුරුලෙන් තබා වරෙන්
කැලණි ගඟේ ඔරු යනවා බලා වරෙන්
සාධුකාර දී ඔරුවක නැගී වරෙන්

ගැල් කවි (කරත්ත කවි)

තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා
කටු කැලේ ගාලෙ නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බට දනවා
පවුකල ගොනෝ ඇඳපන් හපුතල් යනවා

- ඉහත සඳහන් කවි කිහිප අවස්ථාවක් තාලානුකූල ව හා රිද්මයානුකූල ව ගායනය කිරීමට අවස්ථා සලසන්න.

උදාහරණ :-තාලානුකූල ගායනයට - ගොයම් කැපීමේ කවි පමණි
රිද්මයානුකූල ගායනයට - පතල් කවි, පැල් කවි, පාරු කවි, ගැල් කවි (කරත්ත කවි)
(මෙම ජනකවි ගායනයේ දී ඒ පිළිබඳ හැකියාව ඇති ගුරුවරයකු හෝ සිසුවකු හෝ බාහිර පුද්ගලයකුගේ සහාය ලබා ගැනීමෙන් ක්‍රියාවලිය ඵලදායී කර ගත හැකි ය)

- වැඩ කරන අවස්ථා ගායනය සමඟ රංගනයට යොමු කරන්න.
- මෙම අවස්ථා සඳහා යොදා ගත හැකි උපකරණ කිහිපයක් නිර්මාණය කිරීමට සලස්වන්න. (ඒවා භාවිත කරමින් ක්‍රියාකාරකම්හි යෙදවීමට යොමු කරන්න.)

උදාහරණ :- දැකැති, කුඩ, ඔරුවක්, හඹලක් ... වැනි අවස්ථාවට උචිත නිර්මාණ
කරට බැඳිය හැකි මාල (විවිධ ඇට වර්ග වැනි දෙයින්)
තාලම්පට හෝ සිලි සිලියක්

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

1. ගොයම් කැපීම
    ගායනය කරමින් සිසුන්ගේ අභිමතය පරිදි ගොයම් කැපීමට හා නර්තනයට අවස්ථා ඉඩ දෙන්න. (සාම්ප්‍රදායික ගොයම් කැපීම නර්තනය මෙහි දී බලාපොරොත්තු වන්නේ නැත)
    සිසුන්ට ම නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.
    නිර්මාණය කරන ලද දෑකැති භාවිතයට ගැනීමට මතක් කර දෙන්න.
    ගායනය කරන අවස්ථාවේ දී නිර්මාණය කරන ලද තාලම්පට භාවිත කිරීමට යොමු කරන්න.
2. පතල් වැඩ කිරීමේ අවස්ථා ගායනය සමඟ නිරූපණයට යොමු කරන්න.
    පතල කපන ආකාරය
    මතු වන ජලය ඉවත් කරන ආකාරය
    කූඩයකින් ජලය බේරා වටිනා ගල් වර්ග මතු කර ගන්නා ආකාරය
    මතු කර ගත් ගල් වර්ග අව්වට අල්ලා විපරම් කර බලන ආකාරය
    වටිනා ගල් වර්ගයක් ලැබී සතුටු වන ආකාරය මෙහි දී චලන ක්‍රියාකාරකම් සමඟ ගායනා ද යොදා ගන්න.
3. පැල් රැකීම
    සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. හැකිනම්
    කුඩා පැල් දෙකක් සෑදීමට කණ්ඩායම් දෙක යොමු කරන්න.
    එම පැල් දෙකේ සිසුන් කණ්ඩායම් දෙකට පැල් කවි මාරුවෙන් මාරුවට කීමට අවස්ථාව සලසන්න.
4. පාරු පැදීම
    කවි ගායනය කරමින් පාරු පැදීම චලනයෙන් නිරූපණයට යොමු කරන්න.
5. ගැල් පැදවීම (කරත්ත කවි)
    කරත්ත යන ආකාරය නිරූපණය කරමින් ගැල් කවි ගායනයට අවස්ථාව ලබා දෙන්න.
    සාදා ගන්නා ලද ආදේශ තාලම්පට ගායනයේ දී භාවිතයට ගැනීමට උපදෙස් දෙන්න.

- තනි පුද්ගලයකු වැඩක නිරතවීමට වඩා කණ්ඩායමක් එක් වී වැඩක නිරතවීමේ වැදගත්කම මතු කර දෙන්න.
- වෙහෙස නැති කර ගැනීමට කවි ගායනය කළ බව පැහැදිලි කර දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.11 මිනිස් හැසිරීම්

තමා පිළිබඳ ව ගරුත්වයක් ඇති ව සිතීමට හා ක්‍රියා කිරීමටත් අනුන්ට ද ගරුත්වයෙන් යුතු ව හැසිරීමටත් මෙම තේමාවෙන් සිසුන් යොමු කෙරේ. එමෙන් ම සිය අදහස් යටපත් කර ගෙන සිටීම හෝ ආවේගශීලී ව ප්‍රකාශ කිරීම හෝ යන අන්තවලට නොගොස් සහනශීලී ව ප්‍රකාශ කිරීමට හුරුවීමට ද මෙහි දී අවස්ථා සැලසේ. තමා පිළිබඳ ව මෙන් ම අනුන් පිළිබඳ ව ද ගරුත්වයක් ඇති ව ක්‍රියාකරන, සිතට එකඟ ව සංයමයෙන් අදහස් ප්‍රකාශ කරන අනාගත පුරවැසියන් සඳහා පදනමක් ඇති කිරීමට මෙහි දී අපේක්ෂා කෙරේ.

නිපුණතා

★ අන් අයගේ ගරුත්වය ආරක්ෂාවන ලෙස ආචාරශීලී ව හැසිරෙයි.
★ සිය අදහස් සහනශීලී ලෙස ප්‍රකාශ කරයි.
★ තමා පිළිබඳ ව ප්‍රතිජනනාත්මක ව අගය කරයි.
★ අන් අය අගය කරමින් සාමූහික කටයුතුවල නියැලෙයි.
★ මානව ගරුත්වය අවධාරණය කෙරෙන සිද්ධි කතන්දර ඉදිරිපත් කරයි.
★ මානව වටිනාකම් අවධාරණය කෙරෙන කවි, ගී ගායනා කරයි. රංගනවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ මම කවු ද? යනුවෙන් චිත්‍රයක් ඇඳීමට සිසුන් යොමු කරන්න. ඒ සඳහා මග පෙන්වන්න.
මෙම චිත්‍රයට
- තමා කැමතිම ක්‍රීඩා
- තමාගේ දක්ෂතා, හැකියා සහ රුචිකත්ව
- තමාගේ අනාගත අපේක්ෂා
- තමා කැමතිම විනෝදාංශ
- තමා කිරීමට කැමති යහපත් දේවල්
- තමාට ප්‍රියමනාප පුද්ගලයන්

ආදිය ඇතුළත් කළ හැකි බව පවසන්න. තමා පිළිබඳ ව අගයකින් යුතු චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න.

- සිසුන් නිරීක්ෂණය කිරීමේ දී චිත්‍රය ඇඳීමේ ගැටලු සහගත බවක් දක්වන සිසුන් වේ නම්, සමීප වී චිත්‍රය මඟින් තමා කවුදැ යි නිරූපණය කිරීමට සහාය වන්න. සෑම සිසුවෙක් ම චිත්‍රය ඇඳ අවසාන වූ විට ඊළඟ පියවර අරඹන්න.

✠ සිසුන් යුගලය බැගින් වෙන් වී වාඩිවීමට සලස්වන්න. එළිමහන් ස්ථානයක ඉඩකඩක් සපයා ගත හැකි නම් වඩාත් සුදුසු ය.

- යුගලයේ සිසුන් එකිනෙකා තම චිත්‍රය අනෙක් සිසුවාට විස්තර කිරීමට මග පෙන්වන්න. සිය චිත්‍රය අනෙකාට විස්තර කිරීමේ දී මුලින් තමාගේ සාමාන්‍ය විස්තර ද එයට පසුව තමාගේ යහපත් සිතිවිලි, යහගුණ, අනාගත අපේක්ෂා ආදිය ද දැක්වීමේ අවශ්‍යතාවය අවධාරණය කරන්න.
- අසා සිටින සිසුන් විසින් මිත්‍රශීලී ප්‍රශ්න නගමින් චිත්‍රය පිළිබඳ තව දුරටත් කරුණු දැන ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- යුගලයේ දෙදෙනා එකිනෙකාගේ චිත්‍ර පිළිබඳ ව කතා බහ කර අවසාන වනතුරු මෙම පියවර ක්‍රියාත්මක කරන්න.
- යුගලයක සිටින සිසුන් දෙදෙනාට සිය චිත්‍ර මාරු කිරීමට උපදෙස් දෙන්න. තමා අයත් යුගලයේ අනෙක් සිසුවාගේ චිත්‍රය ගෙන එය නැවත එය අයත් සිසුවාට විස්තර කිරීමට හැකි දැ යි බැලීමට අවස්ථාව සලසන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙම විස්තරය අසා සිටින චිත්‍රය අයත් සිසුවා මතකයෙන් ගිලිහී ගිය දෑ මතක් කිරීමෙන් හා අඩු පාඩු සම්පූර්ණ කිරීමෙන් තම මිතුරාට තමා වෙනුවෙන් කතා කිරීමට උදවු කළ හැකි ය. යුගලයෙන් යුගලයට ගොස් චිත්‍රය අයත් සිසුවාට ගරුත්වයක් දැනෙන ලෙස චිත්‍රය විස්තර කිරීම අවධාරණය කරන්න.

- සෑම යුගලයක ම එක් සිසුවකු බැගින් තැන් මාරු කිරීමට යොමු කරන්න. තමන් අත ඇති චිත්‍රය විස්තර කරමින් චිත්‍රය අඳින ලද සිසුවා පිළිබඳ ව ගරුත්වයක් ඇති වන සේ විස්තරයක් කිරීමට සිසුන් යොමු කරන්න.

  මේ චිත්‍රය රසිකා නිසංසලාගේ
  එයා කැමති එයාට නිසංසලා කියා කතා කරනවාට.
  එයා අම්මට ගොඩාක් ආදරෙයි.
  අම්මා බොහොම වෙහෙස මහන්සි වෙලයි එයාව පාසල් එවන්නේ.
  කාඨික තරගවලින් ඉදිරියට යන්නයි එයා හිතන්නේ.
  එයාට ලස්සනට අකුරු ලියන්න පුළුවන්.
  ළමා පුවත් පත්වල නිසංසලා ලියූ කවි පළවෙලා තිබෙනවා.
  නිසංසලාගේ ගේ මිදුල හරි ලස්සනයි. එය චිත්‍රයේ මෙතන ඇඳ තිබෙනවා.
  ඒ ලස්සන මල් පාත්ති එයා ම හදපු ඒවා
  එයා ලොකු වෙන කොට ලේඛිකාවක් වෙන්නයි අදහස

  මෙහි දී සාමාන්‍ය විස්තරයක් නොව, චිත්‍රය අයත් සිසුවාගේ යහගුණ, දක්ෂතා, අපේක්ෂා, සිතුම් පැතුම් ආදිය ඇතුළත් විස්තරයක් කිරීමට දිරි දෙන්න. තමා සවන් දෙන විස්තරයට අදාළ සිසුවාගේ දක්ෂතා, යහගුණ, නිවැරදි චර්යා ආදිය මතක තබා ගැනීමට යොමු කරන්න. සෑම යුගලයක ම සිටින දෙදෙනා ම විස්තර කිරීම් අවසන් වන තුරු මෙය ක්‍රියාත්මක කරන්න.

- පන්තියේ සිසුන් සියලු දෙනා සමඟ මෙතෙක් සහභාගි වූ ක්‍රියාකාරකම් පිළිබඳ ව කතා බහක යෙදෙන්න. එම අදහස්වලට නිදහසේ මතු වීමට අවශ්‍ය පරිසරය සකස් කරන්න. සිසු අදහස්වලට එක් වෙමින් පහත දැක්වෙන අන්දමේ අදහස් මතු කර ගෙන ලෑල්ලේ සටහන් කරන්න. ඒවා එකිනෙක පන්තියේ සතිපතා ප්‍රදර්ශනය කරන්න.

  උදාහරණ :
  - හැම කෙනකුටම කළ හැකි යමක් ඇත.
  - තමාගේ යහගුණ සිතිවිලි යහපත් ක්‍රියා පිළිබඳ සතුටු වෙමු.
  - අනුන්ට ගරුත්වයක් ඇතිව කතා කරමු.
  - අනුන්ට ගරුසරු ලෙස ආචාරශීලී ව හැසිරෙමු.

මෙවැනි අදහස් මතු කරන විට සිසුන්ගෙන් මතු වන නිර්මාණශීලී පාඨ ඇත්නම් බෙහෙවින් අගය කර ඒවා ප්‍රදර්ශනය කරන්න. සිය හැකියා මත නිමැවුණු පාඨ ප්‍රදර්ශනය වීමේ සතුට විඳ ගැනීමට සිසුන්ට අවස්ථාව සලසන්න. යහගුණ, ගරුත්වය, යහපත් සිතුවිලි හා යහපත් ක්‍රියා වැනි මානව වටිනාකම් මතු කෙරෙන ගීවලට සවන් දීමට සලස්වන්න. එවැනි ගී ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 2

✠ සිසුන් එදිනෙදා මුහුණ දෙන ප්‍රායෝගික සිද්ධි පෙළක් මෙම ක්‍රියාකාරකමට පෙර එක් රැස් කර ගන්න.

  උදාහරණ :-යාබද පන්තිය අතුගා කුණු ඔබේ පන්තිය අසල තබයි.
  බස්රථයට පෝලිමේ සිටින විට පසුව පැමිණෙන සිසුවෙක් ඉදිරියෙන් සිට ගනියි.
  අද රැගෙන එන බවට පොරොන්දු වී ඊයේ ඉල්ලා ගෙන ගිය පොත අද ගෙන විත් නැත.
  යාබද සිටින සිසුවා ඔබෙන් අවසරයක් නැතිව ඔබේ බෑගය විවෘත කර පැන්සල ගෙන වැඩ කරයි. ඔබට ලියන්නට පැන්සලක් නැත.

- මෙවැනි සිද්ධි භූමිකා රංගනවලින් දැක්වීමට සිසුන් යොමු කරන්න. වඩා හොඳින් රංගනයෙන් අදහස් පළ කිරීමට හැකි සිසුන් යුගල තුන තෝරා ගන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- පහත දැක්වෙන ආකාරයේ යටහත් චර්යා දක්වන භූමිකා රංගන තුනක් සඳහා එම යුගල තුනකට මග පෙන්වන්න.

  භූමිකා රංගනය 1

  යාබද පන්තියේ පන්ති නායකයා පන්තිය අතුගා ඔබේ පන්තිය ළඟ කුණු ගොඩක් තබා යයි. ඔබ එය බයාදු සිනාවකින් ඉවසා සිටියි. අනෙකා යටහත් ව එම චර්යාව පිළිගනියි.

  භූමිකා රංගනය 2

  බස් රිය එනතුරු සිසුන් පෝලිමේ සිටියි. එක් සිසුවෙක් පසුව පැමිණ පෝලිමේ මුල් කොටසට රිංගා ගනියි. එයට පසු පසින් සිටින සිසුවා බයාදු ලෙස හැසිරී එයට ඉඩ දෙයි.

  භූමිකා රංගනය 3

  එක් සිසුවෙක් අනෙක් සිසුවාගෙන් ඊයේ ඉල්ලා ගෙන ගිය පොත ඉල්ලයි. එය අද ගෙන ඒමට අමතක වූ බව අනෙක් සිසුවා කියයි. පොත අයත් සිසුවා බයාදු සිනාවකින් එය පිළිගනියි.

මෙම භූමිකා රංගන තුන අවසන් වූ පසුව පොදු සාකච්ඡාවක් මෙහෙයවන්න. යටහත් චර්යාවෙන් සියල්ල පිළිගැනීම සුදුසු දැයි විමසන්න. සිසු අදහස් විමසමින් ඒ අදහස් තුළින් පහත දැක්වෙන දෑ අවධාරණය කරන්න.

- යටහත් චර්යා වෙන් සියල්ල පිළිගැනීම නිසා තම ආත්ම ගෞරවයට හානි සිදුවේ.
- මේ නිසා තමන්ට දිගින් දිගට ම පාඩු සිදුවේ.
- මේ නිසා නිවැරදි විය යුතු දේවල් නිවැරදි වන්නේ නැත.
- දිගටම මෙවැනි හැසිරීමක් හුරුවීම නිසා අනාගතයේ දී ද සිය ගරුත්වයට හානි සිදුවේ.

✠ පහත දැක්වෙන ආකාරයේ ආක්‍රමණශීලී භූමිකා රංගන තුනක් සඳහා සිසුන්ට මග පෙන්වන්න.

  භූමිකා රංගනය 1

  යාබද පන්තියේ සිසුවා පන්තිය අතුගා කුණු ගොඩ අනෙක් පන්තිය ළඟ තබයි. අනෙකා ආක්‍රමණශීලී ලෙස බැන වදිමින් එයට එරෙහි වෙයි.

  භූමිකා රංගනය 2

  බස් රිය එනතුරු සිසුන් පෝලිමේ සිටියි. පසුව පැමිණෙන සිසුවා පෝලිමට රිංගනවාත් සමඟ පිටපසින් සිටින සිසුවා බැන වදිමින් එයට එරෙහි වෙයි.

  භූමිකා රංගනය 3

  ඊයේ පොත දුන් සිසුවා අද එය විමසයි. ගෙනැවිත් නැති බවට පිළිතුරු ලැබුණු වහාම දැඩි සේ බැන වදියි.

- මෙම භූමිකා රංගන තුන අවසන් වූ පසුව සියලු ම සිසුන් සමඟ කතා බහ කරන්න. ආක්‍රමණශීලී ව හැසිරීම නිසා බොහෝ පාඩු සිදුවන බව පහත දැක්වෙන ලෙස සිසු අදහස් තුළින් අවධාරණය කරන්න.
  - ආක්‍රමණශීලී ව බැන වැදීම තාවකාලික සහනයක් පමණයි.
  - ඒ මගින් ගැටලු විසඳෙන්නේ නැත.
  - ආක්‍රමණශීලී වූ විට අපගේ ද අනුන්ගේ ද ගරුත්වයට හානි සිදුවේ.
- එදිනෙදා ඇති වන ගැටලු විසඳීමට අප භාවිත කරන්නේ යටහත් වීම හෝ ආක්‍රමණශීලී වීම හෝ බව අවධාරණය කරන්න. ඒ දෙයාකාරය ම
  - එකිනෙකා ගරුත්වයට හානිකරය.
  - විසඳුමක් කරා ඒමට අසීරුය.
  - තාවකාලික සහනයක් ඇතත් මේ දෙයාකාරයට ම ගැටලු ස්ථිරව විසඳෙන්නේ නැත.
  - එකිනෙකාගේ නිරෝගී බවට හානිකරය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මේ දෙයාකාරයට ම වෙනස් ව හැසිරීමට හැකි දැ යි සිසුන්ගෙන් අසා චින්තනයට යොමු කරන්න. සිතා බැලීමට කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න.
  - යටහත්ව සිටින්නේත් නැතිව ආක්‍රමණශීලී වන්නේත් නැතිව කිව යුතු දේ කියන්නේ කෙසේ ද?
  - පුද්ගලයන්ට පහර නොදී කිව යුතු දේ කියන්නට හැකි ආකාරය කුමක් ද?
  - අපට ඇති වූ පාඩුව සිත් වේදනාව අනෙක් අයට දැනෙන ලෙස කියන්නේ කොහොම ද?

  චින්තනයට යොමු කර ඊළඟ ක්‍රියාකාරකම පසු දිනකට කල් තබන්න.

ක්‍රියාකාරකම 3

✠ සහනශීලී චර්යා දැක්වීම සඳහා කලින් භූමිකා රංගනයේ යෙදුන යුගල තුනට ම මග පෙන්වන්න. එහි දී ඉතා සංයමයකින් වචන හැසිරවීම සහ ඉරියව් හැසිරවීම පිළිබඳ එම යුගල තුනට ම නිසි ලෙස මග පෙන්වන්න.

භූමිකා රංගනය 1

යාබද පන්තියේ සිසුවා කුණු අතුගා අනෙක් සිසුවාගේ පන්තිය ළඟ තබා යයි. එවිට අනෙක් සිසුවා "ඔයා ඔය කුණු ඔතන තැබීම ගැන මට හරි කණගාටුයි. ඒක හොඳ මදි නේ ද? මම කැමතියි ඔය කුණු ටික කුණුවලට දමනවා නම්"

භූමිකා රංගනය 2

බස් රිය එනතුරු සිසුන් පෝලිමේ සිටියි. පසුව පැමිණෙන සිසුවා පෝලිමට රිංගනවාත් සමගම පසු පසින් සිටින සිසුවා මෙසේ කියයි. "ඔයා පසුව ඇවිත් මෙතන සිට ගත්තාම අපි හැමෝට ම හරි වේදනාවක් අපි කැමතියි ඔයා නියම තැනට ගිහින් සිට ගන්නවා නම්"

භූමිකා රංගනය 3

ඊයේ පොත් රැගෙන ගිය සිසුවා අද එය විමසූ විට පොත ගෙන ඒම අමතක වූ බව කියයි. පොත දුන් සිසුවා මෙසේ කියයි. "ඔයා පොරොන්දු වූ විදියට පොත නොගෙන ඒම මට හරි පාඩුවක්. අද මට ලියන්න විදියක් නැහැ. මම කැමතියි, ඔයා පොරොන්දු වූ දේවල් ඉටු කරනවා නම්"

- සහනශීලී චර්යා හුරු කර ගැනීම ගැන සිසුන් සමග කතා බහ කරන්න. යම් කිසි සිද්ධියක දී තමාට කියන්නට ඇති දේ සහනශීලී ව කියා පෑමේ වැදගත්කම අවධාරණය කරන්න. සිසුන් සමග කතා බහ කරමින් සිසු අදහස් තුළින් පහත කරුණු අවධාරණය කරන්න.

  සහනශීලී චර්යා නිසා :
  - ගැටුම් වැළකී යයි.
  - හොඳ හිත දිගට ම පවත්වා ගත හැකියි.
  - වගකීමක් ඇති ව හැසිරීමට හුරුවේ.
  - හැම දෙනාගේ ම ගරුත්වය ආරක්ෂා වේ.

  එදිනෙදා කටයුතුවල දි ආක්‍රමණශීලීව සහ යටපත් ව කටයුතු කරන අවස්ථා පිළිබඳ ව නිරන්තරයෙන් විමසිලිමත් ව සිටින්න. එවැනි අවස්ථාවල දී සහනශීලී ලෙස හැසිරීමට ඔවුන්ට මග පෙන්වන්න. ඒ සඳහා දිරි ගන්වන්න. සහනශීලී ව හැසිරෙන සිසුන් අගය කරන්න. ඔවුනොවුන් සහනශීලී ව හැසිරෙන පන්ති සංස්කෘතියක් ගොඩ නගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 4

✠ මානව ගරුත්වය අවධාරණය කෙරෙන කතන්දර හා සිද්ධි රැස් කර ගැනීමට යොමු වන්න.

උදාහරණ :

ඉතාමත් දුෂ්කර කාලවල දී වුවත් මිනිසුන් එකිනෙකාට ගරු කරමින් කටයුතු කළ ආකාරය මතු වූ ගැටලු ආවේගශීලී නොවී හැමගේ ම ගරුත්වය ආරක්ෂා වන ලෙස බේරුම් කර ගත් හැටි එකිනෙකාට ගරු සරු ඇතිව කතා බහ කිරීම නිසා ඇති වූ ගැඹුරු මානව සබඳකම් ආදිය අවධාරණය වන කතන්දර/සිද්ධි පොතකින්, පුවත් පත්වලින්, විද්‍යුත් මාධ්‍යයෙන් රැස් කර ගැනීමට සිසුන් යොමු කරන්න. දෙමාපිය කවයක දී ද සිසුන් සමඟ මානව ගරුත්වය අවධාරණය කෙරෙන කතන්දර සහ සිද්ධි ගැන කතා කිරීමේ වැදගත්කම අවධාරණය කරන්න.

සිසුන් ඉදිරියේ ඔබ ද එවැනි එක් කතන්දරයක්/සිද්ධියක් ඉදිරිපත් කරන්න. එමගින් මානව ගරුත්වය අවධාරණය කරන්න.

සිසුන් ඉදිරිපත් කරන කතන්දර හා සිද්ධි තුළින් ද මානව ගරුත්වය මතු කර දක්වන්න.

- එම සිද්ධි අතුරින් තමාගේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැඟීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 5

✠ පිළිගත කරන ලද මානව වටිනාකම් අවධාරණය කෙරෙන කවි, ගී, අසා රස විඳීමට ද ගායනා කිරීමට ද සිසුන් යොමු කරන්න.

උදාහරණ : මිනිසා සුවඳයි මල සේ - නුවණින් එළියයි හිරුසේ
පරවී වැටිලා ඒ හිරු මල මේ දෙරණේ //
පොළොවේ උරුමේ කියමින් බිලිඳී විහිදුණ ගුණදම්
දහසින් මියෙනා සටනින් අහලේ හිමිකම් සොයමින්
ලොව නහවා සෝ කඳුළින් - සැනහේ ජයපැන් පුරමින්
උණු ලේ විෂ වී සිරුරේ - මිතුරන් ගැටෙනා අතරේ
ගිනි මල් පිපිලා අහසේ ඇවිලේ ගිනි දැල් සයුරේ
සා පවසින් ඉකි බිඳිනා - සුසුමන් යදිමින් හෙළනා
(පද මාලාව - කුමාරදාස සපුතන්ත්‍රී)
(ගායනය - සුනිල් එදිරිසිංහ)

අසන්නට සලස්වන ලද කවි ගී ගායනා කළ පසු ඒ කවි/ගීවලින් මතු වූ මානව දයාව ගැන සිසුන් සමඟ කතා බහ කරන්න.

එවැනි තවත් කවි, ගී සොයා දැන ගෙන ඒමට සිසුන් පොළඹවන්න. එවැනි කවි ගී සොයා ගෙන ආ සිසුන් අගය කරමින් ඒවා ගායනා කිරීමට පන්තියේ සිසුන් දිරිමත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.12 පොළොව හා අහස


මිනිසාගේ විවිධ ක්‍රියාකාරිත්ව නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යන විවිධ ස්වභාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද විපත් බහුල කාලයක අපි ජීවත් වෙමු. මෙවැනි කාලයක අහස සහ පොළොවේ ඇති වන වෙනස්කම් කෙරෙහි ඉතා සංවේදී ව ස්වභාව ධර්මයෙන් අපට ලැබී ඇති සම්පත් ඥානාන්විත ලෙස භුක්ති විඳිය යුතු ය. ඒ අතර ම ස්වභාව ධර්මයෙන් සිදු වන හානි කෙරෙහි සංවේදී වී ආරක්ෂා වීමට ද හැකි විය යුතු ය. එබැවින් මෙම අවධියේ සිට ම සිසුන් පොළොව සහ අහසේ විවිධ වෙනස්වීම් කෙරෙහි සංවේදී විය යුතු ය.
මෙම තේමාවේ දී අහසේ සහ පොළොවේ විවිධ වෙනස්කම් කෙරෙහි සංවේදී වීමට ද ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සම්පත් ඵලදායී ලෙස පරිහරණය කිරීමට ද යොමු වේ. එමෙන් ම මෙම තේමාවේ දී අදාළ තොරතුරු වාර්තා කිරීමට ද වින්දනාත්මක ව අධ්‍යයනය කිරීමට ද අවස්ථා සැලසීමට අපේක්ෂිත ය.

නිපුණතා
- ★ භූමියේ මතු පිට විවිධත්වය තුළින් මතු වන සුන්දරත්වය අගය කරයි.
- ★ ස්වභාව ධර්මයේ අපට ලැබී ඇති දේ ඵලදායී ව පරිහරණය කරයි.
- ★ අහසේ දක්නට ලැබෙන දෑ පිළිබඳ තොරතුරු රැස් කර විවිධ අයුරින් වාර්තා කරයි.
- ★ සුළං ලබා ගැනීම සඳහා විවිධ ක්‍රම භාවිත කරයි.
- ★ සුළඟින් ඇති ප්‍රයෝජන විමර්ශනය කර වාර්තා කරයි.
- ★ ස්වභාව ධර්මයේ බලපෑමෙන් සිදු විය හැකි හානි පිළිබඳ ව විමසිලිමත් ව ක්‍රියා කරයි.
- ★ සුළඟින් ක්‍රියා කර විය හැකි සරල නිර්මාණ කරයි.
- ★ අහස පොළොව සුළං වැස්ස තේමා කරගත් කවි, ගී ගායන හා විවිධ රංගනවල නිරත වෙයි.
- ★ භූමියේ විවිධත්වය මතුවන අන්දමේ නිර්මාණාත්මක ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ★ අවකාශ භාවිත කරමින් කළ හැකි ක්‍රීඩාවන්හි නියැලෙයි.
- ★ විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් අහස පෙළොව සුළං වැස්ස පිළිබිඹු කෙරෙන විවිධ නිර්මාණවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1

✠ පාසල් භූමියේ හෝ පාසලට ආසන්න පරිසරයක භූමියේ හෝ විවිධත්වය පෙනෙන ස්ථානයකට සිසුන් රැගෙන යන්න. භූමියේ විවිධත්වය නිරීක්ෂණය කිරීමට මග පෙන්වන්න.
- එම ස්ථානයට ආසන්නයේ උස් තැන් පහත තැන් සම මට්ටමේ තැන් ඒ ඒ තැන්වල ඇති පාෂාණ සහ පසෙහි ස්වභාවය, වැවී ඇති පැළෑටි හා ගස්වැල් ආදිය නිරීක්ෂණය කිරීමට මග පෙන්වන්න.

✠ සිසුන් කණ්ඩායම් කර පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- සෙන්ටිමීටර හතරක් පමණ විෂ්කම්භයක් සහ සෙන්ටිමීටර 15 පමණ දිග සිලින්ඩරාකාර කඩදාසි බට එක සිසුවකුට එක බැගින් සාදා ගැනීමට සලස්වන්න.
- සිසුන් එළිමහනට කැටුව යන්න.
  මීටර දහයක් පමණ දිග ලණු කැලි හතරක් සපයා ගන්න.
  රූපයේ පරිදි දිශා අට ඔස්සේ ලණු බිම එලන්න.
  ඒවා අග සිසු කණ්ඩායම්වලට සිට ගැනීමට සලස්වා
  කඩදාසි බට ඇසට තබා අදාළ දිශාව ඔස්සේ ඈත බලා
  දකින දේ ලැයිස්තු ගත කිරීමට සලස්වන්න.




පන්තියට ගොස් සියලු සිසුන් දක්නා ලද දේවල් පොදු ලැයිස්තුවකට ගන්න. ඒවා ඉදිරිපත් කිරීමට සලස්වා ඒ පිළිබඳ ව කතා බහ කරන්න.




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

භූමියේ විවිධත්වය පෙන්නුම් කෙරෙන මෙවැනි පින්තූර කිහිපයක් සපයා ගන්න. කණ්ඩායම් වශයෙන් එම පින්තූර බලමින් ඒවායේ පෙනෙන භූමියේ විවිධත්වය පිළිබඳ කතා බහ කිරීමට සිසුන්ට අවස්ථා සලසන්න. ඒ පිළිබඳ ව තම අදහස් ප්‍රකාශනයට සිසුනට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2

✠ තරමක් විශාල ශ්‍රී ලංකාවේ පළාත් සිතියමක් ගෙන එය පිළිබඳ ව සිසුන් සමඟ කතා කරන්න.

- ට්‍රේසිං කඩදාසියක් සිතියම මත තබා ඔබේ පළාතේ සීමාව සටහන් කර ගැනීමට සලස්වන්න. පසුව එය පාට කඩදාසියක් මත තබා ඇඳ ගැනීමට සලස්වන්න. පාට කඩදාසියේ තම පළාත් අඩංගු කොටස කපා ඉවත් කරන්න. දැන් එය කවුළුවකි.



- මෙම කවුළුව මුල් සිතියමේ ඔබේ පළාත පිහිටා ඇති තැන මත තබන්න. තමා ජීවත් වන පළාත ගැන සිසුන් තුළ වැඩි අවධානයක් යොමු කරවීමට සලස්වන්න. එම කොටස නිරීක්ෂණය කරමින් දකින තොරතුරු කීමටත්, කළුලෑල්ලේ හෝ ඩිමයි කඩදාසියක හෝ ලිවීමටත් සලස්වන්න.
- එසේ ම සිතියමේ ඇති සිසුන්ට නොතේරෙන සංකේත සලකුණු ආදිය පිළිබඳ ව පැහැදිලි කරන්න.
- මෙම සාකච්ඡාව හා නිරීක්ෂණය මගින් සිය පළාතේ ඇති කඳු, බෑවුම්, තැනිතලා, වෙරළ, ස්වභාවික ජලාශ, වැව්, ගංගා හා වෙනත් ජල මාර්ග සහ වනාන්තර ආදී භූගෝලීය වටිනාකමක් ඇති ස්ථාන කිහිපයක් හඳුනා ගැනීමට සලස්වන්න.
- භූමියේ විවිධත්වය හොඳින් දැක ගත හැකි ස්ථානයක් නැරඹීමට චාරිකාවක් පිළියෙල කරන්න. තෝරාගත් භූමියේ දක්නට ලැබෙන විවිධත්වය එනම්
  - තද බෑවුම්, මඳ බෑවුම් හා ඈත පෙනෙන තැනිතලා ආදී වශයෙන් භූමියේ වෙනස
  - කළුගල්, තිරුවානා ගල්, කබොක් ගල්, හුණු ගල්, වැලි ගල්, කුඩු ගල් ආදී විවිධ ප්‍රමාණයේ ගල් වර්ග
  - දුඹුරු පාට පස්, රතු පාට පස්, කහ පාට පස්, හුණු පස් හා වැලි ආදී වශයෙන් පස් වර්ග විවිධ ආකාරයේ පස් වර්ග
  - ජලාශ හෝ දිය පාරවල් හෝ ආදිය කෙරේ සිසු අවධානය යොමු කරවන්න.
  - හඳුනා ගත් ලක්ෂණ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.


ක්‍රියාකාරකම 3

✠ රූප සටහනේ දැක්වෙන ආකාරයට සිදුරු කැමරාවක් සාදා ගන්න. එය තැබීම සඳහා ඇටවුමක් ද පිළියෙල කර ගන්න. සිදුරු කැමරාවේ තිරය වෙනුවට වීදුරු තහඩුවක් තබන්න. ඒ මත ටිෂු කඩදාසියක් සවි කරන්න. මෙහි ඉදිරිපත් කර ඇති සිදු කැමරාව ජනේලයකට එල්ල කර ඇත. එහි ඡායාව තිරයේ දැක්වේ. මේ ආකාරයට කැමරාව ගසකට එල්ල කර ටිෂු කඩදාසිය මත පතිත වන ගසේ (යටිකුරු) ඡායාව ඇඳ ගන්න.

ඉන්පසු හැඩයෙන් වෙනස් වෙනත් ගසකට කැමරාව යොමු කොට එහි ඡායාව වෙන කඩදාසියක ඇඳ ගන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙසේ ගස් පහක පමණ ජායාවන් විත්‍රයට නගන්න.



සිදුරු කැමරාව

- සියලු කණ්ඩායම් විසින් අඳින ලද ජායා සටහන් එක පෙළට තබන්න. ඒ ඇසුරෙන් පහත දැක්වෙන ආකාරයේ කරුණු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - එකම වර්ගයේ ගස්වල ඉහළ කොටසේ හැඩය සමාන ද? වෙනස් ද?
  - අප දුටු සියලු ගස්වල හැඩ, කාණ්ඩ කීයකට වෙන් කළ හැකි ද?
  - ඉහත හැඩ අතුරින් ඔබ වඩාත් කැමති වන්නේ කුමන හැඩයට ද? ඊට හේතු මොනවා ද?

ක්‍රියාකාරකම 4

- පස් ගැන අවධානය යොමු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. පස් තදට හෝ බුරුල් ව හෝ පිහිටා තිබේ දැ යි බැලීම, පස් ස්වල්පයක් ඇඟිලි අගට ගෙන පොඩි කර කැටවල ප්‍රමාණය ගැන අවබෝධයක් ලැබීම, පස්වල සිටින කුඩා සතුන් හඳුනා ගැනීම ආදිය
- ගස්වල හා පඳුරුවල මුල් නිසා ස්වභාවික ව ම පස සේදී නොයා ආරක්ෂා වී ඇති අන්දම පෙන්වා දෙන්න. මෙහි දී ශාක මුල් පොළොව තදින් බැඳගෙන තිබෙන ආකාරය පෙන්විය හැකි ය. තණකොළ ආදී කුඩා පැළෑටි ද පස වසා ගෙන සිටින ආකාරය නිරීක්ෂණ ඇසුරෙන් පෙන්වා දෙන්න.
- ගස්වල අතුවලින් වියනක් සෑදී පොළොව ආරක්ෂා කරන අන්දම පෙන්වා දෙන්න. මෙම වියන නිසා වැහි වතුර බිංදු කෙළින් ම පොළොවට නොවැටෙයි. ඒවායේ වේගය බාලවන නිසා පස් කැට බුරුල්වීම වැළකෙන බව පැහැදිලි කරන්න.

ක්‍රියාකාරකම 5

✠ සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. අහස නිරීක්ෂණයට මෙම කණ්ඩායම් යොමු කරවන්න. (එක් එක් කණ්ඩායමක් හඳුනා ගන්නා ලක්ෂණ වාර්තා කර ගැනීමට සලස්වන්න.) රැස් කර ගන්නා තොරතුරු සුදුසු ආකාරයට ගොනු කර ඉදිරිපත් කිරීමට සලස්වන්න.

උදාහරණ :

| වේලාව | වළාකුළු වර්ණය | වළාකුළුවල වෙනස්වීම | අහසේ දක්නට ලැබුණු වෙනත් දේවල් |
|---|---|---|---|
| පෙ.ව.10.00 | සුදු පාට | වළාකුළු සෙමින් ගමන් කිරීම (තමා සිටින ස්ථානය අනුව දිශාව දැක්විය හැකි ය) | කුරුල්ලෝ පියාඹා යාම |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

එක් එක් කණ්ඩායම ඉදිරිපත් කරන තොරතුරු පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න.

- නිරීක්ෂණය කරන අවස්ථාවේ පැවැති වළාකුළුවල ස්වභාවය අනුව පසුවට ඇති විය හැකි වෙනස්කම් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීමට යොමු කරන්න.
- සිසුන්ගේ පෙර අත්දැකීම් තුළින් වළාකුළු මඟින් ප්‍රකාශ කළ හැකි අනාවැකි පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම 6

✠ පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. පහත දැක්වෙන පැවරුම් කණ්ඩායම් දෙකකට දෙන්න.මේ සඳහා පහත දැක්වෙන වගුව භාවිත කරන්න.

පැවරුම 1 එක දිගට ම දින කිහිපයක් අලුයම සිට හිරු එළිය මිදුලට වැටෙන තෙක් හෝ පාසල් ඒමට පටන් ගන්නා තෙක් හෝ අහසේ දක්නට ලැබෙන වෙනස්කම් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.

පැවරුම 2 අනෙක් කණ්ඩායම පහත සඳහන් ක්‍රියාකාරකමේ යොදවන්න.

- එක දිගට ම දින කිහිපයක් සවස පහට පමණ සිට අවට කළුවර වැටෙන තෙක් සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කිරීමට යොමු කරන්න.

| දිනය | වේලාව | අහසේ දක්නට ලැබුණ දේ | සූර්යයා | වළාකුළුවල ස්වභාවය |
|---|---|---|---|---|
| | | | | |

- දිනපතා ම කණ්ඩායමට එක් වී ඉහත කණ්ඩායම සකස් කළ පරිදි තොරතුරු සාකච්ඡා කර පොදු වාර්තාවක් සකස් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- වාර්තා දෙකක ම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. එම අදහස් පිළිබඳ ව ගුරුවරයාගේ මැදිහත් වී තව දුරටත් පැහැදිලි කිරීමක් කරන්න.
- නිරීක්ෂණ පසුබිම් කර ගනිමින් චිත්‍රයක් ඇඳීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 7


✠ දහවල දී හා රාත්‍රී කාලයේ දී අහසේ සිදුවන වෙනත් විස්මිත දෑ හඳුනා ගැනීමට උනන්දු කරවන්න.

- එම අවස්ථාවේ වේලාව, සිදුවන ස්ථානය, එම අවස්ථාවේ අවට තත්ත්වය වැනි ලක්ෂණ ද නිරීක්ෂණය කිරීමට සලස්වන්න. එම නිරීක්ෂණ තොරතුරු සහ ඊට අදාළ ලිඛිත තොරතුරු පන්තියට වාර්තා කිරීමට සලස්වන්න. ඒවා පිළිබඳ ව කතා බහක යෙදෙන්න.

  උදාහරණ :- දේදුන්න, වල්ගාතරු, තාරකා, කෘත්‍රිම චන්ද්‍රිකා, චන්ද්‍රග්‍රහණ
- පහත ඒවායින් එකක් දේදුනු වර්ණ නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ වශයෙන් :
  - සබන් ගා ජලය මිශ්‍ර කර ගනිමින් සකස් කර ගන්නා සබන් බෝල හිරු එළිය පතිත වන ස්ථාන වෙත යැවීමෙන් සබන් බෝල මත හිරු එළිය වැටෙන විට දේදුන්නේ වර්ණ දැකිය හැකි ය.
  - හිරුට පිටුපා සිට ගෙන මුඛයට ගත් වතුර පිඹීම තුළින් විසිරෙන ජල බිංදු අතරින් දේදුනු වර්ණ දැකිය හැකි ය.
  - විසිරි පොම්පයක් ආධාර කර ගනිමින් හිරුට පිටුපා ජලය විසිරීමට සලස්වන්න. ඒ අතර විසිරි යන ජල බිංදු තුළින් දේදුන්නේ වර්ණ නිරීක්ෂණයට සලස්වන්න.
  - බේසමකට ජලය දමන්න. කැඩපතක් ගෙන එය පහත දිස්වන ආකාරයට තබන්න. හිරු එළිය කැඩපතට වැටෙන ආකාරයට තැබිය යුතු ය. හිරු එළියෙන් පරාවර්තනය වන ජලය හරහා එන ආලෝක ධාරාව බිත්තියකට වැටීමට සලස්වන්න. එය නිරීක්ෂණය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.



- මෙවැනි අත්දැකීම් ලබා දීමට [illegible] කරන්න.
- අහස හා අහසේ දක්නට ලැබෙන දෑ පිළිබඳ ව කියැවෙන කවි, ගී රැස් කිරීමට සලස්වන්න. ඒවා ගායනය කිරීමට සහ ගායනයට අනුව තාලානුකූල චලන කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  උදාහරණ :- පුංචි තාරකා // ඈත ඈත ආකාසේ
  පුංචි තාරකා
  පුංචි තාරකා
  සඳ ඇති දා සඳ වටකර පුංචි තාරකා
  සඳ වට සේ සිනා සෙන්න පුංචි තාරකා
  සඳ නැති දා කඳුළු සලන පුංචි තාරකා
  පුංචි අපට එළිය ගෙනන පුංචි තාරකා
  නිල් අහසේ තණ පලසේ මල් පොහොට්ටු සේ හිනැහෙන පුංචි තාරකා ///
  (පාදමාලාව - සමරසේන කළුගම්පිටිය)

ක්‍රියාකාරකම 8

✠ පසළොස්වක පෝය දිනට සතියකට පමණ පෙර සිට පෝය දින දක්වා ම සඳ නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.

- පසළොස්වක දිනට පසු සඳ දිස් වූ ආකාරයේ වෙනස්වීම් පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න. තම අත්දැකීම් විවිධාකාරයෙන් වාර්තා කිරීමට යොමු කරන්න. සඳේ මේරීම හා සඳ ක්‍රමයෙන් අඩු වී යාම සම්බන්ධ ව කතා බහ කරන්න. සඳ හා සම්බන්ධ විවිධ විශ්වාසයන් වැඩිහිටියන් අතර ඇත. සඳේ ස්වභාවය අනුව පුර සඳ අව සඳ වශයෙන් ද හැඳින්වේ. මේ පිළිබඳ ව වැඩිහිටියන්ගෙන් තොරතුරු රැස් කර පන්තියට ගෙන ඒම සලස්වන්න.

  මේ පිළිබඳ ව මාසයක පමණ කාලයක් දින කිහිපයක් රාත්‍රි කාලයේ දී සඳ නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීමට උපදෙස් දෙන්න.
- සඳ පිළිබඳ ව තව දුරටත් තොරතුරු රැස් කිරීමට පුවත්පත් සඟරා තොරතුරු සහ වැඩිහිටි අත්දැකීම් ආදිය සහාය කර ගත හැකි ය. එම තොරතුරු ඇතුළත් පොත් පිංචක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- සඳ හා සම්බන්ධ සරල නිර්මාණ කිරීමටත්, භාවිතයේ පවත්නා කවි ගී ගායනයටත්, තාලානුකූල ගායනය සමඟ රිද්මයානුකූල චලන කිරීමටත් සලස්වන්න.

  උදාහරණ :- 1. දිය ගොඩ සැමතැන කිරි ඉතිරේ - ගස් වැල් කිරි මුහුදේ කිමිදේ
  මද මුදු සුළඟින් අප නැලවෙන්නේ බැබළෙන හඳපානේ
  හඳපානේ //// රෑ යාමේ
  මගෙ පොඩි නංගී කිරි ඉල්ලා
  දෝත නගා මහ ඉහළ බලා
  අම්බිලියෝ කියමින් නැලවෙන්නේ
  බැබළෙන හඳපානේ
  හඳපානේ //// රෑ යාමේ


Copyright © 2007 National Institute of Education - Sri Lanka.

වවුලන් හා බකමූණන්ගේ
නාදය ඉඳ හිට මට ද ඇසේ
කිරි වෙනුවට ගොම සොයමින් යන්නේ
බැබළෙන හඳපානේ
හඳපානේ //// රෑ යාමේ
(ගායනය, පදරචනය : සුනිල් ශාන්ත)

ක්‍රියාකාරකම 9

✠ සුළඟින් ක්‍රියා කරවිය හැකි සරල නිර්මාණ සඳහා සිසුන් යොමු කරන්න.
උදාහරණ :- සිහින් බටයක් උපයෝගී කර ගෙන සුළං පෙත්තක් කර කැවීමේ සරල නිර්මාණයක් සිසුන් සමඟ පිළියෙල කරන්න.

අවශ්‍ය දේ
පොල්පිති නාරටියක් හෝ කාඩ්බෝඩ් තීරුවක්
රබර් ඇටයක්
ඉරටුවක්
නූල් කැබැල්ලක්



පොල්පිති නාරටියක් හෝ
කාඩ්බෝඩ් කැබැල්ලක්

සිදුරු විදගත් රබර් ඇටය
(මේ වෙනුවට වෙනත් ආදේශයක්
යොදා ගත හැකි ය.)

ඉරටුව

රබර් ඇටය අතින් අල්ලා ගෙන
නූලේ ඉරටුව අඹරවා වරින් වර අදින්න

- තවත් මෙවැනි නිර්මාණ සඳහා සිසුන් යොමු කරන්න. තේමාව අවසාන වන කාලයේ දී සිසුන් විසින් නිර්මාණය කළ මෙවැනි දෑ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න. සිය නිර්මාණය අන් අය ඉදිරියේ ක්‍රියා කරවීමෙන් සතුට ලබා ගැනීමට යොමු කරන්න. සිසුන් කළ නිර්මාණ අගය කරන්න.

ක්‍රියාකාරකම 10

✠ නිවාසවලට සුළං ලබා ගැනීම සඳහා යෙදෙන විවිධ ක්‍රම පිළිබඳ ව සොයා බැලීමට සිසුන් යොමු කරන්න. තේමාව ආරම්භ කරන දිනවලදී ම නිවෙස්වලට සුළං ලබා ගැනීමට යොදා ඇති විවිධ ක්‍රම නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. එවැනි චිත්‍ර, ඡායාරූප හා සුළං සපයන විදුලිපංකා ආදිය පිළිබඳ පුවත් පත් දැන්වීම් ආදිය එකතු කිරීමට යොමු කරන්න.
සිසුන් සමඟ සාකච්ඡාවකින් සිසුන්ගේ අත්දැකීම් මතු කරන්න.
උදාහරණ :

- නිවෙස්වල ජනේල යොදා තිබීම
- බිත්තියේ ඉහළ වාකවුළු තැබීම
- ජනෙල්වල උළුවස්සේ ඉහළ සිදුරු සහිත කැටයම්/ලියවැල්/බීරළු යොදා තිබීම
- විදුලිපංකා භාවිතය
- වායුසමීකරණ යන්ත්‍ර භාවිතය



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මෙසේ සුළඟින් ඇති ප්‍රයෝජන විමර්ශනය කිරීමට පෙළඹවීමක් ඇති කරන්න. සුළඟින් ඇති ප්‍රයෝජන පිළිබඳ වාර්තා කිරීමට අවස්ථා සලස්වන්න.
- වැසි සහ සුළං ආශ්‍රිත රංගන නිර්මාණය කරන්න. විවිධ ශබ්ද හා රිද්ම උපයෝගී කර ගෙන සිසුන්ට එම නිර්මාණ වින්දනාත්මක ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම 11

✠ ස්වභාව ධර්මයේ බලපෑමෙන් සිදු වූ හානි පිළිබඳ පුවත් පත්වල පළ වූ ඡායාරූප එකතු කර ගෙන සිසු කණ්ඩායම්වලට ඉදිරිපත් කරන්න. එවැනි අවස්ථාවල සිදුවන හානි පිළිබඳ ව කතා බහට කුඩා කණ්ඩායම්වල දී අවස්ථා සලස්වන්න.

- එම අවස්ථාවල දී ආරක්ෂාකාරී ව කටයුතු කළ යුත්තේ කෙසේ දැ යි සිතා බලා කතා බහ කිරීමට නැවතත් අවස්ථාවක් දෙන්න.
  එක් එක් කණ්ඩායමේ අදහස් දැක්වීමට අවස්ථා සලසමින්, ඔබේ අදහස් ද එකතු කරමින්, ඒ හානිවල දී ගත හැකි ආරක්ෂාකාරී පියවර පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න. තේමාව අවසානයේ දී සපයා ගත හැකි ස්වභාවික හානිවලින් ආරක්ෂාවීම පිළිබඳ පෝස්ටර් ආදිය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

ක්‍රියාකාරකම 12

✠ කණ්ඩායම් වශයෙන් වළලු තුළින් රිංගායාමේ ක්‍රීඩා සඳහා සිසුන් යොමු කරන්න.
  මේ සඳහා සුදුසු ස්ථානයකට සිසුන් රැගෙන යන්න. කණ්ඩායම් වශයෙන් දිවීම සඳහා ආරම්භක ස්ථානයක් අවසාන ස්ථානයක් සලකුණු කර ගන්න. සිසුන් කණ්ඩායම් හතරකට බෙදා පේළි හතරකට සිටීමට සිසුනට උපදෙස් දෙන්න. අවසාන ස්ථානයේ වළලු හතරක් තබන්න. සංඥාවක් දුන් විට අවසාන රේඛාවට දිව ගොස් එතන තිබෙන වළල්ල සිය හිස සිට දෙපතුලට දමා වළල්ල එතන ම තබා ආපසු දුව විත් තම කණ්ඩායමේ පිටපසු සිට ගැනීමට යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.13 අපට කළ හැකි වෙනස්කම්

අප ජීවත් වන පරිසරය වඩාත් හොඳ ස්ථානයක් බවට පත් කර ගැනීම සඳහා අපට කළ හැකි දෑ බොහෝ ය. මේ සඳහා පුද්ගලයකු තුළ තිබිය යුතු ආකල්ප සංවර්ධනය කිරීමත් අවශ්‍ය හුරු පුරුදු ලබා දීමත් පාසල් කාලය තුළ සිට ම කළ යුතු ය. තමා අවට පරිසරය සංවර්ධනාත්මක දෘෂ්ටි කෝණයකින් යුතු ව වෙනස් කිරීමට අවශ්‍ය නිපුණතාවන් සිසුන් තුළ ඇති කිරීමේ අරමුණෙන් මෙම තේමාව සංවර්ධනය කර ඇත.

නිපුණතා

- ★ පාසල් පරිසරයේ/නිවෙස් පරිසරයේ සිදුකළ හැකි වෙනස්කම් අධ්‍යයනය කර වාර්තා කරයි.
- ★ යහපත් වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ සැලසුම් සකස් කරයි.
- ★ සැලසුම්වල දී එකිනෙකාගේ හැකියාවන් මත වගකීම් බෙදා හදා ගනියි.
- ★ වගකීම් ඉටු කිරීම හා සම්පත් භාවිතය මඟින් අදාළ වෙනස්කම් කිරීමේ ලා නිරත වෙයි.
- ★ වෙනස්කම් පිළිබඳ කණ්ඩායම් ලෙස වාර්තා සකස් කර ඉදිරිපත් කරයි.
- ★ වෙනස්කම් පිළිබඳ ව සැලසුමට පෙර තත්ත්වය, සැලසුම හා පසු තත්ත්වය, සන්සන්දනාත්මක ව තොරතුරු තක්සේරු කරයි.
- ★ යහපත් වෙනස්කම් ඇති කිරීමේ ලා එකිනෙකාගේ දායකත්වය හා වගකීම් ඉටු කිරීම පිළිබඳ ව ප්‍රතිජනනාත්මක ව අගය කරයි.
- ★ යහපත් වෙනස්කම් පිළිබඳ ව නිර්මාණාත්මක කතන්දර ඉදිරිපත් කිරීම, කවි, ගී, ගායනා, රංගන හා විවිධ සම්පත් භාවිත කරමින් කළ හැකි නිර්මාණවල නිරත වෙයි.
- ★ යහපත් ස්ථානයක් ලෙස ක්‍රීඩා පිටිය හඳුනා ගනිමින්, නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ පන්ති කාමරය සංවර්ධනය කිරීම වෙනුවෙන් අපට කළ හැකි දෑ හඳුනා ගැනීමට සලස්වන්න.
උදාහරණ :-පන්තියේ දැනට නැති, එහෙත් පන්තියේ කටයුතුවලට බෙහෙවින් ප්‍රයෝජනවත් දෙයක් නිර්මාණය කිරීම.

- මුලින් ම සිසුන්ට මෙම ක්‍රියාකාරකමේ අරමුණ පහදා දෙන්න. පන්තියට වැදගත් වන එමෙන් ම දැනට පන්තියේ නැති අපහසුවකින් තොර ව තනා ගත හැකි සරල භාණ්ඩ හෝ උපකරණ හෝ විය යුතු බව පවසන්න.
  නොඑසේ නම් දැනට පවතින යමක්, වඩාත් ප්‍රයෝජනවත් වීම සඳහා කරන වෙනස්කමක් විය හැකි බව ද දක්වන්න.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. කණ්ඩායමට නායකයකු බැගින් පත් කරන්න. ඒ එක් එක් කණ්ඩායම තුළ තම කණ්ඩායම විසින් කරනු ලබන වෙනස්කම් තීරණය කිරීම සඳහා සාකච්ඡා මෙහෙයවීමට අවස්ථාව දෙන්න. කණ්ඩායමේ සිසුන් ඉදිරිපත් කරන යෝජනා අතුරෙන් ඔවුන් වැඩි දෙනකු එකඟ වන වෙනස්කම තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙන්න. මෙහි දී ඔබගේ මඟ පෙන්වීම ඉතා වැදගත් වේ.
  මෙම තේමාව ඉගෙන ගන්නා කාලයට සමගාමී ව එක් එක් කණ්ඩායම විසින් තීරණය කරන ලද වෙනස්කම අනුව ක්‍රියාකාරී වීමට යොමු කරන්න. කණ්ඩායමක් තුළ පහත දැක්වෙන ආකාරයේ ක්‍රියාකාරකම් තිබිය හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තීරණය කරන ලද වෙනස්කම අනුව යම් භාණ්ඩයක් හෝ උපකරණයක් හෝ තැනීමට/පන්තියේ පවත්නා යමක් නව ආකාරයට වෙනස් කිරීමට

අවශ්‍ය වන ද්‍රව්‍ය එකතු කිරීම
ද්‍රව්‍ය හා ස්ථානපිරිසිදු කිරීම හා නිසි අකාරයට පිළියෙල කිරීම
නියමිත කොටස් එක්ලස් කිරීම
සකස් කළ දැතැබීමට තීරණය කරන ස්ථානය සකස් කර ගැනීම
නිමාවක් සහිත ව තැන්පත් කිරීම

මෙම කටයුතු සැලසුමකට අනුව ක්‍රියාත්මක කිරීමට සිසු කණ්ඩායම් යොමු කරන්න.
උදාහරණ :-

| කණ්ඩායම් අංකය :- | නායකයා :- | |
|---|---|---|
| කටයුත්ත | වගකීම | ඉලක්ක දිනය |
| 1. අවශ්‍ය ද්‍රව්‍ය එකතු කිරීම | | |
| 2. ද්‍රව්‍ය හා ස්ථාන පිරිසිදු කිරීම හා නිසි ආකාරයට පිළියෙළ කිරීම | | |
| 3. නියමිත කොටස් එකලස් කිරීම | | |
| 4. සකස් කළ දැ තැබීමට තීරණය කරන ස්ථානය සකස් කර ගැනීම | | |
| 5. නිමාවක් සහිත ව තැන්පත් කිරීම | | |

ඉන්පසු කාර්යය ඇරඹීමට යොමු කරවන්න.

- මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙන අතර තුරේ දී සාමූහික කාර්යයන් සියලු දෙනා එක් වී සාකච්ඡා කොට තීරණ ගැනීමෙත් ඒ අනුව ක්‍රියා කිරීමේත් වැදගත්කම හා එයින් සැලසෙන වාසි පිළිබඳ ව ද සිසු අවධානය යොමු කරවීම වැදගත් වේ.

ක්‍රියාකාරකම 2

✠ කරන ලද වෙනස්කමට පෙර (එය අඩුවක් ව පැවති කාලයේ) සිදු වූ දුෂ්කරතා නැවත මෙනෙහි කරවන්න. දැන් එම තත්ත්වය වෙනස් වී ඇති ආකාරය සාකච්ඡා කරන්න.

උදාහරණ :-කරන ලද වෙනස්කම මකුළු දැල් කඩන උපකරණයක් තැනීම නම්, එයට පෙර
(1) වෙනත් අමාරු ක්‍රම මගින් එම කාර්යය කිරීමට සිදුවීම
(2) අනෙකුත් පන්තිවලින් ඉල්ලා ගෙන ඒමට සිදුවීම
(3) එම කාර්යය සඳහා වැඩිපුර කාලයක් ගත වීම

තැනීමෙන් පසු (1) නිසි උපකරණයක් භාවිත කරන නිසා ඉක්මනින් හා අලංකාර ව කාර්යය නිම කිරීමට හැකි වීම
(2) කාලය ඉතිරිවීම
(3) වෙනත් පන්තිවලින් ඉල්ලන්නට සිදු නොවීම

ක්‍රියාකාරකම 3

✠ තීරණය කරන ලද වෙනස්කම් අනුව ක්‍රියාත්මක වීමේ දී තමන් ලද අත්දැකීම් විවිධ ආකාරයට ඉදිරිපත් කිරීමට සලස්වන්න. මේ සඳහා වාක්‍ය, ගී, කවි, චිත්‍ර, රංගන ආදිය භාවිත කිරීමට දිරි ගන්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 4

- ✠ තීරණය කරන ලද වෙනස්කම නිමා කිරීමෙන් පසු එක් එක් ශිෂ්‍යයාගේ ඇගයීම සඳහා පොදු සාකච්ඡාවක් මෙහෙයවන්න. කණ්ඩායම් නායකයන් ලවා සිය සාමාජිකයන්ගේ දායකත්වය මෙසේ ඇගයීමට ලක් කරන්න.

  උදාහරණ :-

  1. කණ්ඩායමේ නායකයා

     තිස්ස පොත් පහක් ම ගෙනාවා
     අතුල ඒවාට පිටකවර දැම්මා
     ශානිකා ලස්සනට පොතේ නම ලිව්වා
     සමන්මලී අංක යෙදුවා

  ආදී වශයෙන් කරන ලද කාර්යය/ දැක් වූ සහයෝගය/ සහභාගි වූ අන්දම ගෙන හැර දැක්විය හැක. කණ්ඩායමේ නායකයින්ගේ දායකත්වය ගුරුවරයා විසින් ම ඇගයීමට ලක් කිරීමට පුලුවන.

ක්‍රියාකාරකම 5

- ✠ අපට කළ හැකි වෙනස්කම් ආශ්‍රයෙන් කළ හැකි ආකෘති ආදර්ශ පුවරු ආදිය නිර්මාණය කරන්න.
  උදාහරණ :- ආදර්ශ පාඨ සකස් කර ප්‍රදර්ශනය කිරීම.

ක්‍රියාකාරකම 6

- ✠ සිසුන් සමඟ එකතුව එළිමහන් ස්ථානයක සිට කළ හැකි ක්‍රීඩාවක් නිර්මාණය කරන්න. මෙම ක්‍රීඩාව පන්තියේ සියලු සිසුන්ට සහභාගිවිය හැකි එකක් විය යුතු ය. මේ සඳහා බෝල, සුමට ලී කැබලි, දැල් ආදී අනතුරුදායක නොවන ඕනෑම භාණ්ඩයක් හෝ කිහිපයක් හෝ උපයෝගී කර ගත හැකි ය. ක්‍රීඩාවේ නියැලී විනෝද වීමට ඉඩ සලස්වන්න.
  තේමාව අවසානයේ කරන ලද ක්‍රියාකාරකම් සිහි ගන්වමින් සමාලෝචන සාකච්ඡාවක් පවත්වන්න. අපට යහපත් වෙනස්කම් කළ හැකි බව අවධාරණය කරන්න. ඒ සඳහා තනි තනි ව මෙන් ම සාමූහික ව ද උත්සාහ කිරීම හා කැපවීමේ වැදගත්කම අගය කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.14 මිනිසා හා තොරතුරු

තොරතුරු හුවමාරු වීම අධික වේගයෙන් සිදුවන යුගයක අවශ්‍ය ම තොරතුරු ලබා ගැනීමටත් තිබෙන තොරතුරුවලින් වඩාත් වැදගත් තොරතුරු ලබා දීමත් විමසිලිමත් ව කළ යුත්තකි. අදටත් වඩා වේගවත්ව, බහුල ලෙස තොරතුරු හුවමාරු වන අනාගත ලෝකයේ දී මෙය වඩාත් අභියෝගාත්මක වෙයි.
එවැනි අනාගතයකට පිවිසෙන සිසුන්ට සුදුසු පදනමක් ඇති වන සේ මෙම තේමාවේ දී විවිධ අවශ්‍යතා සඳහා විවිධ මාධ්‍යවලින් හුවමාරු වන තොරතුරු පිළිබඳ ව විමසිලිමත් ව ක්‍රියා කිරීම පිළිබඳ අත්දැකීම් ලබා දීමට අපේක්ෂිත ය.

නිපුණතා

★ විවිධ අවශ්‍යතා සඳහා එදිනෙදා හුවමාරු වන තොරතුරු පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
★ අතීතයේ දී තොරතුරු හුවමාරු කර ගත් ආකාරය පිළිබඳ ව සොයා බලා වාර්තා කරයි.
★ විද්‍යුත් මාධ්‍ය හා ඒවා භාවිතය පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ සන්නිවේදන සේවා කටයුතු සිදුවන ආකාරය විමර්ශනය කර වාර්තා කරයි.
★ කාලීන ගැටලු, සිදුවීම් සඳහා යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කරයි.
★ සන්නිවේදන කටයුතු සිදුවන ආකාර නිරූපණය කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ සති දෙකක පමණ කාලයක් තුළ ජාතික පුවත් පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි මාධ්‍ය ඔස්සේ ආගමික, ක්‍රීඩා, සෞඛ්‍ය, පාසල හා සම්බන්ධ ලෝකයේ සිදු වූ තොරතුරු කීපයක් රැස් කිරීමට සිසුන්ව යොමු කරන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න. රැස් කර ගත් තොරතුරු සිය කණ්ඩායම ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
- ඉදිරිපත් වූ තොරතුරු පිළිබඳ සාකච්ඡා කරමින් ඒවා විවිධ අයුරින් වර්ග කිරීමට කණ්ඩායම් මෙහෙය වන්න.

  උදාහරණ :- තොරතුරු ලැබුණු ප්‍රදේශ අනුව
  තොරතුරු ලැබුණු මාධ්‍ය අනුව
  තොරතුරුවල අන්තර්ගත කරුණු ස්වභාවය අනුව

  එසේ වර්ග කරන ලද තොරතුරු මුළු පන්තියට ඉදිරිපත් කිරීමට දිරි දෙන්න.
- ඒ අනුව ශ්‍රී ලංකාවේ හා ලෝකයේ විවිධ ප්‍රදේශවලින් හා විවිධ මාධ්‍යවලින් තොරතුරු ලැබෙන බව පහදා දෙන්න.
- එම පුවත් මගින් තමන්ට ඉගෙන ගත හැකි දේවල් හඳුනා ගැනීමට සලස්වන්න.

  උදාහරණ :- සෞඛ්‍ය පණිවුඩ
  ක්‍රීඩා ඇසුරින් සාමූහික උත්සාහය
  සාර ධර්ම

ක්‍රියාකාරකම 2

✠ රැස් කර ගත් තොරතුරුවලින් මාතෘකා කිහිපයක් යොදා ගෙන කරුණු ගොනු කර පන්තියේ/ශිෂ්‍ය සමිතියේ කතා පැවැත්වීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉහතින් ලබා ගත් තොරතුරු අප වෙත ලබා දුන් මාධ්‍ය ගැන දැනුවත් වීමට අවස්ථාව ලබා දෙන්න.
- තමාට කිසියම් තොරතුරක් ඇස මගින් හෝ කණ මගින් හෝ ඇස හා කණ දෙකම මගින් ලබා ගත හැකි යයි පවසා ඉහතින් ගොනු කළ තොරතුරු ලබා ගත් මාධ්‍ය ගැන අවබෝධයක් ලබා ගැනීමට යොමු කරන්න.




Copyright © 2007 National Institute of Education - Sri Lanka.


- කණ මුල් කර තොරතුරු ලබා දෙන මාධ්‍ය නම් කිරීම.
  උදාහරණ :-



දුරකථනය




ගුවන් විදුලි යන්ත්‍රය




ශබ්ද වාහිනිය


- ඇස මුල් කර තොරතුරු ලබා දෙන මාධ්‍ය නම් කිරීම.
  උදාහරණ :-



පුවත්පත්




පෝස්ටර්




පරිගණකය

- ඇස හා කණ මගින් තොරතුරු ලබා දෙන මාධ්‍ය නම් කිරීම.
  උදාහරණ :-



රූපවාහිනිය



වේදිකාව

ක්‍රියාකාරකම 3

✠ රූපවාහිනිය හා ගුවන් විදුලි යන්ත්‍රය ඔස්සේ සජීවී හෝ තැටිගත/පටිගත කරන ලද ප්‍රවෘත්ති ප්‍රකාශයක් හෝ පන්ති කාමරය තුළ දී නැරඹීමට හා ශ්‍රවනය කිරීමට ඉඩ ලබා දෙන්න.

- එමගින් ඉදිරිපත් වූ සිද්ධීන්ට අදාළ තොරතුරු හා ලබා දෙන ලද පණිවුඩ පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- තැපැල් කන්තෝරුවක් නැරඹීමට හෝ වෙනත් රටට තොරතුරු සපයන/සේවා සපයන ස්ථානයක් හෝ නැරඹීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.
- එහි දී සිදුවන කාර්යයන් පහත දී ඇති කරුණු ඔස්සේ නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
- නිරීක්ෂණයෙන් හඳුනා ගත් තැපැල් හලක ක්‍රියාවලිය පන්තියේ නිරූපණය කිරීමට යොමු කරන්න.
- තැපැල් හලක් පන්තියේ පැවැත්වීමට යෝජනා කර වැඩ බෙදා දෙන්න.
  - තැපැල් ස්ථානාධිපති පත් කර ගැනීම.
  - දුරකථන ඇමතුම් ලබා ගැනීම හා දීම.
  - මුද්දර කවර හා පෝස්කාඩ් සකස් කර තැබීම.
  - මුද්දර සකසා තැබීම. (මේ සඳහා පරණ මුද්දර යොදා ගත හැකි ය)
  - ලිපි තැපැල් කිරීම.
  - තැපැල් පෙට්ටියක් තැනීම.
  - ලියුම් මලු සැකසීම.
  - ලියුම් බෙදීම.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- ආදී ක්‍රියා සිදු කිරීම මගින් අත්දැකීම් ලැබීමට සලස්වන්න.
- මාධ්‍ය සම්බන්ධ වෙනත් ස්ථානයකට යාමට හැකි වේ නම් එහි වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය හා වැඩ කොටස් බෙදා ඇති ආකාරය පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කරන්න.

ක්‍රියාකාරකම 4

✠ කැසට් පටයකට පටිගත කිරීම ඉලක්ක කර ගෙන වැඩසටහනක් සකස් කර ගන්න. මෙම පටියට පහත සඳහන් දේ ඇතුළත් කළ හැකි ය.
  - ප්‍රවෘත්ති
  - ගායන හා වාදන
  - සෞඛ්‍ය පණිවිඩ
  - විශේෂ දැන්වීම්
  - නාට්‍යමය දෙබස්

FM මයික් එකක් යොදා ගෙන එම වැඩ සටහන් පටිගත කර ගැනීම වඩාත් යෝග්‍ය ය. පටිගත කර ගත් එවැනි වැඩ සටහන් ශ්‍රවණයට අවස්ථාව දෙන්න. මෙහි දී කැසට් රෙකෝඩරය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්දැකීම් ලැබීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 2.15 අපේ අතීත විත්ති

තුන්වන ශ්‍රේණියේ දී අපේ අතීත විත්ති මාතෘකාව යටතේ සිසුන් තමාගේ පාසලේ අතීතය පිළිබඳ තොරතුරු හදාරන ලදී. එහි දී විවිධ ක්‍රමවේද භාවිත කරමින් පාසලේ අතීතය ගැන හදාරා ඉන් ලබා ගත හැකි ආදර්ශ හඳුනා ගැනීමට සිසුන් යොමු කරන ලදී. හතරවන ශ්‍රේණියේ දී පාසලෙන් බැහැරට ගොස් තම ප්‍රදේශයේ ඓතිහාසික ස්ථාන, රටේ අතීතයේ සිටි වැදගත් රජවරුන්, වැදගත් ඓතිහාසික ස්ථාන කිහිපයක් හඳුනා ගැනීමට සිසුන් යොමු කිරීම අපේක්ෂා කෙරේ. අනෙක් තේමාවන්හි දී මෙන් ම මෙම තේමාවේ දීත් තොරතුරු එකතු කිරීමට පමණක් සීමා නොවී පහත ඉදිරිපත් කර ඇති හැකියා වැඩි දියුණු කිරීම මුල් කර ගෙන ඉගෙනුම් ක්‍රියාවලිය සංවිධානය කිරීම අවශ්‍ය ය.

නිපුණතා

★ තම ප්‍රදේශයේ හෝ පළාතේ ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන/පුද්ගලයන්/කලා කෘති පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
★ ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා ස්ථාන නිරීක්ෂණය කිරීමෙන් හා පුද්ගලයන් සමඟ කතා බහ කිරීමේ අත්දැකීම් වාර්තා කරයි.
★ පළාතේ ඇති ඓතිහාසික උරුමයන් අභිමානයෙන් යුතු ව අගය කරයි.
★ පළාතේ ඇති ඓතිහාසික උරුමයන් රැක ගැනීමට තුඩු දෙන නිර්මාණ ඉදිරිපත් කරයි.
★ පළාතේ ඇති ඓතිහාසික වටිනාකමක් ඇති ජන කවි, ජන ගී, ගායන, රංගන හා කතන්දර ඉදිරිපත් කරයි.
★ තම පළාතේ අතීතයේ සිට පැවත එන ජන ක්‍රීඩාවල සාමූහික ව නිරත වෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ තමාගේ ප්‍රදේශයේ ඇති වැදගත් ඓතිහාසික ස්ථාන හඳුනා ගෙන අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- ගුරුවරයාගේ පූර්ව සූදානමක් ඇති කර ගැනීම අවශ්‍ය ය. එහි දී අධ්‍යයනයට ලක් කළ යුතු ඓතිහාසික ස්ථාන හඳුනා ගෙන එහි ඇති ඓතිහාසික වටිනාකම පිළිබඳ තොරතුරු එකතු කර ගැනීම අවශ්‍යය.

  සිසුන් සමඟ එම ස්ථානය නැරඹීමට යාම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කර ගන්න. මෙම චාරිකාවේ දී
  - ඓතිහාසික ස්ථානය පසුබිම් කර ගෙන ඇති කතා පුවත් හඳුනා ගැනීම
  - ඓතිහාසික කතා පුවත සනාථ කරන සාධක හඳුනා ගැනීම.
  - සාධක මත තීරණ ගැනීම යන අදහස් සිසුන්ට අවබෝධ වන ආකාරයට කතා පුවත හා බැඳුණු සාධක කිහිපයක් හඳුනා ගැනීම ප්‍රමාණවත් වේ.

  තොරතුරු වාර්තා කිරීම, පින්තූර ඇඳීම, කෙටි සටහන් කීපයක් ලිවීම සහ ඡායාරූප එකතු කිරීම වැනි ක්‍රම උපයෝගී කර ගෙන සොයා ගත් තොරතුරු වාර්තා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. තොරතුරු රැස් කිරීමේ දී අවශ්‍ය වේ නම් පළාතේ වැඩිහිටියන්ගේ සහාය ද ලබා ගන්න. ඉහත ක්‍රියාකාරකම සඳහා පහත දක්වා ඇති උදාහරණය අධ්‍යයනය කොට ඔබේ ම සැලැස්මක් මේ සඳහා භාවිත කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ :- ගාලු කොටුවෙහි ඇති ඓතිහාසික වැදගත්කම හඳුනා ගැනීම

| | | |
|---|---|---|
| ගුරුවරයාගේ පූර්ව සූදානම | : | ස්ථානයක් නැරඹීමට යන්නේ නම් ගමන් කරන ආකාරය, සිසුන්ගේ ආරක්ෂාව සලසන ආකාරය, ආහාර පාන ආදිය පින්තූර ඡායාරූප ආශ්‍රයෙන් පාඩම කරන්නේ නම් අවශ්‍ය ද්විතියික මූලාශ්‍ර සපයා ගැනීම ඓතිහාසික ස්ථානය නැරඹීමෙන් සිසුන් දැනුවත් කිරීමට අපේක්ෂා කරන දෑ තීරණය කර ගැනීම |
| ඓතිහාසික ස්ථානය නැරඹීමට යාම/පාඩම ගොඩ නැංවීම | : | ඉහත පියවරට අනුව පාඩම ගොඩ නැංවීම ඓතිහාසික කතා පුවත පෘතුගීසි ජාතිකයන් ශ්‍රී ලංකාවට පැමිණි පසු බලකොටුවක් වශයෙන් ගොඩ නැංවීම ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයන් ද එය බලකොටුවක් වශයෙන් ගොඩ නැංවූ බව හා යොදා ගත් බව හමු වී ඇති කාසි මුර කපොලු ආදිය කතා පුවත සනාථ කරන සාධක වශයෙන් පෙන්වා දීම |
| තොරතුරු වාර්තා කිරීම | | ගාලු කොටුව පිළිබඳ පින්තූර ඇඳීම චිත්‍ර ඇඳීම, ආකෘති සැකසීම ඡායාරූප රැස් කිරීම හා රැස් කර ගත් තොරතුරු ඇසුරින් කුඩා පොත් පිංචක් බැගින් සකස් කිරීම ඒවා ඇගයීමට ලක් කිරීම |

ක්‍රියාකාරකම 2

✠ සිසුන් කණ්ඩායම් කරන්න.

අපේ රටේ සිටි පැරණි රජෙක්/රැජිනක් පිළිබඳ තොරතුරු අධ්‍යයනයට සලස්වන්න.

අධ්‍යයනය කිරීම සඳහා යෝග්‍ය එක් රජ කෙනකු/රැජිනක ඔබට ඇති පහසුකම් ආශ්‍රයෙන් තෝරා ගන්න.

මෙහි දී තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි චරිතයක් තෝරා ගැනීම වඩාත් උචිතය. අවශ්‍ය පින්තූර හා වෙනත් සාධක ද මේ සඳහා එකතු කර ගත හැකි ය.

කතන්දරයක් ලෙස රජු/රැජින පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට යොමු කරන්න. පින්තූර හා එකතු කර ගත් සාධක මුල් කර කතාව ගොඩ නැංවීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරවන්න.

- ඔහු/ඇය ජීවත් වූ කාලය
- ඔහු/ඇය සම්බන්ධ ජනකතා
- ඔහු/ඇය කළ සේවාවන් පිළිබඳ තොරතුරු හා සේවා ඇගයීම
- එම රජුගේ/රැජිනගේ සේවාවන් තුළින් ලබා ගත හැකි ආදර්ශ

රැස් කළ තොරතුරු ඇසුරින් කණ්ඩායම් වශයෙන් කුඩා පොත් පිංචක් බැගින් සකස් කිරීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න. ඒවා ඇගයීමට ලක් කරන්න.

ක්‍රියාකාරකම 3

✠ ශ්‍රී ලංකාවේ අතීතයේ සිට ගායනා කරන ලද ජන කවි සහ ගීත කිහිපයක් හඳුනා ගැනීමට සලස්වන්න.

හඳුනා ගත් ජන කවි සහ ගීත සාමූහික ව ගැයීමට අවස්ථාව දෙන්න.

අවශ්‍ය වේ නම් සංගීත ගුරුවරයකුගේ හෝ පාසලේ වැඩිහිටි ශිෂ්‍යයකුගේ සහාය ලබා ගන්න.

උදාහරණ :-සත් සියක් කපු මල් රැගෙන මම
සත් සියක් සුදු කෙඳි රැගෙන මම
සත් සියක් කපු පිළි වියන මම
සත් සියක් දෙන පළ දිනේ //



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

සත් සියක් රත් මල් රැගෙන මම
සත් සියක් රත් හුය රැගෙන මම
සත් සියක් මල් දම් ගොතන මම
සත් සියක් ගෙල පළ දිතේ //
සත් සියක් මායා බෙලෙන් මම
සත් සියක් බන් ධන බෙලෙන් මම
සත් සියක් සක්වල සොයා මම
ගෙන් වූ කුමරුන් අද එතේ // (කුවේණි නාට්‍යයෙන්)
(පද මාලාව - හෙන්රි ජයසේන)

- එකතු කර ගන්නා ජන කවි ඇසුරින් පොත් පිංචක් සකස් කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න.
- තාලාත්මක ව ගායනා කළ හැකි කවි, ආදේශ භාණ්ඩ යොදා ගනිමින් වාදනයන් ද සහිත ව ගායනා කිරීමට යොමු කරන්න.

උදාහරණ :-

රබන් පද

ඊතණ පඳුරෙත් හාවො සිටින්නා
රත්තණ පඳුරෙත් හාවො සිටින්නා
රබන් නාදෙ දස දෙස පැතිරෙන්නා
පඳුරෙත් හාවො නොසිට දුවන්නා

තිත්ත කැකිරි ගෙඩි මාමට දීපන්
තෙලං කැකිරි ගෙඩි නැන්දට දීපන්
පුංචි රබානට ගින්දර දාපන්
ගහන රබන් පද හරියට ගහපන්

ලී කෙළි කවි

එක පඳුරින් ලී සයක් කපාගෙන
එක උස ඇති සදෙනෙක් තෝරාගෙන
ගුරුන් අතට දී ලී බෙදවා ගෙන
අපිත් කෙළිමු ලී දෙපිල බෙදී ගෙන

පැරණි රජෙකුගේ හෝ රැජිනකගේ හෝ කතා පුවතක් ඇසුරින් නිමවුන නාට්‍යයක් රඟ දැක්වීමට සිසුන්ට අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

ක්‍රියාකාරකම 4

✠ අතීතයේ පැවති කලා ශිල්ප කීපයක් හඳුනා ගැනීමට සලස්වන්න.

උදාහරණ :-

සඳකඩ පහන - (ඡායාරූප නැරඹීම මගින් විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම) හැකිනම් සඳකඩ පහනක් නැරඹීමට සිසුන් රැගෙන යන්න.

චිත්‍ර - සීගිරි බිතු සිතුවම්

ඔබ ප්‍රදේශයේ තිබෙන මෙවැනි කලා ශිල්ප කෙරෙහි අවධානය යොමු කරන්න.

අතීතයේ සිට පැවතෙන මෙම කලා කෘති ඇගයීමට ලක් කරන්න.

- තම වැඩිහිටියන්ගෙන් කතන්දර අසා ගෙන ඒමට කියන්න. ඒවා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 5

✠ අතීතයේ සිට ඔබ පළාතේ යොදා ගන්නා ජන ක්‍රීඩා මොනවා දැයි විමසන්න. විශේෂයෙන් ම භාවිතයෙන් ඇත් ව තිබෙන ජන ක්‍රීඩා මතු කර ගන්න. එම ක්‍රීඩාවලට ප්‍රමුඛත්වය දෙමින් කණ්ඩායම් වශයෙන් හෝ සාමූහික ව හෝ ක්‍රීඩා කිහිපයක නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.

උදාහරණ :- වක්ගුඩු පැනීමේ ක්‍රීඩාව

- ජන ක්‍රීඩාවල දක්නට ලැබෙන ලක්ෂණ ඒවායේ වැදගත්කම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 2.16 අපේ යහපැවැත්ම

ශාරීරික හා මානසික යහපැවැත්මෙන් හෙබි, අධ්‍යාත්මික පහන් බවින් යුත් පුද්ගලයන් බහුතරයක් සිටින ශ්‍රී ලංකාවක සාමූහික ඵලය අති උත්කෘෂ්ට වන බවට සැකයක් නැත. අද අප අත් විඳින පීඩාකාරී සමාජය වෙනස් කිරීමට පත්තරයක් ඇති, පෙර කී පුරවැසියන්ගේ ශාරීරික, මානසික හා අධ්‍යාත්මික පදනම ශක්තිමක් කිරීම අරමුණින් මෙම තේමාව සැලසුම් කර ඇත. මෙම තේමාවේ දී සිසුන් ශාරීරික ව ද, අධ්‍යාත්මික ව ද වින්දනාත්මක අත්දැකීම් ලබනු ඇතැයි අපේක්ෂිත ය. එමෙන් ම සාමාජීය ලෙස සාමූහිකත්වයේ අගය පිළිබඳ මූලික සංකල්ප ඇති කිරීම ද අපේක්ෂා කෙරේ.

නිපුණතා

★ පවුලේ යහපැවැත්ම කෙරෙහි ක්‍රියාශීලී ව දායක වෙයි.
★ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා උචිත ක්‍රමවේද භාවිත කරයි.
★ පොදු ස්ථාන හා පොදු කාර්යයන්හි දී නිවැරදි චර්යා ප්‍රදර්ශනය කරයි.
★ සහයෝගී ක්‍රීඩාවල නිරත වෙමින් ජය හෝ පරාජය හෝ සාමූහික ව විඳ දරා ගනියි.
★ සාමූහික ව විවිධ නිර්මාණවල යෙදෙයි.
★ සාමූහික ව කටයුතු කිරීමේ අගය දැක්වෙන කවි, ගී, ගායන, රංගන ඉදිරිපත් කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

✠ සිසුන් පාසලට පැමිණෙන නිවස සහ එහි කටයුතු ද නිවැසියන් එකිනෙකාගේ වගකීම් ද පිළිබඳ සිතා බැලීමට යොමු කරන්න. නිවැසියන් එක් ව නිවසක ජීවත් වන විට යහපත් පරිසරයක් සඳහා එකිනෙකා ඉටු කරන වගකීම් පිළිබඳ ව අවධානය යොමු කරවන්න.
(මෙහි දී ඔබේ පවුලේ මව, පියා ආදී වශයෙන් කතා නොකර තමා පාසලට පැමිණෙන නිවසේ සිටින අය හා ඒ ඒ අයගේ වගකීම් හා කටයුතු ලෙස කිසිවකුටත් වේදනාකාරී නොවන අයුරින් සාකච්ඡාව මෙහෙය වන්න)
නිවසේ සිටින අය නිවසේ කටයුතු වෙනුවෙන් කරන දෑ මෙන් ම, සිසුන් සිය නිවසේ වඩා යහපත් පරිසරයක් සඳහා කරනු ලබන කටයුතු ද සිතා බැලීමට යොමු කරන්න.
වඩාත් යහපත් පරිසරයක් සඳහා නිවසේ වෙසෙන එකිනෙකා කරන කටයුතු ඇතුළත් වන ලෙස චිත්‍රයක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.
තුන්දෙනා/සිව්දෙනා බැගින් වූ කණ්ඩායම්වලට එක් වී සිය චිත්‍රය විස්තර කිරීමට ඉඩ සලසන්න.
නිවසේ කටයුතු කෙරෙහි චිත්‍රය අඳින ලද සිසුවාගේ දායකත්වය පිළිබඳ වැඩිදුර අසා දැන ගැනීමට කණ්ඩායමේ අනෙක් අය යොමු කරන්න.
කණ්ඩායම්වල කතා බහ අවසානයේ පන්තියේ සියලු ම සිසුන් සමඟ කතා බහක යෙදෙන්න. තමා ජීවත් වන නිවසේ වෙසෙන අයගේ යහපත වෙනුවෙන් සිසුන් දැනට කරන දායකත්වය විමසා සිටින්න.
කණ්ඩායම් ක්‍රියාකාරකමේ දී දැන ගත් කරුණු අනුව සිසුන්ගේ ක්‍රියාශීලී දායකත්වය පිළිබඳ ව අදහස් දැක්වීමට ඉඩ දෙන්න. තමන් ජීවත් වන නිවසේ නිවැසි සියලු දෙනා වෙනුවෙන් දැනට නොදක්වන තව දුරටත් දැක්විය හැකි දායකත්වය ගැන සිතා බැලීමට යොමු කරමින් පොදු සාකච්ඡාව අවසාන කරන්න.
අඳින ලද චිත්‍රයේ සිසුන්ගේ දායකත්වය දැක්වෙන වැකියක් ලියා අලවා ප්‍රදර්ශනය කිරීමට යොමු වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2


✠ අධ්‍යාත්මික යහපැවැත්ම සඳහා පුරුදු පුහුණු කළ යුතු සූර්ය නමස්කාරය ක්‍රියාකාරකම් පුරුදු පුහුණු වීමට අවස්ථාව සලස්වන්න. (සෞඛ්‍යමත් ජීවිතයක් සඳහා අවශ්‍ය වන ශාරීරික යෝග්‍යතාව ද මානසික යෝග්‍යතාව ද සපුරා ලන සරල යෝග්‍ය අභ්‍යාස මාලාවක් සූර්ය නමස්කාර ක්‍රියාකාරකම්වලට ඇතුළත් ය. සූර්ය නමස්කාර ක්‍රියාකාරකම්වලට හුරු වී එය දෛනික අභ්‍යාසයක් ලෙස හුරු පුරුදු වීමෙන් ඇති වන ශාරීරික හා මානසික යෝග්‍යතාව අධ්‍යාත්මික යහපැවැත්මට හේතු වේ.)

ක්‍රියාකාරකම් අවසානයේ දී මෙම අභ්‍යාස ගෙදර දී ද පුරුදු පුහුණු වීමට යොමු කරන්න.

කායික හා මානසික යෝග්‍යතාව සඳහා තේමාව ක්‍රියාත්මක වන කාලයේ සෑම දිනක ම සූර්ය නමස්කාරයේ අභ්‍යාසය පුරුදු පුහුණු වීමට ඉඩ දෙන්න.

තේමාව අවසන් වූ පසුව ද සෑම සතියක ම විෂය සමගාමී ක්‍රියාකාරකම් මිනිත්තු 30ක කාලය ආරම්භ කිරීමේ දී සූර්ය නමස්කාරය අරඹන්න.

නිවාඩු කාලයේ දී ද ඉදිරි ජීවිතයේ දී ද ශාරීරික හා අධ්‍යාත්මික යෝග්‍යතාව සඳහා දිනපතා කළ යුතු සරල ක්‍රියාකාරකමක් ලෙස සූර්ය නමස්කාරය සිසුන්ට දායාද කරන්න.




Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 3

✠ සිත් පහන් කිරීමේ පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිසුන්ට ඉදිරිපත් කරන්න.

තේමාව ක්‍රියාත්මක කරන සෑම දිනක දී ම සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකම්වලින් අරඹන්න. මෙය නිවසේ දී පුරුදු පුහුණු වීමට යොමු කරන්න.

අධ්‍යාත්මික යෝග්‍යතාවය සඳහා දිනපතා ජීවිතයට හුරු කර ගත යුතු ක්‍රියාකාරකමක් ලෙස සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකම් සිසුන්ට දායාද කරන්න.

පියවර 1

ශාරීරික ලිහිල් බව

පහසු ආකාරයකට ඉඳ ගන්න. ඇස් වසා ගන්න. හෙමින් හෙමින් අත් පා තද නොකර සැහැල්ලු කර ගන්න. පාදවල ඇඟිලි, වළලුකර, දණහිස, උකුල, බඩ, පපුව උරහිස, අත්, අත් ඇඟිලි, සැහැල්ලු කර ගන්න, බෙල්ල, හිස ප්‍රදේශය සැහැල්ලු කර ගන්න. හුස්ම ඉහළට ගන්න, පහළට ගන්න.

පියවර 2

මානසික ලිහිල් බව

සිසුන් අමතා මෙසේ කියන්න.

ඔබේ ඇඟ දැන් ලිහිල් බවට පත් වෙලා. දැන් සිත ද ලිහිල් බවට පත් කරමු. වටපිටාවේ ඇසෙන ශබ්දවලට සවන් දෙමු. ඈතින් ඇසෙන ශබ්දවලට සවන් දෙමු. සමීප ව ඇසෙන ශබ්දවලට සවන් දෙමු. අපේ ම හද ගැස්මට සවන් දෙමු. අපේ හුස්ම ගැනීමට සවන් දෙමු. අපේ ම සිතට සවන් දෙමු. සිතුවිලි ලිහිල් කරමු. සිත වෙහෙස කරන සිතිවිලිවලින් ඈත් වෙමු. සිතිවිලි සුහද වේවා! සිත සන්සුන් වේවා ! සිත සැනසේවා !

පියවර 3

අධිෂ්ඨානය

සිසුන් අමතා මෙසේ කියන්න. මෙසේ සිතන්නට යෝජනා කරන්න.

මගේ සිත සන්සුන් කරන්නට මට හැකි වෙනවාමයි. මගේ සිතේ සැනසීම අනෙක් අයට දැනෙන විදියට මම හැසිරෙනවාමයි. මගේ පන්තියට, පාසල, නිවසට මම ආලෝකයක් වෙනවාමයි. මම ගුරුතුමාගේ උපදෙස්වලට අනුව හැසිරී ඉගෙනීමේ කටයුතුවලින් ජයක් ලබනවාමයි. මම අපේ පවුලේ අයට, නිවසට ගුණ ගරුක හොඳ දරුවෙක් වෙනවාමයි. මම රටට දැයට වැඩදායි කෙනකු වෙනවාමයි.

පියවර 4

ප්‍රාර්ථනාව

මගේ සිතේ නිවීමේ ලැබෙන සැනසිල්ල මගේ යහළුවන්ට දැනේවා!

මගේ පවුලේ හැමට ම දැනේවා. පාසලේ හැමට ම දැනේවා. කුඩා පන්තිවල නංගිලා මල්ලිලාට දැනේවා. සතුන්ට, ගස්වැල්වලට, හැම දෙනකුට ම දැනේවා. සැමගේ ම සිත් නිවේවා. සැනසේවා.

පියවර 5

උදානය

පන්තියේ යහළු යෙහෙළියන්ට මගේ සිතට දැනෙන සැනසීම බෙදා දෙන්නට දැන් මට පුළුවන. මගේ ආදරය යහළුවන්ට, යෙහෙළියන්ට බෙදා දෙන්නටත් මට පුළුවන. මගේ පන්තියට පාසලට මම පහනක් වන්නෙමි. මම මගේ පවුලේ අයට මිණිපහනක් වන්නෙමි. මම පහනක් වගේ ලෝකයට එළිය දෙන්නම්.

දැන් ක්‍රියාකාරකම මෙසේ අවසාන කරන්න.

දැන් පහන් වූ සිතින් යුතුව වැඩ කරන්නට ඔබ කිහිප විටක් හුස්ම ඉහළට/පහළට ගන්න. සිත තැන්පත් කර ගෙන මිනිත්තු දෙකක පමණ කාලයක් ගත කරන්නට සිසුන්ට ඉඩ දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 4

සහයෝගී ක්‍රීඩාවල නිරත වීමට සිසුන්ට අවස්ථා සලස්වන්න.

උදාහරණ 1 :

හය දෙනා බැගින් සිසුන් කාණ්ඩ කරන්න. කණ්ඩායමේ තීරණය පරිදි සැවොම කැමති යන්ත්‍රයක ක්‍රියාකාරිත්වය නිරූපණය කළ යුතු ය. යන්ත්‍රය සැලසුම් කිරීම සඳහා මිනිත්තු 10ක කාලයක් දෙන්න. අනතුරු ව කාණ්ඩයම් ලවා ක්‍රියාකාරකම ඉදිරිපත් කරන්න.

කණ්ඩායම් ඉදිරිපත් කරන යන්ත්‍ර ක්‍රියාකාරිත්වය අනුව :

සෑම සාමාජිකයෙක් ම ක්‍රියාශීලීවීම

යන්ත්‍ර කොටස් ලෙස ක්‍රියාකරන අය අතර මනා සම්බන්ධය

ක්‍රියාත්මක වීමේ ආකර්ශනීය බව

වැනි කරුණු මතුවන සේ ක්‍රියාකාරකම අවසානයේ සාකච්ඡාවක් මෙහෙයවන්න. ඒ ඇසුරෙන් වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් වූ මිනිස් යන්ත්‍රය කුමක් දැ යි සිසුන්ගෙන් විමසන්න. එවැනි කණ්ඩායමක සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත්ම අගය කරන්න. අනෙකුත් කණ්ඩායම්වලට ද තම යන්ත්‍රය වඩාත් සාර්ථක කර ගැනීමට කළ යුතු වෙනස්කම් පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න.වඩාත් සාර්ථක ලෙස තම යන්ත්‍රය නිරූපණය කිරීමට නැවතත් එම කණ්ඩායම්වලට අවස්ථා ලබා දෙන්න.

උදාහරණ 2:

පන්තිය - අට දෙනකුගෙන් පමණ සැදුම්ලත් කණ්ඩායම් අනුව බෝල රිලේ ක්‍රීඩාවේ යෙදවීම ආරම්භක රේඛාවේ සිට අවසාන රේඛාව දක්වා බෝලය බිම දිගේ යවා ආපසු ආරම්භක රේඛාවට ඒ අයුරින් ම බෝලය ගෙන ආ යුතු ය. එවිට ඊළඟ සාමාජිකයා ආරම්භ කරයි. ඉක්මනින් බෝලය බිම දිගේ යනා ප්‍රථමයෙන් අවසාන කරන කණ්ඩායම ජය ගනියි.

සහයෝගී ක්‍රීඩා අවසානයේ කතා බහ තුළින් පහත දැක්වෙන කරුණු අවධාරණය කරන්න.

ජයග්‍රහණය සඳහා කණ්ඩායමක සෑම අයකුගේ ම කැපවීම අවශ්‍ය ය.

කණ්ඩායමක සාර්ථක නායකත්වය සෑම දෙනකුගේ ම සහයෝගය දිනා ගනියි.

කණ්ඩායමක් ලෙස ලබන ජය සෑම සාමාජිකයකුට ම සමාන ලෙස අයත් වේ.

කණ්ඩායමක් ලෙස පරාජය වූ විට එකිනෙකාට චෝදනා කිරීම නොකළ යුතු ය. පරාජය වීමේ වගකීම සැවොම සමාන ව බෙදා ගත යුතු ය.

ක්‍රියාකාරකම 5

✠ සිව් දෙනා බැගින් යුතු කණ්ඩායම් එක් ව එක ම චිත්‍රයක්/ආකෘතියක් හෝ කැමති ඕනෑම යමක් නිර්මාණය කිරීම ගැන කතා බහක යෙදෙන්නට අවස්ථාව දෙන්න. තමන්ගේ කණ්ඩයමේ තීරණය පරිදි අවශ්‍ය දෑ ගෙන ඒමේ වගකීම් බෙදා ගැනීමට යොමු කරන්න. ඒවා සපයා ගෙන පසුදින සාමූහික නිර්මාණයට යොමු කරන්න.

එකිනෙකාගේ අදහස්වලට ගරු කරමින් සාමූහික නිර්මාණයේ නිමාව දක්වා යෙදීම අගය කරන්න. අවසානයේ සාමූහික නිර්මාණ ප්‍රදර්ශනයක් පවත්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 6

✠ සාමූහික ව කටයුතු කිරීමේ අගය දැක්වෙන කවි, ගී, රංගනවල යෙදීමට සිසුන් දිරිමත් කරන්න.

උදාහරණ :

අපි ඔක්කොම රජවරු - ඔක්කොම වැසියෝ
තුන් සිංහලයම නෑදැයෝ
අපි ඔක්කොම පියවරු - ඔක්කොම මව්වරු
තුන් සිංහලයම දූ දරුවෝ //
ජය දද බන්දා - සිරි දුව කැන්දා //
රුපු සෙන් ඔද තෙද බින්දා
හද අරවින්දා - කර සිරිනන්දා
පර ගැති සිත ගත බින්දා //
සිත මල් පිපුණා - හස රැල් නැගුණා
හද සෝ ගිනි දැල් නිවුණා
නෙතු කැන් දිලුණා - හද මල් පිපුණා
ජය මංගල ගී ගැයුණා (පද මාලාව - සුනිල් ආරියරත්න)
(ගායනය - වික්ටර් රත්නායක)

ලොවේ සැමා - එකම දැයේ
දූ දරුවන් වේවා
වාද නැති භේද නැති
ලස්සන ලොව හෙට අපට උදා වේවා
මනුෂ කම් අහක දමා
ජාති වාදයෙන් උදම් අනා
සතුරු කමින් පිල් බෙදිලා
මිනිසා මුලා වෙලා
මනු දැයේ - මිනිසුනේ
වාද වීලා එල නැතේ
එක රැනේ එක් වූ දා
ලොව ලස්සන වන්නේ
වැටුණු කෙනෙකු හට නැගී සිටින්නට
අත දෙන්නට පැකි ලෙන්න එපා
ඔහුගේ රට ජාතිය ආගම කුල ගොත ගැන සොයන්නෙපා
සාමයේ ගීතිකා පතුරාලා මුළු ලෝ තලේ
එක යායේ වාස වෙමු
සැමදා එකට බැඳී
වාදම් ඉල්ලෙයි - බේදම් ඉල්ලෙයි
අලගිය උලහම් - නාලෙයි මලර්හිරදු
ෆෝ යුනිටි ඇන්ඩ් ෆිස් ඇන්ඩ් හාමොනි වේ වී ලිව්
ටුමෝරෝ ටු ගෙදර් ඇස් වන්
(ගායනය - ජිප්සීස් සමූහ ගීතයක්)
(පදමාලාව - ආනන්ද පත්මසිරි, හේමසිරි හල්පිට)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 7

✠ පන්තියේ සෑම සිසුවකු/සිසුවියක සඳහා ම ඇගයුම් පතක් නිර්මාණය කිරීමට මග පෙන්වන්න. ඇගයුම් පත සඳහා $A_4$ ප්‍රමාණයේ කාඩ්පතක් දෙකට නමා පොතක් මෙන් සකස් කර ත හැකි ය. සෑම ඇගයුම් පතකම මුල් පිටුවේ තමා කැමති ම නමේ කොටස සහ සුදුසු චිත්‍රයක් සැරසිල්ලක් යොදා ගත හැකි ය.

පන්තියේ සිසුන් එළිමහන් ස්ථානයක කවාකාර ව ඉඳ ගැනීමට සලස්වා ඇගයුම් පත් රවුමේ යැවීමට ඉඩ හරින්න. තමන් වෙත ලැබෙන අන් අයගේ ඇගයුම් පත්වල අනිවාර්යයෙන් ම අගය කිරීමේ අදහසක් ලිවිය යුතු වේ.

උදාහරණ :

ඔබ ගී ගයන විට අහන්නට ආසයි
ඔබේ චිත්‍ර හරි ලස්සනයි
ඔබ හැම විට ම අනුන්ට උදවු වෙන කෙනෙක්
ඔබේ ඇඳුම් හරි ම පිරිසිදුයි

මෙසේ සෑම අයෙක් අතට ම පත් වි කවයේ වටයක් යන අගය කිරීමේ කාඩ්පත් අවසානයේ එය හිමි සිසුවා අතට පත් වෙයි. එය කියවා බලා තමන්ගේ යහගුණ/යහපැවතුම් හා දක්ෂතා ගැන තම මිතුරු මිතුරියන් දක්වා ඇති අදහස් ගැන සතුටු සිත් ඇති ව සිහිවටනයක් සේ තබා ගැනීමට සිසුන් යොමු කරන්න. එසේ ම අන් අය තම ගැන ලියූ අගය කිරීමේ වැකිවලින් තමා වඩාත්ම කැමති වැකිය කොටු කර දැක්වීමට යොමු කරන්න. ලෑල්ලේ කඩදාසියක් සවි කර එසේ කොටු කරන ලද එක් එක් අගය කිරීමේ වැකි එහි ලියන්න. සියලු දෙනාගේ ම අගය වැකි එක් වූ පසු මේ අපේ පන්තියේ ශක්තියයි. යනුවේ මාතෘකා පාඨයක් ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න. ඒ ගුණ හැකියා දක්ෂතා එක්කර කටයුතු කිරීමට අවධානය කරවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරු පත්‍රිකාව - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව - හතරවන ශ්‍රේණිය

තක්සේරු කිරීමේ පරිමාණය

සාර්ථක ව කරයි ✓
දුෂ්කරතා පෙන්නුම් කරයි/
තව දුරටත් උදවු අවශ්‍යයි •

සිසුන්ගේ නම්

| අංකය | ඉගෙනුම් ඵලය | මාතෘකාව |
|---|---|---|
| 1. | විවිධ පරිසරවල වැඩෙන මල් පිපෙන ගස්වැල් නම් කරයි. | පැළැටි හා ගස්වැල් |
| 2. | මලක ප්‍රධාන කොටස් නම් කරයි. | |
| 3. | මල්වලින් හා පත්‍රවලින් ලබා ගන්නා ප්‍රයෝජන කීපයක් ප්‍රකාශ කරයි. | |
| 4. | මල් හා පත්‍ර කල් තබා ගන්නා ක්‍රම අත්හදා බලයි. | |
| 5. | ආසන්න පරිසරයේ වෙසෙන සතුන් පිළිබඳ ව තොරතුරු රැස් කර වාර්තා කරයි. | අප අවට සතුන් |
| 6. | සතුන්ට ඇති විශේෂ හැකියා කිහිපයක් ප්‍රකාශ කරයි. | |
| 7. | සතුන්ගෙන් ඇති විය හැකි රෝග මොනවා දැයි ප්‍රකාශ කර රෝගවලින් ආරක්ෂා වීමට ගත හැකි පියවර විස්තර කරයි. | |
| 8. | පොත් පත් ඇඳුම් පිරිසිදු ව හා ආරක්ෂා සහිත ව පරිහරණය කරයි. | අප පරිහරණය කරන දේ |
| 9. | නිරීක්ෂණය කරන ලද රැකියා ස්ථානවල නියුතුවන්නන් විසින් භාවිත කරන උපකරණ කිහිපයක් නම් කරයි. | |
| 10. | පන්ති කාමරයේ එදිනෙදා පරිහරණය කරන උපකරණ නිවැරදි ව පරිහරණය කරයි. | |
| 11. | ආහාර වේලක අඩංගු පෝෂක කොටස් නම් කර මිශ්‍ර ආහාර වේලක් ගැනීමේ වැදගත්කම විස්තර කරයි. | අපේ ආහාර |
| 12. | අපිරිසිදු ආහාර ගැනීම නිසා ඇති වන රෝග හඳුනා ගෙන නම් කරයි. | |
| 13. | අපිරිසිදු ආහාර ගැනීමෙන් වැළකී සිටීම කළ යුතු දේ ප්‍රකාශ කරයි. | |
| 14. | ශ්‍රී ලංකාව ස්වභාවික සෞන්දර්යයන්ගෙන් පිරි රටක් ලෙස අගය කිරීමට බලපෑ හේතු කිහිපයක් ඉදිරිපත් කරයි. | අපි ලක්වැසියෝ |
| 15. | ශ්‍රී ලාංකිකයන්ගේ ආගම් නම් කරයි. | |
| 16. | ශ්‍රී ලාංකිකයන්ගේ අනන්‍යතාව පිළිබිඹු වන ලක්ෂණ හඳුනා ගෙන නම් කරයි. | |
| 17. | ජාතික ගීය නිවැරදි ඉරියව්වෙන් සිට තාලානුකූල ව ගායනා කරයි. | |
| 18. | එදිනෙදා ජීවිතයේ දී අනතුරු ඇති විය හැකි අවස්ථා ප්‍රකාශ කරයි. | ආරක්ෂාව හා පරිස්සම |
| 19. | අනතුරුවලින් ආරක්ෂාවීම සඳහා කළ යුතු දේවල් විස්තර කරයි. | |
| 20. | විවිධ ද්‍රව්‍ය ජලය සමඟ ක්‍රියාකරන ආකාරය නිරීක්ෂණය කර තොරතුරු කිහිපයක් ප්‍රකාශ කරයි. | ජලය |
| 21. | අපිරිසිදු ජලය පිරිසිදු කර ගන්නා ක්‍රම ප්‍රකාශ කරයි. | |
| 22. | අපිරිසිදු ජලය පාවිච්චිය නිසා බෝවන රෝග නම් කරයි. | |
| 23. | පාසල අවට මංමාවත් පිළිබඳ තොරතුරු දැක්වෙන දළ සටහනක් ගොඩ නගයි. | ගමනාගමනය |
| 24. | මංමාවත් භාවිත කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා දැයි ප්‍රකාශ කරයි. | |
| 25. | පොදු වාහනවල ගමන් කිරීමේ දී මගීන් වශයෙන් කළ යුතු යුතුකම් කිහිපයක් ප්‍රකාශ කරයි. | |
| 26. | බෝගයක් සිටුවීමට ගෙවත්ත සකස් කළ යුතු ආකාරය පැහැදිලි කරයි. | ගෙවත්ත |
| 27. | බෝගයක වර්ධන අවස්ථා නිරීක්ෂණය කර වාර්තා කරයි. | |
| 28. | වැඩ පහසු කිරීමේ ක්‍රම කිහිපයක් ප්‍රකාශ කරයි. | වැඩ පහසු කිරීමේ මං |
| 29. | වැඩ පහසු කර ගත හැකි උපකරණයක් නිර්මාණය කරයි. | |
| 30. | සාමූහික ව වැඩ කිරීමේ වැදගත්කම පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි. | මිනිස් හැසිරීම් |
| 31. | අන් අයගේ ගරුත්වය ආරක්ෂා වන ලෙසින් ආචාරශීලී හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | |
| 32. | ස්වභාවික පරිසරයේ ඇති දෑ කිහිපයක් නම් කරයි. | පොළොව හා අහස |
| 33. | අහස නිරීක්ෂණය කර හඳුනා ගත් ලක්ෂණ ප්‍රකාශ කරයි. | |
| 34. | සුළඟින් ඇති ප්‍රයෝජන කිහිපයක් ප්‍රකාශ කරයි. | අපට කළ හැකි වෙනස්කම් |
| 35. | පරිසරයට හානි නොවන අයුරින් පවතින තත්ත්වයට වඩා සංවර්ධනාත්මක වෙනසක් කිරීමට දායක වෙයි. | |
| 36. | සමාජයේ එදිනෙදා පණිවිඩ ලැබෙන හා යවන ක්‍රම නම් කරයි. | මිනිසා හා තොරතුරු |
| 37. | අතීතයේ දී තොරතුරු හුවමාරු කර ගත් ආකාරය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි. | අපේ අතීත විත්ති |
| 38. | සේවා ස්ථානයක තොරතුරු හුවමාරු වන ආකාරය නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි. | |
| 39. | තම ප්‍රදේශයේ/පළාතේ ඓතිහාසික ස්ථානයක් පිළිබඳ ව තොරතුරු රැස් කර වාර්තා කරයි. | |
| 40. | පාසලේ පොදු කාර්යයන්හි දී උචිත චර්යා ප්‍රදර්ශනය කරමින් ක්‍රියාශීලී ව දායක වෙයි. | අපේ යහපැවැත්ම |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 3.0 ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

හැඳින්වීම

පළමුවන ප්‍රධාන අවධියේ දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීම පිළිබඳ ව සරල අත්දැකීම් ලබා ඇති සිසුන් තව දුරටත් ඒ ඔස්සේ යොමු කරමින් සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි භාෂාව යොදා ගන්නා ආකාරය පිළිබඳ අත්දැකීම් ලබා දීම දෙවන ප්‍රධාන අවධියෙහි දී ද අපේක්ෂා කෙරේ. පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී තනි වචන, වචන යුගල, විධාන, ආශීර්වාද, වාක්‍යාංශ හා ඉතා කෙටි වාක්‍ය භාවිතයට හුරු වූ ඔවුහු තුන්වන සහ හතරවන ශ්‍රේණිවල දී ඉංග්‍රීසි වාක්‍ය භාවිත කරන හා තේරුම් ගන්නා ආකාරය පිළිබඳ ව වැඩිදුරටත් හුරුවක් ලබති.

මෙම කාර්යය පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී කරන ලද ක්‍රියාකාරකම්වලට වඩා තරමක් සංකීර්ණ ක්‍රියාවලියක් බව පෙනී යයි. මේ අවධිය වන විට තුන්වන ශ්‍රේණියේ දී ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයකු පැමිණ ක්‍රමවත් ව ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට පටන් ගෙන ඇත.

තුන්වන ශ්‍රේණියේ පටන්, ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ, ඉංග්‍රීසි භාෂාව විෂය නිර්දේශයකට අනුව ඉගැන්වීමට සමගාමීව ය. මේ නිසා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩ සටහන සඳහා ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාගේ සහාය වඩාත් පුළුල් ව ලබා ගැනීමේ අවශ්‍යතාවක් පන්තිය භාර ගුරුවරයාට ඇති වනු ඇත. එනිසා ගුරුවරුන් දෙදෙනා අතර ඇති වන අන්‍යොන්‍ය අවබෝධය සහ සහයෝගය මත මෙම වැඩසටහනේ සාර්ථකත්වය රඳා පවතී.

තනි සරල වාක්‍ය වශයෙන් අසන්නට ලැබෙන ඉංග්‍රීසි තේරුම් ගැනීමටත්, ඒ ආකාරයට ම තම අදහස් සරල ඉංග්‍රීසි වාක්‍යවලින් ප්‍රකාශ කිරීමටත් හැකියාව සිසුන්ට ලබා දීම මෙම අවධියේ දී අපේක්ෂා කෙරේ.

මේ සඳහා අවස්ථා තුනක දී සිදු කරනු ලබන ක්‍රියාකාරකම් යොදා ගත යුතු වේ.

1. පන්තියට පැමිණෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා විසින් ඉංග්‍රීසි භාෂාව සඳහා වෙන් කොට ඇති කාල පරිච්ඡේදවල දී විෂය නිර්දේශයට අනුව ඉංග්‍රීසි භාෂාව උගන්වනු ලැබේ.

2. පළමුවන ප්‍රධාන අවධියේ දී මෙන් ම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ගණිත විෂයට අදාළ කාලය හා විවේකකාලය ප්‍රයෝජනයට ගනිමින් පන්තිය භාර ගුරුවරයා විසින් සිසුන්ට ඉංග්‍රීසි කතා කරන්නටත්, අසන්නටත් අවස්ථාව ලබා දෙයි.

3. මේ සියල්ලට ම අමතර ව සිසුන්, පන්තිය භාර ගුරුවරයා සහ ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා සහභාගී වෙමින් සතියකට වරක් පවත්වනු ලබන සංවාද වැඩසටහන තුන්වන ශ්‍රේණියේ දී හඳුන්වා දෙනු ලබන අලුත් අංගයකි.

- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් පාඩම ආශ්‍රයෙන් ගොඩ නඟා ගනු ලබන ක්‍රියාකාරකමක් මත සංවාදය පැවැත්වේ. සම්පූර්ණයෙන් ඉංග්‍රීසි භාෂාව භාවිත කරමින් ද, ක්‍රියාකාරකම් හා විනෝදජනක ක්‍රීඩා යොදා ගනිමින් ද මෙම අංගය ගොඩ නැගිය යුතු වේ. මේ සඳහා සතියකට වරක් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට අයත් කාල පරිච්ඡේදවලින් එකක් වෙන් කර ගත යුතු වේ.


- ඉහත සඳහන් සංවාද වැඩසටහන සඳහා තෝරා ගන්නා කාල පරිච්ඡේදය පන්තිය භාර ගුරුවරයාටත් ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාටත් එක විට සහභාගී විය හැකි එකක් විය යුතු ය. කාල සටහන් පිළියෙල කිරීමේ දී විදුහල්පතිවරයාගේ විශේෂ අවධානය මේ සඳහා යොමු විය යුතු ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

- මෙම වැඩ සටහනේ දී ලිවීම කියවීම පාඩම් කරවීම ආදිය නොකළ යුතු ය. ඒ වෙනුවට කිසියම් ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන් ශිෂ්‍යයන් හා ගුරුවරුන් දෙදෙනා අතර සරල සංවාද ගොඩ නැගිය යුතු ය. එක වාක්‍යයක් කිහිපවරක් පුනරුච්චාරණය කරවීම මගින් සිසුන්ගේ හැකියා තහවුරු කරවන පරිදි සංවාද සැලසුම් කිරීම ඉතා වැදගත් ය. මෙහි අන්තර්ගත වන වචන සහ වාක්‍ය ඛණ්ඩ සියල්ලක් ම භාවිත කිරීම අවශ්‍ය නොවේ. සුදුසු අවස්ථාවන්හි දී අදාළ වචන හා වාක්‍ය ඛණ්ඩ යොදා ගැනීමට නිදහස ඇත.

- මෙහි දී යොදා ගන්නා වාග්මාලාව, හතරවන ශ්‍රේණියේ සිසුන්ට තේරුම් ගත හැකි පරිදි හා කතා බහ කළ හැකි පරිදි සරල වචන තෝරා ගෙන සකස් කර ගත යුතු වේ. පළමුවන හා දෙවන ශ්‍රේණි ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල අඩංගු ඉංග්‍රීසි වාක්‍යාංශ, වාක්‍ය, විධාන, ඉල්ලීම් හා සුබ පැතුම් ආදිය මෙහි දී යොදා ගත හැකි ය. හඳුනාගත් ඉංග්‍රීසි වාක්‍ය රටාවක් පන්තියේ දී හා පන්තියෙන් පිටත දී නැවත නැවත භාවිත කිරීම සඳහා දිරි ගැන්වීම ගුරුවරුන් විසින් කළ යුතු ය.

- මෙබඳු ක්‍රියාකාරකමකට සහභාගී වීමට පෙර ඒ සඳහා හොඳින් සූදානම් වී සිටීම අවශ්‍ය වේ. විදුහල්පතිවරයාගෙන් ලැබෙන උපදෙස් අනුව, හතරවන ශ්‍රේණියේ පන්තිය භාර ගුරුවරයාත්, ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාත් එක් ව පෙර සූදානමෙහි නිරත විය යුතු බවට නිර්දේශ කෙරේ.




නිපුණතා

දෙවන ප්‍රධාන අවධියට පැමිණෙන ශිෂ්‍යයකු සඳහා ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන නිපුණතා සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- සරල වචන ඉංග්‍රීසි වගන්ති භාවිත කරමින් එදිනෙදා ජීවිතයේ සංනිවේදන කටයුතුවල නියැලෙයි.
- එදිනෙදා සංනිවේදන කටයුතුවල දී සරල ඉංග්‍රීසි වචන හා වගන්ති භාවිත කිරීමට කැමැත්තක් දක්වයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# ACTIVITY BASED ORAL ENGLISH
# AN EXAMPLE OF A VOCABULARY

## Objects in the classroom

chair, cupboard, desk, blackboard, chalk, bags, books, bottles, register, record book, table, table cloth duster, posters, eraser, pen, pencil, gum, glue, clay, pictures,calendar, ruler, lunch box

## Persons in the school

principal, teacher, monitor, captain, security guard, peon, vice princpal, group leader, watcher

## Common places inside the school

art-room, classroom, canteen, dental clinic, corridor, garden, well, gate, fence, tap, dancing-room, shrine room, library, office, toilet, playground, room, music-room, sickroom, staffroom

## Common places outside the school

home, house, market, dispensary, hospital, airport, post office, bus stop, shop, fair, bakery mosque, pharmacy, police station, railway station, temple

## Persons outside the school

brother, sister, father, aunt, doctor, driver, policeman, postman, priest, mother, grandfather, nurse, uncle, grandmother

## Names of toys

ball, bat, doll, building block, balloon, kite, whistle

## Common food items and drinks

bread, buns, cakes, beans, butter, cheese, ice cream, chocolate,dhal, hoppers, rice and curry beetroot, brinjal, potatoes, toffees, biscuits, cabbage, carrot, milk, tea, curd and treacle, string hoppers, fish

## Parts of body

eyes, ears, face, nose, arms, hands, legs, finger, feet, toes, thumb, mouth

## Fruits

mango, pineapple, plantain, papaw, wood apple, lemon, orange, grapes, apple

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## Vehicles

| |
|---|
| bus, bicycle, car, lorry, train, tractor, aeroplane,helicopter, ship, boat, motor cycle, van, cart, jet plane |

## Common animals and birds

| |
|---|
| dog, cat, cow, hen, elephant, horse, parrot, peacock, ant, spider, bee, goat, crow, pigeon, butterfly, mosquito, rabbit |

## Common flowers

| |
|---|
| rose, sunflower, shoe-flower, carnation |

## Colours

| |
|---|
| red, blue, white, green, yellow, pink, black, brown, orange, maroon, violet, purple, gold, silver |

## Numbers

| |
|---|
| one, two, three, four, five, six, seven, eight, nine, ten |

## Natural environment

| |
|---|
| sky, sun, moon, stars, clouds, rainbow, wind,rain, thunder, lightening, mist, river, water-falls, sea, beach, lake, tanks, trees, flowers, animals |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

| Theme No | Theme | Suggested Vocabulary |
|---|---|---|
| 01 | Plants Trees and Creepers | herbs, honey, coconut-oil, spices, decorate, caterpillar, shade, nest, drink, ants, red ants |
| 02 | Animals around us | animals, legs, spiders, smell, message, malaria, fly, blood, rat, sick |
| 03 | What we use | wood, glass, plastic, cloth, handkerchief(hanky), clean, dirty, shoes, bag, carpenter, broom, duster, flute |
| 04 | Our Food | balanced diet, fresh, clean, apron, kitchen, sweets, wash, hands, daily, plate, cook, eggs, hungry, thirsty |
| 05 | We are Sri Lankan | shape(of Sri Lanka), globe, place, North, South, East, West, Island, India, Maldives, Pakistan, Bhutan, Nepal |
| 06 | Safety and Protection | safe, dangerous, floods, thorns, earth slip, serpent(reptile), poison,stale food, vomit, swell, rash |
| 07 | Water | ice, hot water, warm water, cool water, temperature, salt, sugar, spoon, tea, |
| 08 | Transport | bridge, busstand, yellow line, crossing by road(s), railway line, hospital, school, temple, police, pavement |
| 09 | Home Garden | agriculture, vegetable bed(flower bed), insects, soil, sunny, grow, compost, fence, rain, sun, protect |
| 10 | Ways of making work easy | work, heavy, lift, bottle opener, stick, move, wheel, wheelbarrow, machine, magnet, pin, torch, batteries |
| 11 | Human Behavior | borrow, sweep, promise, queue, forget, problem, friend, friendly, draw, smile, help |
| 12 | Earth and Sky | map, beach, rivers, weeds, nature, cloud, birds, fly, cover, district, village, tracing paper |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

| | | |
|---|---|---|
| 13 | Changes we can make | plan, cobweb, clean, tidy, decide, leader, save, time, song, discussion |
| 14 | Man and Information | world, computer, post office, stamp, post box, envelop, post master, post master, stage, post card, news, message |
| 15 | Our Past | history, fort, coins, king, queen, game, temple, church, proud, important place |
| 16 | Our Good Behavior | wish, worship, beautiful, like, mind, relax, unity, group, leader, win, loose, listen |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## CLOSSROOM LANGUAGE

### Greetings and wishes
Good morning
Good afternoon
Good evening
Good bye
Good luck
All the best
Happy birthday
Happy New year
Merry Christmas

### Requests
May I come in/go out/go home?
May I go to the toilet/office/canteen?
Silence please
Listen to me please
Hurry up please
Be quiet
Be careful
Please do your home work
Please come to school every day
Tell your parents…
Go home straight
Don't shout please
Please try to be clean/be good
Please think about others

### Simple commands
Do me a favor please
Hands up/down,
Run, jump, start, stop,
clap your hands
look at me
form a line/circle
don't go out
Get ready
Come here
Go there (out)
Bring (your book)
show

Please give me a pencil/book/ruler
Please clean the blackboard
Please sit down
Please open your book
Please look at the picture
Please wipe your feet/nose

## Polite forms

Thank you
Please excuse me
I am sorry
Can I help you
Could you please/bring me the duster/ Some chalk
Please take this to the office/ to your parents
Be good to bring me the register
How are you?
Take care
Look after your self
Be careful
Can I see…?
Do you like..?
Please bring me…

## Praising

good
very good
well done
That's right
I like it
Good work
Excellent
Keep it up
Very well
You have done well
That's good work
Wonderful

## Simple answer forms

This is my…..
I have got a …/ I've got a …
It's….
I am going to the….
Here it is.

I am hungry.
I am thirsty.
I am reading a book.
I am drinking water.
I am coming to the class.
I am going out.
I am watering the plants.
I am closing my bag.

I want to watch a match.
I want to pluck flowers.
I want to sing.
I want to dance.
I want to play.
I will come tomorrow.
I will bring flowers.
I will sweep the classroom.
I will clean the blackboard.
I will walk slowly.
I can hear you.
I can come now.

## Simple question forms

Who is shouting?
What's this?
What's that?
What's it?
Are you ready?
Is this yours?
Is it a ………..?
What do you like?
Where are you going?
Where is the…?
What can you see in the…?

## Simple suggestions

Let's go home.
Let's go out.
Let's sing a song.
Let's go to the playground

Shall we get ready?
Shall we go to the playground?
Shall we start the game?
Shall we wash our hands?
Shall we sing a song?
Shall we pluck flowers?
Shall we stop now?

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

| | |
|---|---|
| number | Hundred |
| order | Thousand |
| ordering | Whole |
| number pattern | Half |
| add | Fraction |
| digit | Bill |
| two digits numbers | Angle |
| subtract | Direction |
| multiply | Solid |
| divide | Plane |
| balance | Spatial Patterns |
| time | Money |
| hour | Data |
| minutes | Front view |
| clock | Side view |
| date | Plan |
| day | Problem solving |
| month | Square |
| year | Triangle |
| ruler | Rectangle |
| length | Straight line |
| meter | Cube |
| weight | Cuboids |
| kilogram | Sphere |
| gram | Area |
| volume | Measurements |
| liter | Graph |
| milliliter | Picture graph |
| | Table |
| | Transaction |
| | Symmetry |
| | Axis |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# ඉංග්‍රීසි සංවාද වැඩසටහන

## හැඳින්වීම

තුන්වන හා හතරවන ශ්‍රේණිවල සිසුන් සඳහා අවස්ථා තුනක දී ඉංග්‍රීසි භාෂාව ඉදිරිපත් කෙරේ.

1. පළමුවන හා දෙවන ශ්‍රේණිවල දී මෙන් පන්ති භාර ගුරුවරයා විසින් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් පාඩම සමඟ වාචික ඉංග්‍රීසි භාවිත කිරීම.
2. මෙම ප්‍රධාන අවධියේ සිට ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයකු විසින් ඉංග්‍රීසි විධිමත් ව ඉගැන්වීම.
3. පන්තිය භාර ගුරුවරයා, ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා සහ සිසුන්ගේ සහභාගිත්වයෙන් කෙරෙන සංවාදාත්මක ඉංග්‍රීසි වැඩසටහන යනුවෙනි.

සතියකට වරක් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සඳහා වෙන් වූ වේලාවෙන් තෝරා ගත් කාල පරිච්ඡේදයක් සංවාදාත්මක වැඩසටහන යොදවා ගැනීමට යෝජනා කර තිබේ. මේ සඳහා විදුහල්පතිවරයාගේ සහයෝගය ද ලබා ගෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයාට මේ වැඩසටහන සඳහා සතියකට වරක් පන්තියට පැමිණීමට හැකි වන පරිදි කාල සටහන සකස් කර ගැනීම අපේක්ෂිත ය. සිසුන් සමඟ මිත්‍රශීලී ව කටයුතු කරමින් මේ කාලය තුළ ඔවුන්ගේ ඉංග්‍රීසි භාවිතය පිළිබඳ නිපුණතාව වැඩි දියුණු කිරීමට ගුරුවරුන් දෙදෙනා කටයුතු කරනු ඇතැ යි බලාපොරොත්තු වේ.

- ★ සිසුන් ඉංග්‍රීසි භාෂාව වාචික ව භාවිත කරන විට ඊට සවන් දීමටත්, තමන් ද එම භාෂාව යොදා ගෙන කතා කිරීමටත් යොමු වීම මෙම වැඩසටහනේ අරමුණයි.
- ★ අදාළ සතියේ හෝ ඊට පෙර සතියේ උගන්වන ලද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තේමා අනුසාරයෙන් මෙම සංවාදය ගොඩ නඟා ගැනීම අපේක්ෂා කෙරේ.
- ★ අදාළ සතියේ තමන් විසින් උගන්වන ලද තේමාව පිළිබඳ ව පන්තිය භාර ගුරුවරයා තුළ ඇති අවබෝධය පදනම් කර ගෙන ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා සමඟ එකතුව සංවාද වැඩසටහන සැලසුම් කළ යුතු ය.
- ★ ගුරුවරුන් දෙදෙනාගේ ම දෛනික පාඩම් සැලසුමට එය ඇතුළත් වී තිබීම මෙම වැඩසටහන් සාර්ථක කර ගැනීමට හේතු වේ.
- ★ වැඩසටහන මෙහෙය වන කාලය තුළ පන්තිය භාර ගුරුවරයා ද ඉංග්‍රීසි විෂයය උගන්වන ගුරුවරයා ද සිසුන් ද යන පාර්ශව තුන ම සංවාදයට සහභාගි වීම අවශ්‍ය වේ.
- ★ තුන්වන ශ්‍රේණිය හා හතරවන ශ්‍රේණිය වන විට පින්තූර භාවිතයට ගත හැකි ය. පින්තූර ඉදිරිපත් කිරීමේ දී ඒවා යටින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් නම් කර තිබීම පහසුවක් විය හැකිය.

තේමා කිහිපයකට අදාළ ආදර්ශ ඉංග්‍රීසි සංවාද වැඩසටහන් කිහිපයක් ඉදිරි පිටුවලින් ඉදිරිපත් කර ඇත. මෙම වැඩසටහන් ආශ්‍රිත කර ගෙන තවත් එබඳු වැඩසටහන් නිර්මාණය කර ගැනීමට උනන්දු වන්න. කෙසේ වෙතත් සෑම සතියක ම මෙබඳු වැඩසටහනක් පැවැත්වීම මඟින් සිසුන්ගේ ඉංග්‍රීසි භාවිතය පිළිබඳ නිපුණතාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව සැලකිය යුතු ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තේමාව 2 : අප අවට සතුන්

හඳුන්වා දෙන වාක්‍ය හා වාක්‍යාංශ

| | |
|---|---|
| How many...do you have? | centipede |
| I have two........ | grasshopper |
| I have four........ | parrot |
| I have Six......... | spider |
| I have many.......... | snail |
| I have no........ | |

ක්‍රියාකාරකම 1

පෙර සූදානම :

නිවස ආශ්‍රිත සතුන්ගේ විශාල ප්‍රමාණයේ පින්තූර හෝ එම සතුන්ගේ මුහුණු ආශ්‍රිත වෙස් මුහුණු මෙම ක්‍රියාකාරකම සඳහා උපයෝගී කර ගත හැකි ය.

ක්‍රියාකාරකම :

පන්ති භාර ගුරුවරයා සහ ඉංග්‍රීසි විෂයභාර ගුරුවරයා විසින් පළමුව මෙම ක්‍රියාකාරකම ඉදිරිපත් කරන්න. (වෙස් මුහුණු ආශ්‍රයෙන් හෝ පින්තූර ආශ්‍රයෙන්)

ඉංග්‍රීසි ගුරුවරයා

I am a centipede. Who are you?

පන්ති භාර ගුරුවරයා

I'm a grasshopper

How many legs have you got?

ඉංග්‍රීසි ගුරුවරයා

I have many legs.

How many legs have you got?

පන්ති භාර ගුරුවරයා

I have six legs.

සතුන්ගේ පාද සංඛ්‍යාව අනුව පන්තිය කණ්ඩායම් හයකට බෙදා කණ්ඩායම් දෙකක සාමාජිකයන්ට ඉහත ආකාරයෙන් ම භූමිකා රංගනයේ යෙදීමට සලස්වන්න.

| | | |
|---|---|---|
| උදාහරණ :- | (1) two legs | eg. parrot |
| | (2) four legs | eg. cat |
| | (3) six legs | eg. fly |
| | (4) eight legs | eg. spider |
| | (5) many legs | eg. centipede |
| | (6) no legs | eg. snail |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මේ ආකාරයට පන්තියේ හැම ශිෂ්‍යයකුට ම නිවස ආශ්‍රිතව සිටින තමා කැමති සතකු ලෙස භූමිකා රංගනයේ යෙදීමට අවස්ථාව දෙන්න.
මේ සඳහා ද වෙස් මුහුණු/පින්තූර ප්‍රයෝජනයට ගත හැකි ය. සතාගේ නම නොදනී නම් ඒ සඳහා උදවු ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2


ගුරුවරුන් දෙදෙනා ම සහභාගි වෙමින් මෙම ගීතය ගායනා කරන්න. අවශ්‍ය නම් අභිනයන් ඉදිරිපත් කිරීමට සලස්වන්න.

I have two eyes.
I have two ears.
I have one little chin.
I have two hands.
I have two legs and just one little nose.

ක්‍රියාකාරකම 3


පෙර දිනයේ ළමුන් තමා කැමති ආකාරයේ විරූපී සතකුගේ පින්තූරයක් ඇඳගෙන එන ලෙස කියන්න. උදාහරණයක් ලෙස ඉංග්‍රීසි පෙළ පොතේ my body පාඩමේ දැක්වෙන monster පින්තූරය ගන්න. අනතුරු ව ගුරුවරුන් දෙදෙනා තමන්ගේ පින්තූර පෙන්වා ඒ ගැන පහත ආකාරයෙන් කියන්න.

උදාහරණ : This is my monster.
Her/His name is bang bang.
She/He has the eyes of a cat.
He has the ears of a dog.
He has the legs of the cow.
He has the nose of an elephent.
He has wings of a grasshopper
and the mouth of a pig.



අනතුරු ව ළමුන්ට තමන්ගේ පින්තූර ගැන ඒ ආකාරයෙන් ම කීමට උනන්දු කරවන්න.
මෙය අවශ්‍ය නම් පහත ආකාරයෙන් ද කියවීමට පුළුවන.

This is my monster.
Her/His name is Tin Tin
She/He has six ears.
She/He has two noses.
She/He has two heads.
She/He has two mouths.
She/He has four hands.
She/He has three legs.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තේමාව 3 : අප පරිහරණය කරන දේ

හඳුන්වා දෙන වාක්‍ය හා වාක්‍යාංශ

I spy with my little eye my ............(comb, tooth brush, shoes, school bag, water bottle, soap, broom, spoons)

What is it?

Is it in the .............( bed room?, kitchen?, toilet?, living room?, dining room?)

ක්‍රියාකාරකම 1

පෙර සූදානම :

කණ්ඩායම් කිහිපයකභාවිත කළ හැකි පරිදි නිවසක සැලැස්ම කාඩ් කිහිපයක අඳින්න. විශාල කළ සැලැස්මක් ද සූදානම් කර ගන්න.

සැලැස්ම

| | | |
|---|---|---|
| BED ROOM | TOILET | KITCHEN |
| LIVING ROOM | DINING ROOM | |

ක්‍රියාකාරකම :

මුල් ම දෙබස ගුරුවරු දෙදෙනා අතර සිදු වේ. ඉංග්‍රීසි ගුරුවරයා සැලැස්ම ළමුනට දැකීමට සලස්වා, තමා පනාව තැබූ තැන නිදන කාමරයේ මේසය උඩ යයි සිතා,

(A) I spy with my little eye my comb where is it? යනුවෙන් පවසන්න.

පන්ති භාර ගුරුවරයා

(B) Is it in the dining room? යනුවෙන් කියයි.

ඉංග්‍රීසි ගුරුවරයා (පිළිතුර නිවැරදි බවින් දුරස් නිසා) It is cold යයි පවසයි.
පන්ති භාර ගුරුවරයා Is it in the toilet?

ඉංග්‍රීසි ගුරුවරයා (පිළිතුරු නිවැරදි බවින් දුරස් නිසා) It is cold යයි පවසයි.
පන්ති භාර ගුරුවරයා Is it in the bed room?

ඉංග්‍රීසි ගුරුවරයා (පිළිතුරු නිවැරදි බවට සමීප නිසා)It is warm
පන්ති භාර ගුරුවරයාIs it on the bed?

ඉංග්‍රීසි ගුරුවරයා (පිළිතුරු නිවැරදි බවින් දුරස් නිසා)It is cold
පන්ති භාර ගුරුවරයාIs it near the table.

ඉංග්‍රීසි ගුරුවරයා It is warm
පන්ති භාර ගුරුවරයාIs it on the table

ඉංග්‍රීසි ගුරුවරයා Yes that's correct.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ළමුන් කණ්ඩායම් දෙකකට බෙදා මෙම ක්‍රියාකාරකම වෙනස් භාණ්ඩයක් හා ස්ථානයක් උපයෝගී කර ගෙන කිරීමට සලස්වන්න.
එක් එක් කණ්ඩායමේ සැලසුම් අනුව ඒ ඒ කණ්ඩායම්වල ළමුනට මෙම ක්‍රියාකාරකම තනිව ම කිරීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 3
ගුරුවරුන් දෙදෙනාට මෙම ගීතය අභිනයෙන් දක්වමින් ඉදිරිපත් කොට අනතුරු ව ශිෂ්‍යයන් සහභාගි කරමින් ගායනය කළ හැක.
ගුරුවරුන්ගේ අභිමතය පරිදි මෙම ගීතය අවශ්‍ය පරිදි වෙනස් කර ගත හැක.

We drink our milk in the morning ///
    and hope its a very nice day
We wash our cups in the morning ///
    and hope its a very nice day
We iron our clothes in the morning ///
    and hope its a very nice day
We take our books in the morning ///
    and hope its a very nice day

ක්‍රියාකාරකම 4
පෙර සූදානම :
එළිමහනේ ස්ථාන හය (6)ක් ලකුණු කර Market, Post office, Milk bar, Book shop, Toy shop යනුවෙන් නම් කරන්න.
ඒ ඒ ස්ථානවලින් ලබා ගත හැකි භාණ්ඩවල පින්තූර ළමුන් අතරේ බෙදා හරින්න. (එසේ නැතිනම් එම පින්තූර පෙර දින දැනුම් දීමකින් ළමුන් ලවා ගෙන්වා ගන්න.)
උදාහරණ : fish, fruit, vegetables, stamps, envelopes
post-cards, plasters
milk, ice-cream, books, pens, rulers, dolls
balloons, cars

ක්‍රියාකාරකම :
ගුරුවරුන් දෙදෙනාගෙන් එක් අයෙක් (පන්ති භාර ගුරුවරයා) පින්තූරයක් ලබා ගෙන එම භාණ්ඩය ගත හැකි ස්ථානයට යන්න.
උදාහරණ : 'Fish' පින්තූරය ගෙන 'Market' ස්ථානයට යන්න. අනෙක් ගුරුවරයා (ඉංග්‍රීසි) What did you buy? කියා අසන්න. පන්ති භාර ගුරුවරයා I brought fish යනුවෙන් පවසන්න.

මේ ආකාරයෙන් භාණ්ඩ කිපයක් ගෙන ඒ අදාළ ස්ථානයට ගොස් ප්‍රශ්න හා පිළිතුර ලබා ගන්නා අයුරු දක්වන්න.

භාණ්ඩවල පින්තූරය බැගින් ළමුනට ලබා දී මෙම ක්‍රියාකාරකම කළ හැකි ය.
මෙහි දී ගුරුවරුන් දෙදෙනා දුම්රිය දෙකකින් පැමිණෙන ආකාරය අභිනයෙන් පෙන්වා What did you buy? කියා අසන්න. පිළිතුර නිවැරදි නම් 'get in' කියා ළමයා දුම්රියට සම්බන්ධ කර ගන්න.
පළමු පිළිතුර දුන් සිසුවා ඊළඟ අවස්ථාවේ ප්‍රශ්නය ඇසීමට යොමු කරන්න.
පිළිතුර නොගැළපේ නම් නිවැරදි පිළිතුර දී ඊළඟ දුම්රියේ නැගීමට සලස්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තේමාව 5 : අපි ලක්වැසියෝ

හඳුන්වා දෙන වාක්‍යාංශ

I'm .........
I live in............
I love...........

හඳුන්වා දෙන වචන

Muslim
Burgher
Tamil
Sinhalese

ක්‍රියාකාරකම 1:

පෙර සූදානම :

පන්තියේ සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන ගොස් රවුමකට සිටුවා, අංක 1, 2, 3 සහ 4 වශයෙන් කීමට සලස්වා එක් අංකයකින් සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදී එක් ජාතියක් නියෝජනය වන බව පවසයි. පසුව ඉංග්‍රීසි ගුරුවරයා බෝලය අතට ගෙන රවුම මැදට පැමිණෙයි.

එසේ පැමිණ,

I'm Sinhalese
I live in Sri Lanka
I love my country
යනුවෙන් පවසයි.

පසුව බෝලය පන්තිය භාර ගුරුවරයාට යවයි.
ඔහු/ඇය රවුම මැදට පැමිණ

I'm Tamil
I live in Sri Lanka
I love my country

යනුවෙන් පවසයි.

කීප සැරයක් ඉංග්‍රීසි ගුරුවරයා සහ පන්ති භාර ගුරුවරයා සිසුන්ට පෙනෙන්නට මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙති. (සිසුහු සවන් දෙති)
ඉන් පසුව එක් සිසුවකුට බෝලය යවා ඔහු රවුම මැදට පැමිණ ලබා දුන් අංකයට හිමි ජාතිය කියයි.
මේ ආකාරයට පන්තියේ සිසුන් සියලු දෙනා ම මෙම ක්‍රියාකාරකමෙහි යෙදෙති.
සියලු සිසුන් මෙම ක්‍රියාකාරකමෙහි යෙදීමෙන් පසු පහත දැක්වෙන ගීතය ගායනා කරති.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

We are Sri Lanka
අපි වෙමු ශ්‍රී ලංකා
නාමේ ශ්‍රී ලංකා
We are Sri Lanka

This land belongs to you
this land belongs to me
This land belongs to you and me
To live in harmony
We are...........

හඳුන්වා දෙන වචන
Bo leaves
maroon
orange
green
yellow
stripes
around
national flag
lion with a sword

ක්‍රියාකාරකම 2
පෙර සූදානම :
පන්ති කාමරය තුළ හෝ එළිමහන් ස්ථානයක මෙම ක්‍රියාකාරකම කළ හැකි ය.
තරමක් විශාල සිංහ කොඩියක් පාඩම පටන් ගන්නා අවස්ථාවේ තිබිය යුතු ය.

පහත දැක්වෙන අයුරින් පන්තිය භාර ගුරුවරයා සහ ඉංග්‍රීසි ගුරුවරයා අතර සංවාදය ගොඩ නගන්න.

| පන්ති භාර ගුරුවරයා | ඉංග්‍රීසි ගුරුවරයා |
|---|---|
| 1. What is this ? (කඩුව සහිත සිංහයාට අත දිගු කර) | This is lion with a sword. |
| 2. බෝ කොළවලට අත දිගු කර What are these ? | They are Bo leaves. |
| 3. කොළ පාට තීරුව පෙන්වා What's this? | It's a green strip |
| 4. තැඹිලි පාට තීරුව පෙන්වා What's this? | It's orange strip. |
| 5. කහ පාට තීරුවට අත දිගු කර What's this? | It's yellow border. |
| 6. කුණ ලේ පාට තීරුවට අත දිගු කර What's this? | It's maroon background |

ගුරුවරුන් දෙදෙනාගේ සංවාදයෙන් පසු සිසුන් සමඟ සංවාදය ගොඩ නගන්න.
සිසුන්ට යහළුවන්ගෙන් ප්‍රශ්න ඇසීමටත්, පිළිතුරු ලබා ගැනීමටත් අවස්ථාව දෙන්න.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 3 (ජාතික කොඩිය ඇඳීම)

දෙවන ආදර්ශ ක්‍රියාකාරකමින් ජාතික කොඩිය ඇති සංකේත සහ වර්ණ පිළිබඳ ව සිසුන් දැනුවත් වූ පසු මෙම ක්‍රියාකාරකම කළ හැකි ය.

ඉංග්‍රීසි ගුරුවරයා : " Let's draw the National flag "
පන්ති භාර ගුරුවරයා : That's good idea

පන්ති භාර ගුරුවරයා සිසුන්ට ද අපි ජාතික කොඩිය අඳිමු යයි පවසයි.
ඉංග්‍රීසි ගුරුවරයා දෙන උපදෙස් අනුව පන්ති භාර ගුරුවරයා හා සිසුන් ක්‍රියාකාරකමේ යෙදෙයි.

ඉංග්‍රීසි ගුරුවරයා දෙන උපදෙස් : (ජාතික කොඩිය පෙන්වමින්)

Draw a rectangle
Draw the green strip
Draw the orange strip
Draw the yellow border
Draw the four Bo leaves
Draw the lion with the sword
Colour the background in maroon

මෙලෙස උපදෙස් දෙමින් ජාතික කොඩිය අන්දවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.


## වැඩ පහසු කිරීමේ මං

හඳුන්වා දෙන වචන හා වාක්‍යාංශ


1. bottle operner
2. axe
3. mammothy
4. pair of scissors
5. wheel barrow
6. hammer (to drive/ fix the nails)
7. dig the soil
8. chop the firewood
9. open the bottle
10. carry the sand
11. cut a piece of cloth
12. cut - vegetables
   - bread
   - fruits

ක්‍රියාකාරකම 1


පෙර සූදානම




carry the sand



wheel barrow



cut vegetables




knife


Copyright © 2007 National Institute of Education - Sri Lanka.





Open the bottle




bottle operner




Fix the nail




hammer




Cut a piece of cloth



scissor



Chop the firewood




axe


Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ඉහත පෙනෙන ආකාරයේ පින්තූර කාඩ්පත් කට්ටල හයක් සකස් කර ගන්න. පන්තියේ ළමුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම්වලට බෙදන්න. සිසුන් කණ්ඩායම්වලට අවශ්‍ය පරිදි පින්තූර කට්ටල සාදා ගන්න. (දෙදෙනකුට එක කට්ටලයක්)

පන්ති භාර ගුරුවරයා උපකරණ සහිත කාඩ්පතක් ගනියි. ඉංග්‍රීසි ගුරුවරයා එම උපකරණයෙන් කෙරෙන කාර්යය සහිත කාඩ්පත ගනියි.

උදාහරණ : පන්ති භාර ගුරුවරයා ඉංග්‍රීසි ගුරුවරයා





ඉංග්‍රීසි ගුරුවරයා :I want to cut vegetables යනුවෙන් කියයි.
පන්ති භාර ගුරුවරයා : Here's the knife කියා කියයි.

සෑම උපකරණයක් සඳහා ම මේ ආකාරයට සංවාදය ගොඩ නගන්න.
පසුව සිසුන් කණ්ඩායම් කර කාඩ්පත් කට්ටල ඔවුන් බෙදා දී සිසුන් ලවා සංවාදය ඉහත ආකාරයට ගොඩ නගන්න.

| | |
|---|---|
| 1. I want to cut vegetables | Here's the knife |
| 2. I want to open the bottle | Here's the bottle operner |
| 3. I want to fix / drive the nail | Here's the hammer |
| 4. I want to carry some sand | Here's the wheel barrow |
| 5. I want to cut a piece of cloth | Here's the pair of scissors |
| 6. I want to chop firewood | Here's the axe |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තේමාව 12 :පොළොව හා අහස

හඳුන්වා දෙන වචන හා වාක්‍යාංශ
sun
moon
stars
rainbow
clouds
river
trees
mountain
waterfall
stream

ක්‍රියාකාරකම 1
පෙර සූදානම :
පන්ති කාමරය තුළ ඉඩ තිබේ නම් එහි හෝ එළිමහන් ස්ථානයක මෙම ක්‍රියාකාරකමෙහි යෙදිය යුතු ය. පන්ති භාර ගුරුවරයා අහසේ සහ පොළොවේ දකින්නට ඇති දේවල් පිළිබඳ ව ඉංග්‍රීසි ගුරුවරයා සමඟ සිංහලෙන් සංවාදයක් අරඹයි. ඉංග්‍රීසි ගුරුවරයා ඉංග්‍රීසියෙන් අහසෙහි සහ පොළොවේ දකින්නට ඇති දේවල් ගැන කියයි.

ඉන් පසුව ඉංග්‍රීසි ගුරුවරයා shall we draw a picture යනුයෙන් කියයි.
පන්ති භාර ගුරුවරයා එය අනුමත කරමින් Let's draw a picture යනුවෙන් කියයි.

පොළොවේ හා අහසේ පෙනෙන දේවල් උපයෝගී කර ගෙන අලංකාර චිත්‍රයක් ගොඩ නැගීමට සිසුන්ට උපදෙස් දෙන්න.
ළමුන් චිත්‍රය ගොඩ නගන අතර පන්ති භාර ගුරුවරයා ද චිත්‍රයක් ද අඳියි.
චිත්‍රය ගොඩ නගා අවසානයේ
ඉංග්‍රීසි ගුරුවරයා චිත්‍රයේ තිබෙන දේවල් විස්තර කරයි. පසුව සිසුන් කීප දෙනකුගේ චිත්‍රවල තිබෙන දේවල් පෙන්වමින් පන්ති භාර ගුරුවරයාත් ඉංග්‍රීසි ගුරුවරයාත් සමඟ සිසුන් සහභාගි කර ගනිමින් සංවාදයේ යෙදෙයි.

There is a ............(sun,moon) in the picture
There are ...........( stars, clouds) in the picture
there is ................( trees, house, stream, river, waterfall) in the picture
සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර දෙදෙනාගේ චිත්‍ර පිළිබඳ විස්තර කර ගැනීමට අවස්ථාව දෙන්න.
ගුරුවරු දෙදෙනා ඒ සඳහා උදවු ලබා දෙන්න.

ක්‍රියාකාරකම 2
I see the <u>moon</u>
The <u>moon</u> sees me
God bless the <u>moon</u>
and god bless me

ඉහත සඳහන් ගීතයේ ඉරි ඇඳි පද සඳහා පහත සඳහන් වචන ද යොදා ගීතය සංවර්ධනය කර ගන්න.
sun, stars, rainbow, clouds, river, mountain, stream etc...

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 4.0 දෙවන ජාතික භාෂාව (දෙමළ) - විෂය නිර්දේශය

නිපුණතාව
* තම නිවසේ පිහිටීම අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| வீட்டு விலாசம் | වීට්ටු විලාසම් |
| வீதி, ஊர் | වීදි, ඌර් |

නිපුණතාව
* පොදු ස්ථානවල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| வங்கி | වංගි |
| தபாலகம் | තපාලහම් |
| புகையிரத நிலையம் | පුහෛයිරද නිලෛයම් |
| பஸ் தரிப்பு நிலையம் | බස් තරිප්පු නිලෛයම් |

නිපුණතාව
* පාසලේ දී ලැබෙන විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

| | |
|---|---|
| முன்னால் வாருங்கள் | මුන්නාල් වාරුංගල් |
| கைகளை மேலே உயர்த்துங்கள் | කෛහලෛ මේලේ උයර්ත්තුංගල් |
| துள்ளிப் பாயுங்கள் | තුල්ලිප් පායුංගල් |
| கண்களை மூடுங்கள் | කන්ගලෛ මූඩුංගල් |
| கண்களைத் திறவுங்கள் | කන්ගලෛත් තිරවුංගල් |
| வேகமாக ஓடுங்கள் | වේගමාහ ඕඩුංගල් |

නිපුණතාව
* නිවසේ දී තම අවශ්‍යතා සඳහා වූ සුහද ඉල්ලීම් කරයි.

எனக்கு தண்ணீர் கொஞ்சம் தாருங்கள்
එනක්කු තන්ණීර් කොඤ්ජම් තාරුංගල්
எனக்கு இந்த பாடத்தைச் சொல்லித் தாருங்கள்
එනක්කු ඉන්ද පාඩත්තෛච් සොල්ලිත් තාරුංගල්
எனக்கு பட்டம் ஒன்று செய்து தாருங்கள்
එනක්කු පට්ටම් ඔන්රු සෙය්දු තාරුංගල්
நாங்கள் விளையாடப் போவோமா?
නාංගල් විලෛයාඩප් පෝවෝමා?

නිපුණතාව
* නිවසේ දී අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.

| | |
|---|---|
| வாருங்கள் உட்காருங்கள் | වාරුංගල් උට්කාරුංගල් |
| எப்படி சுகம்? | එප්පඩි සුහම් |
| தேநீர் குடியுங்கள் | තේනීර් කුඩියුංගල් |
| மறுபடியும் (மீண்டும்) வாருங்கள் | මරුපඩියුම් (මීණ්ඩුම්) වාරුංගල් |

නිපුණතාව
* ආහාරපානවල නම් නිවැරදි ව භාවිත කරයි.

| | | | |
|---|---|---|---|
| பால் | පාල් | பாற்சோறு | පාට්චෝරු |
| தேநீர் | තේනීර් | கோப்பி | කෝප්පි |
| கஞ்சி | කඤ්ජි | கடலை | කඩලෛ |
| பழரசம் | පලරසම් | பயறு | පයරු |
| தோசை | තෝසෛ | | |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව

* තම සමීප පරිසරයේ වැඩෙන ගස්වැල්වල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| தென்னை மரம் | තෙන්නෙ මරම් |
| வாழை மரம் | වාළෛ මරම් |
| கத்தரிச் செடி | කත්තරිච් චෙඩි |
| மிளகாய்ச் செடி | මිළහායිච් චෙඩි |
| பாகற்கொடி | පාහට්කොඩි |
| பயற்றங்கொடி | පයට්ට්‍රංකොඩි |
| மாமரம் | මා මරම් |
| கொய்யா மரம் | කොයියා මරම් |
| பலா மரம் | පලා මරම් |

නිපුණතාව

* තම සමීප පරිසරයේ දකින සතුන් නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| குயில் | කුයිල් |
| வௌவால் | වව්වාල් |
| புறா | පුරා |
| மாடு | මාඩු |
| ஆடு | ආඩු |

නිපුණතාව

* ශරීරයේ අවයව හා ඉන්ද්‍රියයන් නිවැරදි ව ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| கண் | කණ් |
| காது | කාදු |
| வாய் | වාය් |
| மூக்கு | මූක්කු |
| வயிறு | වයිරු |
| விரல் | විරල් |

නිපුණතාව

* නිවසේ දී එදිනෙදා භාවිත කරන භාණ්ඩ/උපකරණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | |
|---|---|
| கட்டில் | කට්ටිල් |
| அலுமாரி | අලුමාරි |
| கோப்பை | කෝප්පෙ |
| பீங்கான் | පීංගාන් |
| தும்புத்தடி | තුම්බුත්තඩි |
| வாளி | වාලි |

නිපුණතාව

* නිවසට පැමිණෙන නෑදෑයින්ගේ ඥාතිත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.

| | | | |
|---|---|---|---|
| பாட்டி | පාට්ටි | பெரிய அம்மா | පෙරිය අම්මා |
| தாத்தா | තාත්තා | பெரிய அப்பா | පෙරිය අප්පා |
| மாமி | මාමි | சின்னம்மா | සින්නම්මා |
| மாமா | මාමා | சித்தப்பா | සිත්තප්පා |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව

* සරල අකුරු යොදුණු වචන ලියයි.

| | | | |
|---|---|---|---|
| குடம் | කුඩම් | கப்பல் | කප්පල් |
| வயல் | වයල් | பருப்பு | පරුප්පු |
| முயல் | මුයල් | | |

නිපුණතාව

* 16 - 20 දක්වා අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

| | |
|---|---|
| பதினாறு | පදිනාරු |
| பதினேழு | පදිනේලු |
| பதினெட்டு | පදිනෙට්ටු |
| பத்தொன்பது | පත්තොන්පදු |
| இருபது | ඉරුපදු |

නිපුණතාව

* 10 - 50 දක්වා අගයන් 10න් වැඩි කරමින් නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

| | |
|---|---|
| பத்து | පත්තු |
| இருபது | ඉරුපදු |
| முப்பது | මුප්පදු |
| நாற்பது | නාට්පදු |
| ஐம்பது | ඓම්පදු |

නිපුණතාව

* පොදු ස්ථානවල දී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට තොරතුරු විමසයි.

புகையிரத நிலையத்திற்கு எப்படிப் போவது?
පුහෙයිරද නිලෛයත්තිට්කුප් එප්පඩිප් පෝවදු?
நூலகம் எத்தனை மணிக்கு திறக்கப்படும்?
නූලහම් එත්තනෛ මනික්කු තිරක්කප්පඩුම්?
வைத்தியர் எத்தனை மணிக்கு வருவார்?
වෛත්තියර් එත්තනෛ මනික්කු වරුවාර්?
முத்திரை வாங்குவது எங்கே?
මුත්තිරෛ වාංගුවදු එංගේ?

නිපුණතාව

* සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

නිපුණතාව

* තම සමීපතමයන් සමඟ මූලික තොරතුරු පිළිබඳ සංවාදයක යෙදෙයි.

நீங்கள் எத்தனையாம் வகுப்பில் படிக்கிறீர்கள்?
නීංගල් එත්තනෛයාම් වහුප්පිල් පඩික්කිරීර්කල්
உங்கள் பாடசாலையின் பெயர் என்ன?
උංගල් පාඩසාලෛයින් පෙයර් එන්න?
உங்களுக்கு எத்தனை வயது?
උංගලුක්කු එත්තනෛ වයදු?
உங்களுக்கு சகோதர சகோதரிகள் எத்தனை பேர்?
උංගලුක්කු සහෝදර සහෝදරිකල් එත්තනෛ පේර්?

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

- භාෂාව අනුක්‍රමයෙන් වර්ධනය වීම සඳහා ඉතා සෙමින් අලුත් වචන හඳුන්වා දීම
- මෙම භාෂාව ඉගෙන ගැනීම සඳහා ශිෂ්‍යයන් උද්යෝගිමත් කිරීම
- කථනය හා සවන් දීම තුළින් සුබ පැතුම් කීමටත් ඒවා සමාජශීලී ව ලබා ගැනීමටත් හුරුවීම

## හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන් තමා සමඟ ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව ඉගෙනීම තුළින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාවන් සිසුන් තුළ වර්ධනය කිරීම මෙමඟින් බලාපොරොත්තු වේ.

මෙම අරමුණ ඇතිව දෙවන ජාතික භාෂාවත් ඉගැන්වීම තුළින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමත්, සරල හැඩ සහිත අකුරු ලිවීමේ හැකියාව යම් ප්‍රමාණයකට ඇති කිරීමත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමත් අපේක්ෂා කෙරේ.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට ජාතික සමගිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමට දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි ද අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව දෙවන ප්‍රධාන අවධිය තුළ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීමට මෙම විෂය නිර්දේශය සකසා ඇත.

### ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

* එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමේ දී අදාළ වචන හා වගන්ති යොදා කතා කරයි.
* භාෂාවකට සවන් දී අර්ථාන්විත ව ප්‍රතිචාර දක්වයි.
* භාෂාවක් හැසිරවීමේ යහපුරුදු ප්‍රදර්ශනය කරයි.
* අන් අය ඉදිරියේ තම අදහස් ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි.
* කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි. එය අර්ථාන්විත ව භාවිත කරයි.
* කවි, ගී අසමින් ගයමින් රස විඳියි.
* දෙමළ භාෂාව හැසිරවීම තුළින් වින්දනයක් ලබයි.
* දෙමළ භාෂාව හැසිරවීමට ඇති හැකියාව අගයයි.

### දෙවන ප්‍රධාන අවධියේ අපේක්ෂිත නිපුණතා

* සුවිශේෂී ස්ථානයක පිහිටීම අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.
* තම අවශ්‍යතා සඳහා වූ පොදු ස්ථාන හඳුනාගෙන ඒවායේ නම් ප්‍රකාශ කරයි.
* එදිනෙදා කාර්යයන්වල දී අදාළ සරල විධානවලට ප්‍රතිචාර දක්වයි.
* එදිනෙදා තම අවශ්‍යතා සඳහා සුහද ව ඉල්ලීම් කරයි.
* අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.
* තම සමීප පරිසරයේ ඇති ගස්වැල් මල්වල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* තම සමීප පරිසරයේ දකින සතුන් නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* තම ශරීරයේ අවයව නිවැරදි ව ප්‍රකාශ කරයි.
* එදිනෙදා භාවිත කරන භාණ්ඩ හා උපකරණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* නිවසේ සාමාජිකයන්ගේ ඥාති සබඳතාවය තම සමීපතමයන්ට හඳුන්වා දෙයි.
* සරල අකුරු යෙදුණු වචන ලියයි.
* සංඛ්‍යාංක හඳුනාගෙන නිවැරදි ව හා පැහැදිලි උච්චාරණය සහිත ව කියයි.
* පොදු ස්ථානවල දී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට තොරතුරු විමසයි.
* සරල කවි ගී අංග චලනය සහිත ව ගායනා කරයි.
* තම සමීපතමයන් සමඟ මූලික තොරතුරු සංවාදයක යෙදෙයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## හතරවන ශ්‍රේණිය සඳහා අපේක්ෂිත නිපුණතා

* තම නිවසේ පිහිටීම අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.
* පොදු ස්ථානවල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* පාසලේ දී ලැබෙන විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.
* නිවසේ දී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට සුහද ව ඉල්ලීම් කරයි.
* නිවසේ දී එන අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.
* ආහාරපානවල නම් නිවැරදි ව භාවිත කරයි.
* තම සමීප පරිසරයේ වැඩෙන ගස්වැල්වල නම් හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* තම සමීප පරිසරයේ දකින සතුන් නිවැරදි ව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* ශරීරයේ අවයව හා ඉගෙනුම් කාර්යයන් නිවැරදි ව ප්‍රකාශ කරයි.
* නිවසේ දී එදිනෙදා භාවිත කරන භාණ්ඩ/උපකරණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* නිවසට පැමිණෙන නෑදෑයින්ගේ ඥාතිත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි.
* සරල අකුරු යෙදුණු වචන ලියයි.
* 16 සිට 20 දක්වා අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
* 10 සිට 50 දක්වා අගයන් 10න් දහයට වැඩි කරමින් නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
* පොදු ස්ථානවල දී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට තොරතුරු විමසයි.
* සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.
* තම සමීපතමයන් සමඟ මූලික තොරතුරු පිළිබඳ සංවාදයේ යෙදෙයි.

## පාසල් ප්‍රතිපත්තිය හා වැඩසටහන්

දෙවන ජාතික භාෂාව භාවිත කරන අවස්ථා පාසල් ප්‍රතිපත්තිය තුළ ඇති කිරීමට විදුහල්පතිවරුන්ගේ අවධානය යොමු විය යුතු ය. මෙයට අමතර ව හතරවන ශ්‍රේණියේ පන්තිය තුළ දෙවන ජාතික භාෂාව භාවිත වන පන්ති ප්‍රතිපත්ති ඇති කිරීමට පන්ති භාර ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානය යොමු විය යුතු ය. මෙහි දී සුබ පැතීම්, ස්තුති කිරීම්, ඇතැම් අවස්ථාවල දෙවන ජාතික භාෂාවෙන් ද පැවසීම වැනි භාෂා ප්‍රතිපත්ති ඇති කර ගත හැකි ය. තව ද දෙවන ජාතික භාෂාව සඳහා දිනයන් වෙන් කර පන්ති මට්ටමෙන් වැඩ සටහන් සංවිධානය කළ හැකි ය.

## සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

අවස්ථානුකූල ව දෙමළ වචන හා වාක්‍ය භාවිත කරන ආකාරය පිළිබඳ ව තොරතුරු රැස් කරන්න. එම තොරතුරු සිසුන්ගේ ප්‍රබලතා හඳුනා ගැනීමටත් දුෂ්කරතා අවම කර ගැනීම සඳහාත් යොදා ගන්න. පොදු තක්සේරු පත්‍රිකාවේ දෙවන ජාතික භාෂාව තක්සේරු කිරීම සඳහා අදාළ නිර්ණායකයන් ද ඇතුළත් කර ඇත.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
තම නිවසේ පිහිටීම අන් අයට නිවැරදි ව ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම
- මේ සඳහා පහත සඳහන් තොරතුරු විමසා බැලීමට යොමු කරන්න.
- සෑම ශිෂ්‍යයකුගෙන් ම තමත් වෙසෙන ගමේ/නගරයේ නම විමසා දැන ගන්න.
- ගමේ/නගරයේ නම දැන ගත් පසු ඔවුන් පදිංචි වීදියේ/පාරේ නම විමසා දැන ගන්න. (වීදියේ/ පාරේ නම ප්‍රකාශ කරන විට නිවසේ අංකයත් සමඟ ප්‍රකාශ කිරීමට යොමු කරන්න.)
- සිසුන්ගෙන් වෙන වෙන ම නිවසේ ලිපිනය විමසා දැන ගත් පසු දෙමළ බසින් එය ප්‍රකාශ කිරීමට යොමු කරන්න.

ශිෂ්‍යයන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න. ඔවුන් පහත දැක්වෙන ආකාරයට සංවාදයේ යෙදීමට යොමු කරන්න.
උදාහරණ :-

මුල් සිසුවා (ප්‍රශ්නය) உங்களுடைய ஊர் எது?
උංගලුඩෛය ඌර් එදු ?
ඔබේ ගම කොහේ ද?

දෙවන සිසුවා (පිළිතුර) எனது ஊர் ...............
එනදු ඌර් ................
මගේ ගම ................

දෙවන සිසුවා (ප්‍රශ්නය) உங்களுடைய ஊர் எது?
උංගලුඩෛය ඌර් එදු ?
ඔබේ ගම කොහේ ද?

පළමු සිසුවා (පිළිතුර) எனது ஊர் ................
එනදු ඌර් ..............
මගේ ගම ...............

පළමු සිසුවා (ප්‍රශ්නය) உங்கள் வீடு எந்த வீதியில் உள்ளது?
උංගල් වීඩු එන්ද වීදියිල් උල්ලදු?
ඔබේ ගෙදර තියෙන්නේ කොයි පාරේ ද?

දෙවන සිසුවා (පිළිතුර) எனது வீடு .......... உள்ளது.
එනදු වීඩු ............. උල්ලදු
මගේ ගේ තියෙන්නේ ................

දෙවන සිසුවා (ප්‍රශ්නය) உங்கள் வீடு எந்த வீதியில் உள்ளது?
උංගල් වීඩු එන්ද වීදියිල් උල්ලදු?
ඔබේ ගෙදර තිබෙන්නේ කොයි පාරේ ද?

පළමු සිසුවා (පිළිතුර) எனது வீடு .......... உள்ளது.
එනදු වීඩු ............ උල්ලදු
මගේ ගේ තිබෙන්නේ ....................

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

දෙවන සිසුවා (ප්‍රශ්නය) **உங்கள் வீட்டு முகவரி என்ன?**
උංගල් වීට්ටු මුහවරි එන්න?
ඔබේ නිවසේ ලිපිනය මොකක් ද?

පළමුවන සිසුවා (පිළිතුර) **எனது வீட்டு முகவரி...**
එනදු විට්ටු මුහවරි ..................
මගේ ගෙදර ලිපිනය ................

දෙවන සිසුවා (ප්‍රශ්නය) **உங்கள் வீட்டு முகவரி என்ன?**
උංගල් වීට්ටු මුහවරි එන්න

පළමුවන සිසුවා (පිළිතුර) **எனது வீட்டு முகவரி...**
එනදු විට්ටු මුහවරි ..................

මේ ආකාරයට ම පළමු සිසුවා දෙවන සිසුවාගෙන් ලිපිනය විමසිය යුතු ආකාර දෙවන සිසුවා ලිපිනය ප්‍රකාශ කළ යුතුයි.
(සිසුන් සියලු දෙනාට ම තම නිවසේ ලිපිනය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න)

නිපුණතාව
පොදු ස්ථානවල නම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.


ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම

- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සමඟ සම්බන්ධ කරමින් අපට සේවා සපයන පොදු සේවා ස්ථාන පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- පොදු සේවා ස්ථාන කිහිපයක පින්තූර ප්‍රදර්ශනය කර ඒවායේ නම් මව්බසින් ප්‍රකාශ කිරීමට යොමු කරන්න.
- බැංකුව, තැපැල් කාර්යාලය, බස් නැවතුම්පොළ, දුම්රියපළ යන ස්ථානවල පින්තූර ප්‍රදර්ශනය කර ඒවායේ නම් දෙමළ බසින් නිවැරදි ව උච්චාරණය කිරීමට යොමු කරන්න.

පහත දැක්වෙන පොදු ස්ථානවල නම් භාෂා තුනෙන් ම ලියන ලද පින්තූර කාඩ්පත් සූදානම් කර ගන්න.



வங்கி
වංගි
බැංකුව



தபாலகம்
තපාලහම්
තැපැල් කාර්යාලය

Copyright © 2007 National Institute of Education - Sri Lanka.



பேரூந்து நிலையம்
පේරුන්දු නිලෙයම්
(බස් නිලෙයම්)
බස් නැවතුම්පොළ



புகையிரத நிலையம்
පුහෙයිරද නිලෙයම්
දුම්රියපළ

සිසුන් කණ්ඩායම් හතරකට බෙදා ගන්න. සෑම කණ්ඩායමකට ම එක් කාඩ්පතක් බැගින් දෙන්න. කාඩ්පතේ පින්තූර උදවු කර ගෙන පොදු ස්ථානයේ නම දෙමළ බසින් පැවසීමට අවස්ථාව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| උදාහරණ :- வங்கி | වංගී | බැංකුව |
| தபாலகம் | තබාලහම් | තැපැල් කාර්යාලය |
| பஸ் நிலையம் | බස් නිලෙයම් | බස් නැවතුම්පළ |
| பேரூந்து நிலையம் | පේරුන්දු නිලෙයම් | බස් නැවතුම්පළ |
| புகையிர நிலையம் | පුහෙයිරද නිලෙයම් | දුම්රියපළ |

කණ්ඩායම් හතරට ම කාඩ්පත් හතරම බලා අදාළ වචන කීමට අවස්ථාව ලබා දෙන්න. (සියලු ම සිසුන්ට කාඩ්පත් හතරේ ම ඇති වචන උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

නිපුණතාව
පාසලේ දී ලැබෙන විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1

- විධාන කිපයකට සවන් දී එය අවබෝධ කර ගනිමින් එයට ප්‍රතිචාර දැක්වීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

සිසුන් පන්තියෙන් පිටතට ගෙන ගොස් රවුමට සිටීමට සලස්වන්න. ඔබ පන්තියේ මැදට ගොස් විධාන කීපයක් දෙන්න.

උදාහරණ :- අත්පොඩි ගසන්න
එක තැන උඩ පනින්න
අත් ඉහළට ඔසවන්න
කපුටකු මෙන් හඬ නගන්න

රවුමේ දුවමින් තමන් කලින් සිටි ස්ථානය වෙනස් කිරීමට උපදෙස් දෙන්න. නැවත විධානයක් දෙන්න.
ඉදිරියට එන්න
සිසුන්ට ප්‍රතිචාර දැක්වීමට ඉඩ දෙන්න. කීපවතාවක් ම මෙය කරවන්න.
පසුව - முன்நோக்கி வாருங்கள்
ඉදිරියට එන්න - මුන්නාල් වාරුංගල් යනුවෙන් දෙමළ බසින් ප්‍රකාශ කරන්න. සිසුන්ට ද එම විධානය දෙමළෙන් ප්‍රකාශ කිරීමට ඉඩ දෙන්න.
බෝලයක් ගෙන එය රවුමේ සිටින සිසුවකු වෙත දමන්න. සිසුවා බෝලය අල්ලාගත් විගස මුන්නාල් වාරුංගල් යනුවෙන් පැවසීමට උපදෙස් දෙන්න.
එවිට එම සිසුවා වටය මැදට ආ යුතුය.
මෙම ක්‍රියාකාරකම සෑම සිසුවකුට ම අවස්ථාවක් ලැබෙන පරිදි ක්‍රියාත්මක කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2
අත් ඉහළට ඔසවන්න යන විධානය දී ප්‍රතිචාර ලබා ගන්න. කීපවතාවක් ම ප්‍රකාශ කරන්න. සිසුන් ලවා ද කියවන්න. පසුව මෙම විධානය දෙමළ බසින් හඳුන්වා දෙන්න.
උදාහරණ :- **கைகளை மேலே உயர்த்துங்கள்.**
කෛහලෙ මේලේ උයර්ත්තුංගල්
අත් ඉහළට ඔසවන්න.
කීපවතාවක් ම මෙය ප්‍රකාශ කරන්න. සිසුන්ට ද ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න. සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර එක් අයකු ලවා විධානය ද අනෙක් සිසුවා ඊට ප්‍රතිචාර දැක්වීමට ද යොමු කරන්න. නැවත මෙම ක්‍රියාකාරකම සිසුන් දෙදෙනා මාරු කරමින් කරවන්න.

ක්‍රියාකාරකම 3
පනින්න - එක තැන උඩ පනින්න යන විධානයන් දෙන්න. පසුව දෙමළ බසින් **துள்ளிப் பாயுங்கள்** තුල්ලිප් පායුංගල් - උඩ පනින්න යනුවෙන් හඳුන්වා දෙන්න. නැවත නැවත ප්‍රකාශ කරමින් සිසුන් තුළ එය ප්‍රගුණ කරවන්න.
ඇස් පියා ගන්න
ඇස් අරින්න යන විධාන දී සිසුන්ගෙන් ප්‍රතිචාර ලබා ගන්න. නැවත නැවත කරමින් සිසුන්ට එය පුහුණු කරවන්න. පසුව එම වචන දෙමළෙන් හඳුන්වා දෙන්න.
**கண்களை மூடுங்கள்** - කන්ගලෙ මූඩුංගල් - ඇස් පියාගන්න
**கண்களைத் திறவுங்கள்** - කන්ගලෙ තිරවුංගල් - ඇස් අරින්න
මෙම විධාන දෙක දෙමළ බසින් මාරුවෙන් මාරුවට කියමින් සිසුන් තුළ ප්‍රගුණ කරවන්න.

ක්‍රියාකාරකම 4
රවුමේ දුවන්න
රවුමේ ඇවිදින්න
වේගයෙන් ඇවිදින්න වැනි විධානයන් දී සිසුන්ට ප්‍රතිචාර දැක්වීමට ඉඩ සලසන්න. නැවත වේගයෙන් දුවන්න යන්න ප්‍රකාශ කරන්න. ඉන් පසුව දෙමළෙන්
**வேகமாக ஓடுங்கள்**
වේහමාහ ඕඩුංගල්
වේගයෙන් දුවන්න හඳුන්වා දෙන්න. මෙය නැවත නැවත කියමින් සිසුන්ට ද ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

ක්‍රියාකාරකම 5
සිසුන් කණ්ඩායම් පහකට බෙදා එක් එක් කණ්ඩායමට එක් එක් විධානය බැගින් දී ඊට ප්‍රතිචාර දැක්වීමට ඉඩ සලසන්න. පසුව විධාන මාරු කරමින්, කණ්ඩායම් අතර මෙම ක්‍රියාකාරකම කරවන්න.

නිපුණතාව
නිවසේ දී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට සුහද ව ඉල්ලීම් කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1

- ඉල්ලීම් කීපයක් ඉටු කර ගැනීම පිණිස දෙමළ බසින් ඉල්ලීම් කීපයක් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

මේ සඳහා සිසුන් අර්ධ කවාකාරව සිට ගැනීමට සලස්වන්න. අපේ අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී සුහද ව උදවු ඉල්ලා සිටිය යුතු බව සිසුන්ට සිහිපත් කරන්න.
උදාහරණ :- දෙන්න **தாருங்கள்** තාරුංගල්
වාක්‍ය වශයෙනුත් අපගේ ඉල්ලීම් කළ හැකි ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මට වතුර ටිකක් දෙන්න. සිසුන් මෙම වචන නිවැරදි ව පැවසූ විට දෙමළ බසින් එය පවසන ආකාරය හඳුන්වා දෙන්න.

எனக்கு தண்ணீர் கொஞ்சம் தாருங்கள்.
එනක්කු තන්නීර් කොංජම් තාරුංගල්
මට වතුර ටිකක් දෙන්න

කීප වතාවක් ම මෙම ඉල්ලීම ඉදිරිපත් කරන්න. සිසුන් ද කීප වතාවක් ඊට සවන් දීමෙන් අවබෝධ කර ගත් විට එම ඉල්ලීම් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ඉහත ආකාරයට මට මේ පාඩම කියලා දෙන්න. යන ඉල්ලීම සිංහලෙන් ඉදිරිපත් කරන්න. සිසුන්ට ද එසේ කීමට අවස්ථාව ලබා දෙන්න. ඉන් පසු දෙමළ භාෂාවෙන් හඳුන්වා දෙන්න.

උදාහරණ :- எனக்கு இந்தப் பாடத்தைச் சொல்லித் தாருங்கள்.
එනක්කු ඉන්දප් පාඩත්තෙ සොල්ලිත්තාරුංගල්
මට මේ පාඩම කියලා දෙන්න

කීප වතාවක් මෙය ප්‍රකාශ කරන්න. සිසුන්ට ද එය පුහුණු වන්නට අවස්ථාව ලබා දෙන්න. සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න. එක් අයෙක්

එනක්කු තන්නීර් කොංජම් තාරුංගල් - எனக்கு தண்ணீர் கொஞ்சம் தாருங்கள்.

යනුවෙන් ප්‍රකාශ කරන විට අනෙක් සිසුවා එනක්කු ඉන්ද පාඩත්තෙ සොල්ලිතාරුංගල් - எனக்கு இந்தப் பாடத்தைச் செல்லித் தாருங்கள். යනුවෙන් පැවසීමට යොමු කරන්න. මෙසේ සිසුන්ට මාරුවෙන් මාරුවට මෙම ඉල්ලීම් කිරීමට අවස්ථාව ලබා දෙන්න. හැකියාව ඇති සිසුන්ට ප්‍රශ්නය සඳහා සුදුසු ප්‍රතිචාර දැක්විය හැකි ය.

ක්‍රියාකාරකම 2

සිසුන් රවුමට සිටීමට සලස්වන්න.  සරුංගලයක් පෙන්වා මෙවැනි සරුංගලයක් සැදිය හැකි දැයි විමසන්න. එසේ නොහැකි නම්,

මට සරුංගලයක් හදලා දෙන්න යැයි ඉල්ලීමට යොමු කරන්න. සැම දෙනා ම මෙම ඉල්ලීම කළ විට එය දෙමළ බසින් කියන ආකාරය හඳුන්වා දෙන්න.

எனக்குப் பட்டமொன்று கட்டித்தாருங்கள்.
එනක්කු පට්ටමොන්රු කට්ටිත්තාරුංගල්
මට සරුංගලයක් හදල දෙන්න.

කීප වතාවක් මෙම වාක්‍ය කියවා සිසුන්ට සවන් දීමට යොමු කරන්න. පසුව සිසුන්ට සාමූහික ව හා තනි තනිව මෙම වාක්‍ය කීමට අවස්ථාව සලසා දෙන්න. දෙදෙනා බැගින් එක්ව මෙම වාක්‍ය මාරුවෙන් මාරුවට කීමට සලසා තව දුරටත් පුහුණු වීමට යොමු කරන්න.

මේ ආකාරයට ම

අපි සෙල්ලම් කරන්න යමු ද? වාක්‍යය ද මුලින් සිංහලෙන් හඳුන්වා දී පසුව දෙමළ බසින් කීමට යොමු කරන්න.

நாங்கள் விளையாடப் போவோமா?
නාංගල් විලෙයාඩප් පෝවෝමා?
අපි සෙල්ලම් කරන්න යමු ද?

මුලින් ම සිසුන්ට ඊට සවන් දීමටත් පසුව පැහැදිලි ව උච්චාරණය කිරීමටත් අවස්ථාව ලබා දෙන්න. දෙදෙනා බැගින් ගෙන එකිනෙකාට මෙම ඉල්ලීම් කිරීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න.
අවසානයේ සියලු ම වාක්‍ය එකතු කර කීමට සලස්වන්න.

| | |
|---|---|
| එනක්කු තන්නීර් කොංජම් තාරුංගල් | எனக்குத் தண்ணீர் கொஞ்சம் தாருங்கள். |
| එනක්කු ඉන්ද පාඩත්වේ සොල්ලිත්තාරුංගල් | எனக்கு இந்தப் பாடத்தைச் செல்லித் தாருங்கள். |
| එනක්කු පට්ටමොන්රු කට්ටිත්තාරුංගල් | எனக்குப் பட்டமொன்று கட்டித் தாருங்கள். |
| නාංගල් විලෙයාඩප් පෝවෝමා | நாங்கள் விளையாடப் போவோமா? |

මේ ආකාරයට ඉල්ලීම්/උදවු ලබා ගැනීමේ දී දෙමළ බස භාවිතයට සිසුන් දිරිමත් කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
නිවසට එන අමුත්තන් පිළිගෙන සුහද කතා බහේ යෙදෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
ළමයින් සමඟ නිවසට එන අමුත්තන් පිළිගන්නේ කෙසේ දැ යි පළමු ව කතා බහ කරන්න. ඉන් පසු නිවසට එන අමුත්තන් ආයුබෝවන් කියා පිළිගැනීම, නිවස තුළට කැඳවාගෙන ගොස් වාඩි කරවීම, සුවදුක් විමසීම, තේ බීමට ආරාධනා කිරීම වැනි අවස්ථාවල දී භාවිත කරනු ලබන ප්‍රකාශ දෙමළ වචන භාවිත කිරීමට ඉඩ සලසන්න. ආයෙත් එන්න යන විධානය දෙමළ බසින් මීන්ඩුම් වරුහ **மீண்டும் வாருக** පවසා ඔවුන්ට සමුදීමත් ප්‍රගුණ කරවීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.

මේ සඳහා සිසුන් පන්තියෙන් බැහැර සෙවන ඇති ස්ථානයකට කැඳවා ගෙන යන්න. වාඩිවීමට උපදෙස් දෙන්න. නිවසට එන අමුත්තන් පිළිගන්නේ කෙසේ දැයි විමසා පිළිතුරු දීමට අවස්ථාව ලබා දෙන්න. පහත සඳහන් දෙබස් සිසුන් දෙදෙනා බැගින් ඉදිරියට කැඳවා පළමුවෙන් ම මව්බසින් ඉදිරිපත් කර දෙවනුව දෙමළ බසින් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

උදාහරණ :-

| | |
|---|---|
| සුමුදු : | ආයුබෝවන් |
| ඉසුරු : | ආයුබෝවන්, එන්න, මෙහෙන් වාඩිවන්න |
| සුමුදු : | ස්තුතියි, කොහොමද සැප සනීප? |
| ඉසුරු: | මම සනීපෙන් ඔයාගෙ සැප සනීප කොහොම ද? |
| සුමුදු : | මමත් සනීපෙන් |
| ඉසුරු : | තේ බොන්න |
| සුමුදු : | ස්තුතියි මම එහෙනම් ගිහින් එන්නම් |
| ඉසුරු : | ස්තුතියි ආයෙ දවසක එන්න |

මෙම ක්‍රියාකාරකම පළමු ව සිංහලෙන් ද දෙවනුව දෙළෙන් ද කරවන්න.

ක්‍රියාකාරකම 2
සිංහල බසින් කළ සංවාදය දෙමළ බසින් කරමු යයි පවසා ක්‍රියාකාරකම් ආරම්භ කරන්න.
සිසුන් දෙදෙනෙක් ඉදිරියට කැඳවා ඔවුන් එකිනෙකාට දෙමළ බසින් ආයුබෝවන් කීමට සලස්වන්න.

| | | |
|---|---|---|
| **வணக்கம்** | වණක්කම් | (1 වන අවධියේ දී හඳුන්වා දී ඇත) |
| **வாருங்கள் இருங்கள்** | වාරුංගල් ඉරුංගල්<br>එන්න වාඩිවෙන්න | |
| **எப்படி சுகம்** | එප්පඩි සුහම්?<br>සැප සනීප කොහොම ද? | |
| **தேநீர் குடியுங்கள்** | තේනීර් කුඩියුංගල්<br>තේ බොන්න | |
| **மீண்டும் வாருங்கள்** | මීන්ඩුම් වාරුංගල්<br>ආයෙත් එන්න | |

ඉහත දක්වා ඇති ප්‍රකාශ සුහද සංවාදවල දි නිතර භාවිත වේ. මේවා එකිනෙක උච්චාරණය කර සිසුන්ට සවන් දීමට සලස්වා, පසුව සිසුන්ට ද මේවා උච්චාරණය කිරීමට ඉඩ ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ඉහත වගන්ති භාවිත කරමින් භූමිකා රංගනයට ඉඩ සලසන්න. පළමුවන ප්‍රධාන අවධියේ දී ඉගෙන ගන්නා ලද වචන ද මෙහි දී භාවිත කළ හැකි ය.

උදාහරණ :-

| | |
|---|---|
| வணக்கம் | වණක්කම් |
| வாருங்கள் இங்கே இருங்கள் | වාරුංගල් ඉංගේ ඉරුංගල් |
| நன்றி. எப்படி சுகம் | නන්රී එප්පඩි සුහම් |
| நல்ல சுகம். உங்கள் சுகம் எப்படி? | නල්ල සුහම් උංගල් සුහම් එප්පඩි ? |
| நான் நல்ல சுகம். | නාන් නල්ල සුහම් |
| தேனீர் குடியுங்கள். | තේනීර් කුඩියුංගල් |
| நன்றி. நான் போய் வரவா? | නන්රී නාන් පෝයි වරවා? |
| நன்றி. மீண்டும் வாருங்கள். | නන්රී මීන්ඩුම් වාරුංගල් |

මේ අන්දමින් අමුත්තා හා නිවැසියාගේ චරිත නිරූපණය කර සංවාදයේ යෙදීමට සෑම සිසුවකුට ම අවස්ථාව ලබා දෙන්න.

නිපුණතාව

ආහාරපානවල නම් නිවැරදි ව භාවිත කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

සිසුන් පාසලට ගෙන ආ ආහාර පිළිබඳ ව විමසන්න.

සිසුන් වඩා ප්‍රියකරන ආහාර වර්ග මොනවා දැ යි ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

මේ සඳහා පහත දැක්වෙන ආහාර වර්ගවල නම් දෙමළ බසින් හඳුන්වා දෙන්න.

| | | |
|---|---|---|
| தோசை | තෝසෛ | තෝසෙ |
| பாற்சோறு | පාට්සෝරු | කිරිබත් |
| கடலை | කඩලෛ | කඩල |
| பயறு | පයරු | මුං ඇට |

සිසුන් වඩා ප්‍රියකරන පාන වර්ග ගැන විමසන්න. ඒවා කළුලෑල්ලේ සටහන් කරන්න.

එම පාන වාර්ගවලින් පහත දැක්වෙන පාන වර්ගවල නම් තෝරා ගෙන ඒවා දෙමළ බසින් උච්චාරණයට යොමු කරන්න.

| | | |
|---|---|---|
| தேநீர் | තේනීර් | තේ |
| பால் | පාල් | කිරි |
| கோப்பி | කෝප්පි | කෝපි |
| பழரசம் | පලරසම් | පලතුරු බීම |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මේ සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත වීමට සලස්වන්න.

සිසුන් හතර දෙනා බැගින් වූ කණ්ඩායම්වලට බෙදන්න. සෑම කණ්ඩායමකට ම හඳුන්වා දෙන ආහාරවල පින්තූර කට්ටලයක් ලබා දෙන්න. ඔවුන් එම පින්තූර කණ්ඩායම් මේසය මත තැබිය යුතු ය. කණ්ඩායමේ එක් එක් සිසුවා මේසය මත ඇති කාඩ්පත බැගින් ගෙන එහි ඇති පින්තූරය දෙස බලා එම ආහාර වර්ගයේ නම දෙමළ බසින් ප්‍රකාශ කර පින්තූරය නොපෙනෙන සේ මේසය මත හරවා තැබිය යුතුය. මෙසේ කිරීමේ දී කණ්ඩායමේ සෑම කෙනකුට ම එක් ආහාර වර්ගයක නමක් කීමට ඉඩ ලැබේ. ඉන් පසුව වෙනත් කාඩ්පතක් තෝරා ගෙන (කලින් නම නොකී) එහි නම කිවයුතු ය. මුනින් අතට හරවා ඇති පින්තූරවල ඇති ආහාර සියල්ලේ ම නම්, සෑම සිසුවෙක් ම පැවසූ පසු පින්තූර පෙනෙන සේ මේසය මත තැබිය යුතු ය.
මේ ආකාරයට පන්තියේ සෑම සිසුවෙක් ම මෙම ක්‍රියාකාරකම කරමින් ආහාර වර්ග හතරේ ම නම් කිරීමට අවස්ථාව දෙන්න.

ක්‍රියාකාරකම 2
සිසුන් හතර දෙනා බැගින් වූ කණ්ඩායම්වලට බෙදන්න. සෑම කණ්ඩායමකට ම තේ, කිරි, කෝපි, පලතුරු බීම ආදියේ නම් සඳහන් පින්තූර සකස් කර ගන්න.
එක් කණ්ඩායමක් එම පින්තූර දෙස බලා ඒවා පෙන්වා ඒවායේ නම් දෙමළ බසින් කිව යුතුයි. එම කණ්ඩායම ක්‍රියාකාරකම අවසන් කළ පසුව මාරුවෙන් මාරුවට අනෙක් කණ්ඩායම් ද ඉහත ක්‍රියාකාරකමේ නිරත කරවන්න. සෑම කෙනකුට ම සෑම පාන වර්ගයකම නම ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දිය යුතු ය.

නිපුණතාව
තම සමීප පරිසරයේ වැඩෙන ගස්වැල්වල නම් හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
සිසුන් සමඟ සාකච්ඡාවක් තුළින් තම පරිසරයේ වැඩෙන ගස්වැල්වල නම් මොනවා දැයි විමසන්න. ඒවා අතරින් පහත දැක්වෙන ගස්වල නම් දෙමළ බසින් කීමට අවස්ථාව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| மாமரம் | මාමරම් | අඹ ගස |
| பலாமரம் | පලාමරම් | කොස් ගස |
| வாழைமரம் | වාලෛමරම් | කෙසෙල් ගස |
| தென்னமரம் | තෙන්නෙමරම් | පොල් ගස |
| கொய்யாமரம் | කොය්යාමරම් | පේර ගස |

පැළ හා වැල් වර්ගවල නම් සිසුන්ගෙන් විමසන්න. පැළ සහ වැල් වර්ග වෙන් කර රූප සටහන් මඟින් පැහැදිලි කරන්න.

| | | | |
|---|---|---|---|
| පැළ (සෙඩි) | மிளகாய்ச்செடி | මිලහායිච්චෙඩි | මිරිස් පැළය |
| | கத்தரிச்செடி | කත්තරිච්චෙඩි | වම්බටු පැළය |
| වැල් (කොඩි) | பாகற்கொடி | පාහට්කොඩි | කරවිල වැල |
| | பயற்றங்கொடி | පයට්ට්‍රංකොඩි | මෑ වැල |

යන පැළ හා වැල් වර්ග දෙමළ බසින් හඳුන්වා දෙන්න



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ගස්, පැළ සහ වැල් වර්ග හඳුන්වා දීමේ දී රූප සටහන් භාවිත කරන්න.
මේ සඳහා සිසුන් පස්දෙනා බැගින් වූ කණ්ඩායම්වලට බෙදන්න.
සෑම සිසුවකුට ම ශාක පත්‍ර කිහිපයක් ඇඳීමට ප්‍රමාණවත් හිස් කඩදාසියක් ලබා දෙන්න.
සෑම කණ්ඩායමක් ම තම කඩදාසිවල අඹ, කොස්, කෙසෙල්, පොල්, පේර යන ගස්වල චිත්‍ර ඇඳීමට සලස්වන්න. (කැමති නම් චිත්‍රවලට වර්ණ යොදා ගත හැක) කණ්ඩායමේ එක් සිසුවෙක් ඇඳිය යුත්තේ එක් ගස් වර්ගයක් පමණි.

අඹ ගස
කොස් ගස
කෙසෙල් ගස
පොල් ගස
පේර ගස

ගස්වල පින්තූර ඇඳීමෙන් පසු කණ්ඩායමේ සෑම කෙනෙක් ම තමා ඇඳි ගසේ නම දෙමළ බසින් පැවසීමට සලස්වන්න.

| | | |
|---|---|---|
| மாமரம் | මාමරම් | අඹ ගස |
| பலாமரம் | පලාමරම් | කොස් ගස |
| வாழைமரம் | වාළෛමරම් | කෙසෙල් ගස |
| தென்னமரம் | තෙන්නෙමරම් | පොල් ගස |
| கொய்யாமரம் | කොය්යාමරම් | පේර ගස |

කණ්ඩායමේ රූප මාරු කර ගනිමින් සෑම කෙනෙක් ම ගස් වර්ග පහේ ම නම් නිවැරදි ව උච්චාරණය කළ යුතු වේ. සෑම සිසුවකුට ම මෙම වචන උච්චාරණය කිරීමේ හැකියාව ලැබෙන තුරු මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 2
සිසුන් හතරදෙනා බැගින් වූ කණ්ඩායම්වලට බෙදන්න. මිරිස් පැළය. වම්බටු පැළය, කරවිල වැල, මෑ වැල ආදී පින්තූර සිසු සංඛ්‍යාවට ගැළපෙන පරිදි කාඩ්පත්වල අලවා සූදානම් කර ගන්න. පන්තියේ සිසුන් 40ක් ද සිටී නම්, සිසුන් හතර දෙනා බැගින් වූ කණ්ඩායම් 10කට බෙදීම අවශ්‍ය ය. කණ්ඩායම් 10ට ම එක් වර්ගයකින් පින්තූර කාඩ්පත් 10 බැගින් ලබා දිය යුතුයි. මෙසේ බෙදීමෙන් පසු කණ්ඩායමේ සිටින එක් එක් සිසුවා නැගිට තමා සතු රූපයේ නම නිවැරදි ව උච්චාරණය කළ යුතුයි. පසුව කණ්ඩායම් අතර පින්තූර හුවමාරු කර ගනිමින් ඒවායේ නම් කියවිය යුතුයි.
සෑම සිසුවෙක් ම හඳුන්වා දුන් පැළ හා වැල්වල නම් සියල්ල නිවැරදි ව උච්චාරණය කළ යුතු වේ.

නිපුණතාව
තම සමීප පරිසරයේ දකින සතුන් නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1

- සිසුන් වඩා කැමති සතුන් පිළිබඳ ව විමසන්න.
- සිසුන්ගේ නිවෙස් ආශ්‍රිත පරිසරයේ දැකිය හැකි සතුන් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- සතුන්ගේ පින්තූර පෙන්වන්න. හඳුනා ගැනීමට සලස්වන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ :- | குயில் | - කුයිල් | කොහා |
| | புறா | - පුරා | පරෙවියා |
| | வௌவால் | - වව්වාල් | වවුලා |
| | மாடு | - මාඩු | හරකා |
| | ஆடு | - ආඩු | එළුවා |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙහි හඳුන්වා දී ඇති සතුන්ගේ නම් දෙමළ බසින් නිවැරදි ව උච්චාරණය කිරීමට සුදුසු ක්‍රියාකාරකම්වල යෙදවීම.
සිසුන් හය දෙනා බැගින් වූ කණ්ඩායම්වලට බෙදන්න. කුඩා පෙට්ටියක් තුළ සතුන්ගේ පින්තූර අඩංගු කාඩ්පත් දමන්න.

කොහා පරෙවියා

වවුලා ගවයා එළුවා

කණ්ඩායමෙන් එක් සිසුවකු නායකයා ලෙස ක්‍රියා කරන්න. නායකයා කණ්ඩායමේ එක් සිසුවකු දෙස බලා, එක් සතකුගේ නම මව්බසින් කී විට, එම සිසුවා ඉදිරියට විත්, සතුන්ගේ නම් අඩංගු පෙට්ටියෙන් අදාළ කාඩ්පත ගෙන, එම සතාගේ නම දෙමළ බසින් පන්තියට පවසා තමා සිටි ස්ථානයට ගොස් සිට ගත යුතු ය. පසුව නායකයා වෙන සිසුවකු පෙන්වා නායකයා බවට පත් කොට, ඔහු කණ්ඩායමේ සාමාජිකයකු ලෙස කණ්ඩායමට එකතුවිය යුතු ය. අලුත් නායකයා මුලින් නායකයා කළ ලෙසට ක්‍රියාකාරකම මෙහෙයවයි. කණ්ඩායමේ හැම කෙනාම නායකයා වනතුරු මෙය කරන්න.

නිපුණතාව
ශරීරයේ අවයව හා ඉගෙනුම් කාර්යයන් නිවැරදි ව ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
ගුරුවරයා ප්‍රකාශ කරන ශරීර අවයව තම සිරුර ඇසුරින් පෙන්වීමට අවස්ථාව ලබා දෙන්න.
එසේ පෙන් වනු ලබන ශරීර අවයවවල නම් දෙමළ බසින් නිවැරදි ව උච්චාරණය කිරීමට අවස්ථාව සලස්වන්න.
පහත දැක්වෙන අවයව නම් භාවිතයට ගන්න.

| | | |
|---|---|---|
| **கண்** | කන් | ඇස |
| **காது** | කාදු | කන |
| **வாய்** | වාය් | කට |
| **மூக்கு** | මූක්කු | නාසය |
| **வயிறு** | වයිරු | බඩ |
| **விரல்** | විරල් | ඇඟිල්ල |

ශරීර අවයවවල නම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාකාරකම සිසුන්ට නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.

සිසුන් පස් දෙනා බැගින් වූ කණ්ඩායම්වලට බෙදන්න. සෑම කණ්ඩායමකට මිනිස් සිරුරේ කොටස් පෙන්නුම් කර ඇති රූප සටහනක් ලබා දෙන්න.
කණ්ඩායමේ සිටින සෑම කෙනෙක් ම අනුපිළිවෙළට රූප සටහන ලබා ගෙන හඳුන්වා දුන් අවයව හයේ ම නම් නිවැරදි ව උච්චාරණය කළ යුතු වේ.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
නිවසේ දී එදිනෙදා භාවිත කරන භාණ්ඩ/උපකරණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
පන්ති කාමරයේ භාවිත කරන භාණ්ඩ කීපයක නම් සිංහලෙන් ද ඉන් අනතුරු ව දෙමළෙන් ද පවසන්නට ඉඩ සලසන්න. එමෙන් ම නිවසේ භාවිත කරන භාණ්ඩ/උපකරණ කීපයක් හඳුන්වා දී ඒවායේ නම් සිංහලෙන් ප්‍රකාශ කිරීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

මේ සඳහා පහත දැක්වෙන භාණ්ඩ/උපකරණ පන්තියේ දී ප්‍රදර්ශනය කරන්න. පොත, පැන්සල, පෑන, අඩිකෝදුව, මේසය, පුටුව, අල්මාරිය, බෝලය
මේවායේ නම් පළමුවන, දෙවන, තුන්වන ශ්‍රේණිවලදී දෙමළ බසින් හඳුන්වා දී ඇත. මේවා නැවත සිහිපත් කිරීම ප්‍රයෝජනවත් ය.
නිවසේ භාවිත කරන භාණ්ඩවල පින්තූර කීපයක් ප්‍රදර්ශනය කරන්න. ඒවායේ නම් ප්‍රකාශ කිරීමට මග පෙන්වන්න.
උදාහරණ :- ඇඳ, අල්මාරිය, කෝප්පය, පිඟාන, කොස්ස, බාල්දිය
මේවායේ නම් දෙමළ බසින් ප්‍රකාශ කිරීමට යොමු කරන්න. මුලින් ඊට සවන් දීමටත්, පසුව නිවැරදි ව උච්චාරණය කිරීමට උපදෙස් දෙන්න.

| | | |
|---|---|---|
| கட்டில் | කට්ටිල් | ඇඳ |
| அலுமாரி | අලුමාරි | අල්මාරිය |
| கோப்பை | කෝප්පෛ | කෝප්පය |
| பீங்கான் | පීංගාන් | පිඟාන |
| தும்புத்தடி | තුම්බුත්තඩි | කොස්ස |
| வாளி | වාලි | බාල්දිය |

භාණ්ඩවල පින්තූර එකිනෙක පෙන්වමින් ඒවායේ නම් දෙමළ බසින් කීමට මග පෙන්වන්න. සෑම සිසුවෙක් ම නිවැරදි ව උච්චාරණය කරන්නේ දැ යි අවධානය යොමු කරන්න.

නිපුණතාව
නිවසට පැමිණෙන නෑදැයින්ගේ ඥාතිත්වය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
ප්‍රථමයෙන් ම නිවසේ සිටින පවුලේ සාමාජිකයන්ගේ නෑකම් හඳුන් වන නාම සිහිපත් කර පැවසීමට අවස්ථාව ලබා දෙන්න.
වෙනත් ඥාතින්ගේ නෑකම් හඳුන් වන නම් නිවැරදි ව උච්චාරණය කර පැවසීමට අවස්ථාව ලබා දෙන්න.

පවුලේ සාමාජිකයන්ගේ නෑකම් මීට පෙර හඳුන්වා දී ඇත. ඒවා මතක් කර කීමට සිසුන් දිරි ගන්වන්න.
උදාහරණ :

| | | |
|---|---|---|
| அம்மா | අම්මා | අම්මා |
| அப்பா | අප්පා | තාත්තා |
| அக்கா | අක්කා | අක්කා |
| அண்ணா | අණ්ණා | අය්යා |
| தங்கை | තංගෛ | නංගී |
| தம்பி | තම්බි | මල්ලී |



Copyright © 2007 National Institute of Education - Sri Lanka.

මෙම වචන හොඳින් තහවුරු වූ පසු ඥාති නාම මුලින් සිංහල බසිනුත්, පසුව දෙමළ බසිනුත් හඳුන්වා දෙන්න.

| | | |
|---|---|---|
| ලොකු අම්මා | பெரியம்மா | පෙරියම්මා |
| ලොකු තාත්තා | பெரியப்பா | පෙරියප්පා |
| පුංචි අම්මා | சின்னம்மா | සින්නම්මා (සිත්ති) |
| බාප්පා | சிற்றப்பா | සිත්තප්පා |
| මාමා | மாமா | මාමා |
| නැන්දා | மாமி | මාමි |
| ආච්චි | பாட்டி | පාට්ටි |
| සීයා | பாட்டன் | පාට්ටන් (තාත්තා) |

හඳුන්වා දෙන ලද මෙම වචන හුරු වූ පසු භූමිකා රංගනයක සිසුන් යොදවන්න.

නිපුණතාව
සරල අකුරු යෙදුණු වචන ලියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
පහත දැක්වෙන වචන අඩංගු කාඩ්පත් සූදානම් කර ගන්න. සිසු කණ්ඩායම්වලට බෙදා දිය හැකි තරම් වචන කට්ටල ප්‍රමාණයක් සූදානම් කර ගන්න.

| | | |
|---|---|---|
| குடம் | කුඩම් | කළය |
| வயல் | වයල් | කුඹුර |
| முயல் | මුයල් | හාවා |
| கப்பல் | කප්පල් | නැව |
| பருப்பு | පරුප්පු | පරිප්පු |

වචන කාඩ්පත්වල තිබෙන වචන වෙන වෙන ම උච්චාරණය කරමින් කළුලෑල්ලේ ලියා දක්වන්න.
සෑම වචනයක් ම සිසුන් ලවා නිවැරදි ව උච්චාරණය කිරීමට සලස්වා නිවැරදි ව ලිවීමට යොමු කරන්න. මෙම වචන දෙමළ බසින් පමණක් ලිවීම ප්‍රමාණවත් ය.
අකුරුවල හැඩය, ප්‍රමාණය, දිශාව යන කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් ලියන්නේ දැයි සැලකිලිමත් වන්න. (ලිවීමේ දුෂ්කරතා දක්වන සිසුන්ට අවශ්‍ය උදවු ලබා දෙන්න)
සිසුන් කුඩා කණ්ඩායම්වලට බෙදන්න. වචන ලියන ලද කාඩ්පත් කට්ටල සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
සෑම වචනයක් ම සෑම සිසුවකුට ම ලිවිය හැකි පරිදි කාඩ්පත් හුවමාරු කර ගෙන වචන ලිවීමට යොමු කරන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

16 සිට 20 දක්වා අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
16 - 20 දක්වා අංක හඳුන්වා දෙන්න.
මේ සඳහා අවශ්‍ය අංක කාඩ්පත් සූදානම් කර ගන්න. කාඩ්පත් සකස් කිරීමේ දී වර්ණ පෑන් (ප්ලැටිග්නම්) භාවිත කරන්න.

| | | |
|---|---|---|
| பதினாறு | පදිනාරු | දහසය |
| பதினேழு | පදිනේළු | දාහත |
| பதினெட்டு | පදිනෙට්ටු | දහඅට |
| பத்தொன்பது | පත්තොන්බදු | දහනවය |
| இருபது | ඉරුපදු | විස්ස |

සෑම අංකයක් ම උච්චාරණය කරමින් කීමට අවස්ථාව ලබා දෙන්න.

ඉහත අංක හඳුන්වා දීමෙන් පසු සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. සිසුන් සංඛ්‍යාව වැඩි නම් කණ්ඩායම් සංඛ්‍යාව හතරකට බෙදන්න. කණ්ඩායම් දෙකක් අතර තරගයක් ආකාරයට මෙම ක්‍රියාකාරකම කළ හැකි ය.

කණ්ඩායම් දෙක දෙපැත්තකින් රඳවන්න.
කලින් සූදානම් කළ අංක කාඩ්පත් පෙට්ටියක බහාලන්න.
එක් කණ්ඩායමක් පෙට්ටියේ ඇති අංකය පෙන්වන විට අනෙක් කණ්ඩායමේ සාමාජිකයන් එම අංකය දෙමළ බසින් ප්‍රකාශ කළ යුතුයි. නිවැරදි පිළිතුරු දෙන සිසුන් අත්පුඩියක් ගසමින් අගයන්න. මෙසේ පෙට්ටියේ තිබෙන සෑම අංකයක් ම පෙන් විය යුතු අතර අනෙක් කණ්ඩායම පිළිතුරු දිය යුතු වේ.

අනතුරු ව ප්‍රශ්න කළ කණ්ඩායම පිළිතුරු දෙන කණ්ඩායම බවටත්, පිළිතුරු දුන් කණ්ඩායම ප්‍රශ්න කළ කණ්ඩායමටත් මාරු වී ඉහත ක්‍රියාකාරකමෙහි නිතර වීමට සලස්වන්න. ඔවුන් ද පෙර පරිදි ම අගය කරන්න.
මෙය කණ්ඩායම් දෙකක් අතර තරගයක් ආකාරයට පැවැත්වුව ද සෑම කණ්ඩායමකම සෑම සාමාජිකයකුට ම ප්‍රශ්න කිරීමටත්, පිළිතුරු දීමටත් අවස්ථාව ලබා දීම අවශ්‍ය වේ.

නිපුණතාව
10 සිට 50 දක්වා අගයන් 10න් දහයට වැඩි කරමින් නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
10, 20, 30, 40, 50 යන සංඛ්‍යා දෙමළ බසින් හඳුන්වා දීම සඳහා පහත දැක්වෙන අංක කාඩ්පත් සූදානම් කර ගන්න.

| | | |
|---|---|---|
| பத்து | පත්තු | දහය |
| இருபது | ඉරුපදු | විස්ස |
| முப்பது | මුප්පදු | තිහ |
| நாற்பது | නාට්පදු | හතළිහ |
| ஐம்பது | ඓම්බදු | පණහ |

මේ ඉලක්කම්වලට අදාළ කාඩ්පත් සකස් කර ගන්න. මෙම කොටස, ඉහත ක්‍රියාකාරකම කළ ලෙසට කළ හැකි ය. එසේ නොමැති නම් ළමයින්ටත් සිත් ඇඳ ගන්නා පරිදි වෙනත් ආකාරයට ද හඳුන්වා දිය හැක. එකම අවස්ථාවක මුළු පන්තියට ම ඉදිරිපත් කිරීමට ද හැකි ය.
මේ ආකාරයට කාඩ්පත් පහම පෙන්වමින් නිවැරදි ව උච්චාරණය කිරීමට මග පෙන්වන්න. සිසුන් සියලු දෙනාට ම අංක පහම නිවැරදි ව උච්චාරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

නිපුණතාව
පොදු ස්ථානවල දී තම අවශ්‍යතා ඉටු කර ගැනීමට තොරතුරු විමසයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
ප්‍රශ්න ඇසීමේ දී භාවිත වන වචන හඳුන්වා දෙමින් එම වචනවලට සවන් දී අවබෝධ කර ගෙන නිවැරදි ව උච්චාරණය කිරීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න. මෙවැනි වචන පළමු ව මව්බසින් හඳුන්වන්න.
මේ සඳහා සිසුන් රවුමට වාඩි කරවන්න.
ප්‍රශ්න ඇසීමේ දී භාවිතකරන වචන මව්බසින් හඳුන්වා දෙන්න.

| | |
|---|---|
| මොකක් ද/මොනව ද? | ඇයි ? |
| කොහේ ද? | කවු ද? |
| කොහොම ද? | කාට ද? |
| කවදා ද? | කීයක් ද? |

මෙම වචන දෙමළ බසින් හඳුන්වා දෙන්න.

| | | |
|---|---|---|
| என்ன? | එන්න? | මොකක් ද/මොනව ද? |
| எப்படி? | එප්පඩි? | කොහොම ද? |
| எப்போது? | එප්පෝදු? | කවදා ද? |
| ஏன்? | ඒන්? | ඇයි? |
| எத்தனை? | එත්තනෛ? | කීය ද?/කීයක් ද? |
| யார்? | යාර්? | කවු ද? |
| யாருக்கு? | යාරුක්කු? | කාට ද? |
| எங்கே? | එංගේ? | කොහේ ද? |

මෙම වචනවලින් බොහෝමයක් මීට පෙර හඳුන්වා දී ඇති වුව ද ඒවාට නැවතත් හොඳින් සවන් දීමටත් නිවැරදි ව උච්චාරණය කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
මෙම වචන භාවිත කරමින් ප්‍රශ්න ඇසීමට සුදුසු වාක්‍ය ප්‍රකාශ කිරීමට මග පෙන්වන්න.

උදාහරණ :- பெயர் என்ன? (නම මොකක් ද)
පෙයර් එන්න?

என்ன? - பெயர் என்ன?
எது? - ஊர் எது?
(ගම කොහේ ද)

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

ක්‍රියාකාරකම 2

ප්‍රශ්න හඳුන්වා දීමට ප්‍රථම මීට පෙර උගත් පොදු ස්ථාන කිපයක් මතක් කරන්න.

| | | |
|---|---|---|
| புகையிரத நிலையம் | පුගෙයිරද නිලෙයම් | දුම්රියපළ |
| நூலகம் | නූලහම් | පුස්තකාලය |
| வைத்தியசாலை | වෛත්තිය සාලෛ | රෝහල |
| தபாலகம் | තපාලහම් | තැපැල් කාර්යාලය |

පොදු ස්ථානවල නම් හඳුනා ගත් පසු ප්‍රශ්න ඇසීමට සලස්වන්න.

උදාහරණ :-

புகையிரத நிலையத்திற்குப் போவது எப்படி?
පුහයිරද නිලෙයත්තුක්කුප් පෝවදු එප්පඩි
දුම්රිය පළට යන්නේ කොහොම ද?

நூலகம் எத்தனை மணிக்கு திறக்கப்படும்?
නූලහම් එත්තනෙ මණික්කු තිරක්කප්පඩුම්
පුස්තකාලය අරින්නේ කීයට ද?

வைத்தியர் வருவது எத்தனை மணிக்கு?
වෛත්තියර් වරුවදු එත්තනෙ මණික්කු
වෛද්‍යවරයා එන්නේ කීයට ද

முத்திரை வாங்குவது எங்கே?
මුත්තිරෛ වාංගුවදු එංගේ
මුද්දර ගන්නේ කොහෙන් ද?

- ප්‍රශ්න අසන ආකාරය සිසුන්ට හුරු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
  පොදු ස්ථාන හැඳින් වෙන නම් හා ප්‍රශ්න ඇසීමට උදවු වන වචන සිසුන් කලින් ප්‍රගුණ කර ඇති බැවින් මෙම ප්‍රශ්න උච්චාරණය කිරීම අපේක්ෂා කෙරේ. මෙහි දී වැදගත් වන්නේ ප්‍රශ්න ඇසීම ප්‍රගුණ කර ගැනීමයි. ප්‍රතිචාර දැක්වීමට සුදුසු පිළිතුරු ලබා දෙන සිසුන් අගය කරන්න.
  අනෙක් සිසුන් සඳහා අවශ්‍ය උදවු ලබා දෙන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

නිපුණතාව
සරල කවි, ගී අංගචලන සහිත ව ගායනා කරයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම 1
පහත දැක්වෙන කවි ගී ගුරුවරයා පළමුව ගායනා කරන්න. එම ගීතය/ගී සිසුන්ට සවන් දීමට සලස්වා පසුව ගුරුවරයා සමඟ එක්ව ගායනා කිරීමට යොමු කරන්න.
කුඩා කණ්ඩායම් වශයෙන් මෙම ගීතය නිවැරදි ව උච්චාරණය කරමින් ගායනයට සලස්වන්න.
මේ සඳහා සිසුන්ට එම ගීත කියවිය හැකි ආකාරයට ඔවුන්ගේ මව්බසින් එම ගීත ලියා ප්‍රදර්ශනය කරන්න. ගීතවලට සුදුසු අංගචලන සහිත ව තාලානුකූල ව ගායනා කිරීමට මග පෙන්වන්න. මෙහි දී ආදේශ භාණ්ඩ භාවිත කිරීමෙන් වඩාත් වින්දනාත්මක ගැයීමට හැකි ය.

1. මුහුදු වෙරළ
2. අන්න බලන්
3. පැද්දෙන බැලූන්

1. මුහුදු වෙරළ (කඩට්කරෛ)

| | | |
|---|---|---|
| கடல் ஓரம் கரையாம் | කඩලෝරම් කරෛයාම් | මුහුද අයිනෙ වෙරළක් |
| கரை மேலே வீடாம் | කරෛ මේලේ වීඩාම් | වෙරළෙ තියෙන ගෙදරක් |
| வீட்டு மேலே விளக்காம் | වීට්ටු මේලේ විලක්කාම් | ගෙදර උඩින් පහනක් |
| விளக்கு வீசும் ஒளியாம் | විලක්කු වීසුම් ඔලියාම් | පහනින් එන එළියක් |
| | | |
| ஒளி பார்த்து கப்பல் | ඔලි පාර්ත්තු කප්පල් | එළිය දකින නැව |
| ஓடி விரைந்து வருமாம் | ඕඩි විරෛන්දු වරුමාම් | හනික ඇදෙයි ගොඩ |
| நெளிந்து வரும் அலைமேல் | නෙලින්දු වරුම් අලෛමේල් | නැගි එන රැල්ල උඩින් |
| நீந்திக் கப்பல் வருமாம் | නීන්දික් කප්පල් වරුමාම් | පාවී එයි නැව |

(වෙ නල්ලතම්බි)

2. අන්න බලන් (අදෝ පාරායි)

| | |
|---|---|
| குதித்துக் குதித்தே ஓடும் | කුදිත්තුක් කුදිත්තේ ඕඩුම් |
| குதிரை அதோ பாராய் | කුදිරෛ අදෝ පාරායි |
| | |
| அசைந்து அசைந்து செல்லும் | අසෛන්දු අසෛන්දු සෙල්ලුම් |
| ஆனை இதோ பாராய் | ආනෛ ඉදෝ පාරායි |
| | |
| பறந்து பறந்து போகும் | පරන්දු පරන්දු පෝකුම් |
| பருந்து அதோ பாராய் | පරුන්දු අදෝ පාරායි |
| | |
| நகர்ந்து நகர்ந்து செல்லும் | නහර්න්දු නහර්න්දු සෙල්ලුම් |
| நத்தை இதோ பாராய் | නත්තෛ ඉදෝ පාරායි |
| | |
| தத்தித் தத்திப் போகும் | තත්තිත් තත්තිප් පෝකුම් |
| தவளை அதோ பாராய் | තවලෛ අදෝ පාරායි |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

துள்ளித் துள்ளி நாமும் — තුල්ලිත් තුල්ලිත් නාමුම්
பள்ளி செல்வோம் வாராய் — පල්ලි සෙල්වෝම් වාරායි

அழ வள்ளியப்பா (අල වල්ලියප්පා)

පැන පැන දුවයන - අශ්වය අර බලන්
පැද්දි පැද්දි යන - අලියා දෙස බලන්
ඉගිලි ඉගිලි යන - උකුසා දෙස බලන්
ඇදි ඇදී යන - ගොලු බෙල්ලා මේ බලන්
පැන පැන දුව යන - ගෙම්බා අන්න බලන්
සතුටින් දුව පැන - පාසල් යමු දැන්

3. ஆடுகின்ற பலூன்கள் - (ආඩුහින්ඩ්‍රු බැලූන්) පැද්දෙන බැලූන්

| | | |
|---|---|---|
| அதோ பார் அதோ பார்<br>அழகழகாய் பலூன்கள்!<br>அதோ பார் காற்றினிலே<br>ஆடுகின்ற பலூன்கள்! | අදෝ පාර් අදෝ පාර්<br>අලහලකායි බැලූන්ගල්<br>අදෝ පාර් කාට්රිනිලේ<br>ආඩුහින්ර බැලූන්ගල් | අන්න බලන්, අන්න බලන්<br>හරි ලස්සන බැලූන්<br>අන්න බලන්, සුළඟේ<br>නැලවෙන ඒ බැලූන් |
| மூச்சடக்கி ஊதி வைத்த<br>மொட்டைத் தலை பலூன்கள்!<br>பேச்சடக்கி ஊத ஊத<br>பெருத்து வரும் பலூன்கள்! | මූච්චඩක්කි ඌදිවෛත්ත<br>මොට්ටෛත්තලයි බැලූන්ගල්<br>පේච්චඩක්කි ඌද ඌද<br>පෙරුත්තුවරුම් බැලූන්ගල් | බඩේ හුළං පිරුණු<br>බෝල බෝල බැලූන්<br>පිඹින පිඹින තරමට<br>පිම්බෙනවා බැලූන් |
| மஞ்சள் நிறம் சிவப்பு நிறம்<br>பழுப்பு நிறப் பலூன்கள்!<br>உச்சி வரை ஊத ஊத<br>உடல் வெடிக்கும் பலூன்கள்! | මඤ්ජල් නිරම් සිවප්පුනිරම්<br>පලුප්පුනිරප් බැලූන්ගල්<br>උච්චිවරෛ ඌද ඌද<br>උඩල්වෙඩික්කුම් බැලූන්ගල් | කොළ පාටයි, රතු පාටයි<br>දිලිසෙනවා බැලූන්<br>සුළං ගොඩක් පිම්බෝතින්<br>පිපිරෙනවා බැලූන් |

- செல்ல கலைபதி

නිපුණතාව
තම සමීපතමයන් සමඟ මූලික තොරතුරු පිළිබඳ සංවාදයේ යෙදෙයි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය
ක්‍රියාකාරකම
සිසුන් එළිමහනට කැටුව ගොස් දෙදෙනා බැගින් කණ්ඩායම් වී තම තොරතුරු මව්බසින් විමසීමේ සංවාදයක යොදවන්න.
එහි දී අසනු ලබන ප්‍රශ්න කීපයක් සුවිශේෂ කර ප්‍රකාශ කිරීම. පසුව එම ප්‍රශ්න දෙමළ බසින් අසන ආකාරය ගුරුවරයා හඳුන්වා දෙන්න. මෙහි දී එම වාක්‍ය සඳහා (දෙමළෙන් ලියා ගත්) තීරු කාඩ්පත් භාවිත කළ හැක.
සිසුන්ට මෙම වාක්‍යවලට සවන් දීමට සලස්වා පසුව නිවැරදි ව උච්චාරණය කරමින් පැවසීමට යොමු කරන්න. සිසුන්ට වාක්‍ය හොඳින් හුරු වන තුරු කීපවතාවක් ම කියවන්න.
සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර දෙමළ බසින් සංවාදයේ යෙදීමට යොමු කරන්න. මෙහි දී අවශ්‍ය තැන්වල දී පෙර ශ්‍රේණිවල දී උගත් ප්‍රශ්න ද භාවිත කිරීමට ඉඩ සලස්වන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

උදාහරණ :-

உங்கள் பெயர் என்ன?
ඔයාගේ නම මොකක් ද? (කලින් ශ්‍රේණිවල දී ඉගෙන ගෙන ඇති)
උංගල් පෙයර් එන්න?

நீங்கள் எத்தனையாம் வகுப்பில் படிக்கிறீர்கள்?
ඔයා ඉගෙන ගන්නේ මොන පන්තියේ ද?
නීංගල් එත්තනයාම් වහුප්පිල් පඩික්කිරීර් කල්?

உங்கள் பாடசாலையின் பெயர் என்ன?
ඔයාගේ පාසලේ නම මොකක් ද?
උංගල් පාඩසාලෙයින් පෙයර් එන්න?

உங்களுக்கு எத்தனை வயது?
ඔයාගේ වයස කීය ද?
උංගලුක්කු එත්තනෙ වයදු ?

உங்களுக்கு எத்தனை சகோதர சகோதரிகள்?
ඔයාට සහෝදර සහෝදරියෝ කීදෙනෙක් ඉන්නව ද?
උංගලුක්කු එත්තනෙ සහෝදර සහෝදරිකල්?

(මෙම ප්‍රශ්න අතර තුර දී සිසුන්ගේ හැකියාව අනුව සුදුසු පිළිතුරු දීමට දිරි ගන්වන්න.)
මුලින් ප්‍රශ්න කළ සිසුවා පිළිතුරු දෙන්නා ලෙසත් පිළිතුරු දුන් සිසුවා, ප්‍රශ්න කරන්නා ලෙසත් මාරුවෙන් මාරුවට සියලු ම සිසුන් ප්‍රශ්න ඇසීමේ ක්‍රියාකාරකමේ යොදවන්න.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

තක්සේරු කිරීමේ පරිමාණය
සාර්ථකව කරයි ✓
දුෂ්කරතා පෙන්නුම් කරයි/
තව දුරටත් උදවු අවශ්‍යයි •

| සිසුන්ගේ නම් | | | |
|---|---|---|---|
| 1. ආරම්භයේ සිට අවසානය තෙක් වැඩක නියැලෙයි. | | | |
| 2. උදව් අවශ්‍ය අවස්ථා හැඳිනගෙන උදවු කරයි. | | | |
| 3. පොදු වස්තූන් පරිහරණය කරයි ආරක්ෂා කරයි. | | | |
| 4. තාලානුකූල ව ගායනයෙහි යෙදෙයි. | | | |
| 5. චරිත නිරූපණවල යෙදෙයි. | | | |
| 6. නිර්මාණශීලී ව කාර්යයක නියැලෙයි. | | | |
| 7. පාසලේ කටයුතුවල දී අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. | | | |
| 8. යමක් කිරීමට කැමැත්තෙන් ඉදිරිපත් වෙයි. | | | |
| 9. ගුරුවරුන්ට ගෞරව කරයි. ආචාරශීලී ව කතා කරයි. | | | |
| 10. භාවිතයට ගන්නා උපකරණ නිසි පරිදි පරිහරණය කරයි. ආරක්ෂා කරයි. | | | |
| 11. අත්හදා බැලීම් කරයි. | | | |
| 12. සරල පරීක්ෂණවල යෙදෙයි. | | | |
| 13. පුවත්පත් ගුවන්විදුලිය හා රූපවාහිනිය මඟින් ලබා ගන්නා ආරංචි පන්තියේ ප්‍රකාශ කරයි. | | | |
| 14. නායකත්වයට ගරු කර කටයුතු කරයි. | | | |
| 15. තමන්ගේ දේ මෙන් ම අන්‍යයන් ද අගය කරයි. | | | |
| 16. ස්වයං ඉගෙනුමට පෙළඹෙයි. | | | |
| 17. තම අදහස් හා හැඟීම් චිත්‍ර මගින් ප්‍රකාශ කරයි. | | | |
| 18. ද්‍රව්‍ය ආශ්‍රිත ව නිර්මාණ කරයි. | | | |
| 19. අන්‍යයන් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි. | | | |
| 20. සංචලන ක්‍රියාකාරකම්වල යෙදෙයි. | | | |
| 21. ආදේශ භාණ්ඩ යොදා ගනිමින් සමූහ වාදනයෙහි යෙදෙයි. | | | |
| 22. පාරිසරික සම්පත් යොදා ගනිමින් නිර්මාණවල යෙදෙයි. | | | |
| 23. යොමු කරන දළ සැලැසුමක් යටතේ දළ ආකෘති නිර්මාණය කරයි. | | | |
| 24. මැහුම් ගෙතුම් ඇසුරෙන් නිර්මාණය කරයි. | | | |
| 25. හැඟීම් හා අදහස් චිත්‍ර මගින් ප්‍රකාශ කරයි. | | | |
| 26. රටා හා මෝස්තර නිර්මාණ කරයි. | | | |
| 27. ඇවිදීම දිවීම් පැනීම් ආශ්‍රිත ක්‍රීඩාවල යෙදෙයි. | | | |
| 28. පන්දු ඇල්ලීම හා විසිකිරීම් ආශ්‍රිත ක්‍රීඩාවල යෙදෙයි. | | | |
| 29. තම අවශ්‍යතා සඳහා දෙමළ බසින් සරල ඉල්ලීම් කරයි. | | | |
| 30. දෙනු ලබන සරල විධානවලට දෙමළ බසින් ප්‍රතිචාර දක්වයි. | | | |
| 31. ආහාරපානවල නම් දෙමළ බසින් නිවැරදි ව භාවිත කරයි. | | | |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 5.0 සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

## 5.1 හැඳින්වීම

ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් සඳහා ඵලදායී වූ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරුවරුන්ට, සිසුන් ඉගෙනීමේ දී පෙන්නුම් කරන දුෂ්කරතාවයන් හා දක්ෂතා පිළිබඳ ව සුවිශේෂී අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව පන්තියේ සිටින සියලු ම සිසුන්ට ගැළපෙන ආකාරයට ඉගෙනුම් ක්‍රම සංවිධානය කළ හැකි ය. මේ පුළුල් අරමුණෙන් යුතුව පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව නිරන්තරයෙන් තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් හඳුන්වා දිය හැකි ය. සිසුන් තක්සේරු කිරීමේ විවිධ පරමාර්ථ තිබේ. ස්ථාපන කාර්යයන්, අනාවරණ කාර්යයන්, උපදේශන කාර්යයන්, සහතික පත් ප්‍රදානය කිරීම හා පර්යේෂණ කාර්යයන් මෙහි දී ප්‍රධාන වේ. එහෙත් ප්‍රාථමික ශ්‍රේණිවල දී තක්සේරු කිරීම ප්‍රධාන වශයෙන් ම අනාවරණය හා උපදේශනය යන කරුණු මුල් කර ගෙන ක්‍රියාත්මක වේ. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් ඉගෙනීමේ දී බොහෝ ගැටලු පෙන්නුම් කරයි. ගුරුවරුන් උගන්වන අතරතුර ඒවා හොඳින් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබා දීම අවශ්‍ය ය. තම පන්තියේ සිටින එක් එක් සිසුවා සුවිශේෂී ලෙස මුහුණපාන ගැටලු හඳුනාගෙන ඒ එක් එක් සිසුවාට ගැළපෙන ආකාරයට ඉගෙනුම් කටයුතු සංවිධානය කිරීම මෙමඟින් පහසුවනු ඇත. ඒ මඟින් සෑම සිසුවකුම විෂයමාලාවෙන් අපේක්ෂිත නිපුණතා කරා කැටුව යාමට ගුරුවරුනට පුලුවන. සිසුන් පළමුවැනියා දෙවැනියා වශයෙන් තරා කිරීම හෝ දක්ෂ සිසුන් හා දුර්වල සිසුන් වශයෙන් වර්ග කිරීම හෝ වැනි කරුණු ප්‍රාථමික ශ්‍රේණිවල දී තක්සේරු කිරීමේ පරමාර්ථ නොවේ.

## 5.2 සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමශිල්ප

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමශිල්ප ප්‍රධාන කරුණු දෙකක් යටතේ හඳුන්වා දිය හැකි ය.

### 5.2.1 සිසු ප්‍රගතිය විධිමත් ලෙස තක්සේරු කිරීම

ඉගැන්වීමේ ක්‍රියාවලිය තාවකාලික ව නතර කොට පූර්ව සූදානමකින් හා සැලසුමකින් යුතු ව මුළු අවධානයම ඒ කෙරෙහි යොමු කොට කරනු ලබන තක්සේරු කිරීම විධිමත් තක්සේරු කිරීම වශයෙන් හැඳින්විය හැකි ය. ඒ යටතේ විධිමත් පරීක්ෂණ හා ක්‍රියාකාරකම් සකස් කර භාවිත කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ප්‍රාථමික ශ්‍රේණිවල උගන්වන ගුරුවරුන්ගේ ප්‍රයෝජනය පිණිස සකසා ඇති විධිමත් පරීක්ෂණ සකස් කිරීම පිළිබඳ උපදෙස් සංග්‍රහය භාවිතයට ගත හැකි ය.

### 5.2.2 සිසු ප්‍රගතිය අවිධිමත් ලෙස තක්සේරු කිරීම.

සිසුන් ඉගෙනීමේ යෙදී සිටින අතරතුරම ඊට බාධා නොවන ආකාරයෙන් තොරතුරු රැස් කිරීම මෙහි දී සිදු කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්න කිරීම, සිසුන් සමඟ තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ සාකච්ඡා කිරීම, සිසුන් වැඩෙහි නිරත ව සිටින අතරතුර ඔවුන්ගේ වැඩ නිරීක්ෂණය කර තොරතුරු ලබා ගැනීම, සිසුන්ගේ ගෙදර වැඩ ඇගයීමට ලක් කිරීම වැනි ක්‍රමශිල්ප භාවිත කරනු ලැබේ. මෙහි දී ගුරුවරයාගේ වෘත්තියභාවය අතිශයෙන් වැදගත් වේ. ගුරුවරයා ගනු ලබන විනිශ්චයන් වඩාත් නිවැරදි ව ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතු ව කටයුතු කිරීම අවශ්‍ය ය. අවිධිමත් ක්‍රමශිල්ප මඟින් සිසුන් පිළිබඳ ව විස්තරාත්මක වූත් ගුණාත්මක වූත් තොරතුරු ලැබෙන හෙයින් ඒවා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වඩාත් ඵලදායී ලෙසයොදා ගත හැකි වනු ඇත.

සිසුන් පිළිබඳ ව ගුරුවරුන් අවිධිමත් ලෙස ගන්නා තීරණවල වලංගුතාවය ද ඉතා ඉහළ බව බොහෝ පර්යේෂණ මඟින් අනාවරණය වී ඇත.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 5.3 තක්සේරු කිරීමේ විවිධ ස්වරූපයන්

තක්සේරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී සිදු කළ හැකි ය. ඒ අනුව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සම්පිණ්ඩිත තක්සේරු කිරීම හා සම්භවන තක්සේරු කිරීම යනුවෙන් වර්ග කළ හැකි ය.

සම්පිණ්ඩිත තක්සේරු කිරීම :-

ඉගෙනුම් අදියරක් අවසානයේ යම් ඉගෙනුම් කොටසක් කොතෙක් දුරට සාධනය කර ගෙන ඇත් ද යන්න පරීක්ෂා කිරීම සම්පිණ්ඩිත තක්සේරු කිරීම යනුවෙන් අදහස් කෙරේ. ඒ අනුව අවුරුද්දක්/වාරයක්/ඒකකයක් අවසානයේ එම අවුරුද්ද/වාරය/ඒකකය තුළ උගන්වන ලද විෂය කරුණු පාදක කර ගෙන සකස් කළ ප්‍රශ්න පත්‍රයක් මගින් සිසුන් ලබා ඇති ප්‍රගතිය තක්සේරු කළ හැකි ය. නමුත් මෙවැනි තක්සේරු කිරීමක් ප්‍රාථමික ශ්‍රේණි සඳහා වඩාත් යෝග්‍ය යැයි නිර්දේශ කිරීම අපහසු ය.

සම්භවන තක්සේරු කිරීම :-

යම් ඉගෙනුම් අදියරක් අතරතුර දී නිරන්තරයෙන් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ ව සොයා බැලීම සම්භවන තක්සේරු කිරීම යනුවෙන් අදහස් කෙරේ. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්, ඉගෙනීමේ දී මුහුණ දෙන ගැටලුවලට ඉතාමත් ප්‍රායෝගික විසඳුම් ලබා දීම අත්‍යවශ්‍ය ය. එසේ නැතහොත් සිසුන් ලබන අසාර්ථකත්වයන් ඔවුන් තව දුරටත් පසුබට සිසුන් බවට පත් කිරීමට හේතු වේ. එහෙයින් සිසුන් පිළිබඳ නිරන්තරයෙන් සොයා බැලීම ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් සැලකිය යුතු ය.

ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වනුයේ නිර්ණායක මූලික තක්සේරු කිරීම් වේ. මෙහි දී ගුරුවරයා විසින් භාවිත කරනු ලබන අවිධිමත් ක්‍රමවේදයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

විෂයමාලාවේ අන්තර්ගතය හා නිපුණතා අනුව සකස් කරගත් නිර්ණායක කරා සිසුන් ළඟා වී තිබේ ද යන්න පරීක්ෂා කිරීම නිර්ණායක මූලික තක්සේරු කිරීමයි. මේ සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස නිර්ණායක මූලික ව සකස් කර ඇති තක්සේරු පත්‍රිකා ප්‍රාථමික අවධිය සඳහා යෝජිත ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි අන්තර් ගත කර ඇත. මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි මව්බස සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන් සඳහා තක්සේරු පත්‍රිකා ඒ ඒ විෂය කොටස් අවසානයේ ඇතුළත් කර ඇති අතර පොදු තක්සේරු කිරීමේ පත්‍රිකාවක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇත. තව ද ගණිතය විෂය සඳහා සකස් කර ඇති තක්සේරු පත්‍රිකාව ගණිතය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අවසානයේ ඇතුළත් කර ඇත.

පහත දක්වා ඇත්තේ ගණිතය, මව්බස හා පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන්ට අදාළ ව සකස් කළ තක්සේරු කිරීමේ නිර්ණායක සඳහා නිදසුන් කිහිපයකි.

ගණිතය - ඉලක්කම් හතර නොඉක්මවූ සංඛ්‍යා දෙකක් ගෙන යාම ස්ථාන දෙකක් පමණක් සහිත ව එකතු කරයි.

මව්බස - නිවේදනයකට සවන් දී වැදගත් කරුණු ප්‍රකාශ කරයි.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - මිශ්‍ර ආහාර වේලක් ගැනීමේ ඇති වැදගත්කම ප්‍රකාශ කරයි.

දෙවන ජාතික භාෂාව - ආහාරපානවල නම් නිවැරදි ව භාවිත කරයි.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 5.4 කාර්ය සාධන ගොනුව

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ඉතාම ඵලදායී ක්‍රමයක් ලෙස කාර්ය සාධන ගොනු සලකනු ලැබේ. සිසුන් ඉගෙනීමේ දී මුහුණු දෙන ගැටලු ඔවුන් තුළ තිබෙන දක්ෂතා අඛණ්ඩව ඇගයීමේ ක්‍රමයක් වශයෙන් මෙය වැදගත් වේ. ප්‍රාථමික ශ්‍රේණිවල බොහෝ ගුරුවරු එක් එක් සිසුවාගේ වැඩ වෙන වෙන ම ගොනුවල එකතු කිරීම පුරුද්දක් වශයෙන් කරනු ලැබේ. නමුත් කාර්ය සාධන ගොනුව මෙයට වඩා ඉදිරියට ගිය ක්‍රියාවලියක් සේ සලකනු ලැබේ. ඒ අනුව කාර්ය සාධන ගොනුව

සිසුවාගේ දක්ෂතා මෙන් ම ඔහු ඉගෙනීමේ දී මුහුණපාන ගැටලු නිරූපණය වන ආකාරයට ඉතා අර්ථාන්විත ලෙස සකස් කළ සිසුවාගේ වැඩ එකතුවක් ලෙස සලකනු ලැබේ. එය සිසුවා පිළිබඳ ව පැහැදිලි අදහසක් දක්වන දෙයක් විය යුතු ය. කාර්ය සාධන ගොනු පිළියෙල කිරීම ගුරුවරයාගෙන් ගුරුවරයාට වෙනස් විය හැකි ය. නිශ්චිත ක්‍රමයක් දැක්වීම අසීරුය. නිර්මාණාත්මක ගුරුවරයකුට තමාගේ ම ක්‍රමයක් අනුගමනය කරමින් ඉතා උසස් මට්ටමේ කාර්ය සාධන ගොනුවක් සකස් කළ හැකි ය. කාර්ය සාධන ගොනුවකට ඇතුළත් කළ හැකි දේ මොනවා ද? බොහෝ දුරට ඒවා සිසුන්ගේ වැඩවල නියැදි, ලියු ලේඛන, විසඳන ලද ගණිත ගැටලු, අඳින ලද චිත්‍ර, කරන ලද නිර්මාණ විය හැකි ය. එසේ ම ගුරුවරයා විසින් ලියන ලද කෙටි සටහන් ද එයට ඇතුළත් කළ හැකි ය.

## 5.5 කෙටි සටහන් ලිවීම හා පිරික්සුම් ලැයිස්තු භාවිත කිරීම

සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනීමේ ගැටලු හඳුනා ගැනීමේ දී එක් එක් සිසුවා පිළිබඳ ව ගුරුවරයාට ප්‍රයෝජනවත් වන තොරතුරු කෙටි සටහන් වශයෙන් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වේ. පන්තියේ උගන්වන අතරතුර දී සිසුන් පිළිබඳ ව තොරතුරු සමුදායක් ගුරුවරුන්ට ලැබේ. නමුත් මෙම තොරතුරු අර්ථාන්විත ලෙස ප්‍රයෝජනයට ගැනීමක් බොහෝ විට සිදු නොකෙරේ. එම නිසා සිසුන් පිළිබඳ ව අනාවරණය කරගන්නා තොරතුරු පොතක කෙටි සටහන් වශයෙන් තබාගෙන ඒවා අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

පිරික්සුම් ලැයිස්තු භාවිතය ද එසේ ම ප්‍රයෝජනවත් වන තවත් ක්‍රමයකි. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇති නිර්ණායක කරා සිසුන් ළඟා වී තිබේ දැයි තීරණය කිරීම සඳහා එවැනි පිරික්සුම් ලැයිස්තු ද උපයෝගී කර ගත හැකි ය.

## 5.6 තක්සේරු කිරීමේ පත්‍රිකා හා ඒවා ප්‍රයෝජනයට ගැනීම

රැස් කරනු ලබන තොරතුරු වාර්තා කිරීම සඳහා යොදා ගත හැකි පත්‍රිකාවල ආකෘති හතරක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්හි ඇතුළත් කර ඇත. ඒවා මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ පොදු තක්සේරු පත්‍රිකා ලෙස නම් කර ඇත.

ඒවායේ එක් එක් සිසුවාගේ නම ඉදිරියෙන් එක් එක් ඉගෙනුම් ඵලය සඳහා එක් කොටුව බැගින් වෙන් කර ඇත. සිසුන් ඒ ඒ ඉගෙනුම් ඵලය කරා ළඟා වී තිබේ ද නැති ද යන්න, පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සටහන් කළ යුතු ය. පොදු තක්සේරු පත්‍රිකාවේ තක්සේරු කිරීමට භාජනය කළ යුතු බොහෝ "ඉගෙනුම් ඵල" වසර පුරාම සොයා බැලිය යුතු අයුරින් විහි දී ඇත. එක් ඉගෙනුම් ඵලයක් වාර තුනෙහි ම පරීක්ෂා කිරීම සඳහා දී ඇති කොටුව වෙන් කර භාවිතයට ගන්න.

එක් එක් සිසුවා සම්බන්ධයෙන් එක් එක් ඉගෙනුම් ඵලය යටතේ ඔබ රැස් කළ තොරතුරු ඇසුරෙන් පහත සඳහන් ආකාරයට සංකේත යෙදීමෙන් වාර්තා කළ හැකි ය.

| තීරණය | සංකේතය |
|---|---|
| සාර්ථක ව කරයි | √ |
| දුෂ්කරතා පෙනුම් කරයි/තව දුරටත් උදවු අවශ්‍යයි | · |

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

යම් ඉගෙනුම් ඵලයක් සම්බන්ධයෙන් සිසුවෙක් සාර්ථකත්වය පෙන්නුම් කරන්නේ ද යන්න ගුරුවරයකු විසින් තීරණය කරනු ලැබීම සඳහා අදාළ ඉගෙනුම් ඵලයට ගැළපෙන පරිදි තමා ම සකස් කර ගත නිර්ණායක උපයෝගී කර ගැනීමට හැකි ය.

## 5.7 අනාවරණය හා ප්‍රතිකාර්ය

අවිධිමත්-සම්භවන තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රධාන අරමුණක් වන්නේ අනාවරණයයි.

යම් සිසුවකු සඳහා තක්සේරු පත්‍රයේ " · " සලකුණ යොදා ඇති සෑම අවස්ථාවක් කෙරෙහි ම ගුරුවරයාගේවිශේෂ අවධානය යොමු විය යුතු ය. සිසුවා මුහුණ දෙන දුෂ්කරතා හඳුනා ගෙන ඒවාට පිළියම් යොදා නැවත තක්සේරු කිරීමට භාජන කළ යුතු ය. එම " · " සංකේතය " √" සංකේතයක් බවට වෙනස් කිරීමට හැකි වන තෙක් මෙම ක්‍රියාවලිය දිගට ම සිදු කිරීම ගුරුවරුන්ගේ වගවීමයි.

හඳුනා ගනු ලබන ඉගෙනුම් දුෂ්කරතා මග හැර වීම පිණිස එක් එක් අවස්ථාවට ගැළපෙන පරිදි සුවිශේෂ ප්‍රතිකාර්ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සම්පාදනය කිරීම ද වැදගත් ය. මේවා එක් එක් සිසුවා පෙන්නුම් කරන ඉගෙනුම් දුෂ්කරතා අනුව තීරණය විය හැකි ය.

එමෙන් ම යම් ඉගෙනුම් අභිමතාර්ථයක් කෙරෙහි පන්තියේ සිසුන් වැඩි දෙනකු "·" සංකේත ලබා ඇත්නම් එසේ වීමට බලපෑ හේතු රාශියක් තිබිය හැකි ය. ඒවා හඳුනා ගෙන සුදුසු ක්‍රියාමාර්ග ඇසුරින් සිසුන් අවශ්‍ය ඉගෙනුම් ඵල කරා ගෙන ඒම ගුරුවරයාගේ වගකීමකි.

## 5.8 වෙනත් කරුණු

- එක් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය තවත් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය සමඟ සැසඳීමෙන් අධ්‍යාපනික වශයෙන් වැදගත් වූ තීරණ ලබා ගැනීම අසීරුය. එම නිසා සිසු-සිසු සාධන සැසඳීමෙන් වළකින්න.
- එක් සිසුවකුගේ වර්තමාන සාධන මට්ටම එම සිසුවාගේ ම පූර්ව සාධන මට්ටම් සමඟ සැසඳීමෙන් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි හෙයින් ඒ පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය. එසේ ම විෂයමාලාවේ අපේක්ෂණ කරා කොතරම් ළඟා වී ඇත්දැයි සොයා බැලිය යුතු ය.
- තමාගේ පන්තියේ සිටින සිසුන්ට ගැළපෙන ආකාරයට පන්තිය භාර ගුරුවරයාම තක්සේරු උපකරණ සකස් කිරීමට සමත් විය යුතු ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

# 6.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

## 6.1 හැඳින්වීම

නිපුණතාවක් යනුවෙන් මෙහි අදහස් කෙරෙනුයේ දැනුම, කුසලතා, ආකල්ප හා වටිනාකම්වල සංකීර්ණ සංකලනයකට ය. විවිධ ආකාරයේ නිපුණතා තිබිය හැකි ය. සමහර නිපුණතා කුසලතා දිශාවට වැඩියෙන් බර වූ ඒවා වන අතර තවත් සමහරක් දැනුම හෝ ආකල්ප දිශාවන්ට වැඩියෙන් බර වූ ඒවා වීමට ඉඩ ඇත.

දෙවන ප්‍රධාන අවධිය අවසන් කරනු ලබන සිසුන් ඒ අවධිය සඳහා නිර්දේශිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණත්වය ලබා ගෙන ඇතැයි තහවුරු කිරීමක් කළ යුතු බව ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා සැලැස්මෙහි සඳහන් කර ඇත. පැහැදිලි ව අවබෝධ කර ගත යුතු කරුණු කිහිපයක් මෙම ප්‍රකාශයේ ඇතුළත් ව ඇත.

එනම්

- අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
- පළමුවන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනාවා ද?
- ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
- නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

මේ එක එකක් පිළිබඳ ව විස්තර වශයෙන් විමසා බලමු.

## 6.2 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

විෂයමාලාවක් සංවර්ධනය කිරීමේ දී එහි අන්තර්ගතය තීරණය කිරීමට වැදගත් ස්ථානයක් හිමි වේ. විවිධ හැකියා මට්ටම්වල සිටින සිසුන්ට ගැළපෙන පරිදි සරල මෙන් ම සංකීර්ණ නිපුණතා, විෂයමාලාවක් තුළ සාමාන්‍යයෙන් ඇතුළත් කරනු ලැබේ.

එක් එක් ප්‍රධාන අවධිය අවසන් කිරීමට ප්‍රථම අදාළ ශ්‍රේණිවල සෑම සිසුවකු ම පාහේ අනිවාර්යයෙන් ම ඉහළ මට්ටමක දක්ෂතා ප්‍රදර්ශනය කළ යුතු නිපුණතා සමූහයක් විෂයමාලා අන්තර්ගත තුළ අඩංගුව ඇත. සෑම සිසුවකුම විසින් ප්‍රගුණ කළ යුතු යැයි අපේක්ෂා කරන මෙම නිපුණතා අප අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලෙස හඳුන්වනු ලැබේ.

මේ අනුව අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ගණයට අයත් වනුයේ

- ඉගෙනුම තව තදුරටත් ගොඩ නැගීමට හා පවත්වා ගෙන යෑමටත්,
- යහපත් පුරවැසියකු ලෙස සාර්ථක ව ජීවත් වීමටත් අනිවාර්යයෙන් ම අවශ්‍ය නිපුණතා වේ.

සැමට අධ්‍යාපනය ලබා දීමේ සම්මුතිය යටතේ සියලු ම සිසුන් තුළ අඩුම වශයෙන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වර්ධනය කරවීමට අප බැඳී ඇත.

පන්තියේ සියලු ම සිසුන් ගෙන ආ යුතු ඉහළතම ප්‍රාප්ති මට්ටම ලෙස අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කිසි විටෙකත් සැලකිය යුතු නොවේ. වඩා දක්ෂ සිසුන් විසින් වර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කරන එහෙත්, සියලු ම සිසුන් සඳහා අත්‍යවශ්‍ය යැයි නොසැලකෙන ඉහළ මට්ටමේ නිපුණතා සමූහයක් ද විෂයමාලා අන්තර්ගතයන් තුළ ඇත. ඒවා අභිමත ඉගෙනුම් නිපුණතා ලෙස හැඳින්වේ.

ගුරුවරයාගේ අරමුණ විය යුත්තේ පන්තියේ සෑම සිසුවකු තුළ ම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඉහළ මට්ටමකට වර්ධනය කරන අතර, සිසුන් වැඩිදෙනකු තුළ අභිමත ඉගෙනුම් නිපුණතා වර්ධනය කිරීමට පියවර ගැනීම ය.

Copyright © 2007 National Institute of Education - Sri Lanka.

## 6.3 දෙවන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?

දෙවන ප්‍රධාන අවධිය අවසන් කරන සිසුන් විසින් ඉහළ මට්ටමක හැකියාවන් ප්‍රදර්ශනය කළ යුතු යැ යි අපේක්ෂා කරන අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහයක් හඳුනා ගෙන ඇත. මේවා හඳුනා ගැනීමේ දී තුන්වන හා හතරවන ශ්‍රේණිවල විෂය නිර්දේශ සහ අනිකුත් විෂයමාලා ද්‍රව්‍ය ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, කථිකාචාර්යවරුන්, විෂයමාලා සංවර්ධකයන් සහ ප්‍රවීණ අධ්‍යාපනඥයින් රැසකගේ අදහස් සැලකිල්ලට භාජන කරන ලදී. එමෙන් ම, වෙනත් රටවල ප්‍රකාශයට පත් කර ඇති මෙවැනි අත්‍යවශ්‍ය ප්‍රාප්ති මට්ටම් ද අධ්‍යයනය කරන ලදී.

හඳුනා ගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහය විෂයයන් වශයෙන් වෙන් වෙන් ව නොව, පොදු නිපුණතා සමූහයක් වශයෙන් සකස් කර ඇත. එම නිපුණතා සමූහය තුළ සන්නිවේදනයට, පෞරුෂත්වයට, පරිසරයට, වැඩ ලෝකයට සූදානම් වීමට, ආචාර ධර්ම හා ආගමට, ක්‍රීඩා විවේකයට සහ ඉගෙනුමට ඉගෙනීමට අදාළ නිපුණතා අන්තර්ගත ය.

## 6.4 ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

යම් නිපුණතාවකට අදාළ දැනුම, කුසලතා හා ආකල්ප පිළිබඳ ව උසස් මට්ටමේ හැකියාවන් ප්‍රදර්ශනය කරනු ලබන සිසුවකු එම නිපුණතාවයේ ප්‍රවීණයකු ලෙස මෙහි දී පිළිගැනෙනු ඇත. උසස් මට්ටමක හැකියාවක් ලබා තිබේ දැ යි තීරණය කිරීමට තක්සේරු කිරීම් තුළින් රැස් කළ විවිධ ආකාරයේ තොරතුරු සහ අදාළ නිර්ණායක එක් එක් නිපුණතාවට අදාළ ව සලකා බැලීමට සිදු වෙනු ඇත.

යම් නිපුණතාවක් සම්බන්ධව ප්‍රවීණ මට්ටමට පැමිණි සිසුවකු තුළ දක්නට ලැබිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- එම නිපුණතාවට අදාළ ඊළඟ ඉහළ මට්ටමට යොමු වීමට සූදානම් බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව තමා තුළ ආත්ම විශ්වාසයක් ඇති බව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට සම්බන්ධ දැනුම හෝ කුසලතා හෝ තවත් අයකුට පැහැදිලි කර දීමට හෝ ඉගැන්වීමට හැකියාවක් පෙන්නුම් කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව විශේෂ උන්නඳුවක් හෝ ආශාවක් දක්වන බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව සම්බන්ධ ගැටලුවකට මුහුණ පෑ විට එය ස්වාධීන ව විසඳා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට අදාළ කාර්යයන් බොහෝ දුරට නිවැරදි ව කරයි.
- ආකල්පවලට අදාළ නිපුණතාවන් සම්බන්ධ චර්යා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරයි.

## 6.5 නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දීම සිදු කළ යුත්තකි. ඒ සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්‍රම දෙකක් හඳුනාගෙන ඇත.

(අ) අවිධිමත් තක්සේරු ක්‍රම මගින් අඛණ්ඩව රැස් කර වාර්තා කර ඇති තොරතුරු පමණක් ඇසුරෙන් තීරණ ගැනීම. (සම්භවන තක්සේරු තොරතුරු පමණි)

(ආ) ඉහත (අ) හි සඳහන් තොරතුරුවලට අමතර ව සම්පිණ්ඩිත තක්සේරු කිරීමක් හෝ වැඩි ගණනක් හෝ ඇසුරෙන් තීරණ ගැනීම.

ඉහත සඳහන් ක්‍රම භාවිත කර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට ළඟා වී තිබේ ද යන්න පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය මග පෙන්වීම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සම්බන්ධයෙන් පිළියෙල කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගතව ඇත.



Copyright © 2007 National Institute of Education - Sri Lanka.